325 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 325 - இல. 08
Volume 325 - No. 08

2026 මාර්තු 03 වන අඟහරුවාදා
2026 மார்ச் 03, செவ்வாய்க்கிழமை
Tuesday, 03rd March, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය [තීරුව 1397]

**නිවේදන:**
ශ්‍රී ලංකා දේශගුණය පිළිබඳ පාර්ලිමේන්තු සංසදය සහ WFD විසින් සංවිධානය කළ විශේෂ සංවාදය [තීරුව 1398]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1399]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1401]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1402]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1403-1450]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
අවලංගු කරන ලද ඉස්ලාමීය පුණ්‍යායතන නැවත සක්‍රිය කිරීම [තීරුව 1452]

**වරප්‍රසාද:**
ස්ථාවර නියෝග 27(2) යටතේ යොමු කළ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවසර නොදීම [තීරුව 1456]

**විදේශ විනිමය පනත:**
නියමය [තීරු 1462-1559]

**කල්තැබීමේ යෝජනාව:**
සිවිල් ආරක්ෂක නිලධාරින් මුහුණ දෙන ගැටලු [තීරු 1559-1569]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 1569-1580]


# பிரதான உள்ளடக்கம்


**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப: 1397]

**அறிவிப்புகள்:**
இலங்கைக் காலநிலை பற்றிய பாராளுமன்ற ஒன்றியம் மற்றும் WFD இணைந்து ஏற்பாடு செய்த விஷேட கலந்துரையாடல் [ப: 1398]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1399]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1401]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1402]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1403-1450]

**தனி அறிவித்தல் மூல வினா:**
பதிவு இரத்துச் செய்யப்பட்ட இஸ்லாமியத் தொண்டு நிறுவனங்களை மீண்டும் செயற்படுத்துதல் [ப: 1452]

**சிறப்புரிமை:**
நிலையியற் கட்டளை 27(2) இன்கீழ் முன்வைக்கப்பட்ட வினாவை எழுப்ப அனுமதி வழங்காமை [ப: 1456]

**அந்நியச் செலாவணி சட்டம்:**
கட்டளை [ப: 1462- 1559]

**ஒத்திவைப்புப் பிரேரணை:**
சிவில் பாதுகாப்புப் படை வீரர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள் [ப: 1559-1569]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 1569-1580]


# PRINCIPAL CONTENTS


MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation [Col. 1397]

ANNOUNCEMENTS:
Special Dialogue Organized by Caucus on Climate Parliament of Sri Lanka and WFD [Col. 1398]

AUDITOR-GENERAL'S REPORT [Col. 1399]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1401]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1402]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1403-1450]

QUESTION BY PRIVATE NOTICE:
Reactivation of Deregistered Islamic Charitable Organizations [Col. 1452]

PRIVILEGE:
Denial of Permission to Raise a Question under Standing Order No. 27(2) [Col. 1456]

FOREIGN EXCHANGE ACT:
Order [Cols. 1462-1559]

ADJOURNMENT MOTION:
Issues Faced by Civil Defence Personnel [Cols. 1559-1569]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols.1569-1580]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 මාර්තු 03වන අඟහරුවාදා***
*2026 மார்ச் 03, செவ்வாய்க்கிழமை*
*Tuesday, 03rd March, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශ ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/21

2026 පෙබරවාරි මස 28 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ 2026 පෙබරවාරි මස 28 දාතමින් කරනු ලබන ප්‍රකාශනය මඟින් ඉහත කී ආඥා පනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම වර්ෂ දෙදහස් විසිහයක් වූ පෙබරවාරි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වියයුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත කී ප්‍රකාශනය කිරීමට හේතුව දිට්වා සුළිකුණාටුව හේතුවෙන් ඇති වී ඇති පසු ආපදා තත්ත්වය සලකා රටේ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම හා මහජනතාවගේ ජීවිතයට අත්‍යාවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහා බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති



**II**

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/3/01

2026 පෙබරවාරි මස 27 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි.

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ශ්‍රී ලංකා දේශගුණය පිළිබඳ පාර්ලිමේන්තු සංසදය සහ WFD විසින් සංවිධානය කළ විශේෂ සංවාදය
### இலங்கைக் காலநிலை பற்றிய பாராளுமன்ற ஒன்றியம் மற்றும் WFD இணைந்து ஏற்பாடு செய்த விஷேட கலந்துரையாடல்
### SPECIAL DIALOGUE ORGANIZED BY CAUCUS ON CLIMATE PARLIAMENT OF SRI LANKA AND WFD

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"ශ්‍රී ලංකා දේශගුණය පිළිබඳ පාර්ලිමේන්තු සංසදය" සමඟ එක්ව, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ වෙස්ට්මින්ස්ටර් පදනම සංවිධානය කරන "දේශගුණික අවදානම් කළමනාකරණය කිරීමේ දී සෙන්ඩායි රාමුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වැදගත් වන්නේ කෙසේද" යන මාතෘකාව යටතේ පැවැත්වෙන විශේෂ සංවාදයක්, සමතුලිත පරිසරයක් සඳහා වූ ගෝලීය නීති සම්පාදකයින්ගේ සංවිධානයේ ප්‍රධාන විධායක නිලධාරි මාලිනී මෙහෙරා මහත්මියගේ සහභාගිත්වයෙන් 2026 මාර්තු 03 දින, එනම් අද දින පස්වරු 3.30 සිට පස්වරු 4.45 දක්වා කාරක සභා කාමර අංක 1 දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

එම අවස්ථාවට සහභාගි වන ලෙස සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වෙත මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 මාර්තු 03වන අඟහරුවාදා, එනම් අද දින පූර්ව භාග 11.15ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLIV කොටස සහ නවවැනි කාණ්ඩයේ XXIX කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Regulations made by the Minister of Finance, Planning and Economic Development in consultation with the Colombo Port City Economic Commission and relevant Regulatory Authorities under Section 71 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021 and published in Gazette Extraordinary No. 2469/02 of 29th December, 2025.

I move that these Regulations be referred to the Ministerial Consultative Committee on Finance, Planning and Economic Development.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

Proclamation made and published in Gazette Extraordinary No. 2477/47 of 28th February, 2026 and Schedule thereto, by virtue of the powers vested with the President in terms of Section 2 of the Essential Public Services Act, No. 61 of 1979.- [The Hon. (Dr.) Harini Amarasuriya]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the Order under Section 22 of the Foreign Exchange Act, No. 12 of 2017 (published in Gazette Extraordinary No. 2467/67 of 18th December, 2025), which was referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I have a question for the Hon. Prime Minister. She just tabled a Gazette carrying Regulations made under the Colombo Port City Economic Commission Act.

I do not understand why it was not referred to the Committee on Public Finance because it is that Committee which, from day dot, has been liaising with the Colombo Port City because there are multiple finance-related issues that arise from the Act and Regulations made relating to the Port City, Sir. Therefore, it should have been referred to the Committee on Public Finance.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, it was referred to the Ministerial Consultative Committee on Finance, Planning and Economic Development. If necessary, we can refer it to the Committee on Public Finance as well.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

It is not under the discretion of that Committee, Hon. Prime Minister, if I am not mistaken. You cannot refer it to the Ministerial Consultative Committee; it has to come to the Committee on Public Finance. That is the practice.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

That is the policy-making body.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

That is the practice, Hon. Prime Minister.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

I will look into it and let you know. If that is the practice, there is no problem.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Okay.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

You have presented such gazettes in the past also. Always, it comes to the Committee on Public Finance.

Thank you.

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 සහ 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා හා ගිණුම්;

(ii) 2022 සහ 2023 වර්ෂ සඳහා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා හා ගිණුම්; සහ

(iii) 2022 සහ 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා හා ගිණුම්

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු කථානායකතුමනි, රත්නපුර, උඩකරවිට, පිටදෙනිය, හංගමුව පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජී.එන්. ප්‍රියංකර කරුණාදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
ගරු කථානායකතුමනි, හෙල්බොඩ, කටුකිතුල, හෙල්සිරිගම, අංක 11 යන ලිපිනයේ පදිංචි කේ.කේ. බෝධිපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) රඹුක්කන, හේවාදිවෙල, මීරිහාගොඩ, මුදලිගෙදර යන ලිපිනයේ පදිංචි මුදලිගෙදර නිශාන්ත බංඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) දොරවක, තෝරදෙණිය, "විජේ විලා" යන ලිපිනයේ පදිංචි ආර්.පී. විජේතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) බෙලිගල, එගොඩවෙල, අංක අයි 10/2 යන ලිපිනයේ පදිංචි ටී.එම්.පී.කේ. වැකුඹුර මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) තෝලංගමුව, දෙල්ගමුව යන ලිපිනයේ පදිංචි ටී.ආර්.ඩබ්ලිව්. තාඹුගල මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### නොරොච්චෝලේ බලාගාරයේ සිසිලන ක්‍රියාවලියට භාවිත කරන ජෙනරේටර් යන්ත්‍ර: විස්තර
### நுரைச்சோலை மின் நிலையத்தில் குளிர்விக்கும் செயன்முறைக்கான மின்பிறப்பாக்கிகள்: விபரம்
### GENERATORS FACILITATING COOLING PROCESS AT NOROCHCHOLAI POWER PLANT: DETAILS

681/2025

**1. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ, විදුලි උත්පාදන යන්ත්‍ර රත්වීම පාලනය කිරීමට අවශ්‍ය සිසිලන ක්‍රියාවලිය සඳහා භාවිත කිරීමට ජෙනරේටරයක් ගෙනෙන ලද දිනය කවරේද;

(ii) එම ජෙනරේටරය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම ජෙනරේටරය මේ වනතෙක් භාවිතයට ගෙන නොමැති බව දන්නේද;

(iv) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நுரைச்சோலை அனல் மின் நிலையத்தில் மின் உற்பத்தி இயந்திரங்கள் வெப்பமடைவதை கட்டுப்படுத்துவதற்குத் தேவையான குளிர் விக்கும் செயன்முறையின் பயன்பாட்டுக்காக ஒரு மின்பிறப்பாக்கி கொண்டுவரப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) மேற்படி மின்பிறப்பாக்கி தொடர்பாக செலவிடப்பட்டுள்ள பணத்தொகை யாது என்பதையும்;

(iii) இந்த மின்பிறப்பாக்கி இதுவரை பயன்பாட்டுக்கு உட்படுத்தப்படவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(iv) அது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the date on which a generator was brought to the Norochcholai Thermal Power Plant to facilitate the cooling process, necessary for controlling the heat of the power generators;

(ii) the amount spent on the aforesaid generator;

(iii) whether he is aware that the generator has not been used so far; and

(iv) the measures that will be taken in this regard?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මේ සඳහා ජෙනරේටරයක් මිලදී ගෙන නොමැත. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබා දී ඇති තොරතුරුවලට අනුව 2015 වසරේදී චීන රජය විසින් එවකට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ප්‍රදානයක් ලෙස ලබා දුන් ජෙනරේටර් යන්ත්‍ර දෙකක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබාදීමෙන් අනතුරුව ඒවා නොරොච්චෝලේ බලාගාරය වෙත ලබා දී ඇත. ලක්විජය බලාගාරයේ -එනම් නොරොච්චෝලේ බලාගාරයේ- සිසිලන යන්ත්‍රය සහ ඒ හා සම්බන්ධ අනෙකුත් පද්ධති ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය විදුලි බලය ලබා ගන්නේ බලාගාරයේ ඇති උත්පාදන යන්ත්‍රවලින්ම වන අතර උත්පාදන යන්ත්‍ර

ක්‍රියාත්මක නොවන අවස්ථාවලදී සිසිලන පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විදුලිය ජාතික පද්ධතියෙන් ලබා ගනී.

(ii) එම ජෙනරේටර 02 ලැබී ඇත්තේ චීන රජයේ ප්‍රදානයක් ලෙසය.

(iii) සමස්ත විදුලිය බිඳ වැටීමකදී - blackout අවස්ථාවකදී - සිසිලන පද්ධතිය සඳහා මෙම ජෙනරේටර භාවිත කර විදුලිය ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව බලාගාරයේ ඉංජිනේරුවන් විසින් බලාගාරය ඉදිකළ සමාගමේ සහ බලාගාරය සැලසුම් කළ ආයතනයේ සහාය ඇතිව පරීක්ෂණ සිදු කරමින් පවතී. පරීක්ෂණවලින් පසුව සිසිලන පද්ධතියට අවශ්‍ය වෙනස්කම් කර මෙම ජෙනරේටර 02 නිසි පරිදි සේවයේ යොදවා ගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.

(iv) ඉහතින් සඳහන් කළ පරිදි කටයුතු සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, මේ දිනවල කථා වන ගල් අඟුරු සිද්ධියටත් අදාළ අමාත්‍යතුමාගෙන් මම අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අද වනකොට බාල ගල් අඟුරු ගෙනාවා කියලා රජයත් පිළිගෙන තිබෙන මොහොතක, ඒ බාල ගල් අඟුරු නිසා මේ රටේ, විශේෂයෙන්ම නොරොච්චෝලේ බලාගාරයේ නිෂ්පාදනය කරන මෙගාවොට් 900 වෙනුවට මෙගාවොට් 600 දක්වා විදුලිය නිෂ්පාදනය පහත වැටීම නිසා, රටේ ජනතාවට අවශ්‍ය විදුලි ඒකක ගණන ලබා දීමට නොහැකි වෙලා තිබෙනවා.

ඒ වාගේම මේකට අවශ්‍ය වන්නේ ජෙනරේටර. මොකද, ඊළඟට විදුලිය නිෂ්පාදනය කරන්න වෙන්නේ ජෙනරේටරවලින් ඉතාම අධික මිලකට. එතැනදී ලෝකයේ පවතින වර්තමාන තත්ත්වයත් එක්ක ඒකට තවත් කාරණාවක් එකතු වනවා. ගරු ඇමතිතුමනි, මේ යුද්ධයත් එක්ක අද ලෝකයේ ඇති වෙලා තිබෙන තත්ත්වය ඔබතුමා දන්නවා. අද ඔබතුමන්ලා ළඟ තෙල් සංචිත විශාල වශයෙන් නැහැ, මාසයකට විතරයි තිබෙන්නේ කියනවා.

එතකොට තෙල් ආවේ නැත්නම්, එක පැත්තකින් නොරොච්චෝලේ බලාගාරයේ නිෂ්පාදනය වන විදුලිය ඒකක ගණන අඩු වනකොට, ජෙනරේටර්වලින් විදුලිය සපයා ගන්න වනකොට, ඒ ජෙනරේටර් සඳහාත් තෙල් අවශ්‍ය වනවා. අපි හිතමු, තෙල් නැතුව ගියා, විදුලිය නිෂ්පාදනයත් නැතුව ගියා කියලා. එහෙම වුණොත්, අද ලෝකයේ ඇති වෙලා තිබෙන යුද්ධයට වඩා යුද්ධයක් තමුන්නාන්සේලා මේ රට ඇතුළේ නිර්මාණය කරනවා. මේ රටේ සමස්ත අහිංසක ජනතාව තමයි ඒකෙන් පීඩාවට පත් වන්නේ. ඒ ජනතාව තමයි මේ සියලු ප්‍රශ්නවලට මුහුණ දෙන්නේ. එවැනි තත්ත්වයක් උදා වුණොත්, ඔබතුමන්ලා ඒ සම්බන්ධව ගන්නා පියවර මොකක්ද කියන එක තමයි මම පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගල් අඟුරු භාවිතයෙන් සිදු වන බලශක්ති නිෂ්පාදනය කිසිම අඩුවකින් තොරව සිදු කරන්න අවශ්‍ය කටයුතු අපි සූදානම් කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම ඛනිජ තෙල් සැපයුම පිළිබඳවත් කිසිම බාධාවීමක් හෝ ප්‍රමාදයක් නැහැ. මෙතුමන්ලා මෙතැන මේ මරභඩ දුන්නාට, මේ හදලා තිබෙන ටැංකිවල capacity එකෙන් තමයි අපි මේ තත්ත්වයෙන් හරි කටයුතු කරගෙන යන්නේ. ඇත්තටම ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තිබෙන ඔක්කෝම ටැංකි උපරිමයෙන් පුරවලා තමයි අපි මේ තත්ත්වය පවත්වාගෙන යන්නේ. දැනටත් අපි ටැංකි 9ක් අලුතෙන් ගොඩනඟන්න කටයුතු කරගෙන යනවා. මේ රජය යටතේ ඒවාට මුල්ගල් තියලා වැඩ පටන් අරගෙන තිබෙනවා. අපි එහෙම කටයුතු කළාට ඔබතුමන්ලා කිසිම විධියකින් හෙට දවසක් ගැන හිතලා වැඩ කරපු අය නොවෙයි නේ. ප්‍රශ්න ගැන දැන් කථා කරන්න ඉස්සර වෙලා තමන් මොකක්ද කළේ කියලා කල්පනා කරන්න. අවුරුදු 5, 10, 15 හිටපු අය නේ, මේ. අපි ඒවා කළමනාකරණය කරගෙන ඉස්සරහට යනවා. ඒ වාගේම වගකීමෙන් කියනවා, එහෙම තත්ත්වයක් ඇති නොවන්න අපි කටයුතු කරනවා කියලා. ලෝකයම මුහුණ දෙන යුද තත්ත්වය පාලනය කරන්න අපට බැරි වෙයි. හැබැයි, අපි මේ රටේ බලශක්ති සුරැකුම වෙනුවෙන් උපරිමයෙන් කටයුතු කරන බව මතක තියාගන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, එතුමා දුන්නේ තර්ජනාත්මක උත්තරයක්. මම ඇහුවේ, මේ රටේ ජනතාවට තිබෙන ප්‍රශ්නයක් ගැන.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව බලයට එන්න පෙර වර්තමාන ජනාධිපතිතුමා කිව්වා, "ත්‍රිකුණාමලයේ තිබෙන තෙල් ටැංකි ටික අපට තිබුණා නම් අපි දන්නවා තෙල් කොහොමද පරිහරණය කරලා මේ රටේ ජනතාවට ලබා දෙන්නේ කියලා" යනුවෙන්. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ තෙල් ටැංකිය ඇතුළට බැහැපු විධිය අපි දැක්කා. තෙල් ටැංකිය ඇතුළට බැහැලා ඒක ඇතුළේ කැරකුණු විධියත් අපි දැක්කා. හැබැයි තමුන්නාන්සේ දැන් කියන්න එපා, තෙල් ටික පුරවන්න තෙල් ටැංකි නැහැ කියලා. ඒක නොවෙයි උත්තරය.

ගරු කථානායකතුමනි, මම ඒකටම එකතු කරනවා, තව ප්‍රශ්නයක්. මේ රටේ සමස්ත විදුලි පද්ධතියට වැඩියෙන්ම විදුලි සැපයුමක් ලබා දෙන්නේ නොරොච්චෝලේ බලාගාරයෙනුයි. ඒ, මෙගාවොට් 900ක්. මේ රටේ සමස්ත ජනතාවට විදුලිය ලබා දෙමින් ආලෝකවත් කරන බලාගාරය පිහිටි ප්‍රදේශයේ ජීවත් වන ජනතාව අද විශාල ගැටලුවකට මුහුණ දෙනවා. බාල ගල් අඟුරු ගෙනැල්ලා දහනය කිරීමෙන් විශාල පරිසර හානියක් සිදු වන නිසා ඒ ප්‍රදේශයේ ජනතාව අද පීඩාවට පත් වෙලා ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඒකට ඒ අය පළිද? මම එම ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. ජනතාව මන්ත්‍රීවරුන් වශයෙන් අපව ඡන්දයෙන් පත් කරලා පාර්ලිමේන්තුවට එව්වේ මේවා නිවැරදි කරන්නයි. කරුණාකරලා එම ප්‍රදේශයේ සිදු වන පරිසර හානිය නැති කරන්න තමුන්නාන්සේලා ගන්නා පියවරත් ඒ එක්කම මෙම උත්තරීතර සභාවට කියන්න කියලාත් මම ඉල්ලා සිටිනවා. ඒක අත්‍යවශ්‍යයි. මොකද ඒ ජනතාව පළි නැහැ, තමුන්නාන්සේලා කරන මේ ජාවාරම්වලට.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි එහෙම පාවිච්චි කරන්න බැහැ. ඒවා ප්‍රතිසංස්කරණය කළ යුතුයි. අපි දැන් එම කටයුතු ආරම්භ කරලා තිබෙනවා. *[බාධා කිරීම්]* ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් තෙල් ටැංකි 24ක් තිබෙනවා. ඔයගොල්ලන්ගේ ආණ්ඩුව තමයි ඒ කාලයේ අනික් ටික ඉන්දියාවට විකුණලා තිබෙන්නේ; ඔයගොල්ලන්ගේ ආණ්ඩුවෙන් විකුණපුවා තිබෙන්නේ. අපට තිබෙන්නේ තෙල් ටැංකි 24යි. ඒ

[ගරු කුමාර ජයකොඩි මහතා ]

තෙල් ටැංකි 24න්, දැන් 4ක ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. එයින් තෙල් ටැංකි 2ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරලා තිබෙනවා. අනෙක් තෙල් ටැංකි දෙකේත් ප්‍රතිසංස්කරණ කටයුතු කරගෙන යනවා. නළ පද්ධති සම්පූර්ණයෙන්ම සවි කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ කටයුතු අපි කරගෙන යනවා. ඒ කටයුතු කරලා තමයි අපි මේවායේ ගබඩා කරන්න ඕනෑ. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා පොඩි ළමයි වාගේ කියවන්න එපා. ටැංකි තිබුණාට ඒ කටයුතු කරන්න බැහැ. එහෙම නම් ගොඩාක් දේවල් කරන්න පුළුවන්.

අනික් කාරණය මේකයි. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය නිසා පරිසර ප්‍රශ්නයක් මතු වී තිබෙනවා නම් එයින් පරිසරයට හානියක් සිදුව තිබෙනවාද, මොකක්ද තත්ත්වය කියලා ඒ අංශවලින් අපට දැනුම් දෙයි. අපි වගකිව යුතු රජයක් විධියට ඒ වෙලාවට අවශ්‍ය පියවර ගන්නවා. ඒ ගැන කිසිම විධියකින් සැකයක් තියා ගන්න එපා. මොකද, අපි ජනතාවගෙන් පත් වුණු ආණ්ඩුවක්. ඒක නිසා ඔබතුමන්ලා නොබැලුවාට වඩා අපි ජනතාවගේ ප්‍රශ්න දිහා බලනවා.

## ධීවර කර්මාන්තයේ නියැළී සිටින පුද්ගලයින්: රක්ෂණ සහ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම

## கடற்றொழிலில் ஈடுபட்டுள்ளோர்: காப்புறுதி மற்றும் ஓய்வூதியத் திட்டங்கள்

## PERSONS ENGAGED IN FISHING INDUSTRY: INSURANCE AND PENSION SCHEMES

744/2025

**2. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ නියැළී සිටින පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීමේ අවශ්‍යතාව පිළිගන්නේද;

(iii) එසේ නම්, ධීවරයන් වෙනුවෙන් ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் இன்றளவில் கடற்றொழிலில் ஈடுபட்டுள்ளவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவர்களின் பாதுகாப்புக் கருதி காப்புறுதித் திட்டமொன்றை ஆரம்பிக்க வேண்டியதன் அவசியத்தை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) ஆமெனில், கடற்றொழிலாளர்களுக்காகக் கடற்றொழிலாளர் ஓய்வூதியத் திட்டமொன்றை ஆரம்பிப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House-

(i) the number of persons currently engaged in the fishing industry in Sri Lanka;

(ii) whether he accepts the need to initiate an insurance scheme for their protection; and

(iii) if so, what measures will be taken to initiate a pension scheme for fishermen?

(b) If not, why?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த வினாவுக்கான விடை பின்வருமாறு:

(அ) (i) இலங்கையில் மீன்பிடித் தொழிலை மூன்று முக்கிய துறைகளாக வகைப்படுத்தலாம்: கடல் மீன்பிடி, நன்னீர் மீன்பிடித்தல் மற்றும் மீன் வளர்ப்பு.

ஒரு தொழிலாக, ஏராளமான மக்கள் இந்தத் தொழிலில் நேரடியாகவும் மறைமுகமாகவும் ஈடுபட்டுள்ளனர். இது உற்பத்தி முதல் இறுதி நுகர்வோரிடம் சேரும் வரையுள்ள அனைத்துக் கட்டங்களையும் உள்ளடக்குகிறது. கடலில், நன்னீரில் மீன்பிடியிலும் மற்றும் மீன் வளர்ப்பிலும் நேரடியாக ஈடுபட்டுள்ள மீனவர்கள், படகு உற்பத்தியாளர்கள், பல்வேறு விநியோகத்தர்கள், இறக்குமதியாளர்கள்/ ஏற்றுமதியாளர்கள், மீன் உற்பத்திகளின் மொத்த விற்பனையாளர்கள்/ சில்லறை விற்பனையாளர்கள் ஆகியோரும் இந்தத் தொழிலில் நேரடியாகவும் மறைமுகமாகவும் ஈடுபட்டுள்ளனர்.

இந்த அமைச்சினால் 2024ஆம் ஆண்டு வெளியிடப்பட்ட புள்ளிவிபரத் தரவுகளின்படி, மீன்பிடித் தொழிலில் ஈடுபட்டுள்ள சுறுசுறுப்பான மீனவர்களின் எண்ணிக்கை சுமார் 320,470 ஆகும். இதில் 188,940 கடற்றொழில் மீன்பிடிக் குடும்பங்களைச் சேர்ந்த, 225,480 கடல் மீனவர்களும் 83,960 நன்னீர் மீன்பிடிக் குடும்பங்களைச் சேர்ந்த 94,990 நன்னீர் மீனவர்களும் உள்ளனர்.

(ii) ஆம். மீன்பிடித் தொழிலின் சவாலான, ஆபத்தான மற்றும் இடர்நேர்வான தன்மையைக் கருத்திற்கொண்டு, கடற்றொழில் நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு, மீனவர் தனிநபர் காப்பீட்டுத் திட்டத்தில் மிகுந்த கவனம் செலுத்தியுள்ளது. அதன்படி, இலங்கைக் காப்புறுதிக் கூட்டுத்தாபனம், மற்றும் கமத் தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை ஆகியவற்றால் மீனவர் தனிநபர் காப்பீட்டுத் திட்டங்கள் இரண்டு செயற்படுத்தப்படுகின்றன. இந்த நோக்கத்திற்காக மீனவர் தனிநபர் காப்பீட்டுத் திட்டத்தைப் பெற மீனவர்கள் அறிவுறுத்தப்பட்டுள்ளனர். தற்போது அது செயற்படுத்தப்பட்டு வருகிறது.

- ***மீனவர் பாதுகாப்புக் காப்புறுதி***

இந்தக் காப்பீட்டுத் திட்டம் இலங்கைக் காப்புறுதிக் கூட்டுத்தாபனத்தால் 2022 முதல் செயற்படுத்தப்பட்டு வருகிறது. இந்தக் காப்பீட்டின்கீழ், 2025ஆம் ஆண்டிற்கு 10,869 மீனவர்கள் சந்தா செலுத்தியுள்ளனர்.

- ***சயுர மீனவர் தனிநபர் காப்பீடு***

சயுர மீனவர் தனிநபர் காப்புறுதித் திட்டம் கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபையால் செயற்படுத்தப்படுகிறது.

மீன்பிடி நடவடிக்கைகளில் ஈடுபடும்போது, விபத்து மரணம் மற்றும் நிரந்தர ஊனம் ஏற்பட்டால், மேற்படி மீனவர் காப்புறுதித் திட்டங்களின்மூலம் காப்பீடு செய்யப்பட்டுத் தவணைக் கட்டணமாக ரூ. 1,915 செலுத்துகின்றவர்களுக்கு ரூ. 1 மில்லியன் - 1,000,000 ரூபாய்வரையும், அதேபோன்று 2,605 ரூபாய் செலுத்துகின்றவர்களுக்கு ரூ. 1.5 மில்லியன் வரையும், ரூ. 3,165 செலுத்துகின்றவர்களுக்கு ரூ. 2 மில்லியன் வரையும் காப்புறுதிச் சலுகைகளைப் பெற்றுக்கொடுப்பதற்கு ஏற்பாடு செய்யப்பட்டுள்ளது.

மேலும் இந்தக் காப்புறுதித் திட்டத்தில்,

- நிரந்தரமாக பகுதியளவு இயலாமை
- இயற்கை மரணம்
- காணாமற்போதல்
- மருத்துவமனையில் அனுமதி
- விமான டிக்கெட் காப்பீடு
- விபத்து மரணம் (மீனவர்), மற்றும் பள்ளி செல்லும் குழந்தைகளின் கல்விச் செலவுகள்

போன்றவற்றுக்கான காப்பீட்டு சலுகைகளும் உள்ளடக்கப்பட்டுள்ளன.

(iii) புதிய மீனவர் ஓய்வூதியம் மற்றும் சமூகப் பாதுகாப்புச் சலுகைகள் திட்டம் கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு, அதன்கீழ் உள்ள கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களம், இலங்கை தேசிய நீர் உயிரின வளர்ப்பு அபிவிருத்தி அதிகாரசபை, கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை ஆகியவற்றால் இணைந்து செயற்படுத்தப் படுகிறது.

இந்தப் புதிய மீனவர் ஓய்வூதியம் மற்றும் சமூகப் பாதுகாப்புச் சலுகைகள் திட்டம், மீனவ சமூகத்திற்கான ஒரு தனித்துவமான திட்டமாகும். மேலும், இது பங்களிப்பு ஓய்வூதியத் திட்டமாகச் செயற்படுத்தப்படுகின்றது.

புதிய மீனவர் ஓய்வூதியம் மற்றும் சமூகப் பாதுகாப்புச் சலுகைகள் திட்டம், உலக மீனவர் தினத்தையொட்டி, 2025 நவம்பர் 21ஆம் திகதி தொடங்கி வைக்கப்பட்டது. மேலும், மீனவர்கள் இப்போது கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்தின் மாவட்ட அலுவலகங்கள், இலங்கை தேசிய நீர் உயிரின வளர்ப்பு அபிவிருத்தி அதிகாரசபையின் மாவட்ட அலுவலகங்கள், கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபைமூலம் இந்த ஓய்வூதியத் திட்டத்தில் சேரலாம்.

இங்கு, பங்களிப்பாளர் ஓய்வுபெறும் வயதி லிருந்து (60 வயது நிறைவடைந்த பிறகு) வாழ்நாள் வரை மாதாந்தம் ஓய்வூதியத்தைப் பெற உரிமை உண்டு. மேலும், வயது அதிகரிக்கும்போது ஓய்வூதியப் பலன் அதிகரிக்கும் வகையில் தொடர்புடைய ஓய்வூ தியத்தின் நிதி மதிப்பு சரி செய்யப்பட்டுள்ளது.

மேலும், பங்களிப்பாளருக்கு நிரந்தர பூரணமான/ பகுதியளவான இயலாமை மற்றும் மரணம் ஏற்பட்டால், ஒரு மொத்த தொகைப் பணமும் வழங்கப்படும்.

எதிர்காலத்தில் இந்த ஓய்வூதியப் நலன் வாழ்க்கைத் துணைவர்களுக்கும் பொருந்தும் வகையில் தேவையான சட்டத் திருத்தங்கள் செய்யப்பட்டு வருகின்றது.

( ஆ) பொருந்தாது.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමා දන්නවා, අපේ රටේ ධීවර ජනතාව කරන්නා වූ සේවය ගැන. මේ රටේ ප්‍රජාවගේ ආහාර සහ පෝෂණය සම්බන්ධයෙන් ධීවර ජනතාව ලොකු කැපවීමක් කරනවා. ගරු ඇමතිතුමනි, එහිදී ධීවර ජනතාවට අත්‍යවශ්‍ය වෙන දේවල් තමයි ඩීසල් සහ ලාම්පු තෙල්. විශේෂයෙන්ම මේ රටේ මේ වෙලාවේ panic buying ඇති වෙලා තිබෙනවා, ඩීසල් සහ ලාම්පු තෙල් කියන කාරණා දෙකටම. ඒත් එක්කම රජය ප්‍රකාශ කර තිබෙනවා, මාසයකට ආසන්න කාලයකට ප්‍රමාණවත් තෙල් ප්‍රමාණයක් තමයි තිබෙන්නේ කියලා.

ඒ හා සමගාමීව බැලුවොත්, විශේෂයෙන්ම ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, ධීවර ජනතාව තෙල් ලබා ගැනීමේදී ධීවර තොටුපොළවල කටයුතුවලට හැරුණාම, අනික් කාරණාවලට ඒ අයට තෙල් ලබා ගන්න වෙන්නේ බූලිවලට සහ බැරල්වලට බව. දැන් මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක බූලිවලට සහ බැරල්වලට තෙල් ලබා දෙන්නේ නැහැ; ලාම්පු තෙල් සහ ඩීසල්. මේ සඳහා ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරන ක්‍රමවේදය මොකක්ද? ඒ වාගේම මාසයකට පස්සේ තෙල් හිඟයක් ආවොත්, මේ රටේ ධීවර ජනතාවට නොකඩවා තෙල් ලබාදීම සඳහා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද? මොකද, අපට මතකයි, ආර්ථික අර්බුදය වෙලාවේ වැඩිපුරම පීඩාවට පත් වෙච්ච ජනතාවක් තමයි අපේ ධීවර ජනතාව. විශේෂයෙන්ම තෙල් හිඟයත් එක්ක. ඉතින් මේ වෙනකොට ලෝකයේ තෙල් හිඟයක් ඇති වීමේ ප්‍රවණතාවක් තිබෙනවා කියන බය ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම තෙල් නිෂ්පාදනය කරන රටවල් තෙල් බෙදා හැරීම නතර කර තිබෙනවා. ඒකත් එක්ක රජයක් හැටියට, ධීවර අමාත්‍යාංශය හැටියට මේ ධීවර ජනතාව වෙනුවෙන් ඔබ ගන්නා වූ ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම පවසන්න ඕනෑ ගරු මන්ත්‍රීතුමා මුල් ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ insurance පිළිබඳවයි කියන කාරණය. නමුත් අවසානයේදී එය ලාම්පු තෙල්

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

සම්බන්ධ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. කෙසේ වෙතත්, මම එක දෙයක් කියන්න ඕනෑ. අපි ආණ්ඩු බලයට පත් වෙනකොට ලංකාවේ සියලුම බෝට්ටු, විශේෂයෙන් කුඩා බෝට්ටු සියල්ලම ඇදලා වෙරළේ වෙනම ගැට ගහලයි තිබුණේ. ඇයි? යන්න බැහැ, භූමි තෙල් සහනාධාරය නැහැ; වියදමට නැහැ. ඒ තත්ත්වයට පත් වෙලා තිබුණා. නමුත් ඔබතුමන්ලා කවුරුත් දන්නවා, අපි ආපු විගසම භූමි තෙල් සහනාධාරය ලබා දුන් බව. වෙරළේ ගැට ගහලා තිබුණු සියලු බෝට්ටු ආපසු ඒ සේවාවට පත් වුණු බව. ඒ ධීවරයන්ට අදාළ දේ අපි ලබා දුන්නා. ඒ නිසා අපි,- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. ඒ නිසා,-

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මාස තුනක් විතරයි.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
මාස තුනක් නොවෙයි, අපි මාස හයක් ලබා දුන්නා. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්නකෝ. මාස හයක් ලබා දුන්නා. ඒ අවස්ථාවේ ඔබතුමන්ලාගේ බෝට්ටුවලට ලබා දුන්නා ද කියලා මම දන්නේ නැහැ. ඒක වෙනම කාරණයක්. *[බාධා කිරීමක්]* එතුමාට දුන්නා. එතුමාට දෙසැරයක් දුන්නා. *[බාධා කිරීම්]* දෙසැරයක් දුන්නා නේද? දෙසැරයක් දුන්නා. තුන්වැනි වතාවේ එතුමා ඉල්ලුවේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කාටද, ඒ?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
එයා, එයා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද එයා? *[බාධා කිරීමක්]*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
කෙසේ වෙතත්, දැනට ඇති වෙලා තිබෙන භූමි තෙල් සම්බන්ධ ප්‍රශ්නය ද, තෙල් ප්‍රශ්නය ද, නැත්නම් යුද්ධය පිළිබඳ ප්‍රශ්නය ද තව සතියකින්, දෙකකින් තුරන් වෙලා යනවා කියලා අපි විශ්වාස කරනවා. ඒ ප්‍රශ්න තුරන්වෙලා ගියාට පසුව ධීවර ජනතාවට යම් ප්‍රශ්නයක් පැන නැඟුණොත්, ඒ මොහොතේ අපි අනිවාර්යයෙන් ඒකට අදාළ ක්‍රියාමාර්ග ගන්නවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා කිව්වා, තෙල් සහනාධාරය ලැබෙනවා කියලා. ධීවරයන්ට තෙල් සහනාධාරය ලැබී තිබුණේ එක පාරක් විතරයි. මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුදු එකහමාරක් විතර වෙනවා. නමුත්, ඒ දේ සිදු වෙලා නැහැ. பொய் சொல்ல வேலை இல்லை!

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම අපේ ධීවර ජනතාව ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට පාරට ඇවිල්ලා උද්ඝෝෂණ කළා, චින්ච් එකෙන් මාදැල් ධීවර කර්මාන්තය කරගෙන යන්න ධීවරයන්ට ඉඩ දෙන්න කියලා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, ධීවර කර්මාන්තයේ නියැළෙන ඒ ජනතාවට ඒ සාකච්ඡාවෙන් පසුව සිදු වුණු ප්‍රගතිය මොකක්ද කියන එක.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ගරු කථානායකතුමනි, ඒ අතුරු ප්‍රශ්නයත් එතුමාගේ මුල් ප්‍රශ්නයට අදාළ නොවන වෙනත් ප්‍රශ්නයක්. මේකත් වෙනම ප්‍රශ්නයක් විධියට දැම්මොත් මීට වඩා හොඳ, දීර්ඝ උත්තරයක් ලබා දෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා.

කෙසේ වෙතත්, මම කියන්න ඕනෑ අපි මාදැල් කර්මාන්තයට කිසිම බාධාවක් කරලා නැති බව. මාදැල් කර්මාන්තය කරන්න කියලා අපි සියලු දෙනාට කියලා තිබෙනවා. මාදැල් කර්මාන්තය යනු අපේ පාරම්පරික ක්‍රමයක්. අන්න ඒ පාරම්පරික ක්‍රමය එසේ පවත්වා ගෙන යන්න කියලා කියා තිබෙනවා. නමුත්, පසුගිය කාලයේදී ඔබතුමන්ලාගේ ඇමතිවරු කිහිප පොළක් ඒගොල්ලන්ට චින්ච් යන්ත්‍ර සහ ට්‍රැක්ටර් පාවිච්චි කිරීමට අවසර ලබා දීලා තිබෙනවා. ඒ චින්ච් යන්ත්‍ර සහ ට්‍රැක්ටර් පාවිච්චි කිරීමේදී වෙරළට හා ඊට අදාළව විශාල හානියක් සිද්ධ වෙනවා කියලා අපේ පරිසර වාර්තා අනුව ඔප්පු වෙලා තිබෙනවා; නාරා ආයතනයේ වාර්තා අනුව ඔප්පු වෙලා තිබෙනවා. එම නිසා අපි මාදැල් කර්මාන්තකරුවන් මීට මාස හයකට කලින් කැඳවා ඒගොල්ලන් එක්ක සාකච්ඡා කරලා කිව්වා, "තවත් මාස හයකින් අපි මේක නතර කරනවා. ඔයගොල්ලන් එය නතර කරන්න ඕනෑ" කියලා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. නමුත්, ඒක නතර කළේ නැහැ. ඊට පස්සේ තමයි ඒගොල්ලන් උපවාස කළේ. ඊට පස්සේ අපිත්, ජනාධිපතිතුමාත් ඒගොල්ලන් එක්ක සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේදී එකඟතාවකට ආවා. පරිසරයට හානි සිද්ධ වෙන්නේ නැති වන විධියට මේ කර්මාන්තය කෙසේද කරගෙන යන්න ඕනෑ, මේකට ගත යුතු වෙනත් විකල්ප ක්‍රියාමාර්ග තිබෙනවාද, චින්ච් එක පමණක් පාවිච්චි කරන්න පුළුවන්ද, ට්‍රැක්ටරය භාවිතය නැවැත්වීම තුළ වෙන්නේ මොකක්ද කියන කාරණාව දැනට අපි මාදැල් කර්මාන්තකරුවන් සහ අපේ අමාත්‍යාංශය ඇතුළු ඒ පරිසරවේදීන් සමඟ සාකච්ඡා කරමින් පවතිනවා. මාස දෙකෙන් පස්සේ පරිසර වාර්තා සහ ඒ විද්වතුන්ගේ වාර්තාව අනුව ඉදිරියේදී ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නියමිතයි කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -840/2025- (1), ගරු මුජිබුර් රහුමාන් මහතා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
Sir, I rise to a point of Order. මට විනාඩියක කාලයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද? *[බාධා කිරීම්]*

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු කථානායකතුමාගේ අවසරය ඇතිව, මම ඇමතිතුමාට කරුණු පෙන්වා දෙන්නම්. වින්ච් එකේ ප්‍රශ්නය ගැන ඔබතුමා කථා කළා නේ, ගරු ඇමතිතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක, point of Order එකක් නොවෙයි. ගරු ඇමතිතුමා ඒ කාරණයට පිළිතුරක් දුන්නා නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, ඇමතිතුමාගේ අවසරය මත,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, dialogue එකකට යන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමාට එය පැහැදිලි කරන්න පොඩ්ඩක් ඉඩ දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. මට විනාඩියක් දුන්නේ නැත්නම් මම සභා ගර්භය මැදට එනවා. මට විනාඩියක් දෙන්න, කථා කරන්න. *[බාධා කිරීම්]*

***[මෙම අවස්ථාවේදී විපක්ෂයේ මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණියහ.]***
*[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்தின் மத்திக்கு வந்தனர்.]*
*[At this stage, some Members of the Opposition walked into the Well of the House.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න.

## කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්: රාජකාරි සහ කාර්ය සාධනය
### விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்கள்: பணிகள் மற்றும் செயலாற்றுகை
### AGRICULTURAL RESEARCH AND PRODUCTION ASSISTANTS: DUTIES AND PERFORMANCE

913/2025

**4. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරි වසම් මට්ටමෙන් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් පත් කර තිබේද;
(ii) එසේ නම්, මේ වන විට සේවයේ යෙදී සිටින කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) ඔවුන් අයත් වන දෙපාර්තමේන්තුව කවරේද;
(iv) ඔවුන්ගේ ආසන්නතම ඉහළ නිලධාරියාගේ තනතුර කවරේද;
(v) ඔවුන්ගේ ප්‍රධාන රාජකාරි වගකීම් කවරේද;
(vi) ඔවුන්ට රාජකාරි ලැයිස්තුවක් ලබාදී තිබේද;
(vii) ඔවුන්ට මේ වන විට පවරා ඇති පර්යේෂණ කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සම්බන්ධයෙන් කාර්ය සාධන සමාලෝචන සිදු කරන්නේද;
(ii) ඔවුන්ගේ සේවය මඟින් පසුගිය වර්ෂවල කෘෂිකර්මාන්තය ලබා ඇති ප්‍රගතිය කවරේද;
(iii) ක්ෂේත්‍රයේ ඇති ගැටලුවලට විසඳුම් ලබා දීම සඳහා ඔවුන් නිරන්තර ක්ෂේත්‍ර පරීක්ෂාවල යෙදවීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் கிராம அலுவலர் பிரிவு மட்டத்தில் விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்கள் நியமிக்கப்பட்டுள்ளார்களா என்பதையும்;

(ii) அவ்வாறெனில், தற்போது சேவையில் ஈடு பட்டுள்ள விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(iii) அவர்கள் இணைக்கப்பட்டுள்ள திணைக்களம் யாது என்பதையும்;

(iv) அவர்களின் உடனடுத்த உயர் அதிகாரியின் பதவி யாது என்பதையும்;

(v) அவர்களின் முக்கிய கடமைப் பொறுப்புகள் யாவை என்பதையும்;

(vi) அவர்களுக்கு கடமைப் பட்டியல் வழங்கப் பட்டுள்ளதா என்பதையும்;

(vii) தற்போது அவர்களுக்கு வழங்கப்பட்டுள்ள ஆராய்ச்சிப் பணிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர்கள் தொடர்பில் செயலாற்றுகை மீளாய்வுகள் நடத்தப்படுகின்றனவா என்ப தையும்;

(ii) அவர்களின் சேவைமூலம் கடந்த ஆண்டுகளில் விவசாயத்துறை அடைந்துள்ள முன்னேற்றம் யாது என்பதையும்;

(iii) இந்தத் துறையிலுள்ள பிரச்சினைகளுக்குத் தீர்வுகளை வழங்க அவர்களை அடிக்கடி கள ஆய்வுகளில் ஈடுபடுத்த நடவடிக்கை எடுக்கப் படுகின்றதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether Agricultural Research and Production Assistants have been appointed at Grama Niladhari Division level in Sri Lanka;

(ii) if so, the number of Agricultural Research and Production Assistants serving in each district, separately;

(iii) the department to which they belong;

(iv) the designation of their immediate superior officer;

(v) their main official responsibilities;

(vi) whether they have been given a duty list; and

(vii) the research activities that have been assigned to them at present?

(b) Will he also inform this House -

(i) whether performance reviews are conducted in respect of Agricultural Research and Production Assistants;

(ii) the progress that the agriculture sector has achieved through their services in recent years; and

(iii) whether measures will be taken to engage them in regular field inspections in order to provide appropriate solutions to the issues prevailing in the sector?

(c) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) දිවයිනේ ග්‍රාම නිලධාරි වසම් එකක් හෝ කිහිපයක් ඇතුළත් වන පරිදි කෘ.ප.නි.ස. වසම් නිර්ණය කර පිහිටුවා ඇති අතර, උතුර හා නැගෙනහිර පළාත් හැර අනෙකුත් පළාත්වල පිහිටුවා ඇති සෑම කෘ.ප.නි.ස. වසමක්ම නියෝජනය කරමින් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් අනුයුක්ත කර ඇත. එනමුත් පවතින නිලධාරි හිඟය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල සීමිත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් පිරිසක් පමණක් සේවය කරනු ලැබේ.

(ii) 2025.12.31 දිනට දිස්ත්‍රික්ක 25හි සේවය කරන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01 මඟින් දක්වා ඇත. එය දීර්ඝ ඇමුණුමක්

(iii) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.

(iv) ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රධානි, "ගොවිජන සංවර්ධන නිලධාරි"- *[බාධා කිරීමක්]*

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
Point of Order!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වෙදආරච්චි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද? *[බාධා කිරීම්]*

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය මත ඇමතිතුමාටයි මම මේ කාරණය යොමු කරන්නේ. දෙසැම්බර්

මාසයේ වින්ච් තහනම් කළා. තහනම් කළාම දකුණු පළාතේ හැරෙන්න අනෙක් පළාත් ඔක්කොගේම මාදැල් වැඩ කිරීම නතර වුණා. එතකොට ඒගොල්ලන් පෙබරවාරි මාසයේ උද්ඝෝෂණය කළා. ජනාධිපතිතුමා ඒගොල්ලන් කැඳෙව්වා. කැඳවලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා,- *[බාධා කිරීම්]*

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නයට උත්තර දෙමින් හිටියේ. *[බාධා කිරීම්]*

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
පොඩ්ඩක් ඉන්න. විනාඩියක් ඉන්න.*[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි. - *[බාධා කිරීම්]*

ගරු ධීවර අමාත්‍යතුමා. *[බාධා කිරීම්]*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට අදාළව නොවෙයි එතුමා අතුරු ප්‍රශ්නය අහන්නේ. ඒක පළමුවන කාරණය. දෙවැනි කාරණය තමයි, ඒගොල්ලන්ට මාදැල් කර්මාන්තය පිළිබඳ යමක් දැනගන්න ඕනෑ නම් වෙනම කල්තැබීමේ යෝජනාවක් ගේන්න කියන්න. එතකොට අපි උත්තර දෙන්නම්. එහෙම නැත්නම් වෙනම ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න කියන්න. අපි ඒකට උත්තර දෙන්නම්.*[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා උත්තර දෙන්න.*[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වැල්වටාරම් කියන්නේ නැතුව අහන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් විවාදයක් නැහැ. කරුණාකර වාඩිවෙන්න. කරුණාකර වාඩිවෙන්න. අමාත්‍යතුමා ඒකට පිළිතුරු ලබා දුන්නා. *[බාධා කිරීම්]* කරුණාකර වාඩිවෙන්න. ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා, පිළිතුරු දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

(v) 2013.07.25 දින අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් වෙත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කිරීමට අදාළ වගකීම් ඇතුළු අනෙකුත් රාජකාරි පවරා ඇත. එම විස්තර ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

(vi) 2013.07.25 දින අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් වෙත රාජකාරි ලැයිස්තුවක් ලබා දී ඇත. ඒකට අදාළ දීර්ඝ පිළිතුර ඇමුණුම 02හි තිබෙනවා, ගරු මන්ත්‍රීතුමියනි.

(vii) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මෙතෙක් පර්යේෂණ කටයුතු පවරා නොමැත.

(ආ) (i) කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ගේ කාර්යසාධන ඇගයීමේදී ඇමුණුම 03 මඟින් දක්වා ඇති ආකාරයට කාර්යසාධන වාර්තාව අදාළ කර ගන්නා ලෙසත්, ඔවුන්ගේ කාර්යසාධන ඇගයීමේ දී ඇමුණුම 04හි සඳහන් ක්‍රම අනුගමනය කරන ලෙසත් සියලු දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. ඇමුණුම 3 සහ 4 යටතේත් දීර්ඝ විස්තරයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමියනි.

01 සිට 04 දක්වා ඇමුණුම් **සභාගත*** කරමි.

(ii) දිවයින පුරා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් මට්ටමින් දත්ත හා තොරතුරු රැස් කිරීම සහ ක්ෂේත්‍ර මට්ටමින් අවශ්‍යතාව පරිදි ඒ ඒ ව්‍යාපෘතිවලට අදාළ පාර්ශ්ව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ඇත.

(iii) ඔව්.

(ඇ) අදාළ නැත.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ වනකොට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරු ලොකු කාර්යභාරයක් කරනවා කිව්වා. මොකද, ඒගොල්ලන්ට යම් කිසි කාර්යභාරයක් පවරලා තිබෙන නිසා. මම හිතන හැටියට, ඒ විස්තර ඔබතුමා සභාගත කරපු ලේඛනවල ඇති. දැන් මහ කන්නය ඉවර වෙලා තිබෙනවා. මේ වනකොට අපේ පළාත්වල ඒ අස්වැන්න නෙළමින් තිබෙනවා. නමුත්, මේ වනකල් පොහොර සහනාධාරය ලැබිලා නැහැ, හැමෝටම. ඒකට එක හේතුවක් තමයි, system එකට මේ දත්ත ඇතුළත් කරන්න අවශ්‍ය නිලධාරින් නැති වීම. ඒ කටයුත්ත කරන්නෙත් මේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්. ඊළඟට, "දිට්වා" සුළි කුණාටුව ඇති වූ වෙලාවෙත් ඒ අවශ්‍ය තොරතුරු එකතු කර ගන්නට යම් අපහසුතා ඇති වෙලා තිබෙන්නෙත් මේ අයට

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

තිබෙන පහසුකම්වල අඩුපාඩුව නිසායි. අක්කර බදු, අය කිරීම්, වගා ණය අයකිරීම්, පොහොර සහනාධාර බෙදීම් ඇතුළු මේ සියල්ල කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ට තිබෙන වගකීම්. මම හිතන විධියට, ඔබතුමා සභාගත කරපු ලේඛනයේත් ඒ විස්තර ඇති. හැබැයි, මේ වනකොට ඒ කටයුතු ගොවි සංවිධානවලටම කරන්න කියලා පවරා තිබෙනවා. හැබැයි, මේවා මුදල් සම්බන්ධ කටයුතු. නමුත්, ඒ වගකීම් ගන්න කෙනෙක් නැහැ. මේ අය ලොකු කාර්යභාරයක් කරනවා.

ඒ වාගේම වගා බිම්වල, වැව්වල ආක්‍රමණශීලි පැළෑටි තිබෙනවා. *Mimosa pigra* - යෝධ නිදිකුම්බා - ශාකය තිබෙනවා. ඒ වාගේම වැව්වල හැදෙන අර කහ පාට මලක් පිපෙන ශාකය තිබෙනවා. මේවා දැවැන්ත විධියට තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය,-

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්නය අහන්නයි මේ එන්නේ.

ඒවා ඉවත් කිරීමත් ඒ අයගේ කාර්යභාරයක්. හැබැයි, ඒ සඳහා ඔවුන්ට ප්‍රතිපාදන වෙන්වෙලා නැහැ.

පසුගිය දවස්වල රිළව් ගණන් කළා. නමුත්, රිළව් අයින් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. ඔවුන් ලග්ගලට ගිහින් දමනවා කිව්වා. එච්චරයි, ලග්ගලට අඩුවකට තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, දැන් අවසන් කරන්න. මේ වෙනකොට ඔබතුමිය අතුරු ප්‍රශ්නය අහන්න විනාඩි 3ක කාලයක් අරගෙන තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මෙන්න මේ කටයුතු සියල්ල කරන කෘෂි පර්යේෂණ සහකාර නිලධාරින් වැඩ බැලීමේ රාජකාරිවලින් ඉවත් වෙනවා කියලා අද පත්තරේ තිබෙනවා. මොකද, වසම් 2කට වඩා වැඩ බලනවා නම්, ඒ සඳහා ගෙවීම් කරන්නේ නැහැයි කියන එක තමයි අමාත්‍යාංශයෙන් කියන්නේ. ඒ නිසා ඒගොල්ලෝ වෘත්තීය සටනකට යනවා කියනවා. ගරු ඇමතිතුමනි, මෙවැනි තත්ත්වයක් ඇති වුණොත්, ඒකේ පීඩනය එන්නේත් මේ රටේ ගොවි ජනතාවට. එම තනතුරුවල පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා. තිබෙන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කරලා නැහැ. ඒ වාගේම, ඔවුන්ට අවශ්‍ය ගෙවීම් කරලා නැහැ. අමාත්‍යාංශය හැටියට ඔබතුමා මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙළ මොකක්ද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය එක ප්‍රශ්නයක් ඇතුළේ ප්‍රශ්න ගොඩක් ඇහුවා. සමහර ප්‍රශ්නවලට පිළිතුරු ඔබතුමියගේ ඉදිරිපත් කිරීම ඇතුළේම තිබුණා. එකක් තමයි, අපි පොහොරවලට අවශ්‍ය මුදල් දැම්මේ මුර දෙකකට. ඒ කියන්නේ, වගාව ආරම්භ කරන්න කලින් තමයි මුදල් දැම්මේ. වගාව ආරම්භ කරන්න කලින් මුදල් දමපු නිසා තමයි මුර දෙකකට දැම්මේ. තවමත් දෙවැනි මුරේ පොහොර මුදල් නොලැබුණු ගොවීන් පිරිසක් ඉන්නවා. ඒකට හේතු කිහිපයක් තිබෙනවා. එක් හේතුවක් ඔබතුමියම කිව්වා. ඒ තමයි, නිලධාරින්ගේ හිඟය. කෘපනිසලාම 4,000ක් අඩුයි. මොකද, ඔබතුමියලාගේ ආණ්ඩු විසින් ඒ නිලධාරින් බඳවා ගත්තේ නැහැ. රජය විධියට ඉදිරියේදී ඒ පුරප්පාඩු සම්පූර්ණ කරන්න අපි තීරණ අරගෙන තිබෙනවා.

විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුවත් එක්ක අපේ නිලධාරින්ට වාගේම දෙපාර්තමේන්තුවලටත් විශාල වැඩ කොටසක් පැවරුණා. ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ බෝග වර්ග 6ක් සඳහා පමණයි ගොවීන්ට වන්දි ගෙව්වේ. හැබැයි, අපේ ආණ්ඩුව යටතේ වී, කැකිරි, පිපිඤ්ඤා, වට්ටක්කා, පත්තක්කා, කරවිල ඇතුළු සියලු බෝගවලට වන්දි ගෙව්වා. ගෙවූ වන්දි ප්‍රමාණයත් වැඩි වුණා. ඒත් එක්කම හරක්, ඌරන්, එළුවන්, කුකුළන් ඇතුළු සතුන් සඳහාත් වන්දි ගෙව්වා. ඒ තත්ත්වය තුළ අපේ නිලධාරින්ට ලොකු වැඩ කොටසක් පැවරුණා. ඒවාත් එක්ක වැඩවල තදබදයක්, හිර වීමක් සිද්ධ වුණා. ඒ තුළ යම් යම් ගැටලුවක් මතු වුණා. මේ වෙනකොට අපි ඒ තත්ත්වය නිවැරදි කරමින් ඉන්නවා.

විශේෂයෙන්ම ඔබතුමියගේ පැත්තෙන් ඊළඟට ප්‍රකාශ කළ කාරණය තමයි, වැව්වල ආක්‍රමණික ශාක තිබෙනවා වාගේම, වැව් රොන් මඩවලින් පිරිලා තිබෙනවාය කියන කාරණය. මේ වෙනකොට වැව්වල ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුවත් එක්ක කැඩුණු වැව්, අමුණු සහ ඇළවේලි සියල්ලම හදනවා. ඒ සියල්ලට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වැඩ දැන් ආරම්භ වෙලා තිබෙනවා.

ඊළඟට, දෙපාර්තමේන්තුවක් විධියට මේකේ තව ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. අපි ඒ ගැටලු හඳුනාගෙන තිබෙනවා. අපි නිසියාකාරව එම කටයුතු සිද්ධ කරගෙන යනවාය කියන එකත් මම මේ වෙලාවේ කියන්න කැමැතියි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම අහපු ප්‍රශ්නයට උත්තරය ලැබුණේ නැහැ නේ. මම ඇහුවේ මේ අයට මේ ගෙවීම් කරනවාද කියන එක නේ.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මෙහෙමයි. මෙතැනදී වැඩ බැලීමේ දීමනාව සම්බන්ධයෙන් ගැටලුවක් මතු වෙලා තිබෙනවා. එම ගැටලුව නිරාකරණය කිරීමට අපි සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා. ඉදිරියේදී එම ගැටලුවට උත්තරයක් කෘපනිසවරුන්ට ලැබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඔබතුමා කිව්වා, පසුගිය ආණ්ඩු කතන්දරයක්. පසුගිය ආණ්ඩුවල ඒවා දැන් කථා කරලා වැඩක් නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. දැන් අවුරුද්දයි මාස හතරක් ගතවෙලා තිබෙනවා. එම 4,000 පත් කරනවා නම් පත් කරන්න ඔබතුමන්ලාට කාලය තිබුණා.

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාට ලබා දෙනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු කථානායකතුමනි, මම ධීවර ඇමතිතුමාටයි මේ ප්‍රශ්නය යොමු කරන්නේ. සුළු වෙලාවයි මම ගන්නේ. දෙසැම්බර් මාසයේ සිට මාදැල් ධීවර තහනමක් පැනෙව්වා. පෙබරවාරි මාසයේ ජනාධිපතිතුමා කමිටුවක් පත් කළා, ඒ සඳහා. දෙපැත්තෙන් පස් දෙනා, පස් දෙනා බැගින් කමිටුවක් පත් කරලා තීරණයක් ගත්තා. අප්‍රේල් මාසය වෙනකොට පුත්තලම දිස්ත්‍රික්කයේ සහ මීගමුව ප්‍රදේශයේ ධීවර කර්මාන්තය කරන කාල සීමාව ඉවරයි. දෙසැම්බර් ඉඳලා අප්‍රේල් වෙනකම් මේ මිනිස්සු ජීවත් වෙන්නේ කොහොමද, කන්නේ බොන්නේ කොහොමද? ඔබතුමා මාස දෙකක් කල් ඉල්ලුවාම අසාධාරණයි නේ. දැන් පරීක්ෂණය කරලා, -

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා මොකද කියන්නේ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මේක පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය නොවෙයි. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන ප්‍රශ්නයට සම්ප්‍රදායෙන් පිට ගිහිල්ලා පූර්වාදර්ශයක් නොවන හැටියට ධීවර ඇමතිතුමා උත්තරයක් ලබා දෙයි. මේක පූර්වාදර්ශයක් කරගන්න එපා; සම්ප්‍රදාය කරගන්නත් එපා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු කථානායකතුමනි, එතුමා කියපු කාරණයට අපේ පැත්තෙන් තිබෙන උත්තරය මේකයි. මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. - එතුමා අද කළු පාට ඇඳගෙන ඇවිත් ඉන්නවා. මොකටද දන්නේ නැහැ. - අපි එතුමාට දෙසැරයක් භූමිතෙල් සහනාධාරය ලබා දුන්නා. තුන්වැනි සැරේ දුන්නේ නැති නිසා එතුමා තරහෙන් කථා කරනවාද මම දන්නේ නැහැ. කෙසේ වෙතත්, දැන් මාදැල් කර්මාන්තය කඩා වැටිලා නැහැ. මාදැල් කර්මාන්තකරුවන් දැන් නැවත වැඩ පටන් අරගෙන තිබෙනවා. ඒගොල්ලන් මාදැල් අදිනවා. වින්ච් එකයි, ට්‍රැක්ටරයයි විතරයි නතර කරලා තිබෙන්නේ මන්ත්‍රීතුමනි. වින්ච් හා ට්‍රැක්ටර් පාවිච්චි කිරීමේදී ඔබතුමා අත්සන් කරලා දුන්නා නේ, මේක කරගෙන යන්න කියලා. හැබැයි, ඔයගොල්ලන් හොඳ පර්යේෂණයක් කළේ නැහැ. හොඳ පරිසර වාර්තාවක් ගෙන්වා ගත්තේ නැහැ. NARA එකට කියලා වාර්තාවක් ගෙන්වා ගත්තේ නැහැ. ඒ මොකුත් නැතිව ඔබතුමා අත්සන් කරලා දුන්නා. එසේ ලබා දීමේදී ඔයගොල්ලන් දන්නවා, කිලෝමීටර එකහමාරයි දමන්න පුළුවන් කියලා. නමුත් දැන් කිලෝමීටර 6ක්, 8ක්, 10ක් දාලා අදිනවා කියන එකත් දන්නවා. අපට කුඩා බෝට්ටු 5,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒගොල්ලන්ගේ ජීවිතයට බරපතළ හානියක් සිද්ධ වෙලා තිබෙනවා. පරිසරයටත් බරපතළ හානියක් සිද්ධ වෙලා තිබෙනවා. අන්න ඒවා ඔක්කොම සැලකිල්ලට ලක් කරලා මීට මාස හයකට කලින් අපි ඒගොල්ලන් එක්ක සාකච්ඡාවක් කළා. ඉස්සරහට මේක නතර කරනවා, ඒ නිසා ඔයගොල්ලන් වෙන විකල්පයක් සොයා ගන්න කියලා අපි කියා සිටියා. ඒකත් එක්කම අපි දැන් ඒගොල්ලන් එක්ක සාකච්ඡාවක් කරනවා. අපේ ජනාධිපතිතුමාත් මේකට සම්බන්ධ වුණා. ඉදිරියේදී අපි සාකච්ඡා කරලා, වින්ච් එක විතරක් පාවිච්චි කරන්න පුළුවන්ද, නැත්නම් වෙනත් විකල්ප ක්‍රමයක් තිබෙනවාද කියලා බලලා, එසේ තිබෙනවා නම් ඒ විකල්ප ක්‍රමය ලබා දෙනවා. නැත්නම් පාරම්පරික කර්මාන්තය එසේම පවත්වාගෙන යාම සඳහා එයට අදාළ වැඩ පිළිවෙළ අපි සකස් කරනවා.

## ශ්‍රී ලංකා පොලීසිය: පුරප්පාඩු
### இலங்கைப் பொலிஸ்: வெற்றிடங்கள்
### SRI LANKA POLICE: VACANCIES

1174/2025

5\. **ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකා පොලීසියේ මේ වනවිට සේවය කරනු ලබන මුළු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකා පොලීසියේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් නිලය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම පුරප්පාඩු පුරවනු ලබන දිනය එක් එක් නිලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2024 වර්ෂයේ සිට 2025 මැයි මාසය දක්වා අත්අඩංගුවට ගන්නා ලද සංවිධානාත්මක අපරාධකරුවන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකා පොලීසියේ සිදුවන අක්‍රමිකතා හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම අක්‍රමිකතා මැඩපැවැත්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள பொலிஸ் நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) இன்றளவில் இலங்கைப் பொலிஸ் திணைக் களத்தில் கடமையாற்றும் உத்தியோகத்தர்களின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

(iii) இன்றளவில் இலங்கைப் பொலிஸ் திணைக் களத்தில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை ஒவ்வொரு பதவி வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

[ගරු සුනිල් රත්නසිරි මහතා]

(iv) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(v) ஆமெனில், ஒவ்வொரு பதவி வாரியாக மேற்படி வெற்றிடங்களை நிரப்பும் திகதி வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2024ஆம் ஆண்டு தொடக்கம் 2025ஆம் ஆண்டு மே மாதம் வரை கைதுசெய்யப்பட்டுள்ள ஒழுங்கமைக்கப்பட்ட வகையில் செயற்படும் குற்றவாளிகளின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) இன்றளவில் இலங்கைப் பொலிஸ் திணைக்களத்தில் நிகழும் முறைகேடுகள் இனங்காணப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், அம்முறைகேடுகளைக் கட்டுப்படுத்துவதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the number of police stations in Sri Lanka;

(ii) the total number of officers currently serving in the Sri Lanka Police;

(iii) the number of vacancies currently existing in each rank in the Sri Lanka Police, separately;

(iv) whether steps will be taken to fill those vacancies; and

(v) if so, the date on which those vacancies will be filled, separately for each rank?

(b) Will he also inform this House -

(i) the number of organized criminals arrested in each year during the period from the year 2024 to May, 2025, separately;

(ii) whether the irregularities occurring in the Sri Lanka Police at the moment have been identified; and

(iii) if so, the steps that have been taken to curb those irregularities?

(c) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පොලිස් ස්ථාන - 608

(ii)

| 2026.02.15 දිනට සේවය කරනු ලබන නිලධරයන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|
| සාමාන්‍ය සේවය | විශේෂ කාර්ය බලකාය | සහයක සේවය | සහයක සේවය සඳහා උපසේවා පදනමින් බඳවා ගත් | මුළු නිලධරයන් සංඛ්‍යාව |
| 71,424 | 7,256 | 1,032 | 70 | 79,782 |

(iii) ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

ඇමුණුම 01

| 2026.02.15 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව | | | |
|---|---|---|---|
| අනු අංකය | නිලය | මුළු පුරප්පාඩු සංඛ්‍යාව | |
| | | සාමාන්‍ය සේවය | විශේෂ කාර්ය බලකාය |
| 1. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | - | - |
| 2. | කාන්තා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 01 | - |
| 3. | නියෝජ්‍ය පොලිස්පති | 01 | 01 |
| 4. | කාන්තා නියෝජ්‍ය පොලිස්පති | - | - |
| 5. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 33 | 02 |
| 6. | පොලිස් අධිකාරී | 104 | |
| 7. | සහකාර පොලිස් අධිකාරී | 78 | 29 |
| 8. | කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 07 | - |
| 9. | කාන්තා පොලිස් අධිකාරී | 04 | - |
| 10. | කාන්තා සහකාර පොලිස් අධිකාරී | 02 | - |
| 11. | ප්‍රධාන පොලිස් පරීක්ෂක | 204 | 11 |
| 12. | පොලිස් පරීක්ෂක | 1029 | 90 |
| 13. | උප පොලිස් පරීක්ෂක | 1806 | 234 |
| 14. | කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක | 09 | 02 |
| 15. | කාන්තා පොලිස් පරීක්ෂක | 93 | 02 |
| 16. | කාන්තා උප පොලිස් පරීක්ෂක | 211 | 07 |
| 17. | උප පොලිස් පරීක්ෂක/ප්‍රවාහන | 111 | 04 |
| 18. | මහ සැරයන් | 98 | 37 |
| 19. | මහ සැරයන් රියදුරු | 39 | 07 |
| 20. | පොලිස් සැරයන් | 3697 | 259 |
| 21. | පොලිස් කොස්තාපල් | 22027 | 2812 |
| 22. | කාන්තා පොලිස් සැරයන් | 389 | - |
| 23. | කාන්තා පොලිස් කොස්තාපල් | 4342 | 97 |
| 24. | පොලිස් සැරයන්/රියදුරු | 161 | 05 |
| 25. | පොලිස් කොස්තාපල්/රියදුරු | 652 | 216 |
| එකතුව | | 35098 | 3815 |

| 2026.02.15 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව - සහයක සේවා | | | | | | |
|---|---|---|---|---|---|---|
| නි.පො.ප. | ජ්‍යෙ.පො.අ. පො.අ. ස.පො.අ. | ප්‍ර.පො.ප. පො.ප. උ.පො.ප. | කා.ප්‍ර.පො.ප. කා.පො.ප. කා.උ.පො.ප. | පො.සැ. පො.කො. | කා.පො.සැ. කා.පො.කො. | එකතුව |
| 01 | 150 | 292 | 25 | 1139 | 75 | 1682 |

(iv) ඔව්.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කාර්ය පටිපාටික රීති, ප්‍රතිපාදන හා ජාතික පොලිස් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ සහ අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි මත නිශ්චිත කාල සීමා තුළදී උසස්වීම් ලබාදීමට කටයුතු කරනු ලබයි.

ඒ අනුව ඉහත ප්‍රශ්න අංක (iii)හි සඳහන් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත ක්‍රමවේද අනුගමනය කර ඇත.

උසස්වීම් මඟින් පුරප්පාඩු පිරවීම

- ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත තනතුරුවලට (සහකාර පොලිස් අධිකාරි සිට ඉහළ තනතුරු) අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුව සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින හෝ තනතුරේ පුරප්පාඩු ඇති වූ දින යන දෙකෙන් දෙවනුව එළඹෙන දින සිට උසස්වීම් ලබා දී එම තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබයි.

- නියාමන සේවා ගණයේ තනතුරු සඳහා (ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඉන් පහළ තනතුරුවල) ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2020.01.06 දිනැති NPC/ED/NG/PR/07/Time Pro/2019 - (ii) දරන ලිපිය මඟින් ලබා දී ඇති අනුමැතිය පරිදි සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පවතින පුරප්පාඩු සඳහා ඊළඟ වර්ෂයේ ජූනි 31 දිනට පෙර අයදුම්පත් කැඳවා උසස්වීම් ලබාදීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට ඇති වන පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටීන් අනුව ඒ ඒ නිලයට ඊළඟ වර්ෂයේ ජනවාරි 01 වන දිනට උසස්වීම් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

නව බඳවා ගැනීම් මඟින් පුරප්පාඩු පිරවීම

| නිලය | 2025 වර්ෂයේ බඳවා ගත් සංඛ්‍යාව | | | 2026 වර්ෂයේදී බඳවා ගැනීමට නියමිත අනුමැතිය ලත් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා පොලිසිය | විශේෂ කාර්ය බළකාය | එකතුව | ශ්‍රී ලංකා පොලිසිය | විශේෂ කාර්ය බළකාය | එකතුව |
| උප පොලිස් පරීක්ෂක | - | - | - | 300 | 25 | 325 |
| කාන්තා උප පොලිස් පරීක්ෂක | - | - | - | 50 | - | 50 |
| පොලිස් කොස්තාපල් | 470 | 225 | 695 | 6,530 | 775 | 7,305 |
| කාන්තා පොලිස් කොස්තාපල් | - | - | - | 1,000 | 50 | 1,050 |
| පොලිස් කොස්තාපල් රියැදුරු | 130 | - | 130 | 345 | 100 | 445 |
| එකතුව | | | 825 | 8,225 | 950 | 9,175 |
| මුළු එකතුව 10,000 | | | | | | |

සටහන

මේ වන විට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇති සංඛ්‍යාව

| | | |
|---|---|---|
| 01. | උ.පො.ප | 200 |
| 02. | පො.කො | 1,175 |
| 03. | වෛද්‍යවරුන් | 25 |
| | එකතුව | 1,400 |

(ආ) (i)

| 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වෙඩි තැබීම් සම්බන්ධයෙන් | | තියුණු ආයුධවලින් පහරදීම්/ වෙනත් සිදුවීම් සඳහා සෘජුව සම්බන්ධ වූ | අනුබල දීම් | මත්ද්‍රව්‍ය ජාවාරම | ගිනි අවි ළඟ තබා ගැනීම | වෙනත්* | එකතුව |
| | වෙඩික්කරු | පැදිකරු | | | | | | |
| සැකකරුවන් සංඛ්‍යාව | 22 | 14 | 50 | 142 | 57 | 22 | 08 | 315 |
| 2025.01.01 දින සිට 2025.05.31 දින දක්වා | | | | | | | | |
| සැකකරුවන් සංඛ්‍යාව | 34 | 30 | 30 | 174 | 80 | 43 | 17 | 408 |
| 2024.01.01 දින සිට 2025.05.31 දින දක්වා | | | | | | | | |
| සැකකරුවන් සංඛ්‍යාව | 56 | 44 | 80 | 316 | 137 | 65 | 25 | 723 |

* වෙනත් - මෙම අපරාධ සඳහා සහ අපරාධකරුවන්හට විවිධ ආකාරයෙන් සහය දීම හා ආධාර අනුබල දීම් කරන ලද පුද්ගලයින්

(ii) ඔව්.

(iii) පොලිස් නිලධාරින් අක්‍රමිකතාවන්ට පෙළඹීමට හැකියාව පවතින අවස්ථා සහ තත්ත්වයන් පිළිබඳව අධ්‍යයනයක් කර ඒවා මොනවාද යන්න හඳුනා ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙවැනි ක්‍රියාවන් සඳහා නිලධරයන් පෙළඹීම වැළැක්වීම මෙන්ම, මෙවැනි ක්‍රියාවල නිරත වන නිලධරයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව කටයුතු කිරීම සඳහා පහත පරිදි ක්‍රමවේද සකස් කර ඇත.

අක්‍රමිකතා වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග

- නිලධාරින්ගේ වැටුප් හා දීමනා ප්‍රශස්ත මට්ටමකින් වැඩි කිරීමට කටයුතු කිරීම හා සුබසාධන පහසුකම් ඉහළ නැංවීම.

- වගකීමෙන් හා අවංකභාවයෙන් යුතුව අපරාධ හා දූෂණ මර්දන කටයුතුවලට දායක වන හා විමර්ශන සිදු කරන නිලධරයන් හඳුනාගෙන ඔවුන්හට උසස්වීම්, වැටුප් වර්ධක, මුදල් ත්‍යාග හා පොලිස්පති ප්‍රශංසා ලබා දීමට දීප ව්‍යාප්ත වැඩ පිළිවෙළක් සකස් කිරීම.

- දූෂණ අක්‍රමිකතාවල නිරතවීමේ ආදීනව හා හානිකර ප්‍රතිඵල පිළිබඳව නිරතුරුවම නිලධරයන් දැනුවත් කිරීම සඳහා පොලිස්

[ගරු ආනන්ද විජේපාල මහතා]

ස්ථාන මට්ටමින්, පොලිස් කොට්ඨාස මට්ටමින් හා පළාත් මට්ටමින් ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කිරීම.

- පොලිස් නිලධරයන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම තුළින් අක්‍රමිකතාවන්ට පෙළඹීමට ඇති අවස්ථා අවම කිරීම සඳහා වෘත්තිමයභාවයෙන් යුතු පොලිස් නිලධරයන් බිහි කිරීම සඳහා පොලිස් විද්‍යාල, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය හා සේවාස්ථ පුහුණු ඒකක මඟින් වැඩසටහන් හා පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු කිරීම.
- පොලිස් නිලධාරින්හට පවතින ගැටලු සෘජුවම පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා සෑම සතියකම බ්‍රහස්පතින්දා දින පොලිස්පති පොලිස් නිලධාරි සහන දිනය පොලිස් මූලස්ථානයේ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

**<u>අක්‍රමිකතාවලට පෙලඹෙන නිලධරයන් සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් ප්‍රවේශ සලසා දී ඇත.</u>**

- පොලිස් නිලධාරින්ට විරුද්ධව පොලිස්පති වෙත සෘජුව පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා වට්ස්ඇප් අංකයක් හඳුන්වා දීම.
- පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන් හා කොට්ඨාස භාර නිලධරයන් වෙත සෘජුවම පැමිණිලි ඉදිරිපත් කිරීම සහ ඔවුන්ගේ ජංගම දුරකථන අංක ප්‍රසිද්ධියට පත් කිරීම.
- මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ස්ථාපිත කර ඇති ජාතික සේවා මැදිරිය වෙත 118 දුරකථන අංකය මඟින් සෘජුවම අමාත්‍යාංශය වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම.
- ශ්‍රී ලංකා පොලීසියේ www.police.lk වෙබ් අඩවියෙහි ඊ-සේවාව වෙත පිවිස මහජනයාහට පොලිස්පතිවරයා වෙත සෘජුවම පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම.
- "Tell IGP" - telligp@police.gov.lk - විද්‍යුත් තැපැල මඟින් මහජනයා හට පොලිස්පතිවරයා වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම.
- පොලිස් විශේෂ කාර්යාංශයෙහි ස්ථාපිත කර ඇති 1997 දුරකථන අංකය මඟින් මහජනතාවට රහසිගතව ඕනෑම තොරතුරක් පොලිස්පතිවරයා වෙත සෘජුවම ලබා දීමට පහසුකම් සලසා ඇත.
- දූෂණ විරෝධී ජාතික ප්‍රතිපත්තිය යටතේ රාජ්‍ය ආයතනයන්හි දූෂණ අක්‍රමිකතා සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා අභ්‍යන්තර කටයුතු ඒකක ස්ථාපිත කර ඇත. ඒ අනුව මහජනතාවට පොලිස් නිලධාරින්ගේ අක්‍රමිකතා සමබන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට පොලිස් මූලස්ථානය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා පළාත් 9ම ආවරණය වන පරිදි අභ්‍යන්තර කටයුතු ඒකක 11ක් ස්ථාපිත කර ඇත. එම ඒකක වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමේදී දුරකථන, විද්‍යුත් තැපැල, වට්ස්ඇප්, පැමිණිලි පෙට්ටි වෙත හා පෞද්ගලිකව පැමිණ පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී ඇත. එමඟින් ලැබෙන පැමිණිලි අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- මහජනයාහට පොලිස් නිලධාරින්ට එරෙහිව ඔවුන්ට පවතින පැමිණිලි සෘජුවම පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් කිරීමට "පොලිස්පති මහජන සහන දිනය" සතියේ සෑම සිකුරාදා දිනම පොලිස් මූලස්ථානයේ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

**<u>අක්‍රමිකතාවල නිරත නිලධරයන් හඳුනා ගැනීම හා ඔවුන්ට එරෙහි විමර්ශන කඩිනම් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග.</u>**

- පොලිස් විශේෂ කාර්යාංශය සහ ඊට අනුබද්ධිතව ප්‍රාදේශීයව ස්ථාපිත කර ඇති බුද්ධි ඒකක මඟින් සේවයේ යෙදී සිටින සියලුම පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් නිරතුරුවම බුද්ධි වාර්තා කැඳවීමට කටයුතු කරන අතර, එම බුද්ධි වාර්තා අනුව අක්‍රමිකතා කරන නිලධාරින් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා පොලීසියෙහි පොලිස් නිලධරයන්ට විරුද්ධව ලැබෙන පැමිණිලි විමර්ශනය සඳහා පොලිස්පතිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය සහ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ පළාත් විශේෂ විමර්ශන ඒකක 9ක් ස්ථාපිත කර ඇති අතර, එමඟින් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකාවේ පවතින නීතිය යටතට ගැනෙන අපරාධමය ක්‍රියාවක් සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ අවස්ථාවකදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු පළාත් හා ප්‍රාදේශීය මට්ටමෙන් ස්ථාපිත කර ඇති අපරාධ විමර්ශන ඒකක මඟින් විමර්ශන කිරීම සඳහා කටයුතු කිරීම.
- පොලිස් නිලධරයන් විසින් කරනු ලබන විනය කඩ කිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා පොලිස් විනය හා කල්ක්‍රියා කොට්ඨාසය ස්ථාපිත කර ඇති අතර, එමඟින් කඩිනමින් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.
- දූෂණ අක්‍රමිකතාවන්හි යෙදෙන නිලධාරින් සම්බන්ධයෙන් පොලිස් නියෝග, ආයතන සංග්‍රහය, පොලිස්පති චක්‍රලේඛ, ජාතික පොලිස් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ, කාර්ය පටිපාටික රීති ප්‍රතිපාදන අනුව කටයුතු කර එම නිලධාරින් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන විනයානුකූලව කටයුතු කිරීම, වැඩ තහනම් කිරීම හා සේවයෙන් පහකිරීමට කටයුතු කිරීම.
- කිසියම් නිලධාරියෙකු ශ්‍රී ලංකාවේ පවතින අපරාධ නීතිය යටතේ ගැනෙන අපරාධමය වරදක් කර ඇති සෑම අවස්ථාවකදීම ඔවුන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

- ඉහත පරිදි කටයුතු කර 2024.01.01 දින සිට 2025.09.30 දින දක්වා පොලිස් නිලධාරින් 624දෙනෙකු වැඩ තහනමට ලක් කර ඇති අතර, පොලිස් නිලධාරින් 79දෙනෙකු සේවයෙන් පහකිරීමට කටයුතු කර ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, මීට වසරකුත් මාස හතරකට පමණ පෙරාතුව පැවති අපේ රටේ පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳව රටේ ජනතාවගේ විශ්වාසය විශාල වශයෙන් බිඳ වැටිලා තිබුණා. විශේෂයෙන්ම දූෂණ, වංචා හා අක්‍රමිකතා බහුල දෙපාර්තමේන්තුවක් බවට පොලිස් දෙපාර්තමේන්තුව පත් වෙලා තිබුණා. නමුත්, ඊට වසරකුත් මාස හතරකට පසුව අද අපේ පොලිස් දෙපාර්තමේන්තුව සමත් වෙලා තිබෙනවා, අපේ රටේ සෑම පුරවැසියෙකුගේම ප්‍රසාදය දිනාගන්නට. ඒ, ඔවුන්ගේ කාර්යභාරය සුවිශේෂී නිසායි.

ගරු කථානායකතුමනි, මේ මොහොත වනකොට අපේ පොලිස් නිලධාරින් වාර්ෂික ස්ථාන මාරුවීම් ලබා වෙනත් පොලිස් ස්ථානවලට වාර්තා කිරීම් සිදු වනවා. ඔවුන්ගෙන් විශාල මැසිවිල්ලක් තිබෙනවා, විශේෂයෙන්ම නගරවලට කේන්ද්‍ර වනකොට ප්‍රමාණවත් නේවාසික පහසුකම් ලබා දෙන්නට සමත් වෙලා නැහැ කියලා. එම නිසා මගේ පළමු අතුරු ප්‍රශ්නය විධියට ගරු අමාත්‍යතුමාගෙන් අහනවා, වාර්ෂික ස්ථාන මාරුවීම් ලබා විවිධ සේවා ස්ථානවලට පැමිණෙන නිලධාරින්ට ප්‍රමාණවත් නේවාසික පහසුකම් ලබා දීමට වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, සේවා ස්ථාන මාරුවීම් සිදු වන සෑම අවස්ථාවකදීම අදාළ පොලිස් බල ප්‍රදේශය තුළ ඔවුන්ට නේවාසික පහසුකම් සැලසෙනවා. විශේෂයෙන්ම කොළඹ අවට යම් නේවාසික ගැටලුවක් පවතින බවට අවස්ථා කිහිපයකදී අප හඳුනා ගත්තා. ඒ අනුව මෑතකදී පොලිස් දෙපාර්තමේන්තුව හැටියට අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබූ පත්‍රිකාවක් හරහා නිවාස 352කින් සමන්විත නිවාස සංකීර්ණයක් නාගරික සංවර්ධන අධිකාරියෙන් රුපියල් මිලියන 4,100ක් වැය කරලා මිලදී ගැනීමට කටයුතු කළා. එම කටයුත්ත කළේත් නාගරික ප්‍රදේශවල ඉන්න පොලිස් නිලධාරින්ගේ නේවාසික ගැටලු විසඳීම සඳහායි.

එවැනි ක්‍රියාමාර්ග දිගින් දිගටම ගන්නත්, පොලිස් ස්ථාන සතුව තිබෙන පොලිස් බැරැක්ක ප්‍රමාණය වැඩි කරන්නත්, ඒවායේ පහසුකම් වැඩිදියුණු කරන්නත් මේ වනකොට කටයුතු කරමින් සිටිනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, පසුගිය දවස්වල සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් පොලිසියට අනුයුක්ත කිරීමට කටයුතු කරන බවට දැනුම් දීමක් සිදු කළා. මේ මොහොත වනකොටත් පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවල වනඅලි තර්ජනයෙන් ජනතාව ගලවා ගැනීම සඳහා විශාල මෙහෙවරක් කරමින් සිටිනවා, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින්. ඔවුන්ගේ ඉල්ලීමක් තිබෙනවා, පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ගන්නවා නම් ඔවුන් දැනට පදිංචිව සිටින දිස්ත්‍රික්කවල පවත්නා පොලිසිවල ඇති පුරප්පාඩු සඳහා බඳවා ගන්නා ලෙස. ඒ සම්බන්ධයෙන් ඔබතුමා කටයුතු කරනවාද කියන එක තමයි මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය වන්නේ.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, පොලිස් දෙපාර්තමේන්තුවේ පවත්නා පිරිස් බලයේ අඩුකම හේතුවෙන් අපි තීන්දුවක් ගත්තා, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 10,000ක පිරිසක් පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන්න. ඒ කටයුතු මේ වන විට සිදු කරමින් පවතිනවා. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඒක රාශි වී සිටින්නේ ප්‍රධාන වශයෙන් අම්පාර, අනුරාධපුරය, කුරුණෑගල, මොනරාගල වාගේ දිස්ත්‍රික්කවල. බස්නාහිර පළාතට ඔවුන් අනුයුක්ත කිරීමේදී ගැටලු කිහිපයක් පැන නැඟිලා තිබෙනවා. තමන් පදිංචි දිස්ත්‍රික්කවලම සියලු පොලිස් ස්ථානවලට ඔවුන් අනුයුක්ත කිරීමේදීත් ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් අපි සෑම විටම උත්සාහ ගන්නවා, ඔවුන් පදිංචි දිස්ත්‍රික්කවල පොලිස් ස්ථානවලටම ඔවුන් අනුයුක්ත කරන්න. ඊට අමතරව, යම් නිලධාරියෙක් පිට පළාතක පොලිසියකට අනුයුක්ත කරනවා නම්, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමට අපි පියවර අරගෙන තිබෙනවා. ඒ වාගේම, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් පොලිස් සේවයට බඳවා ගන්නා සෑම නිලධාරියෙකු සඳහාම නවාතැන් සහ ආහාර දීමනාව වශයෙන් රුපියල් 25,200ක අමතර දීමනාවක් ගෙවීමටත් මේ වන විට අමාත්‍ය මණ්ඩල තීන්දුවක් අරගෙන කටයුතු කරගෙන යනවා. ඒ අනුව, ඔවුන් මුහුණ දෙන අපහසුතා මඟ හරවන්න අවශ්‍ය පියවර ගන්නවා, ගරු කථානායකතුමනි.

## දීඝවාපි-ආලංකුලම් කෘෂි මාර්ගය සහ වෙල්ලක්කල් තෝට්ටම් සපත්තු පාලම: ප්‍රතිසංස්කරණය

### தீகவாபி-ஆலங்குளம் விவசாய வீதி மற்றும் வெள்ளக்கல் தோட்ட தரைப் பாலம்: புனரமைத்தல்

### DEEGAVAPI-ALANKULAM AGRICULTURAL ROAD AND WELLAKKAL THOTTAM LOW-WATER CROSSING: RENOVATION

1302/2025

6. **ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2022 වර්ෂයේ ඇති වූ ගංවතුර හේතුවෙන් අක්කරෙයිපත්තු වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල පරිපාලන කොට්ඨාසයේ පිහිටා ඇති දීඝවාපි-ආලංකුලම් කෘෂි මාර්ගය සහ වෙල්ලක්කල් තෝට්ටම් සපත්තු පාලම හානි වීම සම්බන්ධයෙන් අදාළ ප්‍රදේශවල ගොවීන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දී ඇති බවත්;

(ii) වාරිමාර්ග අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අංක DI/AM/WG/AP/002/2022 හා 2022.11.28 දිනැති ලිපිය මඟින් ඉහත මාර්ගය සහ සපත්තු පාලම ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ තක්සේරු වාර්තාව ලබා දෙන ලෙස අම්පාර දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂකවරයා වෙත දන්වා ඇති බවත්;

(iii) 2023 වර්ෂයට අදාළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සංවර්ධන සැලසුමට එම මාර්ගය සහ සපත්තු පාලම ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් කිරීමට නිර්දේශ කර ඇති බවත්;

එතුමා දන්නේද?

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

(ආ) (i) දීඝවාපි-ආලංකුලම් කෘෂි මාර්ගය සහ වෙල්ලක්කල් තෝට්ටම් සපත්තු පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ තක්සේරු වාර්තාව මේ වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ලැබී තිබේද;

(ii) එම තක්සේරු වාර්තාව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබුණු දිනය කවරේද;

(iii) මාර්ගය සහ සපත්තු පාලම ප්‍රතිසංස්කරණය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2022ஆம் ஆண்டில் ஏற்பட்ட வெள்ளம் காரணமாக அக்கரைப்பற்று நீர்ப்பாசனப் பொறியியலாளர் காரியாலய நிருவாகப் பிரிவில் அமைந்துள்ள தீகவாபி-ஆலங்குளம் விவசாய வீதியும், வெள்ளக்கல் தோட்ட தரைப் பாலமும் சேதமடைந்துள்ளமை தொடர்பாக அப்பிரதேச விவசாயிகள் நீர்ப்பாசனப் பணிப்பாளர் நாயகத்துக்கு அறிவித்துள்ளார்கள் என்பதையும்;

(ii) நீர்ப்பாசனப் பணிப்பாளர் நாயகத்தின் DI/AM/WG/AP/002/2022ஆம் இலக்க, 2022.11.28ஆம் திகதிய கடிதம்மூலம் மேற்படி வீதியையும், தரைப் பாலத்தையும் புனரமைப்புச் செய்வதற்கான மதிப்பீட்டு அறிக்கையைப் பெற்றுத்தருமாறு அம்பாறை மாவட்ட நீர்ப்பாசனப் பணிப்பாளருக்கு அறிவிக்கப் பட்டுள்ளது என்பதையும்;

(iii) 2023ஆம் ஆண்டுக்கான நீர்ப்பாசனத் திணைக் களத்தின் அபிவிருத்தித் திட்டத்தில் மேற்படி வீதியையும், தரைப் பாலத்தையும் புனரமைப்புச் செய்வதை உட்புகுத்துவதற்கு விதப்புரை வழங்கப்பட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) தீகவாபி - ஆலங்குளம் விவசாய வீதியையும், வெள்ளக்கல் தோட்ட தரைப் பாலத்தையும் புனரமைப்புச் செய்வதற்கான மதிப்பீட்டறிக்கை தற்போது நீர்ப்பாசனத் திணைக்களத்துக்குக் கிடைத்துள்ளதா என்பதையும்;

(ii) மேற்படி மதிப்பீட்டறிக்கை நீர்ப்பாசனத் திணைக்களப் பணிப்பாளர் நாயகத்துக்குக் கிடைத்த திகதி யாது என்பதையும்;

(iii) மேற்படி வீதியையும், தரைப் பாலத்தையும் புனரமைப்புச் செய்வதற்கு மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Is he aware that -

(i) the damage caused to the Deegavapi-Alankulam agricultural road and the Wellakkal Thottam low-water crossing located in the Akkaraipattu Divisional Irrigation Engineer's Zone due to the floods that occurred in the year 2022 was informed to the Director General of Irrigation by the farmers in the areas concerned;

(ii) the Director of Irrigation for the Ampara District had been informed by way of the letter No. DI/AM/WG/AP/002/2022 dated 28.11.2022 of the Director General of Irrigation to provide the assessment report with regard to the renovation of the above road and the low-water crossing; and

(iii) it has been recommended to include the renovation of the said road and the low-water crossing in the Development Plan of the Irrigation Department for the year 2023?

(b) Will he inform this House -

(i) whether the Irrigation Department has received the assessment report for the renovation of the Deegavapi-Alankulam agricultural road and the Wellakkal Thottam low-water crossing;

(ii) the date on which the said assessment report was received by the Director General of the Irrigation Department; and

(iii) the steps that have been taken to renovate the road and the low-water crossing?

(c) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සපත්තු පාලම සහ මාර්ගය හානිවීම සම්බන්ධව වෙල්ලක්කල් තෝට්ටම් ගොවි සංවිධානය විසින් දැනුම් දී තාවකාලිකව පිළියම් යොදන ලෙස ඉල්ලීම් කර ඇත.

(ii) ප්‍රධාන කාර්යාලයේ වාරිමාර්ග අධ්‍යක්ෂ (වත්කම් කළමනාකරණ) විසින් ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස අම්පාර වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත DI/AM/WG/AP/002/2022 හා 2022.11.28 දිනැති ලිපියෙන් දන්වා ඇත.

(iii) ඉහත (ii)හි ලිපියෙන් 2023 වාර්ෂික වැඩසටහනට ඇතුළත් කරන ලෙස ද දන්වා ඇත.

(ආ) (i) ඇස්තමේන්තුව ලැබී නොමැත.

(ii) 2023 ප්‍රමුඛතා ලේඛන සඳහා ඇතුළත් කළමුත්, ප්‍රතිපාදන නොලැබීම නිසා සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ ඌනතාව හේතුවෙන් සහ යල මහ දෙකන්නය සඳහා ජලය සැපයීමට අවශ්‍ය නිර්මිත අලුත්වැඩියාව සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇති බැවින්, ඇස්තමේන්තු සකස් කර නොමැත.

(iii) මාර්ගය සහ සපත්තු පාලම ප්‍රතිසංස්කරණය කිරීම 2026 ප්‍රමුඛතා ලේඛනයෙහි ඇතුළත් කර ඇති අතර, ඉදිරියේදී ප්‍රතිපාදන වෙන් කිරීමට අපේක්ෂා කරයි.

(ඇ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக கேள்வியைக் கேட்கின்றேன்.

அம்பாறை மாவட்டத்திலுள்ள தீகவாபி-ஆலங்குளம் விவசாய வீதியின் புனரமைப்புக்கு 2026ஆம் ஆண்டுக்கான நிதி ஒதுக்கீட்டில் நிதி ஒதுக்குவதாகத் தெரிவித்தமைக்கு கௌரவ பிரதி அமைச்சர் அவர்களுக்கு நன்றி தெரிவிக்கின்றேன். இம்முறை மகாபோக நெல் அறுவடை செய்யும் காலத்தில் அம்பாறை மாவட்ட விவசாயிகளால் ஈர நெல்லை உரிய விலைக்கு விற்பனை செய்ய முடியாத நிலை ஏற்பட்டது. அதுமாத்திரமன்றி, ஏழை விவசாயிகளின் நெல்லை தனியார் குறைந்த விலையில் கொள்வனவு செய்ததால் அவ்விவசாயிகளுக்குப் பாரிய நட்டமும் ஏற்பட்டது. எனவே, அம்பாறை மாவட்டத்தில் அமைந்துள்ள நெல் சந்தைப்படுத்தல் சபையின் நெற்களஞ்சியசாலைகளில் நெல்லை உலர்த்தும் இயந்திரங்களைப் பொருத்துவதற்கான ஏற்பாடுகளைச் செய்ய முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා එම අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කළේ වී මිලදී ගැනීමට අදාළවයි. පසුගිය දිනවල නැඟෙනහිර පළාතට ඇද හැලුණු අධික වර්ෂාපතනයත් එක්ක ගොවීන් දුෂ්කරතාවකට මුහුණ දුන්නා. ඒ ගැටලුව පිළිබඳව ආණ්ඩුව හැටියට අපට අවබෝධයක් තිබෙනවා. ඒ වාගේම, මේ වනවිට අම්පාර ඇතුළු වී අස්වැන්න නෙළන දිස්ත්‍රික්කවල වී අලෙවි මණ්ඩලයේ ගබඩා විවෘත කර, වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා. ඒ නිසා මුල් දින කිහිපයේ ඇති වුණු ඒ ගැටලුව දැන් යම් ප්‍රමාණයකට නිරාකරණය වෙමින් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියන කාරණයට අනුව ගත්තාම, මුල් දින කිහිපයේ පැවති අධික වර්ෂාවත් එක්ක වැස්සට වී තෙමුණා. ඒකත් එක්ක ඇති වුණු ගැටලු ටිකක් තිබුණා. අපි ඒ වෙනුවෙන් විශාල මැදිහත්වීමක් කරලා, අම්පාරේ ගබඩා ටික විවෘත කර දැන් ඒවා වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ சபாநாயகர் அவர்களே, முதலாவது மேலதிக கேள்விக்கு வழங்கப்பட்ட பதில் எனக்குத் திருப்தியளிக்க வில்லை. ஏனெனில், அம்பாறை மாவட்டத்திலுள்ள நெல் சந்தைப்படுத்தல் சபையின் நெற்களஞ்சியசாலைகளுக்கு நெல் உலர்த்தும் இயந்திரங்களை எதிர்காலத்தில் வழங்க முடியுமா? என்றுதான் நான் கேட்டிருந்தேன்.

என்னுடைய இரண்டாவது மேலதிக கேள்வியைக் கேட்கின்றேன்.

அம்பாறை மாவட்டத்தில் சம்புக்களப்பு - பெரியகளப்பு வடிச்சல் திட்டம் நிறைவு செய்யப்படாததால் அட்டாளைச் சேனை, அக்கரைப்பற்று, ஆலையடிவேம்பு, திருக்கோவில் பிரதேசங்களில் சுமார் 8,500 ஏக்கர் நெற்காணிகள் நீரில் மூழ்கிக் கிடக்கின்றன. இதேபோன்று, கரைவாகுபற்று வடிச்சல் திட்டம் நிறைவு செய்யப்படாததால் சம்மாந்துறை, காரைதீவு, சாய்ந்தமருது, கல்முனை, நற்பிட்டிமுனை பிரதேசங்களில் 3,000 ஏக்கர் நெற்காணிகள் நீண்ட காலமாக நீரில் மூழ்கிக் கிடக்கின்றன. இது சம்பந்தமாக நடைபெற்ற கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டங்களில், கௌரவ அமைச்சர் லால் காந்த அவர்களுடைய தலைமையில் பாராளுமன்ற கட்டிடத் தொகுதியில் அம்பாறை மாவட்ட பாராளுமன்ற உறுப்பினர் களையும் அம்பாறை மாவட்டத்திலுள்ள நீர்ப்பாசனம் சார் உயர் அதிகாரிகளையும் இணைத்து விசேட கூட்டமொன்றை நடத்துவதாகத் தீர்மானிக்கப்பட்டது. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, மேற்படி அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் நீங்களும் கலந்துகொண்டீர்கள்; ஏனைய பிரதி அமைச்சர்களும் கலந்துகொண்டார்கள். இவ்விடயம் தொடர்பில் நடைபெற்ற இரண்டு அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டங்களிலும் எடுக்கப்பட்ட மேற்படி தீர்மானம் நீண்ட காலமாகியும் நடைமுறைப்படுத்தப்படவில்லை. அதாவது, அந்த விசேட கூட்டம் இன்னும் நடைபெறவில்லை. எனவே, அதனை நடாத்துவதற்கான ஏற்பாடுகளை மேற்கொள்ள முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳ සාකච්ඡා කර අපි දිනයක් වෙන් කරගෙන ඔබතුමාට දැනුම් දෙන්නම්. අම්පාර දිස්ත්‍රික්කයේ සියලු මන්ත්‍රීවරුන්ට ඒ අවස්ථාව උදා කර දෙන්න අපි සූදානම්.

## හෙද සේවය: විස්තර
### தாதியர் சேவை: விபரம்
### NURSING SERVICE: DETAILS

1328/2025

**7. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ හෙද සේවය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) මේ වනවිට සේවය කරනු ලබන හෙද නිලධාරිනියන් සහ හෙද නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) හෙද සේවයේ මූලික කාර්යයන් කවරේද;

(iv) හෙද සේවයට බැඳීම සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(v) හෙද/හෙදියන්ට තම වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීම සඳහා පහසුකම් සලසා දී තිබේද;

(vi) හෙද/හෙදියන්ට උසස් අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු සුජීව දිසානායක මහතා]

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தாதியர் சேவை ஆரம்பிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(ii) தற்போது பணியாற்றும் தாதியர்களின் எண்ணிக்கை ஆண் மற்றும் பெண் என்ற அடிப் படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(iii) தாதியர் சேவையின் அடிப்படைப் பணிகள் யாவை என்பதையும்;

(iv) தாதியர் சேவையில் இணைந்துகொள்வதற்குத் தேவைப்படும் தகைமைகள் யாவை என்பதையும்;

(v) தாதியர் தமது தொழில் ரீதியான தகைமை களைப் பூர்த்திசெய்து கொள்வதற்குரிய வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்பட்டுள்ளனவா என்ப தையும்;

(vi) தாதியர்கள் உயர் கல்வியைப் பெற்றுக் கொள்வதற்குத் தேவையான வசதிகள் ஏற்படுத் திக் கொடுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the year in which the nursing service was established in Sri Lanka;

(ii) separately, the number of male and female nurses currently serving;

(iii) the primary functions of the nursing service;

(iv) the qualifications required to join the nursing service;

(v) whether nurses have been facilitated to complete their professional qualifications; and

(vi) whether nurses have been facilitated to pursue higher education?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ හෙද සේවය ආරම්භ කළේ 1939දී. එම වර්ෂයේදී සැලසුම් සහගත හෙද අධ්‍යාපනයක් ලබා දීමේ අරමුණින් කොළඹ හෙද විදුහලේ සිසු හෙද පුහුණුව ආරම්භ කර ඇති අතර, එය විධිමත් පරිදි ශ්‍රී ලංකාවේ හෙද සේවයේ ආරම්භය ලෙස සලකනවා.

(ii) 2025.09.30 දිනට,

මධ්‍යම රාජ්‍ය සේවයේ නියුතු සංඛ්‍යාව - 29,749

පළාත් රාජ්‍ය සේවයේ නියුතු සංඛ්‍යාව - 13,804

ඒ අනුව, 2025.09.30 වනවිට හෙද නිලධාරින් සහ නිලධාරිනියන් 43,553ක් සේවය කරනවා.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගැනීමේදී බඳවා ගන්නා සංඛ්‍යාවෙන් සියයට 5ක් පිරිමි අයදුම්කරුවන්ගෙන් ද, සියයට 95ක් ගැහැනු අයදුම්කරුවන්ගෙන්ද සමන්විත වන ලෙස දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය සහිත අයදුම්කරුවන් අතරින් පුහුණුවට බඳවා ගත යුතු සංඛ්‍යාව තෝරා ගනු ලබනවා.

(iii) රෝග නිවාරණය, සෞඛ්‍ය අභිවර්ධනය, වේදනාවන්ගෙන් මුදා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ කාර්යය කිරීම පිණිස මූලික මිනිස් අවශ්‍යතා හඳුනා ගනිමින්, විද්‍යාත්මක මූලධර්ම මත පදනම්ව, රෝගී සත්කාර (රෝහල් හා සායන) සේවා, ප්‍රජා/මානසික හෙද සේවා, හෙද අධ්‍යාපන සේවා හා විශේෂිත/පර්යේෂණ හෙද සේවා යන ක්ෂේත්‍රයන්හි මනා ක්‍රියාකාරිත්වය සඳහා ඉවහල් වන්නා වූ සුවිශේෂිතව පවරා දෙනු ලබන කාර්යයන් ද උපකාරක හෝ පහසුකාරක කාර්යයන්ගෙන් ද සමන්විත වන්නා වූ කාර්යයන් හෙද සේවය විසින් ඉටු කරනු ලබනවා.

(iv) **01. <u>අපොස (උසස් පෙළ) ප්‍රතිඵල මත වසර 3ක සිසු හෙද පුහුණුවට බඳවා ගෙන, සාර්ථකව එම පුහුණුව නිම කරන සිසුන් සඳහා ශ්‍රී ලංකා හෙද සේවයේ III ශ්‍රේණියේ පත්වීම් ලබා දීම</u>**

**1. <u>හෙද විදුහල් සඳහා බඳවා ගැනීමට අදාළ සුදුසුකම් (වාර්ෂිකව පුහුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාවෙන් සියයට 75ක සංඛ්‍යාවක්)</u>**

(අ.) <u>අධ්‍යාපන සුදුසුකම්</u>

- අපොස (උසස් පෙළ) විභාගයේදී ජෛව විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03ක් හදාරා සියලුම විෂයයන්ගෙන් එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

හෝ

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී භෞතිය විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 3ක් හදාරා, සියලුම විෂයයන්ගෙන් එකවර සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

සහ

- සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 4ට සම්මාන සාමර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

ගරු කථානායකතුමනි, (iv)වැනි ප්‍රශ්නයට අදාළ පිළිතුරෙහි ඉතිරි කොටස මම **සභාගත*** කරනවා.

(v) ඔව්.

මේ සඳහා පිහිටුවා ඇති ආයතනය පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාලය වන අතර, එම ආයතනය මඟින් පහත සඳහන් ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා පැවැත්වේ.

- ඉගැන්වීම හා අධීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව
- සෞඛ්‍ය අධීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව
- ශල්‍යාගාර පුහුණුව
- දැඩි සත්කාර පුහුණුව
- ප්‍රජා සෞඛ්‍ය හෙද පුහුණුව
- ප්‍රජා සෞඛ්‍ය මානසික හෙද පුහුණුව
- මානසික සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමාව
- හදිසි ප්‍රතිකාර පුහුණුව
- Palliative care

(vi) ඔව්. පහත සඳහන් පරිදි පහසුකම් සලසා දී ඇත.

- විවෘත විශ්වවිද්‍යාලයේ හෙදකම පිළිබඳ විද්‍යාවේදී උපාධිය හා විද්‍යාපති උපාධිය
- පෞද්ගලික විශ්වවිද්‍යාලවල හෙදකම පිළිබඳ විද්‍යාවේදී උපාධිය හා විද්‍යාපති උපාධිය
- අධ්‍යයන කටයුතු සඳහා වසරකට දින 20ක අධ්‍යයන නිවාඩු ලබා දීම.
- ජාතික විශ්වවිද්‍යාලවලින් පාර්ශ්වීය ඇතුළත් කර ගැනීම් (Lateral entries) සඳහා අවස්ථාව සලසා දීම.

(ආ) පැන නොනඟී.

**** සභාමේසය මත තබන ලද (අ) (iv) පිළිතුරේ ඉතිරි කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட (அ) (iv)க்கான விடையின் எஞ்சிய பகுதி:*
** Rest of the Answer to Question (a)(iv) tabled:*

(ආ.) වෙනත් සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- අයදුම් පත් භාර ගන්නා අවසන් දිනය වනවිට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 28ට නොවැඩි විය යුතුය.
- උස සෙන්ටිමීටර් 147.3ට නොඅඩු විය යුතුය.
- අවිවාහක විය යුතුය.

(ඇ.) **<u>ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අතරින් පහත සඳහන් ක්‍රමවේදය අනුව හෙද පුහුණුවට බඳවා ගනු ලැබේ.</u>**

* **<u>එක් වර්ෂයක අපොස (උසස් පෙළ) ප්‍රතිඵල මත බඳවා ගැනීම</u>**

- දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
- ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයේ ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හා භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ අයදුම් කර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
- එලෙස එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් සියයට 5ක් පිරිමි අයදුම්කරුවන්ගෙන්ද, සියයට 95ක් ගැහැනු අයදුම්කරුවන්ගෙන්ද සමන්විත වන ලෙස දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය සහිත අයදුම්කරුවන් අතරින් පුහුණුවට බඳවා ගත යුතු සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

* **<u>වර්ෂ දෙකක් හෝ ඊට වැඩි වර්ෂ ගණනක අපොස (උසස් පෙළ) ප්‍රතිඵල මත බඳවා ගැනීම</u>**

- මෙහිදී දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
- ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම් කර සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
- ඉන්පසු එම එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම වර්ෂයේ ජෛවීය විද්‍යාව විෂය ධාරාව හා භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ අයදුම් කර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂවලට අදාළව එක් එක් විෂය ධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
- එලෙස එක් එක් වර්ෂයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් සියයට 5ක් පිරිමි අයදුම්කරුවන්ගෙන්ද, සියයට 95ක් ගැහැනු අයදුම්කරුවන්ගෙන්ද සමන්විත වන ලෙස එක් එක් වර්ෂයන්හි එක් එක් විෂය ධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් පුහුණුවට බඳවා ගනු ලැබේ.

02. විද්‍යාවේදී (හෙද) උපාධිය මත මාස 6ක හෙද අනුස්ථාපන හා සමායෝජන පුහුණුවට බඳවා ගෙන සාර්ථකව එම පුහුණුව නිම කරන සිසුන් සඳහා ශ්‍රී ලංකා හෙද සේවයේ III ශ්‍රේණියේ පත්වීම් ලබා දීම

(1) මාස 6ක හෙද අනුස්ථාපන හා සමායෝජන පුහුණුවට බඳවා ගැනීමට අදාළ අධ්‍යාපන සුදුසුකම් (වාර්ෂිකව පුහුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාවෙන් සියයට 25ක සංඛ්‍යාවක්)

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් විද්‍යාවේදී (හෙද) උපාධිය සම්පූර්ණ කර තිබිය යුතුය.

**(ආ) <u>වෙනත් සුදුසුකම්</u>**

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- අයදුම් පත් භාර ගන්නා අවසන් දිනය වනවිට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.
- අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය අයදුම් පත් කැඳවන දිනයට පෙර දිනයක් විය යුතුය.
- සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය වනවිට හෙද සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

(ඇ) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අතුරින් ඔවුන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කර ගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරා ගත් පිරිසක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසු වූ, නුසුදුසු වූ

**** පිළිතුර අවසානයේ පළ කර ඇත.***
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

හා තෝරා නොගන්නා අයදුම්කරුවන්ගේ නාම ලේඛනය පළ කර සුදුසුකම් ලත් අයදුම්කරුවන් මාස 6ක හෙද අනුස්ථාපන හා සමායෝජන පුහුණුවට බඳවා ගනු ලැබේ.

03. ඉහත 01 හා 02 පරිදි සාර්ථකව පුහුණුව අවසන් කරන අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකා හෙද සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

1963 වර්ෂයේදී, සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය පිළිබඳ අන්තර්ජාතික බැංකුව, -ලෝක බැංකුව- ශ්‍රී ලංකාවට යෝජනා කරනවා, අපේ හෙද සේවය විශේෂයෙන්ම උපාධි මට්ටම දක්වා වර්ධනය කරන්න කියලා. නමුත්, තවමත් අපේ රටේ තිබෙන්නේ මේක ඩිප්ලෝමා තත්ත්වයේ පාඨමාලාවක් හැටියටයි. 2025.03.16වැනි දා ගරු අධ්‍යාපන අමාත්‍යතුමියත් එක්ක මේ ගැන සාකච්ඡාවක් පැවැත්වුවා. මේ වෙනුවෙන් උපදේශන කමිටුවක් පවා පැවැත්වුවා. මේ සම්බන්ධයෙන් දැනට වසරකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එම නිසා මම ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් අහන්නේ විශේෂයෙන්ම ලංකාවේ හෙද සේවය උපාධි මට්ටම දක්වා පත් කරන්නට දැනට තිබෙන බාධා මොනවාද කියලායි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, හෙද සේවයට උපාධිධාරීන් ඇතුළත් කර ගැනීම අපි සිදු කරමින් සිටිනවා. ඊට අමතරව, හෙද විද්‍යාලවල සිටින ඩිප්ලෝමාධාරීන් උපාධි තත්ත්වයට උසස් කිරීම සඳහා වන වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. විශේෂයෙන්ම 2024 සැප්තැම්බර් සහ නොවැම්බර් අතර ගරු අග්‍රාමාත්‍යතුමිය සෞඛ්‍ය විෂය භාරව හිටපු කාලයේදීත් මේ සාකච්ඡා ආරම්භ වුණා. එතැනින් පසුව අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත්, සෞඛ්‍ය අමාත්‍යාංශයත් ඒකාබද්ධව අපි කමිටුවක් නම් කරලා තිබෙනවා. ඒ අය මේ හෙද උපාධිය ලබා දීම සඳහා වන කටයුතු කරමින් පවතිනවා. මේක ටිකක් සංකීර්ණ තත්ත්වයක්. අලුත් විශ්වවිද්‍යාලයක්, අලුත් පීඨයක් ආරම්භ කරලා උපාධියක් ලබා දෙනවා වාගේ නොවෙයි, එය පවතින හෙද විද්‍යාල ඒ තත්ත්වයට පත් කිරීම සඳහා වන ක්‍රියාවලියක්. එතකොට, ඒකට අවශ්‍ය කරන ආචාර්ය මණ්ඩලය, හෙද විද්‍යාලවල තිබෙන පහසුකම් වැඩිදියුණු කිරීම, ඒ උපාධිධාරීන් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම වාගේ සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රශ්නවලට ස්ථිරසාර පිළිතුරු ලබා දීමෙන් පමණයි අපි ඒ පියවරට ළඟා විය යුතු වන්නේ. ඒ අනුව එම කටයුතු සිදු වන බව මට කියන්න පුළුවන්. මට මේ වෙලාවේදී දින වකවානු කියන්න බැහැ. මේ හෙද විද්‍යාල සම්පූර්ණයෙන්ම උපාධිය ලබා දෙන ආයතන බවට පත් වෙන්නේ කවදාද කියලා මට මේ වෙලාවේදී කියන්න බැහැ. නමුත්, අපි හැකි ඉක්මනින් ඒ කටයුතු සිදු කරනවා.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, ඔබතුමාත් වෛද්‍යවරයෙක්. අපේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාත්, අපි සියලු දෙනාමත් විශේෂයෙන්ම දන්නවා, හෙද සේවය තුළින්, හෙද හෙදියන්ගෙන් අපේ මනුෂ්‍ය ජීවිතයට සිද්ධ වන සේවාව කුමක්ද කියන එක. විශේෂයෙන්ම ජනතාවට වග කියන රජයක් හැටියට පසුගිය වසරකුත් මාස 4කට ආසන්න කාලයක් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් වාගේම රටට නීරෝගී සම්පන්න ජාතියක් නිර්මාණය කිරීම වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට මේ වෙනකොට අරගෙන තිබෙන පියවර කවරේද කියන එක තමයි මම දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට අහනෙත්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මගේ පිළිතුරේදී මම සඳහන් කළා, දැනට අපට හෙද නිලධාරින් සහ හෙද නිලධාරිනියන් සිටින්නේ 43,553ක් පමණයි කියලා. අපේ සේවාව සැපයීමේදී මේ පිරිස ප්‍රමාණවත් නැහැ. ඒ නිසා දැනට අපේ රජයේ රෝහල්වල සේවයේ නියුතු හෙද හෙදියන් ඉතා විශාල සේවාවක් සිදු කරමින් පවතිනවා.

ඇත්තටම ඔවුන් රෝහල් ඇතුළේ විශාල කාලයක් රාජකාරි කරමින් ඉන්නවා. ඒ නිසා අපිට මේකට තිබෙන විසඳුම තමයි, ඉක්මනින් මේ බඳවා ගැනීම් කරන එක. නමුත් අපිට ඕනෑ ඕනෑ කාලයට බඳවා ගන්න බැහැ. පුහුණුව අවසන් වෙලායි බඳවා ගන්න සිදු වන්නේ. ඒ අනුව පසුගිය වසරේ මැයි මාසයේ හෙද පත්වීම් 3,147ක් අපි ලබා දුන්නා. නොවැම්බර් මාසයේදී හෙද පත්වීම් 294ක් ලබා දුන්නා. ඒ අනුව පසුගිය වසරේ පමණක් අලුතෙන් හෙද සේවයට 3,441දෙනෙක් හෙද විද්‍යාල්වලින් ඇතුළත් වුණා. ඊට අමතරව උපාධිධාරීන් 875දෙනෙක් බඳවා ගැනීම සඳහා අපි අග්‍රාමාත්‍ය ලේකම් කමිටුවෙන් අනුමැතිය ලබා ගත්තා; අයදුම්පත් කැඳෙව්වා. ඒ 875දෙනාගෙන් 517දෙනෙක් පමණයි උපාධිධාරීන් හැටියට හෙද සේවයට ආවේ. ඒ අනුව ඔවුන්ගේ පුහුණුවීම් ආරම්භ කරලා දැන් මාස 6 අවසන් වෙමිනුයි යන්නේ. මේ මාසයේදී ඒ පුහුණුව අවසන් වෙනවා. අපිට පුළුවන්කම ලැබේවි, ලබන මාසය වෙනකොට ඒ අයට ස්ථිර පත්වීම් ලබා දෙන්න. ඒ අනුව ඒ 3,441දෙනාට අමතරව තවත් 517දෙනෙක් හෙද සේවයට ඇතුළත් වෙනවා.

ඊළඟට, දැනට හෙද විද්‍යාල්වල 2,900ක කණ්ඩායමක් පුහුණුව අවසන් කරමින් ඉන්නවා. ඔවුන්ගේ අවසන් විභාගය ලබන ජූලි මාසයේ 15වැනි දා පැවැත්වෙනවා. ඒ 2,900දෙනා ලබන ඔක්තෝබර් මුලදී අපේ හෙද සේවයට ඇතුළත් කරගන්න පුළුවන්. ඒ අනුව ගරු කථානායකතුමනි, අපිට පුළුවන්කම ලැබෙනවා, මේ ගත වෙච්ච මාස 15ක කාලය තුළ සහ ඉදිරි මාස කිහිපයත් ගත්තාට පස්සේ 6,800දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් හෙද සේවයට අලුතෙන් බඳවා ගන්නට.

ඊළඟට අපිට තිබෙන්නේ සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම. එතැනදී 2020, 2021 සහ 2022 වසරවල ඒ කණ්ඩායම් බඳවා ගැනීමට අපි කටයුතු කරනවා. ඒ අනුව 2,915දෙනෙක් බඳවා ගන්නවා සිසු හෙද පුහුණුවට. දැනට හෙද විද්‍යාල මට්ටමින් මේ අය තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කර අවසානයි. මාර්තු මාසයේ 19 සහ 20 කියන දෙදින මේ අය ලියාපදිංචි කරගෙන අප්‍රේල් මාසයේදී අලුතෙන් ඒ 2,915දෙනාගේ සිසු හෙද පුහුණුව සඳහා වැඩකටයුතු ආරම්භ වෙනවා. ඊට අමතරව 2021, 2022, 2023, 2024ට අදාළ කණ්ඩායම් බඳවා ගැනීමට අපි කටයුතු කරනවා. මැයි මාසයේ අපි ගැසට් එක නිකුත් කරනවා. මම හිතනවා, මේක අහගෙන ඉන්න උසස් පෙළ කරපු දරුවන්ට මේක හොඳ පණිවුඩයක් වේවි. 2021, 2022, 2023, 2024 කියන අවුරුදුවල ඒ කණ්ඩායම්වලට ලබන මැයි මාසයේ ගැසට් නිකුත් කරනවා. අපට පුළුවන්, උපරිම වශයෙන් ලබන නොවැම්බර් මාසය වෙනකොට ඒ බඳවා ගැනීම් කරන්න.

ඊට අමතරව ගරු කථානායකතුමනි, කාලයක් නතර කරලා තිබුණු; 2022දී අයදුම් කරලා තිබුණු Nursing Sister training අපි ආරම්භ කළා. 517දෙනෙක් මේ වෙනකොට training වෙනවා. මාස 4කින් ඒ අයගේ training අවසානයි. අවුරුදු එකහමාරක් දක්වා training එක පැවැත්වෙනවා. මහජන සෞඛ්‍ය හෙද නිලධාරින් - PHNOsලා - 217දෙනෙක් පුහුණුවෙමින් ඉන්නවා. PHNOsලා 82දෙනෙක් පුහුණුව අවසන් කරලා තිබෙනවා. අලුත් කණ්ඩායම් බඳවා ගැනීමට කටයුතු කරනවා, තව මාසයක් ඇතුළතදී. ඊළඟට Matron උසස්වීම් සඳහා කටයුතු කරගෙන යනවා. මධ්‍යම රජයේ තිබෙන පුරප්පාඩු 69 පිරවීම සම්බන්ධයෙන් අපි රාජ්‍ය සේවා කොමිෂන් සභාවට දැනුම් දී තිබෙනවා. පළාත් සභාවල පුරප්පාඩුත් පුරවමින් පවතිනවා. මේ අනුව ගත්තොත්, නතර කරලා තිබුණු බඳවා ගැනීම් ආරම්භ කළ බව, හෙද සිසු පුහුණුවට ප්‍රමාදයකින් තොරව බඳවා ගැනීම් කරගෙන යන බව සහ අපේ ක්ෂේත්‍රයේ හෙද සේවයේ තිබුණු උසස්වීම්, පුහුණුව දැන් විධිමත්ව කරගෙන යන බව කියන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -1370/2025- (1), ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය -*[සභා ගර්භය තුළ නැත.]*

## ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු: විසඳීමේ ක්‍රියාමාර්ග
### பிராந்திய ஊடகவியலாளர்களின் தொழில் பிரச்சினைகள்: தீர்ப்பதற்கான நடவடிக்கை
### CAREER ISSUES OF REGIONAL JOURNALISTS: STEPS FOR RESOLUTION

1572/2025

**9. ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ක්‍රියාකාරී ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සහ වාර්තාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රාදේශීය මාධ්‍යවේදීන්හට තම වෘත්තීය කටයුතුවලදී, ප්‍රමාණවත් නොවන ගෙවීම්, නිසි කලට ගෙවීම් නොලැබීම, රැකියා සුරක්ෂිතතාව, ජීවිත ආරක්ෂාව, පුහුණුවීම් සහ සුබසාධන යෝජනා ක්‍රම නොමැති වීම වැනි ප්‍රධාන ගැටලු වලට මුහුණ දීමට සිදුවන බව දන්නේද;

(iii) එම ගැටලු විසඳීම සඳහා රජය විසින් ගෙන ඇති හෝ ගැනීමට නියමිත පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා අඩු පොලී ණය යෝජනා ක්‍රමයක්, නිසි පුහුණු වැඩසටහන් සහ ක්‍රියාකාරී රක්ෂණ යෝජනා ක්‍රමයක් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා අපේක්ෂිත කාල රාමු කවරේද;

(vi) ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය නිපුණතාව සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் செயற்படு நிலையிலுள்ள பிராந்திய ஊடகவியலாளர்கள் மற்றும் நிருபர் களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) பிராந்திய ஊடகவியலாளர்கள் தமது தொழில் நடவடிக்கைகளின்போது, போதியளவு கொடுப் பனவுகள் கிடைக்காமை, அவை உரிய காலத்தில் கிடைக்காமை, தொழிற் பாதுகாப்பு, உயிர்ப் பாதுகாப்பு, பயிற்சிகள் மற்றும் நலன்புரித் திட்டங்கள் இல்லாமை போன்ற பிரதான பிரச்சினைகளை எதிர்கொள்ள நேரிடுவதை அவர் அறிவாரா என்பதையும்;

(iii) மேற்படி பிரச்சினைகளைத் தீர்க்க அரசாங்கம் எடுத்துள்ள அல்லது எடுக்கவுள்ள நடவடிக்கைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) பிராந்திய ஊடகவியலாளர்களுக்காகக் குறைந்த வட்டியிலான கடன் திட்டம், முறையான பயிற்சி வேலைத்திட்டங்கள் மற்றும் செயற்படு நிலையிலான காப்புறுதித் திட்டம் ஆகிய வற்றைத் துரிதமாகச் செயற்படுத்த நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(v) ஆமெனில், அவற்றைச் செயற்படுத்துவதற்கான உத்தேசக் காலச் சட்டகம் யாது என்பதையும்;

(vi) பிராந்திய ஊடகவியலாளர்களின் தொழில்சார் தேர்ச்சி மற்றும் பாதுகாப்பை உறுதிப்படுத்து வதற்காக மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the total number of active regional journalists and reporters in Sri Lanka;

(ii) whether he is aware that regional journalists face substantial professional challenges, such as insufficient payments, delayed payments, lack of job security, safety risks and unavailability of training programmes and welfare schemes;

(iii) the steps that have been taken or to be taken by the Government to resolve the problems concerned, separately;

(iv) whether steps will be taken to expeditiously implement a low-interest loan scheme, proper training programmes and an active insurance scheme for regional journalists;

(v) if so, the expected time frames for the same; and

(vi) the measures that have been taken to ensure professional competence and safety of regional journalists?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2025.12.31 දින වන විට වලංගු මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කර ඇති ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සංඛ්‍යාව 876කි.

(ii) ප්‍රාදේශීය මාධ්‍යවේදීන්හට මාධ්‍ය ආවරණ සඳහා කරනු ලබන ගෙවීම්, ඇතැම් මාධ්‍ය ආයතන වෙතින් ප්‍රමාද වන බව ඒ මාධ්‍යවේදීන් වාර්තා කර තිබෙනවා.

(iii) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වෙත ගෙවිය යුතු හිඟ ගෙවීම් කඩිනමින් සිදුකරන ලෙසට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් සියලු මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත ලිඛිතව දැනුවත් කිරීම් සිදුකර ඇත.

(iv) ජනමාධ්‍යවේදීන්ගේ කුසලතා සංවර්ධනයට අවශ්‍ය සහාය ලබා දීම වෙනුවෙන් උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම හා තාක්ෂණික ප්‍රවේශයන් සඳහා සහයක් ලබා දීම වෙනුවෙන් 2026 වර්ෂයේ අය වැයෙන් රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, 2025 අවුරුද්දේදී රුපියල් මිලියන 7යි වෙන් කරලා තිබුණේ. ඒ අරමුදල් පාවිච්චි කරලා මාධ්‍යවේදීන් 61දෙනෙකුට ශිෂ්‍යත්ව ලබා දුන්නා. මේ අවුරුද්දේදී ශිෂ්‍යත්ව සඳහා රුපියල් මිලියන 54කුත්, තාක්ෂණික ප්‍රවේශය සඳහා රුපියල් මිලියන 50කුත් වශයෙන් තමයි අපට මුදල් වෙන් වෙලා තිබෙන්නේ. ඒ අනුව මේ තාක්ෂණික ප්‍රවේශය සඳහා වන රුපියල් මිලියන 50 මේ මාධ්‍යවේදීන්ගේ ධාරිතා, කුසලතා සංවර්ධනය වෙනුවෙන් යොදවන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මේ අවුරුද්දේදී මේ රුපියල් මිලියන 50කට ආසන්න ප්‍රමාණය පාවිච්චි කරලා වැඩි ශිෂ්‍යත්ව ප්‍රමාණයක් ලබා දෙන්න අපි කටයුතු කරනවා.

(v) මේ කියපු දේවල් අපි මේ වසරේදී අවසන් කිරීමට තමයි අපේක්ෂා කරන්නේ.

(vi) යහපත් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම අරමුණු කර ගනිමින් වැරදි තොරතුරු හෝ වෛරී ප්‍රකාශයන්ගෙන් තොර මාධ්‍ය වාර්තා කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතනවල මාධ්‍යවේදීන් ඉලක්ක කර ගනිමින් පළාත් මට්ටමින් පවත්වනවා.

තවද, මාධ්‍යවේදීන්ගේ වෘත්තීය නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය නමින් ආයතනයක් පිහිටුවීමටත්, එය නියාමනය කිරීමට ශ්‍රී ලංකා මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතන පනතක් කෙටුම්පත් කෙරෙමින් පවතී. ගරු කථානායකතුමනි, මෙය ආරම්භ වෙලා වසර කිහිපයක් වෙනවා. දැන් එහි කටයුතු අවසන් අදියරේ පවතින්නේ.

මීට අමතරව, මාධ්‍යවේදීන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා 2025 වසර තුළ දිස්ත්‍රික් වශයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් පවත්වා ඇත. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පසුගිය අවුරුද්දේදී වැඩමුළු 17ක් පැවැත්වූවා. මේ වසරේ තවත් වැඩමුළු 12ක් පැවැත්වීමට සැලසුම් කරලා තිබෙනවා.

ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ රැකියා පහසුව තහවුරු කිරීම සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කරලා තිබෙනවා. එහෙම ලබා නොගත් අයට යළිත් අයදුම්කර එය ලබා ගන්නට පුළුවන්.

(ආ) පැන නොනඟී.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් බොහෝ පිරිසක් වැඩ කරන්නේ පෞද්ගලික මාධ්‍ය ආයතනවල. ඔබතුමා සඳහන් කළ පරිදිම ඔවුන් නිතරම කියන මැසිවිල්ලක් සහ චෝදනාවක් තමයි, ඔවුන්ට ලැබෙන්නේ අඩු වැටුපක්, ඒ ලැබෙන වැටුප පවා නිසි කලට වේලාවට ලැබෙන්නේ නැහැ කියන එක. ඒ නිසාම සමහර අවස්ථාවලදී ඔවුන් වෙනත් ගනු දෙනුවලට යෑමට ඉඩකඩ තිබෙනවා. ප්‍රවෘත්ති සැපයීමේදී එවැනි අවස්ථාවලට පත් වෙන්න තිබෙන ඉඩකඩ බොහෝ වැඩියි. එම නිසා අපි රජය විධියට ඒ සඳහා නීති රෙගුලාසි හැදීම, ඔවුන්ට නිශ්චිත වැටුපක් ලබා දීමට අවම වැටුපක් නම් කිරීම, වැටුප ලබා දීම සඳහා නිශ්චිත දිනයක් නම් කිරීම වැනි වැඩ පිළිවෙළකට යෑමේ හැකියාවක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඔබතුමාත්, පාර්ලිමේන්තුව නියෝජනය කරන හැම දෙනාමත් දන්නවා, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මාධ්‍ය කටයුතුවලදී; ජනතාවට තොරතුරු ලබා දීමට සැලැස්වීමේදී විශාල කාර්යභාරයක් කරන බව. ඔවුන්ට ගෙවන වැටුප හෝ දීමනා මත නොවෙයි ඔවුන්ගේ සේවය සිදු වන්නේ. ඒ අය ඉන්ධන වියදම නොතකා ඈත දුර පළාත්වලට ගිහින් අව්ව, වැස්ස, කුණාටු නොතකා වාර්තාකරණය කරනවා. මම පිළිගන්නවා, ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට ගෙවන ගෙවීම් ප්‍රමාණවත් නැහැ සහ ඒ ගෙවීමත් නිසියාකාරව සිදු වෙන්නේ නැහැ කියන එක.

අනෙක, ඛේදනීය තත්ත්වය තමයි, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් තමයි ජනතාවගේ හෝ ආයතනවල වැඩ කරන අයගේ අයිතිවාසිකම් ගැන වාර්තා කරන්නේ. ඔවුන් අනෙක් අයගේ වෘත්තීය අයිතිවාසිකම් ගැන කියනවා. නමුත්, ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් කප්පාදු වෙලා තිබෙන්නේ. එම නිසා මම එක වෙලාවකදී කම්කරු ඇමතිතුමා එක්කත් මේ ගැන සාකච්ඡා කළා. ප්‍රාදේශීය මාධ්‍යවේදීන් හැටියට ඔවුන්ටත් වෘත්තීය අයිතිවාසිකම් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරලා තිබෙනවා. මේ ප්‍රශ්නය කාලයක් තිස්සේ නොවිසඳුණු ප්‍රශ්නයක්. මම මාධ්‍ය ආයතනවලින් කරුණාවෙන් ඉල්ලන්නේ, තමන් යටතේ වැඩ කරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට ඔබ එකඟ වූ ආකාරයට නිසි පරිදි, නියම වෙලාවට ගෙවීම් සිදු කරන්න කියලායි. එතකොට මේ ප්‍රශ්නය සැලකිය යුතු මට්ටමකට විසඳා ගන්න පුළුවන්කමක් තිබෙනවා. මොකද, ඒ ආයතන ක්‍රියාත්මක වෙන්නේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ මැදිහත්වීම මත කියන එක ඒ අය දන්නවා ඇති කියලා මම හිතනවා.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

විශේෂයෙන් බිම් මට්ටමේ තමන්ගේ රාජකාරිය ඉටු කරන මාධ්‍යවේදීන් සත්‍ය ප්‍රවෘත්ති සැපයීම නිසාම දැඩි අනාරක්ෂිතභාවයකට පත් වුණු අවස්ථා අපි දැකලා තිබෙනවා. ඔවුන්ට ප්‍රහාර එල්ල කිරීම, මරණය පවා සිදු වුණු අවස්ථා අපි දැකලා තිබෙනවා. විශේෂයෙන් දේශපාලනය පැත්තෙන්, පාතාලය පැත්තෙන් පවා එවැනි තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඔවුන්ට තිබෙන එකම ආරක්ෂණය හැඳුනුම්පත පෙන්වන එක විතරක් බවට පත්වෙලා තිබෙනවා. සමහර වෙලාවට හැඳුනුම්පත පෙන්වද්දීත් ඔවුන්ව ප්‍රතික්ෂේප කරන, ඔවුන් එළවා දමන, ඔවුන්ට පහර දීමට උත්සාහ කරන සහ පහර දීපු අවස්ථාත් අපි දැක්කා. ඒ නිසා ඒ අයගේ ආරක්ෂාව සම්බන්ධව මාධ්‍යවේදී හැඳුනුම්පතෙන් එහා ගිය වැඩ පිළිවෙළක් ආණ්ඩුව පැත්තෙන් සැකසීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම එවැනි අදහසක් ඔබතුමා ළඟ - අමාත්‍යාංශය පැත්තෙන් - තිබෙනවාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ඇතුළු මාධ්‍යවේදීන් සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පත නිකුත් කිරීමට කටයුතු කර තිබෙනවා. එක කාලයකදී මේ මාධ්‍යවේදී හැඳුනුම්පත් නිකුත් කිරීමම අවභාවිත වෙලා තිබුණා. ඇත්තටම වැඩ කරන මාධ්‍යවේදීන් වෙනුවට සමහර ආයතනවල වැඩ කරන වෙනත් වෙනත් අය මාධ්‍ය හැඳුනුම්පත අරගෙන තිබුණා. අපි ඒක සීමා කරලා ඇත්තටම වැඩ කරන මාධ්‍යවේදීන්ට එම හැඳුනුම්පත ලබා දීමට කටයුතු කරනවා. ඒකට වටිනාකමක්, ගරුත්වයක් තිබෙනවා. ඒ වාගේම මාධ්‍යවේදියෙකුට තමන්ගේ රාජකාරි කිරීමේදී කොතැනක හෝ ප්‍රශ්නයක් සිදු වෙනවා නම් ඒ අයට සාධාරණත්වයක් නීතියෙන් අපේක්ෂා කරන්න පුළුවන්. පොලීසිය ඒ වෙනුවෙන් මැදිහත්වීම් කරනවා. ඔවුන්ට පොලීසියට පැමිණිලි කරන්න පුළුවන්. ඒ තැන්වල මොනවා හෝ ප්‍රමාදයක් තිබෙනවා නම් අපි ජනමාධ්‍ය අමාත්‍යාංශය හැටියට ඒ ගැන පොලීසිය භාර අමාත්‍යාංශයත් එක්ක, පොලීසියත් එක්ක සාකච්ඡා කරන්න සූදානම්. පසුගිය කාලයේදී එහෙම පැන නැඟුණු ප්‍රශ්නවලදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එයට මැදිහත් වුණා. ඒ වාගේම ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා පැරැණි කාලයේදී මාධ්‍යවේදීන් ඝාතනය වීම සහ පැහැර ගැනීම පිළිබඳව. ඒ සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැත්තෙන් පරීක්ෂණ දියත් වෙමින් පවතිනවා. ඒවාට කඩිනමින් නඩු පවරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

## විදේශ විශ්වවිද්‍යාල උපාධිධාරීන්: රාජ්‍ය සේවයේ රැකියා ලබාදීම
## வெளிநாட்டுப் பல்கலைக்கழகங்களில் பட்டம்பெற்றவர்கள்: அரச துறையில் வேலைவாய்ப்பு
## GRADUATES OF FOREIGN UNIVERSITIES: EMPLOYMENT IN PUBLIC SECTOR

1797/2025

**10.ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2019 වර්ෂයේදී බලයට පත් රජය විසින් විදේශ විශ්වවිද්‍යාලවලින් උපාධිය ලබාගත් ශ්‍රී ලාංකිකයන්ට රජයේ පත්වීම් ලබා දීම නතර කර තිබේද;

(ii) 2025.11.26 දින ලබා දුන් අධිකරණ තීන්දුවට අනුව, මෙම විදේශ උපාධිධාරීන් සඳහා රජය විසින් ගනු ලබන පියවර කවරේද;

(iii) ඉදිරියේදී මෙම විදේශ උපාධිධාරීන් රජයේ ආයතනවලට බඳවා ගැනීම සඳහා නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කරන්නේද;

(iv) ඉදිරියේදී සියලුම උපාධිධාරීන්ට සාධාරණ ලෙස රජයේ පත්වීම් ලබා දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2019ஆம் ஆண்டு ஆட்சிக்கு வந்த அரசாங்கம், வெளிநாட்டுப் பல்கலைக்கழகங்களில் பட்டம் பெற்ற இலங்கையர்களுக்கு அரசாங்க நியமனங்கள் வழங்கப்படுவதை நிறுத்தி யிருந்ததா என்பதையும்;

(ii) 2025.11.26ஆம் திகதி வழங்கப்பட்ட நீதிமன்றத் தீர்ப்பின்படி, இவ்வெளிநாட்டுப் பட்டதாரி களுக்காக அரசாங்கம் எடுக்கவுள்ள நடவடிக் கைகள் யாவை என்பதையும்;

(iii) எதிர்காலத்தில் இவ்வெளிநாட்டுப் பட்டதாரி களை அரச நிறுவனங்களுக்கு ஆட்சேர்க்கத் திட்டவட்டமான ஒரு கொள்கை வகுக்கப்படுமா என்பதையும்;

(iv) எதிர்காலத்தில் அனைத்துப் பட்டதாரிகளுக்கும் நியாயமான வகையில் அரச நியமனங்களை வழங்குவதற்கான வழிமுறை செயற்படுத்தப் படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether the Government that came to power in the year 2019 stopped giving appointments in the public sector to Sri Lankans who have obtained degrees from foreign universities;

(ii) the steps that will be taken by the Government regarding the said graduates of foreign universities, in accordance with the Court Determination issued on 26.11.2025;

(iii) whether a specific policy will be formulated in the future for the recruitment of the said graduates to government institutions; and

[ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා]

(iv) whether a mechanism will be implemented in future to give appointments in the public sector to all graduates in a fair manner?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත. එසේ පොදු තීරණයක් ගෙන නොමැත.

(ii) අධිකරණ තීරණය අනුව අදාළ බලධාරීන් (ගරු නීතිපති, අමාත්‍ය මණ්ඩල ලේකම්) විමසා අදාළ ප්‍රතිපත්තිමය තීරණය ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

(iii) රාජ්‍ය පරිපාලන විෂයය යටතේ දැනට පවත්නා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි පිරිනමන ආයතන ලෙස පිළිගනු ලබන විශ්වවිද්‍යාල/ ආයතනවලින් උපාධියක් ලබා ඇති උපාධිධාරීන්ට තරග විභාග සමත් වීමෙන් රාජ්‍ය සේවයට පිවිසීමට බාධාවක් නොමැත. එහෙත් ඉහත අධිකරණ තීරණය අනුව දැනට පවතින ක්‍රමවේදයේ යම් වෙනස්කම් සිදු කළ යුතු නම් එය සිදු කිරීම සම්බන්ධව අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

(iv) ඉහත (iii) අනුව පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

இவ்விடயம் சம்பந்தமான நீதிமன்றத் தீர்ப்பை வாசிக்கும்போது தெரிகிறது, தனிநபர் ஒருவரின் தீர்மானம் காரணமாகத்தான் 2019ஆம் ஆண்டு குறிப்பிட்ட வெளிநாட்டுப் பட்டதாரிகளுக்கு நியமனம் வழங்கப்பட்டு, பின்னர் அது cancel பண்ணப்பட்டது என்று. அவர்கள் 2019ஆம் ஆண்டு வேலைவாய்ப்புக்கு விண்ணப்பிக்கும்போது, 40-45 வயதுக்கு உட்பட்டே இருந்தார்கள். இதனால் அவர்கள் விண்ணப்பிப்பதற்குத் தகுதி பெற்றிருந்தார்கள். அதன் பின்னர் அவர்களுக்கு எந்தவித வேலைவாய்ப்பும் வழங்கப்படவில்லை. இன்று அவர்களுடைய வயது 7-8 வருடங்களால் அதிகரித்திருக்கிறது. இப்பொழுது வேலைவாய்ப்பு வழங்கும் போது அந்த வயதெல்லை எவ்வாறு கருத்திற்கொள்ளப்படும்? அவர்களுக்குச் சலுகைகள் ஏதும் வழங்கப்படுமா? என கௌரவ அமைச்சர் அவர்களைக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, අපි අධිකරණයේ තීරණය අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ නිසා ගැටලුවක් පැන නඟින්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

பொதுச் சேவைக்கு ஆட்சேர்க்கும்போது சம வாய்ப்புகளை உருவாக்க வேண்டிய தேவை இருக்கின்றது. இலங்கையில் குறிப்பிட்ட அளவிலான மாணவர்களுக்கே அரச பல்கலைக்கழகங்களுக்குச் செல்லும் வாய்ப்புக் கிடைக்கின்றது. இதனால் ஏனையவர்கள் தனியார் பல்கலைக்கழகங்களிலும் வெளிநாட்டுப் பல்கலைக்கழகங்களிலும் கற்கின்றார்கள். வேலைவாய்ப்பு வழங்கும்போது, அவ்வாறு கற்றவர்களின் பட்டங்களை அங்கீகரிக்கக்கூடிய நடவடிக்கைகள் ஏதும் செய்யப்படுகின்றதா? அல்லது எதிர்காலத்தில் செய்யப்படுமா? என்பதை நான் இந்த இடத்தில் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධි පාඨමාලාවක් හෝ එයට සමාන වෙනත් සුදුසුකමක් ලබාගෙන ඇත්නම් ඒ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදී, පවතින ක්‍රමවේදයට අනුව ඒ අදාළ ආයතනවල පවත්නා සේවා ව්‍යවස්ථාවන් සහ වෙනත් කොන්දේසි සැපිරීමට යටත්ව රැකියා ලබා දීමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්න කටයුතු කර තිබෙනවා. ඉදිරියටත් ඒක එහෙමම ක්‍රියාත්මක වෙනවා. වෙනත් ගැටලුවක් පැන නඟින්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යාන ද්වි ශත සංවත්සර සැමරුම: සමරු ඵලක සහ පොත්
## பேராதனை, றோயல் தாவரவியல் பூங்காவின் இருநூறாவது ஆண்டு நிறைவு விழா: நினைவுப் பலகைகள் மற்றும் புத்தகங்கள்
## BICENTENNIAL CELEBRATION OF ROYAL BOTANIC GARDENS, PERADENIYA: COMMEMORATIVE PLAQUES AND BOOKS

1370/2025

**8. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney at Law)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පේරාදෙණිය, රාජකීය උද්භිද උද්‍යානයේ ද්වි ශත සංවත්සරය පවත්වන ලද දිනය කවරේද;

(ii) එම සැමරුම සඳහා සමරු ඵලක සහ සමරු පොත් මිල දී ගැනීමට වැය කරන ලද මුදල කොපමණද;

(iii) ඒවා මිල දී ගැනීමේදී නිසි ඇගයීමක් සිදුකර තිබේද;

(iv) ඉහත සඳහන් සමරු ඵලක සහ සමරු පොත් මේ වන විට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පවතින බවට විගණන වාර්තාවේ දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பேராதனையிலுள்ள றோயல் தாவரவியல் பூங்காவின் இருநூறாவது ஆண்டு நிறைவு விழா நடாத்தப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) மேற்படி விழாவுக்கான நினைவுப் பலகைகள் மற்றும் நினைவுப் புத்தகங்களைக் கொள்வனவு செய்வதற்காகச் செலவிடப்பட்ட நிதித் தொகை எவ்வளவு என்பதையும்;

(iii) அவற்றைக் கொள்வனவு செய்யும்போது முறையான மதிப்பீடு மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iv) மேற்குறிப்பிட்ட நினைவுப் பலகைகள் மற்றும் நினைவுப் புத்தகங்கள் தற்போது எவ்வித பாவனையுமின்றி காணப்படுவதாக கணக்காய்வு அறிக்கையில் சுட்டிக்காட்டப்பட்டுள்ளமை தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the date on which the bicentennial celebration of the Royal Botanic Gardens, Peradeniya was held;

(ii) the total amount spent on purchasing the commemorative plaques and commemorative books for the said celebration;

(iii) whether a proper evaluation has been conducted when purchasing them; and

(iv) the actions that will be taken regarding the issues highlighted in the audit report, that the aforementioned commemorative plaques and commemorative books are currently not being used for any purpose?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය 1822 වර්ෂයේදී ආරම්භ කර ඇති නමුත් එම උද්‍යානය ආරම්භ කරන ලද නිශ්චිත දිනයක් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සතුව පවතින ලිපි ලේඛනවල සඳහන් වී නොමැත. එනමුත් රාජකීය උද්භිද උද්‍යානයට වසර 200 සම්පූර්ණ වීම නිමිති කොට ද්වි ශත සංවත්සරය 2022 වසරේ පවත්වමින් පෙබරවාරි මස සිට 2022 වසර පුරාවට වැඩසටහන් රාශියක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබුණි.

මෙම සංවත්සරයට සමගාමීව (2022 සහ 2023 වර්ෂවල) ක්‍රියාත්මක කළ වැඩසටහන් පහත දැක්වේ.

| අංකය | වැඩසටහන | දිනය |
|---|---|---|
| i | සර්ව ආගමික වැඩසටහන | 2022.02.02 |
| ii | පිරිත් දේශනාව හා දානමය පින්කම | 2022.02.25 හා 26 |
| iii | දෙශතවර්ෂ පූර්ණ සැමරුමට අදාළව වීඩියෝ පටය එළිදැක්වීම දෙශතවර්ෂ පූර්ණ සැමරුම් ග්‍රන්ථය එළිදැක්වීම විසිතුරු පත්‍ර ශාක ගෘහය විවෘත කිරීම | 2022.04.06 |
| iv | කාර්යය මණ්ඩල අභිනන්දන උළෙල පැවැත්වීම | 2022.04.30 |
| v | සුවහස් මල් ප්‍රදර්ශනය පැවැත්වීම | 2022.06.10 - 2022.06.15 |
| vi | දෙශතවර්ෂ පූර්ණ සැමරුම් මුද්දරය ප්‍රකාශයට පත් කිරීම | 2022.09.12 |
| vii | ළමා දින ක්‍රියාකාරකම් මැයෙන් පාසල් ළමුන් සඳහා චිත්‍ර තරගය | 2022.10.25 - 2022.11.04 |
| viii | "Botanical Garden Gala" මානවවංශ උද්භිද විද්‍යා සංකල්ප ප්‍රවර්ධනය, ශාක හඳුනා ගැනීමේ වැඩසටහන්, ශාක සංරක්ෂණය පිළිබඳ වැඩසටහන්, ආහාර ප්‍රදර්ශන, පැළ තවාන් ආශ්‍රිතව විවෘත දිනයන් පැවැත්වීම | 2022.10.18 සිට 24 දක්වා |
| ix | අවසන් චිත්‍ර තරගය හා ත්‍යාග ප්‍රදානෝත්සවය | 2023.01.06 |

(ii) සමරු ඵලක සඳහා - රු. 3,096,360.00 ක මුදලක්

දෙශත සංවත්සර සමරු පුස්තක සඳහා - රු. 4,115,000.00 ක මුදලක්

(iii) ඔව්.

(iv) 2023-2026 දක්වා උද්භිද උද්‍යාන තුළ පැවැත්වීමට යෙදුණු විශේෂ ප්‍රභූ වැඩසටහන්, අධ්‍යාපනික වැඩසටහන් දෙපාර්තමේන්තුව තුළ පවත්නා විශේෂ උත්සවවලදී අවස්ථානුකූලව එම සමරු ඵලක සහ පොත් තිළිණ වශයෙන් ද ලබා දීමට කටයුතු කර ඇත.

එසේම ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලුම උද්භිද උද්‍යානවල අළෙවි සැල් මඟින් ඉතිරිව පවතින සමරු පොත් හා මිල කමිටුවක් මඟින් ඉතිරිව පවතින සමරු ඵලකවල මිල සංශෝධනය කර 2024.04.01 දින සිට අළෙවි කිරීම සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව අද උදේ 9.30ට පටන් ගත්තාට පසුව ඔබතුමා මිනිත්තු 5ක් ඔබතුමාගේ නිවේදන ඉදිරිපත් කළා. ඊට පස්සේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වටයේදී විපක්ෂයෙන් අහපු ප්‍රශ්න 5කට මිනිත්තු 35ක් ගියා; ආණ්ඩු පක්ෂයෙන් අහපු ප්‍රශ්න 4කට මිනිත්තු 45ක් ගියා. මම ඔබතුමාගෙන් අහන්නේ, මෙහිදී සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ නේද කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වෙනස, අසන ලද ප්‍රශ්නය සහ ඊට ලබා දෙන පිළිතුර අනුව නේ සිදු වන්නේ, ගරු මන්ත්‍රීතුමනි. මට තීරණය කරන්න බැහැ, පිළිතුරේ ප්‍රමාණය කොච්චරද කියලා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අප අහන ප්‍රශ්නවලට මිනිත්තු 2කින් හෝ මිනිත්තු 5කින් උත්තර දීලා ආණ්ඩු පක්ෂයට ඕනෑ තරම් කාලය දෙන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි. ලබා දෙන පිළිතුර මත තමයි එය රඳා පවතින්නේ.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I am on a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන තමයි දැන් පැහැදිලි කරලා දුන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේක පාර්ලිමේන්තුවෙන් මිසක් වෙනත් තැනකින් අහන්න බැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන, Parliamentary Business Committee එකේදී කථා කරමු.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි අහන්නේ, සමස්ත ජනතාව වෙනුවෙන්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You can raise it at the Committee on Parliamentary Business.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Then, that would be raising it outside of Parliament.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා, you can raise your Question.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### අවලංගු කරන ලද ඉස්ලාමීය පුණ්‍යායතන නැවත සක්‍රිය කිරීම
### பதிவு இரத்துச் செய்யப்பட்ட இஸ்லாமியத் தொண்டு நிறுவனங்ககளை மீண்டும் செயற்படுத்துதல்
### REACTIVATION OF DEREGISTERED ISLAMIC CHARITABLE ORGANIZATIONS

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

கௌரவ அமைச்சர் அவர்களே, தங்களது அமைச்சின்கீழ் இயங்கிவரும் முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களத்தின்கீழ், நாடு முழுவதும் சுமார் 350 இஸ்லாமிய தொண்டு நிறுவனங்கள் - Islamic charitable organizations - பல தசாப்தங்களாக குறிப்பாக 40-50 ஆண்டுகளாக பதிவுசெய்யப்பட்டு சட்டபூர்வமாக இயங்கி வந்தன. இந்நிறுவனங்கள் நாட்டின் பல்வேறு மாவட்டங்களிலுள்ள பள்ளிவாசல்கள் மற்றும் சமூக அமைப்புகளுடன் இணைந்து செயற்பட்டு, சமய ஒழுங்குகளைப் பாதுகாத்தல், கலாசார விழுமியங்களை நிலைநிறுத்தல், இளைஞர் மற்றும் பெண்களின் முன்னேற்றம், கல்வி, விளையாட்டு மற்றும் சமூக சேவைகள், சமூகப் பிரச்சினைகளுக்கான சமரச மற்றும் வழிகாட்டல் நடவடிக்கைகள் எனப் பல விடயங்களில் மிகச் சிறப்பான பங்களிப்பை வழங்கி வந்தன. குறிப்பாக, முஸ்லிம் சமூகத்துக்கு ஏற்படும் பல்வேறு பிரச்சினைகளுக்குத்

தீர்வுகளைப் பெற்றுக்கொடுக்கவும் சமூக நல்லிணக்கத்தைப் பேணவும் இந்நிறுவனங்கள் முன்னின்று செயற்பட்டன என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

2019ஆம் ஆண்டு, அப்போதைய புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சினுடைய செயலாளரின் அறிவுறுத்தலுக்கு அமைய, பதிவுசெய்யப்பட்டிருந்த இந்நிறுவனங்களின் பதிவுகள் ஒரேநேரத்தில் இரத்துச் செய்யப்பட்டதை தாங்கள் அறிவீர்கள். எந்தவித தனிப்பட்ட விசாரணை அறிக்கைகளும் வெளியிடப்படாமல், நாடு முழுவதும் செயற்பட்டு வந்த சுமார் 350 இஸ்லாமியத் தொண்டு நிறுவனங்களின் பதிவுகள் மொத்தமாக இரத்துச் செய்யப்பட்டிருப்பது, குறித்த நிறுவனங்களைப் பல்வேறு நிருவாக மற்றும் சட்டச் சிக்கல்களுக்கு உள்ளாக்கியதுடன், முஸ்லிம் சமூகத்தின் மத்தியில் பல்வேறு கேள்விகளையும் சந்தேகங்களையும் கவலையையும் எழுப்பியுள்ளன. இந்தத் தீர்மானத்தின் காரணமாக பல சமூக சேவைகள் இடைநிறுத்தப்பட்டுள்ளன; கல்வி மற்றும் கலாசாரத் திட்டங்கள் பாதிப்புற்றுள்ளன; இளைஞர் மற்றும் விளையாட்டு நடவடிக்கைகள் தடைப்பட்டுள்ளன; சமூக, நல்லிணக்க நடவடிக்கைகள் குறைந்துள்ளன. இதனால் இந்த நாடும் நாட்டின் குடிமக்களும் குறிப்பாக, முஸ்லிம் சமூகம் நேரடியாகவும் மறைமுகமாகவும் பல்வேறு உதவிகளைப் பெற்றுக்கொள்வதிலும் நிலையான அபிவிருத்தியை அடைவதிலும் பெரும் சிரமங்களை எதிர்நோக்கி வருகின்றது.

ஒருசில நிறுவனங்கள் தொடர்பில் சந்தேகங்கள் அல்லது குற்றச்சாட்டுகள் இருந்தால், அவற்றைத் தனியாக விசாரித்து உரிய சட்ட நடவடிக்கைகளை எடுக்க முடியும். ஆனால், எந்தவிதமான தனிப்பட்ட காரணங்களும் இல்லாமல், எந்தவிதமான விசாரணைகளும் இல்லாமல், நாடு முழுவதிலும் செயற்பட்டு வந்த அனைத்து இஸ்லாமியத் தொண்டு நிறுவனங்களின் பதிவுகளையும் ஒரே நேரத்தில் இரத்துச் செய்திருப்பதை ஜனநாயகத்துக்கு விரோதமான ஒரு செயலாகக் கருதுவதுடன், முஸ்லிம் சமூகத்துக்கு இழைக்கப்பட்ட மிகப் பெரிய அநீதியாகவும் துரோகமாகவும் நாங்கள் பார்க்கின்றோம். ஆகவே, இந்த நிலைமையில் நாட்டின் ஒட்டுமொத்த நலனையும், குறிப்பாக முஸ்லிம் சமூகத்தின் நலனையும் முன்னேற்றத்தையும் கருத்திற்கொண்டு, முன்பு சிறப்பாக இயங்கி வந்த இந்நிறுவனங்களின் பதிவுகளை உடனடியாக மீண்டும் வழங்குவதற்கான நடவடிக்கைகளை மேற்கொள்ளுமாறும், அவர்கள் தங்களது பணிகளைச் சட்டபூர்வமாகவும் சிறப்பாகவும் நிறைவேற்றும் வகையில் வழிகாட்ட தங்களது அமைச்சுமூலம் உரிய நடவடிக்கைகளை மேற்கொள்வதற்கு ஆவன செய்யுமாறும் இவ்வுயரிய சபையில் தங்களிடம் வினயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

1. 2019ஆம் ஆண்டு, பதிவு செய்யப்பட்ட சுமார் 350 இஸ்லாமிய தொண்டு நிறுவனங்களின் பதிவுகள் இரத்துச் செய்யப்பட்டிருப்பதை நீங்கள் ஏற்றுக் கொள்கிறீர்களா?
2. அவ்வாறு இரத்துச் செய்யப்பட்ட இஸ்லாமியத் தொண்டு நிறுவனங்களின் பதிவுகளை மீண்டும் செயற்படுத்துவதற்கான உரிய நடவடிக்கைகளை மேற்கொள்வதற்கு நீங்கள் தயாராக உள்ளீர்களா?
3. நீங்கள் மிகவும் சிறப்பாகச் செயற்படுகின்ற ஓர் அமைச்சர். முஸ்லிம் சமூகத்தினராகிய நாங்கள் உங்கள்மீது நம்பிக்கை வைத்திருக்கின்றோம். எங்களுடைய பிரச்சினைகள் தீர்க்கப்படுவதற்கு எடுக்கப்படுகின்ற நடவடிக்கைகளை நாங்கள் என்றும் பாராட்டுகின்றோம். அந்த வகையில், இரத்துச் செய்யப்பட்டிருக்கின்ற இஸ்லாமியத் தொண்டு நிறுவனங்களுக்கு மீண்டும் பதிவு வழங்குவதற்காக இதுவரை மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் என்ன? என்பதை நான் அறிய விரும்புகின்றேன்.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ යොමු කර තිබෙනවා ප්‍රශ්න තුනක්. එතුමා ඒ ගැන පැහැදිලි කිරීමකුත් කළා.

1. ඔව්. මෙම දෙපාර්තමේන්තුවේ ඉස්ලාමීය පුණ්‍යායතන - 350ක් නොවෙයි, ඊට වඩා වැඩියි- 435ක් ලියාපදිංචි කර ඇත. එම කාල වකවානුව තුළ පැවති තත්ත්වය සැලකිල්ලට ගෙන පරිපාලන තීරණයක් ලෙස සියලු ඉස්ලාමීය පුණ්‍යායතන 2019.09.24 දින සිට ලියාපදිංචිය අවලංගු කර ඇත. අවලංගු කරන ලද, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අංක: MRCA/13/6/ASSO හා 2019.09.23 දිනැති ලිපියේ පිටපත ඇමුණුම 01 හා ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

   මේක ඔබතුමා දැනටමත් දන්නා දෙයක්. පුණ්‍යායතන 435ක් තමයි තිබෙන ප්‍රමාණය.

2. මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව විධියට එසේ පියවර ගැනීමට ක්‍රමයක් නැහැ. නමුත් විකල්පයක් යෝජනා කරන්න පුළුවන්.

   මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව තිබූ සංවිධානයක් සම්බන්ධව ත්‍රිකුණාමලය සිවිල් අභියාචනාධිකරණයේ ගොනු කරන ලද නඩු අංක EP/HCCA/TRN/FA/215/17 හා 2018.09.27 දිනැති තීරණයට අනුව, මුස්ලිම් සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීම හා නියාමනය කිරීම සඳහා නිශ්චිත නීති රාමුවක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට නොමැති අතර, 1956 අංක 51 දරන මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර භාර පනතේ - සුප්‍රකට වකුෆ් පනතේ - 25 වගන්තිය යටතේ වකුෆ් මණ්ඩලයේ අනුමැතිය අනුව කටයුතු කළ යුතු බව තීරණය කර තිබෙනවා.

   ඒ නිසා නැවත ලියාපදිංචි කිරීමේ බලය මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට පැවරෙන්නේ නැහැ. එය වකුෆ් මණ්ඩලයටයි පැවරෙන්නේ.

   ඒ අනුව එම පනත හා ඉන් අනතුරුව එම පනතට සිදු කර ඇති සංශෝධන අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ඉස්ලාමීය පුණ්‍යායතන ලියාපදිංචි කිරීම සිදු කළ හැකිය. එය ඇමුණුම 03 මඟින් දක්වා තිබෙනවා.

3. උක්ත 02 වැනි පිළිතුර අනුව ඉස්ලාමීය පුණ්‍යායතන මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කළ නොහැකි බැවින් 1982 අංක 33 හා 1962 අංක 21 (1) න් සංශෝධිත 1956 අංක 51 දරන මුස්ලිම් දේවස්ථාන හා පුණ්‍යාභාර (වකුෆ්) පනත අනුව සුදුසුකම් සම්පූර්ණ කළහොත් ලියාපදිංචිය කරන්න පුළුවන්. එසේ නැතහොත් ඊළඟට තිබෙන විකල්පය තමයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාල යටතේ මේවා ලියාපදිංචි කරන්න පුළුවන් කියන එක.

   මෙන්න මේ විකල්ප ටිකයි අප හමුවේ තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා අපේ දෙපාර්තමේන්තුව සතුව දැනට බලතල නැහැ.

   ඇමුණුම් 01 සිට 03 දක්වා **සභාගත*** කරමි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ அமைச்சர் அவர்களே, பதிலளித்தமைக்கு நன்றி! கிட்டத்தட்ட 350 நிறுவனங்கள் இவ்வாறு முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களத்தின்கீழ் பதிவு செய்யப்பட்டு இருந்தன. இந்தத் திணைக்களத்துக்கு வழங்கப்பட்டிருந்த அதிகாரத்தின் அடிப்படையில்தான் இந்த நிறுவனங்கள் பதிவுசெய்யப்பட்டு இருந்தன. அதாவது, முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களத்துக்கு அமைச்சினால் அல்லது சட்டத்தால் வழங்கப்பட்டிருந்த அதிகாரத்தின் அடிப்படையில்தான் இந்த நிறுவனங்கள் பதிவு செய்யப்பட்டு இருந்தன. அந்த அதிகாரத்தை இல்லாமல் செய்யவோ அல்லது பதிவு செய்யக்கூடாது என்றோ எந்தவொரு தீர்மானமும் அல்லது நீதிமன்றக் கட்டளையும் கிடையாது. எனவே, முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களத்தின் பணிப்பாளர் கொடுத்த பதிவு இரத்து சம்பந்தமான கடிதத்தை அவர் வாபஸ் வாங்குகின்றபோது, அந்த நிறுவனங்கள் automaticஆக இயங்க முடியும். அதற்கு புதியதொரு சட்டமோ, புதியதொரு நடைமுறையோ அவசியமில்லை. வக்பு சட்டத்தின்கீழ் பதிவு செய்கின்ற நடைமுறை இருக்கின்றது. முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களத்தின்கீழ் பதிவு செய்யப்பட்டது சமூக சேவை செய்கின்ற தொண்டு நிறுவனங்களாகும்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அந்தத் திணைக்களத்துக்கு ஓர் ஆலோசனையை வழங்குங்கள்! அவருக்கு வேறு யாரும் அந்த அதிகாரத்தை வழங்கியிருக்கவும் இல்லை. நான் அவரை விமர்சிக்க விரும்பவில்லை. அன்றிருந்த பணிப்பாளர் தனது சொந்த முடிவின் பேரிலே அந்த நிறுவனங்களின் பதிவுகளை இரத்துச் செய்தார். அவை 40-50 வருடங்களாக இயங்கி வருகின்ற நிறுவனங்கள். உதாரணத்துக்கு, ஸ்ரீ லங்கா கதீப், முஅத்தின் நலன்புரி அமைப்பு கிட்டத்தட்ட 30 வருடங்களாக இயங்கி வருகின்ற ஒரு நிறுவனம். அதில் கிட்டத்தட்ட 10,000 சேவையாளர்கள் இருக்கிறார்கள். இவ்வாறான நிறுவனங்களின் பதிவை இரத்துச் செய்வதன்மூலம் அவற்றின் வங்கிக் கணக்குகள், முதலீடுகள் எல்லாமே -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up within a minute, Sir.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களத்தின் பணிப்பாளருக்கு ஓர் ஆலோசனையை வழங்குங்கள்! எங்களுடைய மதிப்புக்குரிய பிரதி அமைச்சர் முனீர் முலாபர் அவர்களும் இங்கு இருக்கிறார். அவருக்கு இது பற்றி நன்றாகத் தெரியும். ஆகவே, நீங்கள் அவரோடும் கலந்துரையாடுங்கள்! குறித்த பணிப்பாளர் அந்தக் கடிதத்தை வாபஸ் பெறுகின்றபோது அந்த நிமிடத்திலேயே அத்தனை நிறுவனங்களும் இயங்கத் தொடங்கும். உங்களுக்கு ஏதாவது ஒரு நிறுவனம் தொடர்பில் பிரச்சினையிருந்தால், தயவுசெய்து அதன் பதிவை நிறுத்திவைத்து, விசாரணை செய்யுங்கள்! அதை நான் குறைசொல்லவில்லை.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය දැන් අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Okay, thank you, Sir.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ පැහැදිලි කිරීමට මා සවන් දුන්නා. මේ ලිපිය නිකුත් කර තිබෙන්නේ, එවකට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.ආර්.එම්. මලික් මහත්මයා. ඒක තනි පුද්ගලයෙකුගේ කැමැත්ත අනුව හිතුවක්කාර තීරණයක් හැටියට කළා කියලා මම හිතන්නේ නැහැ. ඒක පරීක්ෂා කරන්න ඕනෑ. මොකද, එය මුළු දෙපාර්තමේන්තුවම නියෝජනය කරන පරිපාලන තීරණයක් හැටියටයි අතිරේක ලේකම්තුමිය විසින් මට දැනුම් දීලා තිබෙන්නේ. ඒ නිසා ඒක පරීක්ෂා කරන්න ඕනෑ. ඒ වාගේම, ඒක ඉවත් කිරීමෙන් මේ ගැටලුව නිරවුල් වේ යැයි මා එකවර හිතන්නේ නැහැ. මොකද, මේ හා සම්බන්ධ නඩු තීන්දුවකිනුත් මේ කාරණය නැවතත් තහවුරු කර එසේ ලියාපදිංචි කිරීම වකුෆ් මණ්ඩලයට පවරා තිබෙන නිසා. මේ ආයතන register කරන්න අප ඉදිරියේ දැනටත් විකල්ප තිබෙනවා. වකුෆ් පනත, ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලය තිබෙනවා. ඒ නිසා ඉඩ ඇහිරිලා නැහැ. නමුත්, ඔබතුමා යෝජනා කරන විධියට අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා එක්කත් සාකච්ඡා කර මේ කාරණය නැවත සලකා බලන්න පුළුවන්ද කියාත්, ඒ සඳහා තිබෙන නීතිමය ඉඩකඩ මොකක්ද කියන එක ගැනත් මම සොයා බලන්නම්.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ඊයේ දවස නිවාඩු දිනයක් නිසා, ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවෙන් මම පසුගිය සිකුරාදා දිනයේ බාල ගල් අඟුරු සම්බන්ධයෙන් ප්‍රශ්නයක් යොමු කළා. නමුත්, එය අද දිනයේ ගරු සභාවේ අසන්නට මට අවස්ථාව ලැබුණේ නැහැ. එම ප්‍රශ්නය සංශෝධනය කරන්නය කියලා අපට ඉදිරිපත් කළා. ඒ පිළිබඳව මගේ වරප්‍රසාද ප්‍රශ්නය මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා.

## වරප්‍රසාද: ස්ථාවර නියෝග 27(2) යටතේ යොමුකල ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවසර නොදීම
## சிறப்புரிமை: நிலையியற் கட்டளை 27(2) இன்கீழ் முன்வைக்கப்பட்ட வினாவை எழுப்ப அனுமதி வழங்காமை
## PRIVILEGE: DENIAL OF PERMISSION TO RAISE A QUESTION UNDER STANDING ORDER NO. 27(2)

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ, "රීති විරෝධී යැයි කථානායකවරයා විසින් තීන්දු කරනු ලබන යම්

ප්‍රශ්නයක් හැර මහ ලේකම්වරයාට දැනුම් දීම් ලැබ ඇති සියලු ප්‍රශ්න, දැනුම් දෙන ලද දින සිට සම්පූර්ණ දින හතක් ඉකුත් වන්නට මත්තෙන් නොයෙදෙන දිනයකදී පිළිතුරු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.

එසේ වුවද, ප්‍රශ්නය අවසානයේ දී පොදු වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් අදාළ අමාත්‍යවරයාට විධිමත් ලෙස දැනුම් දීමකින් අනතුරුව පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා හෝ පිළිගත් දේශපාලන පක්ෂ නායකවරයෙකු විසින් අසනු ලැබිය හැකිය" යනුවෙන් සඳහන් වෙනවා. එම කාරණාව යටතේ, ගල් අඟුරු සැපයුම් හා ප්‍රමිතිය සම්බන්ධ ප්‍රශ්නය 2026.03.03 දින මා විසින් ගරු සභාවට ඉදිරිපත් කිරීමට ඉල්ලීමක් කර තිබුණා.

ගෙනාපු හැම ගල් අඟුරු නැවක්ම බාල ගල් අඟුරු කියලා දැන් මුළු රටම පිළිගන්නවා නේ, ගරු කථානායකතුමනි. ඒ පිළිබඳව තමයි මම මේ ප්‍රශ්නය අහන්න සූදානම් වුණේ. මම මේ ප්‍රශ්නය යොමු කළේ, මේ වන විටත් ආනයනය කර අවසන් නොවුණු ගල් අඟුරු සම්බන්ධයෙන්. සාරාංශයක් ලෙස මෙම ප්‍රශ්නාවලිය මඟින් ප්‍රධාන වශයෙන් විමසා සිටින්නේ, නොරොච්චෝලේ බලාගාරයේ සම්පූර්ණ ජනන ධාරිතාව සහ ඒ සඳහා අවශ්‍ය වාර්ෂික ගල් අඟුරු ප්‍රමාණය ගොඩබෑමේ ක්‍රියාවලිය පිළිබඳවයි. එහිදී ප්‍රසම්පාදන කාලසීමාවන්, නැව් වාර ගණන සහ ආනයනික ගල් අඟුරුවල තිබිය යුතු ප්‍රමිතිගත පිරිවිතරයන්, ඒ කියන්නේ ash content එක, volatile matter පිළිබඳව රජයේ අවධානය යොමු වන අයුරින් තමයි මම මේ ප්‍රශ්නය යොමු කර තිබෙන්නේ. විශේෂයෙන්ම දකුණු අප්‍රිකාවෙන් ගෙන් වූ ගල් අඟුරු භාවිතයෙන් උපරිම ධාරිතාව ලබාගත නොහැකි වීමට බලපෑ හේතු සහ එහිදී සිදු වූ මූල්‍යමය අලාභ පිළිබඳව මෙහිදී ප්‍රශ්න කළ අතර, ගල් අඟුරු ප්‍රමිතිය මැනීමට තත්‍ය කාලීන - real-time - දහන දත්ත යොදා ගැනීමේ වැදගත්කම සහ පවතින නිෂ්පාදන අඩුව පියවීමට රජය ගන්නා විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව විමසනු ලැබුවා. ඒක තමයි විමසුවේ. මොකද, ගල් අඟුරු නැව් 10ම බාලයි. මට ඒ ප්‍රශ්නය අහන්න අද අවස්ථාවක් නැහැ.

අවසාන වශයෙන්, හදිසි මිලදී ගැනීම් සඳහා බලපෑ හේතු සහ ඒවායේ විනිවිදභාවය පිළිබඳව ද මෙහි විමසා තිබෙනවා. උදාහරණයක් වශයෙන්, "නොරොච්චෝලේ බලාගාරයේ ඉලක්කගත නිෂ්පාදනය - මෙගාවොට් 900 - නොමැතිකම නිසා අහිමි වන විදුලි උත්පාදනයට රජය ගනු ලබන විකල්ප ක්‍රියාමාර්ග කවරේද?" යනුවෙන් අසා තිබෙනවා. එම ප්‍රශ්නය ඇසීම මට තහනම් කර තිබෙනවා. ඊළඟට, ගෙනා ගල් අඟුරුවල Gross Calorific Value - GCV අගය - මෙගාවොට් 300 නිපදවීම තුළ එක් එක් නැව් සඳහා වෙන් වෙන් වශයෙන් reverse calculation හරහා කොපමණද කියන ප්‍රශ්නය අසා තිබෙනවා. දැන් ඒ ප්‍රශ්නය අසන එකත් මට තහනම් කර තිබෙනවා. "පවතින තත්ත්වය තුළ හදිසි ගල් අඟුරු මිලදී ගැනීමක් සිදු කරන්නේද? එසේ හදිසි මිලදී ගැනීමට හේතු වූ කරුණු කවරේද? එසේ කිරීමට අනුගමනය කරන ප්‍රසම්පාදන ක්‍රමවේද හා පිරිවිතර කවරේද?" කියන ප්‍රශ්නයත් අහන්න මට තහනම් කර තිබෙනවා. ඊළඟට අසා තිබුණා, දකුණු අප්‍රිකාවෙන් ආනයනය කරන ලද ගල් අඟුරු නැව් 9හි අළු අන්තර්ගතය - ash content එක - කොපමණද, Volatile matter කොපමණද, ප්‍රමිතිගත ගල් අඟුරුවල තිබිය යුතු අළු අන්තර්ගතය කොපමණද, Volatile matter යනු කුමක්ද කියන ප්‍රශ්න. "එම කරුණු කල් තැබීමේ යෝජනාවේදී ආවරණය වී ඇත" යන හේතුව මත ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා නොදීම නිසාවෙන් ද, ස්ථාවර නියෝග 27(2) යටතේ පක්ෂ නායකයකුට ජාතික වැදගත්කමක් ඇති හදිසි කරුණක් පිළිබඳව නිශ්චිත සහ සංඛ්‍යාත්මක තොරතුරු රජයෙන් විමසීමේ අයිතියක් ඇති නිසාවෙන් ද, එවැනි කරුණක් සංශෝධනය කර ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බැවින් ද, මා විසින් යොමු කළ ප්‍රශ්නය දේශපාලන විවාදයකට අදාළව නොව, ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරයේ විදුලි උත්පාදන ධාරිතාව, ගල් අඟුරු ප්‍රමිතීන්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ මූල්‍ය බලපෑම් පිළිබඳව නිශ්චිත දත්ත ඉල්ලා සිටින කරුණු නිසාවෙන් ද, මා විසින් මෙම ප්‍රශ්නය යොමු කරන ලද්දේ ගල් අඟුරු ආනයනය කිරීම පිළිබඳ කල් තැබීමේ යෝජනාවෙන් පසුව මෙරටට ගෙන්වන ලද ගල් අඟුරු සම්බන්ධයෙන් වන නිසාවෙන්ද, කල් තැබීමේ යෝජනාවකදී සිදු වන සාමාන්‍ය විවාදයක් සහ සංඛ්‍යාත්මක තොරතුරු ලබා ගැනීම සඳහා ස්ථාවර නියෝග 27 (2) යටතේ යොමු කරන ප්‍රශ්නයක් අතර ස්වාභාවික වෙනසක් පවතින නිසාවෙන් ද, -

***[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, the Hon. President Anura Kumara Dissanayake entered the Chamber.]*

කල් තැබීමේ යෝජනාවකදී විවාදයක් සිදු වුවද, එය රජයට සංඛ්‍යාත්මක සහ වගකීම් සහිත පිළිතුරු සපයන නියමිත ක්‍රමවේදයක් නොවන නිසාවෙන් ද, ඉහත හේතුව මත ප්‍රශ්නය ප්‍රතික්ෂේප කිරීම විපක්ෂ නායකවරයා වශයෙන් මාහට පාර්ලිමේන්තු කාර්යභාරය සහ වගකීම් ඉටු කිරීමට ඇති වරප්‍රසාදයට හානි වන බැවින් ද, රට මුහුණ දී සිටින විදුලි උත්පාදන අර්බුදය ජාතික ආර්ථිකය, රාජ්‍ය මූල්‍යය සහ ජන ජීවිතයට සෘජුවම බලපාන බැවින් ද, මෙවැනි ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට ඉඩ නොදීම ජනතාවට සත්‍ය තොරතුරු දැන ගැනීමේ අයිතිය හකුළාලීමක් වන බැවින් ද, මෙමඟින් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3වන වගන්තිය ප්‍රකාරව "පාර්ලිමේන්තුවේ දී භාෂණයේ, විවාද කිරීමේ හා කටයුතුවල නිරතවීමේ නිදහස තිබිය යුතුය" යන්න උල්ලංඝනය වී ඇති හෙයින්, මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ගරු කථානායකතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරලා විශේෂයෙන්ම මේ සතිය තුළම මට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න කියා බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධව සොයා බලා කටයුතු කරන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමාගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවා නම් ඒ ගැන පරීක්ෂා කිරීම ඔබතුමාගේ අභිමතය

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

අනුව කරන්න පුළුවන්. ඒ වාගේම ගල් අඟුරු සැපයුම පිළිබඳව පාර්ලිමේන්තුවේ පෙබරවාරි 20වැනි දා දවස පුරා විවාද කළා. ඔබතුමන්ලා අහපු ප්‍රශ්න ඔක්කොටම අපි උත්තර දුන්නා. ඉස්සරහටත් ස්ථාවර නියෝග 27(2) යටතේ තව ප්‍රශ්න ඇහුවත් අපි උත්තර දෙනවා. ඒ සමස්ත විවාදය තුළ උත්තර දෙන්න බැරි එක ප්‍රශ්නයයි ඉතුරු වුණේ, ගරු කථානායකතුමනි. ඒ තමයි, හෝමාගම මහජන බැංකුවේ account එකක් ගැන කිව්වා. ඒකේ නමයි, account number එකයි කියන්න කිව්වා, මරික්කාර් මන්ත්‍රීතුමාට. නමුත්, අද වනකල් ඒක කිව්වේ නැහැ. ඒක තමයි ඉතුරු වෙලා තිබෙන්නේ. මේ ඕනෑම ප්‍රශ්නයකට උත්තර දෙන්න අපි සූදානම්. මේකට අවස්ථාව ලබා දෙන්න. එතුමාට ප්‍රශ්න කඩලා හරි, එකට හරි අහන්න කියන්න. අපි අදාළ අමාත්‍යාංශ මඟින් උත්තර ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඒ අනුව කටයුතු කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඒ කාරණය ගැන කථා කරලා අවසන්, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමා ඉදිරිපත් කළ කාරණාව ගැනයි මම මේ කියන්නේ. එතුමා නොදන්නවාද දන්නේ නැහැ, ගල් අඟුරු නැව් 25ක් ඇණවුම් කර තිබෙන බව. සභාව කල් තැබීමේ විවාදය පැවැත්වීමෙන් පසුවත් ගල් අඟුරු ආනයනය කර තිබෙනවා. එසේ ආනයනය කරපු ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගල් අඟුරුවලින් මෙගාවොට් 300ක් නිපදවන්නට බැරිවෙලා තිබෙනවා. ඒ වාගේම ඒ ගල් අඟුරුවල අදාළ Gross Calorific Value එක නියමිත ප්‍රමිතියට නැහැ. ඒ වාගේම ash content එක ඇතුළු අනෙක් ප්‍රමිතීන්වලත් බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඒවා පදනම් කරගෙනයි මම මේ ප්‍රශ්නය ඇහුවේ. ගරු ඇමතිතුමනි, එම නිසා ඔබතුමාගේ දැනගැනීමටයි මම මේක කියන්නේ. එසේ ගෙන්වන ලද රුසියානු නැව් එකොළහේම තිබුණු ගල් අඟුරු ප්‍රමිතියෙන් යුක්තයි. ඒවායෙන් මෙගාවොට් 300ම නිපදවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමනි, අපි ඒ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු කරන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හැබැයි, ගෙන්වන්නට කටයුතු කළ ගල් අඟුරු නැව් 25න් 10ක් මේ වනකොට ගෙනැල්ලා තිබෙනවා. ඒ නැව් 10න්ම ගෙනැල්ලා තිබෙන්නේ බාල ගල් අඟුරු. ඒකයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. හෝමාගම බැංකුවක තිබෙන account number එකක් ගැන මම ඔබතුමාගෙන් ඇහුවේ නැහැ. ඒක මට අදාළ නැහැ. මට අදාළ මම අහපු ප්‍රශ්නය. මම අහපු ප්‍රශ්නය ඔබතුමාට ප්‍රතික්ෂේප කරන්න බැහැ, වෙනත් මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කළ ප්‍රශ්නයක් ගැන කියලා. එහෙම කරන්න බැහැ. ගරු කථානායකතුමනි, ඇමතිතුමා මේ සම්බන්ධව ප්‍රතිචාර දක්වනකොට මටත් ඊට ප්‍රතිචාර දක්වන්න අවස්ථාව දෙන්න. එම නිසා මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, මේ සතිය තුළ මට මේ ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න කියලා. මම බොහොම ගෞරවයෙන් ඒ ඉල්ලීම කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමාගේ ඉල්ලීම සම්බන්ධයෙන් සලකා බලන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මේ වැය වන කාලය මෙතුමාගේ ප්‍රශ්නය අහන්න ලබා දුන්නා නම්, අපට උත්තර දෙන්න තිබුණා. අනික් එක තමයි, රුසියානු ගල් අඟුරුවල දේශීය නියෝජිතයෝයි, දකුණු අප්‍රිකානු ගල් අඟුරුවල දේශීය නියෝජිතයෝයි, ඉන්දුනීසියාවෙන් ගෙනාවා නම් එහේ නියෝජිතයෝයි පාර්ලිමේන්තුවේ ඉන්න අවශ්‍ය නැහැ කියන එක. අපි ඒ සැපයුම්වලට අදාළ සියලු ප්‍රශ්නවලට උත්තර ලබා දීලා තිබෙනවා. එම නිසා අර නැව් 11ට මොකද වුණේ, මේ නැව්වලට මොකද වුණේ කියන එක නොවෙයි, අප්‍රේල් මාසයේ මැද වෙනකල් එන නැව් පිළිබඳව අපි වාර්තා කරලා තිබෙන්නේ. 25වැනි නැව එන්නේ අප්‍රේල් මාසයේ මැද. එම නිසා ඒ shipment එකෙන් shipment එකට අදාළ කරන ප්‍රශ්නවලට උත්තර දෙන්න අපි සූදානම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එකක් නැහැ, ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා. මේක විවාදයක් කර ගන්න එපා. *[බාධා කිරීමක්]* මේක ඒ සම්බන්ධයෙන් වන විවාදයක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ point of Order එක බොහොම සරලයි. ගල් අඟුරු සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැත්නම්, ගල් අඟුරු නැව් 9ක් අලුතින් හදිසියේ මිලදී ගන්න යන්නේ ඇයි? ඒකට උත්තර දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි.

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(3) සහ ස්ථාවර නියෝග 91(ආ) අනුවයි මම මේ කථා කරන්නේ. ගරු විපක්ෂ නායකතුමා අහන ස්ථාවර නියෝග 27(2) යටතේ වූ ප්‍රශ්නය හෝ කුමන හෝ ප්‍රශ්නයක් නීති විරෝධී නම්, ඒ නීති විරෝධීභාවය පිළිගන්න තිබෙන්නේ තමුන්නාන්සේට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉස්සෙල්ලාම ඔබතුමා point of Order එක මොකක්ද කියලා කියන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 27(3) යටතේ මම අහන්නේ. අපි ඕනෑම ප්‍රශ්නයක් යොමු කළාම, ඒක නීති විරෝධී නම් පමණයි ප්‍රතික්ෂේප වන්නේ. එතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය නීති විරෝධියි නම්, ඒ නීති විරෝධීභාවය ඔබතුමා පෙන්වන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතුමා - *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. මම කාරණා දෙකක් ගැන කිව්වා නේ. මට අවස්ථාව දුන්නේ නැත්නම් ඒක හරුපයක් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ කාරණය මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා, ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියලා. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයට පිළිතුර තමයි තමුන්නාන්සේලා ඉදිරිපත් කරලා නැත්තේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මම ඔය කාරණය ලේකම් මණ්ඩලය වෙත යොමු කරලා ඒ සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දෙන්න කටයුතු කරන්නම්.

ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විදේශ විනිමය පනත යටතේ නියමය ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා.

## විදේශ විනිමය පනත: නියමය
## அந்நியச் செலாவணி சட்டம்: கட்டளை
## FOREIGN EXCHANGE ACT: ORDER

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 දෙසැම්බර් 18 දිනැති අංක 2467/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.17 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජනාධිපතිතුමා.

[පූ.භා. 11.27]

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ මොහොතේ මැද පෙරදිග කලාපයේ ඇති වෙමින් තිබෙන යුදමය තත්ත්වය පිළිබඳවත්, එය ලංකාවේ අපට ආර්ථිකමය වශයෙන් සහ සමාජයීය වශයෙන් බලපාන ආකාරය පිළිබඳවත් යම් කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට මම අපේක්ෂා කරනවා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

විශේෂයෙන්ම අපගේ ස්ථාවරය වන්නේ, ඕනෑම යුද ගැටුමක් කිසිදු ජන කණ්ඩායමකට හිතකර තත්ත්වයක් නිර්මාණය කරන්නේ නැහැ කියන එකයි. ඒ වාගේම යුද්ධමය වශයෙන් ගත්තොත්, දියුණු තාක්ෂණයෙන් යුතු ඉතා විශාල අවි සහ මෙවලම් නිර්මාණය කරමින් තිබෙන ලෝකයකට ඒවා මොන තරම් විනාශකාරීද කියන එක පිළිබඳව මේ තුළින් අප කාටත් අවබෝධයක් ලබා ගත හැකියි. එම නිසා මේ යුද්ධයට සම්බන්ධ වී සිටින සියලු පාර්ශ්වයන් ඉතා ඉක්මනින් ම සාමකාමී ලෝකයක් වෙනුවෙන් අවශ්‍ය කැපවීම් කරමින්, ඒ මඟ පෙන්වීම් ලබා දිය යුතු බව තමයි ශ්‍රී ලංකාව හැටියට අපගේ ස්ථාවරය වන්නේ. මොකද, මෙය ලෝකයේ ආර්ථිකයටත්, ජන ජීවිතයේ පැවැත්මටත් විශාල තර්ජනයක් සහ බලපෑමක් ඇති විය හැකි තත්ත්වයක්. ශ්‍රී ලංකාවට එයින් ගැලවීමේ හැකියාවක් නැහැ, හුදෙකලා ලෙස. අපි රටක් ලෙස මෙයට මුහුණ දීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ගන්නා අතරතුර, මෙම තත්ත්වයට මුහුණ දිය හැකි වන්නේ ජාත්‍යන්තර පරිමාණයෙන් අප අතර සාමකාමී ලෝකයක් පිළිබඳව තිබෙන කැපවීමෙන් පමණයි කියලා අප විශ්වාස කරනවා.

ඒ වාගේම මා දන්නවා, මැද පෙරදිග කලාපයේ ඇති වී තිබෙන යුද්ධමය තත්ත්වය හේතුකොටගෙන ප්‍රධාන ලෙස ක්ෂණිකව අපට බලපාන ක්ෂේත්‍ර කිහිපයක් තිබෙන බව. එකක් තමයි, අපේ බලශක්ති සැපයුම. එනම්, තෙල් සහ ගෑස්. දෙක, ශ්‍රී ලාංකිකයින් විශාල පිරිසක් විදෙස්ගතව සිටින නිසා ඔවුන් පිළිබඳව මතු වන ගැටලුව. ඊළඟට, අපේ ආර්ථිකයේ ප්‍රධානම පංගුකරුවන් වන සංචාරක කර්මාන්තය හා විදෙස්ගත ප්‍රේෂණ. එය අපේ ආර්ථිකයේ ඉතා විශාල පංගුවක්. ඒ සඳහා කෙරෙන බලපෑමත් මෙහිදී අපට විශාල ප්‍රශ්නයක් වනවා. ඒ වාගේම නාවික කර්මාන්තයත් අපේ රටේ ආර්ථිකයේ විශාල පංගුවක්. නාවික කර්මාන්තය නාවික සේවා සැපයීම මත ගැටගැහිලා තිබෙනවා. ඒ නාවික සේවා සඳහා කරන බලපෑමත් මෙහිදී අපට ගැටලුවක් වනවා. ඒ වාගේමයි ගුවන් සේවා සඳහා කරන බලපෑම. මෙම යුද ගැටුම නිසා මේ ආදී ක්ෂේත්‍ර ගණනාවක බලපෑමකට අපි ක්ෂණිකව මුහුණ දෙනවා. රජයක් හැටියට අපට දිගු කාලීනව මෙම අර්බුද විසඳීම සඳහා තිබෙන මාවත කුමක්ද කියන කරුණ වාගේම, කෙටි කාලීනව ජනතාව මෙම අර්බුදයට හසු නොවීමටත්, රටක් හැටියට මෙම අර්බුදයේ ගිලෙන්නේ නැතිව එය සමනය කර ගන්නේ කොහොමද කියන එක සම්බන්ධවත් අපට යම් වැඩසටහනක් අවශ්‍යයි.

එහිදී අපේ ජනතාව යම් ප්‍රමාණයකට කලබල වන එක ඇත්ත. අපි ඒකට කිසිදු පුරවැසියෙකුට කිසිසේත්ම චෝදනා එල්ල කරලා වැඩක් නැහැ. මොකද, අපේ ජනතාවට ඉතාම අමිහිරි ඉතාම කෙටි කාලීන අතීතයක් තිබෙනවා. ඒ අතීතය තවමත් ඔවුන්ගේ සිත් තුළ හොල්මන් කරනවා. එම අතීතයේදී ගෑස් සහ තෙල් හිඟවීම නිසා පෝලිම්වල සති ගණන් ගතවීම සහ පෝලිම්වල මිය යාම පවා සිදු වුණා. එම නිසා මෙවැනි කුඩා ප්‍රවෘත්තියක් පවා එම ජනතාව යම් තැති ගැන්මකට භාජන කරනවා. එය ස්වාභාවිකයි. ඒ වාගේම ඒ කාලයේදී ඖෂධ හිඟවීම, ගමනාගමනය අඩාළ වීම වැනි දේ නිසා ක්ෂේත්‍ර ගණනාවක අමිහිරි අත්දැකීම් අපි ලැබුවා. අමිහිරි කියනවාට වඩා ඇත්තටම යම් ඛේදවාචකයකට මීට අවුරුදු දෙක තුනකට කලින් අපේ රට මුහුණ දුන්නා. ඒ නිසා ගිනි පෙනෙල්ලෙන් බැට කාපු මිනිහා කණාමැදිරි එළියටත් බයයි වාගේ කුඩා චලනයකටත් අපේ සමාජය තැතිගැන්මකට භාජන වනවා. එය අපට පිළිගත හැකියි. හැබැයි, අපට වාක්‍යවලින්, කරුණුවලින් පමණක් සමාජය ස්ථාවරභාවයකට ගේන්න බැහැ. සමාජය ස්ථාවරභාවයකට ගේන්න හැකි වන්නේ ප්‍රායෝගිකව ඔවුන් අර්බුදයකට මුහුණ නොදෙනවා කියා සහතික කිරීමෙන් පමණයි. ඒ, ඇයි?

ඉතිහාසයේ ඒ, ඒ කාලවල නිර්මාණය වුණු ප්‍රවෘත්ති මොනවාද කියලා ඔබ බලන්න. ඒ හැම ප්‍රවෘත්තියක්ම ඒ කාලයේ රජය පැත්තෙන් කැබිනට් මාධ්‍ය ප්‍රකාශකවරයා, ආණ්ඩුවේ නාළිකා, ජනාධිපතිවරයා ඉදිරිපත් කළා මට මතකයි. ඒ කාලයේ මේ හැමදෙනාම කරපු ප්‍රකාශවල අසත්‍යභාවය පැයක්, දෙකක් ඇතුළත හෙළිදරව් වුණා. ඒ නිසා හැම විටම මෙවැනි කුඩා දෙයකින් තැති ගැන්මකට භාජන වන, අස්ථාවරත්වයන් පිළිබඳ මතයක් නිර්මාණය වන සමාජයක් තමයි අප හමුවේ තිබෙන්නේ. ඒ, ඇයි? අපි තවමත් ආර්ථිකය ඉතාම ශක්තිමත් ලෙස ස්ථාවරභාවයට පත් කරලා නැහැ. එය ස්ථාවරභාවයට පත් කරමින් යන ගමනක් තිබෙන්නේ. අපේ සංචිත අපි ශක්තිමත් කරමින් යන ගමනක් තිබෙන්නේ. අපේ නිෂ්පාදන, ආයෝජන කැඳවා ගැනීම සඳහා කටයුතු සකස් කරමින් යන ගමනක් තිබෙන්නේ. ඒ ගමන අතරතුර තමයි අපට මේ සිදුවීම බලපෑම් ඇති කරන්නේ. අපි දන්නවා, අවුරුද්දකට ටිකක් වැඩි කාලයක් ඇතුළත අපි මෙවැනි අවස්ථා කිහිපයකට මුහුණ දුන් බව.

ඔබට මතක ඇති, අපි ආ විගසම මේ කලාපයේ යුද්ධයක් - ගැටුමක්- පිළිබඳ සාකච්ඡාවක් ආපු බව. ඒ වෙලාවේදීත් මේ වාගේම තැතිගැන්මක් ආවා. නමුත් කෙටි කාලයක් ඇතුළත ඒක සමනය කර ගැනීමට අපට හැකියාව ලැබුණා. ඊළඟට ඔබට මතකයි, එක්සත් ජනපදය තමන්ගේම ආර්ථික උපාය මාර්ගයක් අනුව පනවන ලද බදු සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේත්, පාර්ලිමේන්තුවෙන් පිටතත් විශාල සාකච්ඡාවක් ගෙනිච්චා, රට අනතුරකට මුහුණ දෙයි කියලා. හැබැයි, ඒකත් සැලකිය යුතු ප්‍රමාණයකින් සමනය කරගන්න අපි සමත් වී තිබෙනවා.

ඒ වාගේම අපට මතකයි, "දිට්වා" සුළි කුණාටුව. "දිට්වා" සුළි කුණාටුව විශාල විනාශයක්, අපේ GDP එකෙන් සියයට 4ක වාගේ ප්‍රමාණයකට ඒ තුළින් බලපෑමක් කරලා තිබෙනවා. සමස්තයක් විදියට ගත්තොත්, ඩොලර් බිලියන 4.1ක වාගේ විනාශයක් ඒ තුළින් සිදු වී තිබෙනවා.

නමුත් මාස 3ක් යනකොට අපි එය සැලකිය යුතු ප්‍රමාණයකින් සමනය කරලා, අපේ රට හා ආර්ථිකය සාමාන්‍ය තත්ත්වයට ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා හැම විටම අභියෝග හමුවේ ඒවා සාර්ථකව සමනය කර ගත් මෑත කෙටි කාලීන ඉතිහාසයක් අපට තිබෙනවා. හැබැයි, ඒ සියල්ල හා සන්සන්දනය කර බලනකොට දැනට තිබෙන තත්ත්වය අපි කාටත් විග්‍රහ කර ගන්න පුළුවන්. හැබැයි, එය මොන තත්ත්වයක් දක්වා වර්ධනය වෙයිද කියන එක පිළිබඳව අපි කාටත් තිබෙන්නේ අවිනිශ්චිත ස්වභාවයක්. ඒක අපි තේරුම් ගන්න ඕනෑකම තිබෙනවා. ඒ නිසා රජයක් හැටියට අපි නිරන්තරයෙන් ඇති වෙමින් තිබෙන වර්ධනයන් පිළිබඳව සැලකිල්ලට භාජන කරමින් සිටිනවා. ශ්‍රී ලංකා මහ බැංකුව අද මේ තිබෙන තත්ත්වයන් පිළිබඳව සමාලෝචනය කරලා, අපේ ආර්ථිකයට ඇති විය හැකි බලපෑම පිළිබඳව සමාලෝචන වාර්තාවක් සකස් කරමින් තිබෙනවා. අද හවස හෝ හෙට උදේ වනකොට මට ඒ වාර්තාව ලබා ගන්න පුළුවන්. එතකොට අපේ මූල්‍ය ක්ෂේත්‍රයට ඇති වන බලපෑම් පිළිබඳව අපට යම් විවරණයක් ඒ තුළින් ලබා ගන්න පුළුවන්. ඒ වාගේම මුදල් අමාත්‍යාංශය ලෙස අපි, ජනතාවගේ ජන ජීවිතය පවත්වාගෙන යාමේදී ඇති වන ආර්ථික සහ වෙනත් බලපෑම් මොනවාද සහ විය හැකි විනාශකාරීමය තත්ත්වය ගැන උපකල්පනය කරලා ඒකට අවශ්‍ය වන වාර්තාවක් සකස් කරමින් පවතිනවා. ඒ වාගේම අපේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් මේ තත්ත්වයේදී මුහුණ දිය හැකි අර්බුද පිළිබඳව සැලකිල්ලට ලක් කරලා, ඒකට අවශ්‍ය වන න්‍යාය පත්‍රයක් සකස් කිරීම සඳහා දැන් කටයුතු කරමින් සිටිනවා.

ඊළඟ කාරණය තමයි, අපේ ජනතාවගේ අත්‍යවශ්‍ය සේවා සහ පහසුකම් සැපයීමේ වගකීම. ආණ්ඩුවක් හැටියට අපි ඒක භාර ගත යුතුයි. අර්බුද එනවා. තනි තනි පුරවැසියන්ට ඒ අර්බුදවලින් මිදීම

සඳහා තිබෙන වැඩ කොටස ඉතා සීමිතයි. තනි කෙනෙකුට පෝලිමේ ගිහිල්ලා තෙල් ටිකක් අරගෙන එන්න පුළුවන් වෙයි. හැබැයි, සමස්ත අර්බුදයට විසඳුම තනි තනි පුද්ගලයන් අතේ නැහැ. සමස්ත අර්බුදයේම විසඳුම් මාවත සෙවීමේදී ප්‍රධාන වගකීමක් ආණ්ඩුවට පැවරී තිබෙනවා. ඒ අතරේ පාර්ලිමේන්තුවේ අපි හැමදෙනාටම අත්හරින්නට බැරි වගකීමක් තිබෙනවා. ඒ වාගේම අපේ රටේ පුරවැසියන්ටත් යම් සැලකිය යුතු වගකීමක් තිබෙනවා. ඒ නිසා ආණ්ඩුව, පාර්ලිමේන්තුවේ අපි සියලුදෙනා සහ ජනතාව එක අරමුණක් සහ වැඩ පිළිවෙළක් අනුව මේකට මුහුණ දිය යුතුයි කියන එක තමයි අපගේ යෝජනාව.

මම එකින් එක ඔබට කියන්නම්, මතු විය හැකි තත්ත්වයන් පිළිබඳව. එකක්, තෙල් පිළිබඳ ප්‍රශ්නය. ප්‍රධාන වශයෙන් මම පෝලිම් දැක්කා. මම වාර්තා කැඳෙව්වාට පස්සේ අද යම් ප්‍රමාණයකට ඒ පෝලිම් තත්ත්වය අඩු වෙමින් තිබෙනවා. අපි තව තවත් විශ්වාසය තහවුරු කළොත් මම හිතනවා, ඒ තත්ත්වය පහ වෙලා යාවි කියලා. කෙසේ වුණත්, මම ඒ ගැන පැහැදිලි කරන්නම්.

අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, අපේ ගබඩාවල තිබෙන ධාරිතාව. මාස දෙක, තුන තෙල් ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් වන ධාරිතාවක් අපේ ගබඩාවල නැහැ. එතකොට අපේ ගබඩාවල හැමවිටම කරන්නේ මොකක්ද? ඊළඟ නැව එනකොට ඒ නැවේ තිබෙන තෙල් ගබඩා කර ගැනීම සඳහා අවශ්‍ය වන විධියට ගබඩා හිස් කරමින් තබා ගන්නත් ඕනෑ. ගබඩා පුරවාගෙනම ඉන්න බැහැ. ඒ කියන්නේ, ආසන්න වශයෙන් ගත්තොත්, ත්‍රිකුණාමලයේ තිබෙන Lanka IOC ගබඩා ටික අත්හැරියොත් අපට කොලොන්නාව සහ මුතුරාජවෙල මුළු ගබඩා සංකීර්ණවල ධාරිතාව හැටියට තිබෙන්නේ මෙට්‍රික් ටොන් 150,000ක් පමණයි. හැබැයි, අපට ඒ මෙට්‍රික් ටොන් 150,000ම තියාගෙන ඉන්න බැහැ. ඊළඟ නැව එනකොට ඒ නැවේ ධාරිතාව හිස් කරලා තියා ගන්න ඕනෑ. එහෙම නැතුව ඒ මෙට්‍රික් ටොන් 150,000ම තියා ගන්න කියලා කවුරු හරි කිව්වොත්, ඊළඟ නැව ආවොත් මොකද කරන්නේ? ඒ නිසා නැව් එන පිළිවෙළට ගබඩා හිස් කිරීමේ සැලැස්මක් එක්ක තමයි අපි ඉන්නේ. ඒ අනුව ගත්තොත්, මෙට්‍රික් ටොන් 150,000න්, 103,000ක් ගබඩා පිරිලා තිබුණා.

ඒ වාගේම අපේ දෛනික පිරිපහදුවෙන් මෙට්‍රික් ටොන් 1,800ක් අපට සපයනවා. එතකොට අපේ පිරිපහදුවෙන් එන මෙට්‍රික් ටොන් 1,800ටත් අපි ගබඩා පහසුකම් ටික සකස් කර ගන්න ඕනෑ. මේ තිබෙන ගබඩාවලට අනුරූපී වන පරිදි ඉතා හොඳ සැලැස්මක අපි හිටියා. ගබඩාවල තියාගන්න පුළුවන් ප්‍රමාණය, නැවක් ආවාට පස්සේ ගබඩා හිස් කර ගත යුතු ප්‍රමාණය, ඊට පසුව අපේ පිරිපහදුවෙන් දෛනිකව තෙල් නිෂ්පාදනය කරන ප්‍රමාණය ගබඩා කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් අපි සපයා ගත යුතුයි. මම හිතනවා, අපේ ගබඩා පද්ධති ඒ අනුව ඉතා හොඳින් කළමනාකරණය කරමින් ඉන්නවාය කියලා. ඉතා හොඳින් දත්ත බලමින්, දිනපතා අවශ්‍යතා බලමින්, නැව් එන දින බලමින්, අපේ පිරිපහදුවේ නිෂ්පාදනය වන තෙල් ප්‍රමාණය බලමින් ඒ අවශ්‍ය වන ධාරිතාව තමයි අපි ආරක්ෂා කර ගන්න ඕනෑකම තිබෙන්නේ. එහෙම නැතුව ගබඩා නිකම් පුරවාගෙන ඉන්න බැහැ කියා මම හිතනවා. ඒ වාගේම දෛනිකව මාර්කට් එකට තෙල් යනවා. ඒ ඔක්කෝම සන්සන්දනය කරමින් අපේ ගබඩා පද්ධතිය පරිපාලනය කරමින් තිබුණා. ඒ අනුව, මම හිතන විධියට අපට දින 33කට අවශ්‍ය වන ඩීසල් ප්‍රමාණයක් තිබෙනවා.

පෙට්‍රල් ගත්තොත්, මුළු ගබඩා ධාරිතාව මෙට්‍රික් ටොන් 161,087යි. මේ අර්බුදය මතු වෙනකොට ඒ ප්‍රමාණයෙන් මෙට්‍රික් ටොන් 136,270ක ගබඩා ධාරිතාවක් තිබුණා. හැබැයි, කවුරු හරි මේක මුළුමනින්ම තියා ගන්න කියලා කිව්වාට එහෙම තියා ගන්න බැහැ. අපි operations කරන්නේත් මේ ගබඩාවලින්ම තමයි. අපිට වෙනම තෙල් සංචිත - buffer stocks - තිබුණා නම්, ආරක්ෂිතව ගබඩා කිරීම සඳහා අපට තොගයක් තිබුණා නම්, ඒක තමයි ආරක්ෂිත තොගය. අපට operations කිරීම සඳහා වෙනම ගබඩා සංකීර්ණයක් පවත්වා ගෙන යන්න පුළුවන්. අපිට කවදාවත් ආරක්ෂිත තොගයක් නැහැ. ඒ නිසා හැම වෙලාවේදීම දෛනිකව ක්‍රියාකාරීත්වයේ යෙදෙන තොගයත්, අපට අවශ්‍ය කරන සංචිතත් එකම ගබඩාවල තිබෙන්නේ. අපි දන්නවා, ලෝකයේ වෙනත් රටවල හදිසි අවශ්‍යතාවකදී අවශ්‍ය කරන සංචිත වෙනම ගබඩාවල තිබෙන බව, දෛනික මෙහෙයුම්වලට අවශ්‍ය කරන සංචිත වෙනම තිබෙන බව. නමුත්, අපේ රටේ තිබෙන්නේ කොහොමද? සංචිතත්, දෛනිකව මෙහෙයවන තොගයත් එකම තැනක තිබෙන්නේ. ඒ නිසා අපේ පිරිපහදුවෙන් එන ප්‍රමාණය, වෙළෙඳ පොළට නිකුත් කරන ප්‍රමාණය, නැව් එන දින සහ අපට තිබෙන ගබඩා කියන මේවා ඉතා හොඳින් කළමනාකරණය කර ගන්න ඕනෑකම තිබෙනවා. ඒ කටයුත්ත අපි කරමින් තිබෙනවා. ඒ අනුව, ඕනෑම මොහොතක ඇති විය හැකි අර්බුදයකදී අපට තබා ගත හැකි උපරිම ප්‍රමාණය අපි මේ මොහොතේ රඳවා ගෙන තිබෙනවා. ඒ නිසා තමයි, දින 33කට සරිලන ඩීසල් ගබඩා ප්‍රමාණයක් අපට ඇති කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

පෙට්‍රල් ගත්තොත්, දින 27කට අවශ්‍ය වන ප්‍රමාණයක් දැනට තිබෙනවා. ඒ වාගේම මේ මස 7 හෝ 8 කියන දිනවල තවත් මෙට්‍රික් ටොන් 35,000ක පෙට්‍රල් නැවක් ඒමට තිබෙනවා. ඒ ඔක්කොම ගත්තාම, මම හිතන විධියට දින 40කට ආසන්න ප්‍රමාණයක පෙට්‍රල් ගබඩා සංචිතයක් අපි ළඟ තිබෙනවා. මම මේ කියන්නේ, අපිට ඕනෑ විධියට නැව් ගෙනෙන්න බැහැ කියන එකයි. ඒ නිසා අපි මොකද කරන්න ඕනෑ? අපේ ගබඩා හිස් වන ප්‍රමාණයට තමයි අපි නැව් ගෙනෙන්න ඕනෑකම තිබෙන්නේ. ගබඩා හිස් වන ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා දෛනිකව තෙල් කොච්චර ප්‍රමාණයක් නිකුත් වෙනවාද කියලා අපි දන්නවා. එලෙස නිකුත් වන ප්‍රමාණය දින 20කින් කොච්චර ප්‍රමාණයක් වෙනවාද, එහෙම නම් දින 20න් නැව ළඟා වෙනවා. එහෙමයි මේක plan කරලා තිබෙන්නේ. එහෙම නැතුව තව නැව් ගෙනෙන්න බැරි වුණේ ඇයි කියලා අහනවා. නැව් ගෙනැල්ලා මොකක්ද කරන්නේ? තව ගබඩා කර ගන්න බැරි වුණේ ඇයි කියලා අහනවා. කොහේද ගබඩා කර ගන්නේ? ඒවා ඉතාම අතාර්කික කරුණු. ඒ නිසා ඉතා විද්‍යාත්මක ගබඩා පද්ධති කළමනාකරණයක අප නිරත වෙමින් තිබෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට අපිට ආසන්න වශයෙන් දින 40කට අවශ්‍ය කරන පෙට්‍රල් ගබඩා කරලා තිබෙනවා.

ඊළඟට, Jet A-1 ගුවන් යානාවලට අවශ්‍ය ඉන්ධන සැපයුම ගනිමු. ගුවන් යානාවලට සාමාන්‍යයෙන් දෛනිකව ඉන්ධන මෙට්‍රික් ටොන් 1,800ක පමණ අවශ්‍යතාවක් තිබෙනවා. අපේ පිරිපහදුවෙන් දෛනිකව මෙට්‍රික් ටොන් 1,080ක් විතර හදනවා. අපේ මුළු අවශ්‍යතාව තිබෙන්නේ මෙට්‍රික් ටොන් 1,800ක විතර ප්‍රමාණයක්. එතකොට අපි මෙට්‍රික් ටොන් 1,080ක් Jet A-1 ඉන්ධන හදනවා. ඉතුරු ප්‍රමාණය තමයි අපි ආනයනය කරන්නේ. ආනයන තැන්පතු ප්‍රමාණය අපි හදලා තිබෙනවා. අපි හදන ප්‍රමාණයත්, අපේ ආනයන ප්‍රමාණයත් ගත්තාම අපට ගුවන් යානා ඉන්ධන සැපයුම දින 49කට තිබෙනවා. හැබැයි, මේ දින 49 කියන්නේ මොකක්ද? දැන් තිබෙන තත්ත්වය. දවසක් ගත වෙනකොට මොකද වෙන්නේ? නැවත ගබඩා හිස් වෙනවා. ඒ ගබඩා පිරවීම සඳහා අවශ්‍ය වන නැව් ගෙන්වා ගැනීමේ කාලසටහනකුත් තිබෙනවා. එහෙම නේ, මේක හදලා තිබෙන්නේ. එහෙම නැතුව මේ දින 49ක සංචිතය ඉවර වුණාම ඊළඟ නැව ගෙනැල්ලා පුරවන එකක් නොවෙයි වෙන්නේ. අපේ නැව් කාල සටහනක් තිබෙනවා. අපිට කිසිදු නැවක් ගෙන්වා ගැනීමට බැරි වුවා කියා හිතුවොත් තමයි මේ තත්ත්වය තිබෙන්නේ. හැබැයි,

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

දැනට අපි නැව් ටික පෙළගස්වා තිබෙනවා. ඒ අනුව, RM Parks කියන සමාගමෙන් 14වැනි දා නැවක් එනවා. SINOPEC එකෙන් 17වැනි දා නැවක් එනවා. IOC එකෙන් 21වැනි දා නැවක් එනවා. 28වැනි දා තෙල් සංස්ථාවේ නැවක් එනවා. මේ නැව් ඔක්කොම දැනට load කරලා තිබෙන්නේ. ඒ පිළිබඳව එකඟතාව පළ කරලා තිබෙනවා. නැව් ගබඩා කරන බව හා ලබා දෙන බවට අපට confirm කරලා තිබෙනවා. ඒ අනුව නැව් ටික පෙළගස්වා තිබෙනවා. ගබඩා ටික පුරවා තිබෙනවා. අපි මේ යන්ත්‍රණය සකස් කරලා තිබෙනවා.

ඊළඟට, ප්‍රධාන වශයෙන් තෙල් පිරිපහදුව බැලුවොත්, අපට ඒ සඳහා බොර තෙල් අවශ්‍යයි. ඒ අනුව දැනට තිබෙන බොර තෙල් ප්‍රමාණය දින 26කට ඇති. නමුත්, අපි තවත් නැවක් ගෙනෙනවා. ඒ නැවේ බොර තෙල් ප්‍රමාණය තව දින 18කට ඇති. ඒ නැව දැන් මුහුදේ එමින් තිබෙනවා. එම නැව ආවාම දින 44කට කිසිදු නැවක් ආවේ නැතත් අපේ බොර තෙල් පිරිපහදුවේ කටයුතු ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ අනුව අපි සකස් කරලා තිබෙන පරිදි නැව් ප්‍රමාණය එනවා. ඒ වාගේම, අපි මොකක්ද කරලා තිබෙන්නේ? පිරිපහදුව ක්‍රියාත්මක කරන්නත් පෙට්‍රල්, ඩීසල් සහ Jet A-1 ගුවන් යානාවලට අවශ්‍ය කරන තෙල් සඳහා අපි සැලැස්ම සකස් කරලා තිබෙනවා. ඒ නිසා, මම හිතන විධියට මේ තිබෙන තත්ත්වය අනුව තෙල් සම්බන්ධයෙන් කිසිදු අර්බුදයක් මතු වෙන්නේ නැහැ.

නමුත් යුද්ධය වර්ධනය වුණොත් මොකද වෙන්නේ? වර්ධනය වුණොත් අපි කවුරුත් ඒකට මුහුණ දෙන්න ඕනෑ. වර්ධනය වුණොත් මුහුණ දෙන්න එපා යැ. තෙල් පිරිපහදු මධ්‍යස්ථාන ඔක්කෝටම ගැහුවාය කිව්වොත්, අපි කොහෙන්ද ගන්නේ? අපි ළිංවලින් තෙල් ගන්න නොවෙයි නේ. ඒ නිසා යථාර්ථවාදී වෙන්න ඕනෑ. මේ ප්‍රශ්නය මේ විධියට තිබෙන තාක්කල් මේ ප්‍රශ්නයට උත්තර තිබෙනවා. හැබැයි, මේ ප්‍රශ්නය මෙතැනින් එහාට වර්ධනය වෙනවාද, නැද්ද කියලා තීරණය කරන්නේ අපි නොවෙයි. අපි නොවෙයි නේ. ඒ වර්ධනය අනුව ප්‍රශ්නය මොන විධියට වර්ධනය වෙයිද කියලා අපි උපකල්පනය කරමින් ඒකට අවශ්‍ය වන සැලසුම් හදනවා. ඒකට තමයි ආණ්ඩුවක් ඉන්නේ.

මම ඔබතුමන්ලාට මේ කාරණය මතක් කරන්න කැමැතියි. අපට තිබෙන මේ ධාරිතාව පිළිබඳ ප්‍රශ්නය දිගු කාලයක් තිස්සේ තිබුණු ප්‍රශ්නයක්. හැබැයි, අපි මොකක්ද කළේ? කොලොන්නාවේ මෙට්‍රික් ටොන් 86,000ක ධාරිතාවක් සහිත ගබඩා සංකීර්ණයක් අලුතෙන් හදන්න වැඩකටයුතු කරමින් ඉන්නවා. අලුතෙන්ම ටැංකි 6ක් හදනවා. ඒ වාගේම තිබුණු ටැංකි දෙකක් - අර ගිනි ගත්ත තැන - කපලා නැවත ටැංකි 2ක් හදනවා. ඒ කියන්නේ අලුත් ටැංකි 8ක් හදනවා කොලොන්නාවේ. ඒ ගබඩා සංකීර්ණයේ ධාරිතාව මෙට්‍රික් ටොන් 86,000යි. අපේ සැලසුමේ තිබෙනවා, 2027 වෙනකොට ඒක හදලා අවසන් කරන්න. ඒ සඳහා අපේ වියදම බැලුවොත්, අර ටැංකි 6ට වියදම රුපියල් බිලියන 3.32යි. අනෙක් ටැංකි දෙකට වියදම රුපියල් බිලියන 1.45යි. ඒ කියන්නේ රුපියල් බිලියන 5කින් අපි කොලොන්නාවේ ගබඩා සංකීර්ණයේ විතරක් ගබඩා පහසුකම් වැඩි කරන සැලසුමක ඉන්නවා. මෙට්‍රික් ටොන් 86,000ක් කියන්නේ ආසන්න වශයෙන් ගත්තොත් පෙට්‍රල්, ඩීසල් -අපි තවම සැලසුම හදලා නැහැ, මොන මොනවාද ඒකේ දමන්නේ කියලා- ඔක්කෝම ගැන කල්පනා කළත් දින 10කට අලුතෙන් ඒ ගබඩා සංකීර්ණයේ ධාරිතාව වැඩි වෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත්, අපේ දෛනික අවශ්‍යතාව වෙන්නේ මෙට්‍රික් ටොන් 8,800ක්, 8,600ක් වාගේ ප්‍රමාණයක්; ඩීසල්, පෙට්‍රල් ඔක්කෝම එකතු කළත්. එතැන මෙට්‍රික් ටොන් 86,000ක ගබඩා ධාරිතාවක් තිබෙනවා. ඒක අපි 2027 වෙනකොට අවසන් කරනවා. දැනට මුල් ගල් තියලා, ඔක්කෝම කොන්ත්‍රාත් ප්‍රදානය කරලා තිබෙන්නේ; වැඩ කරමින් යනවා. ඒක 2027 ජනවාරිවල අපට දෙන්න එකඟතාව පළ කර තිබෙනවා. එතැනට අපි රුපියල් බිලියන 5ක් වැය කරනවා.

ඊළඟට, මුතුරාජවෙල ගබඩා සංකීර්ණයේ ධාරිතාව මෙට්‍රික් ටොන් 40,000කින් වැඩි කරන්න අපි අලුතෙන් සැලසුම් හදලා තිබුණා. ඒ ටෙන්ඩරය දැන් අවසන් අදියරේ තිබෙන්නේ. ඒකට රුපියල් බිලියන 3.5ක් වැය කරනවා. දැනට දළ ඇස්තමේන්තුව රුපියල් බිලියන 3.5යි. මුතුරාජවෙල මෙට්‍රික්ටොන් 40,000ක ගබඩා හදන්න සැලසුම් හදලා තිබුණා. මම හිතන්නේ මේ සතිය අවසන් වන විට අපට ටෙන්ඩරය ප්‍රදානය කරන්න පුළුවන් වෙයි.

ඊළඟට, මුතුරාජවෙල ඉඳලා කටුනායකට pipeline එකක් එළන්න අපි සැලසුම් කරලා තිබුණා. ඒ කියන්නේ, Jet A-1 ගෙන යන්න. ඒ සඳහා හොඳ pipeline එකක් හදන්න ඕනෑ. අපි ගුවන් තොටුපොළ සඳහා විශාල සැලැස්මක් හදලා තිබෙනවා. අපේ ගුවන් තොටුපොළ හොඳ hub එකක් බවට පත් කරන්න පුළුවන්. විශේෂයෙන්ම මේ ඇති වන තත්ත්වයන් බැලුවාම අපි ඒ පැත්තෙනුත් කල්පනා කරන්න ඕනෑ. හොඳ ගුවන් සේවා hub එකක් බවට පත් කරන්න පුළුවන්. විශේෂයෙන්ම භාණ්ඩ ප්‍රවාහනය සඳහා හොඳ hub එකක් බවට පත් කරන්න පුළුවන්. එහෙම නම් අපි දන්නවා, අපේ ගුවන් තොටුපොළේ තෙල් ඉල්ලුම වැඩි වෙනවා. දැන් අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 1,800යි. හැබැයි අපි හිතනවා, 1,800ට වඩා වැඩි ඉල්ලුමක් එනවා කියලා. හැබැයි අපේ ගුවන් තොටුපොළ සංවර්ධන සැලැස්මටත්, අපේ ගුවන් තොටුපොළ ගුවන් සේවා සපයන hub එකක් බවට පත් කර ගැනීම සඳහා වන සැලැස්මටත් අනුරූප වන විධියට ගුවන් යානා සඳහා ඉන්ධන සැපයීමේ සැලැස්ම තිබෙන්න ඕනෑ. ගුවන් තොටුපොළ හදලා, ගුවන් යානා වැඩි කරලා, ඉන්ධන සැපයුම ගැන කල්පනා කරලා වැඩක් නැහැ. ඒ නිසා අපි ඒ දෙක සමාන්තරව ගෙන යනවා. ඒ නිසා අපි මුතුරාජවෙල ඉඳලා කටුනායකට pipeline එකක් එළනවා. ඒ වාගේම Jet A-1 ධාරිතාව වැඩි කරනවා; මෙට්‍රික්ටොන් 63,000ක් වැඩියෙන් ගබඩා කරන්න පුළුවන් විධියට හදනවා. දැන් ඒ ටෙන්ඩරය අවසන් අදියරේ තිබෙන්නේ. ඒ සඳහා රුපියල් බිලියන 16ක් වැය වෙනවා. ඒවා තමයි ආණ්ඩුවකින් හදන යටිතල පහසුකම්. එහෙම වුණොත් ඒ මෙට්‍රික් ටොන් 63,000න් විතරක් මම හිතන විධියට අපට දින 40කට වඩා වැඩි දින ප්‍රමාණයකට Jet A-1 ගබඩා කරන්න පුළුවන්. ඒ, දැන් තිබෙන ඉල්ලුමට. හැබැයි අපි බලන්නේ දැන් තිබෙන ඉල්ලුම නොවෙයි. අපි සැලසුමක් හදලා තිබෙනවා. අපේ ගුවන් තොටුපොළේ ඉන්ධන සැපයුම තවත් වැඩි කරන්න ඕනෑ කියලා marketing plan එකක් හදලා තිබෙනවා. පෞද්ගලික අංශයේ සමහර කණ්ඩායම්වලට අපි ආරාධනා කරලා තිබෙනවා. එතැන ඉතාම හොඳ තෙල් සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත් කරන්න පුළුවන්. ඒකට අවශ්‍ය වන යටිතල පහසුකම් සකස් කිරීම සඳහා වන ටෙන්ඩරය අපි අවසන් කරනවා. මම හිතන විධියට අපි ටෙන්ඩරය දැම්මා. සමහර සමාගම් අපෙන් යම් කාලයක් ඉල්ලා තිබුණා; නේද, කුමාර ජයකොඩි ඇමතිතුමා?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඔව්.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
යම් කාලයක් අපෙන් ඉල්ලා තිබුණා. ඒ කාලය ලබා දීලා, සති තුනක් ඇතුළත ටෙන්ඩරය අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, ත්‍රිකුණාමලයේ ගබඩාවලට මොකද වුණේ කියන එක ගැන දැන් ප්‍රධාන සාකච්ඡාවක් යනවා. ගබඩා 24ක් තිබුණා. ඒ කියන්නේ, මුළු ගබඩා ප්‍රමාණයෙන් අපට තනිව පාලනය කරන්න පුළුවන් ගබඩා 24ක් තිබෙනවා. පසුගිය ආණ්ඩු ඒ ගබඩා 24න් ගබඩා 3ක් agreement එකක් ගහලා ප්‍රීමා සමාගමට ලබා දීලා තිබෙනවා. තවත් ගබඩා 21ක් අපට තිබෙනවා. ඒ එක ගබඩාවක ධාරිතාව මෙට්‍රික් ටොන් 10,000යි. ඒ කියන්නේ මෙට්‍රික් ටොන් 210,000ක ගබඩා පහසුකමක් අපට තිබෙනවා, මුතුරාජවෙල. හැබැයි අපට එකවර ඒකට වියදම් කරන්න බැහැ. ඒ නිසා අපි අදියර කිහිපයකින් ඒ ගබඩා ටික ප්‍රතිසංස්කරණය කරන්න සැලසුම් හැදුවා. එහි පළමුවැනි අදියර හැටියට ටැංකි හතරක් අපි තෝරා ගත්තා, ප්‍රතිසංස්කරණය කරන්න. ඒ ටැංකි හතරෙන් දෙකක් ප්‍රතිසංස්කරණය කරලා අවසන්. අනෙක් ටැංකි දෙක ප්‍රතිසංස්කරණය කරනවා. හැබැයි, ගබඩා ප්‍රතිසංස්කරණය කළාට වැඩක් නැහැ, හොඳ නළ පද්ධතියක් නැතුව. එම නිසා අපි ඒ හා සමාන ලෙස මුහුදේ ඉඳලා නළ පද්ධතියක් එළනවා. ත්‍රිකුණාමලයේ පරණ නළ පද්ධතිය තිබෙනවා. ඒවා දිරලා තිබෙන්නේ. ඒවායේ තෙල් ප්‍රවාහනය කරන්න බැහැ. එම නිසා අලුත් නළ පද්ධතියක් එළන්න අපි tenders call කරලා තිබෙනවා. ඒ සඳහා යන වියදම රුපියල් බිලියන 7.37යි. එතකොට ත්‍රිකුණාමලයෙන් අපට අලුතෙන් මෙට්‍රික් ටොන් 40,000ක ධාරිතාවක් එනවා.

ඊළඟට, තෙල් පිරවුම් පහසුකම්. රටට තෙල් ආවාට පසුව අපේ පිරවුම් පහසුකම් අඩුයි. දැන් අපි පිරවුම් පහසුකම් වර්ධනය කරන්න ඕනෑ. අපි දැන් ඒක automate කරන්න යනවා. ඒ සඳහා අපි tenders call කරලා තිබෙනවා. ඒකට අපි වියදම් කරන්න අපේක්ෂා කරනවා, රුපියල් බිලියන 1.5ක්. එතකොට අපට ඉතා වේගයෙන් එම කටයුතු කරන්න පුළුවන්. දැනට අපට තිබෙන ගැන්ට්‍රි පහසුකම් එක්ක, අපට නැවක් ආවාම ඒ ගොඩබෑමේ කටයුතුවලට දින පහක් විතර යනවා. අපි එය දින දෙක දක්වා අඩු කරන්න යන්නේ. මොකද, නැව්වලට වැඩිපුර ගෙවන්න ඕනෑ; demurrage ගෙවන්න ඕනෑ. ඉස්සර යුද්ධය තිබුණු කාලයේ නම් නැව ගෙනැල්ලා දවසක් ගොඩබාලා ආපහු යවන්න ඕනෑ මහ මුහුදට. එහෙම තිබුණේ. ඒවා වෙනස් කරන්න ඕනෑ. එම නිසා මුළු ගැන්ට්‍රි පද්ධතියම අපි automate කරන්න යනවා. ඒකට රුපියල් බිලියන 1.5ක් වැය වෙයි කියලා ඇස්තමේන්තු කරලා තිබෙනවා. ඒ ටෙන්ඩරය අපි දැන් කැඳවන්න සැලසුම් කර තිබෙනවා.

ඊළඟට විශේෂම කාරණය තමයි, තෙල් පිරිපහදුව. 1969දී තමයි තෙල් පිරිපහදුව හැදුවේ. ඒ, මෙට්‍රික් ටොන් 38,000ක අවශ්‍යතාවට. මතක තබා ගන්න, හැදුවේ 1969දී. ඊට පසුව එහි ධාරිතාව වැඩි කළේ, 1979දී. තව මෙට්‍රික් ටොන් 12,000කින් ධාරිතාව වැඩි කළා. 1979 වනකොට අපේ පිරිපහදුවේ මුළු ධාරිතාව, මෙට්‍රික් ටොන් 50,000යි. 1979 ඉඳලා අවුරුදු 46ක් ගත වෙලා තිබෙනවා. 2026ට බැලුවොත්, අවුරුදු 47ක් වෙනවා. මේ අවුරුදු 47ටම මෙට්‍රික් ටොන් එකකින්වත් අපේ පිරිපහදුවේ ධාරිතාව වැඩි කරලා නැහැ. මොකක්ද මේ? හිතන්න, අවුරුදු 47කින්. රටවල්ද මේ? අපේ පිරිපහදුවේ ධාරිතාව අවුරුදු 47කින් වැඩි කරලා නැත්නම් ආණ්ඩුද තිබුණේ කියලා මම අහනවා. අපි සැලසුම හදලා තිබෙනවා. අපේ මෙට්‍රික් ටොන් 50,000ක ධාරිතාව මෙට්‍රික් ටොන් 100,000 දක්වා වැඩි කරනවා. දැන් අපි අභිලාෂ කැඳවා තිබෙනවා. මම හිතන විධියට, දැනට සමාගම් 15ක් අභිලාෂ ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
20ක්.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
15ක් ඉදිරිපත් කරලා තිබුණා. ඊට පසුව තව පොඩි කාලයක් ඉල්ලුවා. ඒ කාලයත් අපි ලබා දුන්නාට පසුව දැන් අභිලාෂ ඉදිරිපත් කර තිබෙනවා, සමාගම් 20ක්. අපි දැන් සාකච්ඡාවක් යොදාගෙන තිබෙනවා, මොකක්ද model එක කියලා බලන්න. රාජ්‍ය පංගුවත් තියාගෙන, පෞද්ගලික අංශයේ ධාරිතාව වර්ධනය කර ගැනීම සඳහා අපි සැලසුම් හදලා තිබෙනවා. අපේ ධාරිතාව මෙට්‍රික් ටොන් 100,000කින්, - සියයට සියයකින් - වැඩි කරනවා. ඒවා නේ ආණ්ඩු කියන්නේ.

ඒ විතරක් නොවෙයි. මෙතැන ඉන්න කවුරුත් දන්නවා අපේ pipelinesවලට වෙලා තිබුණු ප්‍රශ්නය. විශේෂයෙන්ම කොළොන්නාවේ ඉඳන් වරාය දක්වා තිබෙන pipeline එකට මොකද වෙලා තිබුණේ? එය අවුරුදු 90ක් පරණයි. ගිනි ගැනීම් සිද්ධ වනවා. තෙල් කාන්දු සිද්ධ වනවා. මංකොල්ලකෑම් සිද්ධ වනවා. ඒ pipeline එක අවුරුදු 90ක් පරණයි. ඒක හදන්න අවුරුදු 20ක් තිස්සේ උත්සාහ කරනවා. හැබැයි, අවුරුදු 20ටම බැරි වුණා. අපි මොකක්ද කරන්නේ? Lines දෙකක් එළනවා, අඟල් දහහතරේ සහ අඟල් දහඅටේ. ඒ සඳහා අපි මේ වනකොට සියලු වාර්තා සකස් කරලා තිබෙන්නේ. ඉතා ඉක්මනින් ඒකට tenders call කරනවා. ඒ සඳහා රුපියල් බිලියන 12.8ක් වැය වනවා.

ඊළඟට අපි ගනිමු, නැප්තා නළ පද්ධතිය. අපි දන්නවා, කොළොන්නාවේ ඉඳන් කැලණිතිස්ස දක්වා වූ නැප්තා නළ පද්ධතිය අවුරුදු 90ක් පරණ බව. අර විධියේම ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මේ ළඟදි එතැන දෙදෙනෙක් තුවාල වුණා. ඒවා අනාරක්ෂිතයි. ඒ නළ පද්ධතිය අවුරුදු 90ක් පරණයි. අපි මොකද කරන්නේ? ඒක හදනවා. ඉතා ඉක්මනින් tenders call කරනවා. දැන් එය අවසන් අදියරේ තිබෙන්නේ. ඒකට රුපියල් බිලියන 1.5ක් වැය වනවා. ආසන්න වශයෙන් ගත්තොත් බිලියන 30කට වඩා අධික මුදල් ප්‍රමාණයක් අපි යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා වෙන් කරන්න සැලසුම් කරලා තිබෙනවා. ඒක නොවෙයිද ආණ්ඩුවක් කරන්න ඕනෑකම තිබෙන්නේ? දැන් තිබෙන තත්ත්වයට අපි සැලසුම් හදලා තිබෙනවා. මෙවැනි ඕනෑම අර්බුදයකට මුහුණ දෙන්න පුළුවන් ප්‍රමාණයේ බලශක්ති ආරක්ෂාව පිළිබඳව සැලසුම් හදන්න අපි කටයුතු කරමින් තිබෙනවා. එම නිසා මම විශ්වාස කරනවා, අපට මේ තිබෙන අර්බුදයට මුහුණ දෙන්නත් පුළුවන්, නැවත මෙවැනි අර්බුද පිළිබඳ සැකයක් ජනතාව තුළ ඇති නොවන ආකාරයෙන් දිගු කාලීන විසඳුමක් කරා යන්නත් පුළුවන් කියලා. අපි ඒ දෙකම සඳහා වැඩ කරමින් තිබෙනවා. නමුත්, මම නැවත අවධාරණය කරන්න කැමැතියි මේ තත්ත්වය තීරණය කරන්නේ අපි නොවෙයි කියලා. අපි සැලසුම හදන්නේ අපේ ධාරිතාවට. අපි සැලසුම හදන්නේ අපේ හැකියාවට. හැබැයි, අපේ හැකියාවට ඔරොත්තු නොදෙන තත්ත්වයන් මතු විය හැකියි. ඒක අපි පිළිගන්නවා. මේක ආණ්ඩුව සහ විපක්ෂය අතර ගැටුමක් නම් අපි දෙගොල්ලන්ට කථා කරලා අපට පාලනය කළ හැකි සීමාවේ මේක තියා ගන්න පුළුවන්. විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය අහනවා. අපි ප්‍රශ්නයට උත්තර දෙනවා. ඊට පසුව අපි මේ ගානෙන් තියා ගනිමු කියලා කථා වෙනවා. එහෙම නේ, යන්නේ. හැබැයි, මේක එහෙම එකක් නොවෙයි. මේක කොතැනට වර්ධනය වේවිද කියන කාරණය තිබෙනවා. හැබැයි, දැන් තිබෙන තත්ත්වයට අනුව අපට හැකියාව තිබෙනවා කටයුතු කරගෙන යන්න. වර්ධනය වන තත්ත්වයන් අපි අධීක්ෂණය කරමින් ඉන්නවා. ඒ තත්ත්වයන්ට ඔරොත්තු දෙන ආකාරයෙන් අපි මේකට සැලසුම සකස් කරමින් තිබෙනවා. ඒ නිසා බලශක්ති ක්ෂේත්‍රයට අදාළව විශේෂයෙන්ම තෙල් සැපයුම පිළිබඳව අපට සැලසුමක් තිබෙනවා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ඊළඟට අප විශේෂයෙන් මුහුණ දෙන ප්‍රශ්නය තමයි, ගෑස් ප්‍රශ්නය. ගෑස් සම්බන්ධයෙනුත් තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මොකක්ද? අපේ මුළු ගබඩා ධාරිතාව තිබෙන්නේ මෙට්‍රික් ටොන් 8,000කටයි. සාමාන්‍යයෙන් අපේ ලිට්‍රෝ ගෑස් සමාගමේ දෛනික ගෑස් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 1000ත්, 1200ත් අතර ප්‍රමාණයක්. හැබැයි, අපට ගබඩා පහසුකම් තිබෙන්නේ මෙට්‍රික් ටොන් 8,000කටයි. ඒ කියන්නේ, අපට ගෑස් ගබඩා කරන්න පුළුවන් උපරිම වශයෙන් සතියකට විතරයි. හිඳෙන කල්ම ඉඳලා ගෙනෙන්නත් බැහැ නේ. ඉතින් මොකද කරන්නේ? දවස් දෙකක් හැර දෙකක් ගෑස් මෙට්‍රික් ටොන් 8,000 ගණනේ වරායට ගෙනෙනවා. මේකයි තත්ත්වය. ඉතින් මේක වෙනස් කරන්න ඕනෑ නේ.

ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ මොකක්ද වුණේ? අර පෞද්ගලික සමාගමේ ගෑස් සැපයුම අඩාළ වුණු නිසා අපේ ගෑස් සමාගමේ සැපයුම දවසකට මෙට්‍රික් ටොන් 1,800 දක්වා වර්ධනය වුණා. අපේ මුළු ගබඩා ධාරිතාව තිබුණේ, මෙට්‍රික් ටොන් 8,000යි. ලිට්‍රෝ ගෑස් සමාගමේ අවශ්‍යතාව තිබුණේ මෙට්‍රික් ටොන් 1,000යි, 1,200යි. හැබැයි, පෞද්ගලික සමාගමේ ගෑස් සැපයුම අඩාළ වුණු නිසා ලිට්‍රෝ සමාගමේ දෛනික ගෑස් සැපයුම මෙට්‍රික් ටොන් 1,800 දක්වා වර්ධනය වුණා. ඒ කියන්නේ, මෙට්‍රික් ටොන් 1,800ක් දෛනිකව සපයන්න ඕනෑ. හැබැයි, ගබඩා තිබෙන්නේ මෙට්‍රික් ටොන් 8,000කටයි. තේරුම් ගන්න පුළුවන් නේ, ප්‍රශ්නය. දින 5කටවත් ගෑස් ගබඩා කරන්න බැරි තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. දැනුත් කරමින් තිබෙන්නේ මොකක්ද? මාලදිවයිනේ නැවක් නතර කරගෙන තිබෙනවා. ඒ නැවෙන්, පොඩි පොඩි නැව්වලින් මෙට්‍රික් ටොන් 8,000 ගණනේ දවස් දෙකකට සැරයක් ගෙනෙනවා. මේවා රටවල්ද? මේවා තමා හුණ්ඩු. මේවා රටවල් නොවෙයි. මාලදිවයිනේ නැවක් නතර කරගෙන පොඩි නැවකින් ගෑස් මෙට්‍රික් ටොන් 8,000 ගණනේ ගෙනෙනවා. මේවා වෙනස් කරන්න ඕනෑ. ඒ නිසා අපි සැලසුමක් හදලා තිබෙනවා, අපේ ගෑස් සමාගමේ ධාරිතාව වැඩි කරන්න.

ඒ අතරේ මේ හදිසි අවශ්‍යතාවටත් මුහුණ දිය යුතු බව අපි දන්නවා. පෞද්ගලික සමාගමක් සතුව තිබෙනවා, ගබඩා පර්යන්තයක්. එහි ගබඩා පහසුකම්වල මුළු එකතුව ලෙස මෙට්‍රික් ටොන් 30,000ක් තිබෙනවා. හැබැයි, ඔවුන් ඒ ගබඩා පර්යන්තය හැදුවේ export market එකට. අපනයනය කිරීම සඳහා තමයි ඔවුන් ඒ ගබඩා පර්යන්තය හැදුවේ. ඔබතුමන්ලා කවුරුත් දන්නවා හම්බන්තොට එය හදලා තිබෙන්නේ ගෑස් අපනයනය කිරීමට බව. අපි ඔවුන් එක්ක සාකච්ඡා කළා, මේ හදිසි අවශ්‍යතාව නිසා. මම උදේ කථා කළා. අපි කිව්වා, ඒ මෙට්‍රික් ටොන් 30,000ක ගබඩා පහසුකම්වලින් 15,000ක පහසුකම් අපට තාවකාලිකව දෙන්න කියලා. ඒ සමාගමට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, ඒ සමාගම කැමැත්ත ප්‍රකාශ කළා, ඒ මෙට්‍රික් ටොන් 30,000න් 15,000ක් අපට දෙන්නම් කියලා, මේ හදිසි අවශ්‍යතාවට. අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. හැබැයි, ඒ ගබඩා හදන කොට තිබුණු තත්ත්වය මොකක්ද? ඒවා BoI ව්‍යාපෘති. ඒ නිසා ඒ ගබඩාවලින් local market එකට නිකුත් කරනවා නම් අවශ්‍ය වන බදු ගෙවීම කරන්න ඕනෑ.

ඒ පෞද්ගලික සමාගමට ඉඩ දීලා තිබෙන්නේ මොකක් සඳහාද? මම එය විවෘතව කියනවා. ඒ පෞද්ගලික සමාගමට ගෑස් සැපයුම් කරන්න දීලා තිබෙන්නේ, ඒගොල්ලන් export කරන එකෙන් සියයට 20ක් local market එකට දමන්නයි. එහෙම නේ, දීලා තිබුණේ. BoI ව්‍යාපෘතියක් විධියට ආවොත් ඒගොල්ලන් export කරන එකෙන් සියයට 20යි local market එකට දාන්න පුළුවන්. හැබැයි, පසුගිය කාලයේ ඒගොල්ලන්ගේ export market එක මුළුමනින් බිඳ වැටුණා. එක වෙලාවක ඒගොල්ලන් කිව්වා, බංග්ලාදේශයේ ගැටුම් නිසා යවන්න බැහැ කියලා. ඒක නිසා ඒගොල්ලන්ගේ අපනයන market එක වැටුණා. අපනයනය කරන එකෙන් සියයට 20ක් තමයි දෙන්න පුළුවන්කම තිබෙන්නේ, local market එකට. අපනයන සැපයුම නැති වුණාම දේශීය වෙළෙඳ පොළට ගෑස් සපයන්නත් බැරුව ගියා; සමාගම හැටියට හිර වීමක් තිබුණා. හැබැයි, ඒ සමාගමෙන් කහ පාට සිලින්ඩරවලට ගෑස් ගත්තු පාරිභෝගිකයන් හිටියා. දැන් මොකක්ද වෙන්නේ? කහ පාට සිලින්ඩරවලට ගෑස් ගත්තු අයට ගෑස් නැහැ. සමාගමට market එකට දාන්න පුළුවන් export එකෙන් සියයට 20යි. හැබැයි, ඒ සියයට 20 දාන්න සමාගම ගෑස් අපනයනය කරලා තිබෙන්න ඕනෑ. ගෑස් අපනයනය කරලා නැත්නම් market එකට දාන්න බැහැ. Market එකට දාන්නේ නැත්නම් කහ ගෑස් හිඟයි. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ඒකයි. ඒ නිසායි මම විශේෂයෙන්ම හදිසි නීතිය යළි පනවන්න තීරණය කළේ. හදිසි නීතිය යටතේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්වරයා හරහා අපි විශේෂ රෙගුලාසියක් මඟින් ඔවුන්ට local market එකට තාවකාලිකව ගෑස් සපයන්න බලය දෙනවා. හැබැයි, අර කියපු බදු සියල්ල අරගෙන. එහෙම නැතිව අපි ඔවුන්ට කිව්වොත්, ඔයගොල්ලන් ලංකාවෙන් අපනයනය කරන ප්‍රමාණයෙන් සියයට 20ක් විතරයි දාන්න දෙන්නේ කියලා, කහ ගෑස් කවදාවත් ලැබෙන්නේ නැහැ. මොකද, ඒගොල්ලන්ගේ අපනයන market එක දැන් වැටිලායි තිබෙන්නේ. එතකොට වෙන්නේ මොකක්ද? ගෑස් නැතුව යනවා. දැන් අපි ඒගොල්ලන් එක්ක සාකච්ඡා කරනවා. කිසිදු වංචනික ගනුදෙනුවක් නොවෙයි මෙතැන තිබෙන්නේ. මෙතැන තිබෙන්නේ මොකක්ද? අපි දන්නවා, අපේ කහ ගෑස් පාරිභෝගිකයන් සියයට 20ක් ඉන්න බව. හැබැයි, දැන් ඒ සියයට 20ට ගෑස් දෙන්න විධියක් නැහැ. ගෑස් දෙන්න නම් කරන්න ඕනෑ දේ තමයි, ඒ සමාගම BoI සමාගමක් වුණත්, අදාළ බදු සියල්ල ගෙවලා සියයට 20 ඉක්මවා local market එකට ගෑස් දෙන්න පුළුවන් අවස්ථාව සලසන එක. අපි තාවකාලිකව ඒ අවස්ථාව දෙන්න කල්පනා කරලා තිබෙනවා. එතකොට සියයට 20ක් ලාෆ් ගෑස්. ඒ වාගේම ලිට්‍රෝ ගෑස් සමාගමෙන් අලුත් සිලින්ඩර ලක්ෂයක් ඇණවුම් කර තිබෙනවා. මා හිතන විධියට, මේ සතියේ 12වැනි දා නැව එනවා. මොකද, සිලින්ඩරවල හිඟයක් තිබුණා. සමහර අයට කහ පාට එකෙන් නිල් පාට එකට මාරු වෙන්න ඕනෑකම තිබුණා. මොකද, කහ පාට සිලින්ඩරයේ ගෑස් එක ගණන් වැඩියි. නමුත්, අපි මිල වැඩි කළේ නැහැ. ඒක මතක තියා ගන්න. හැම දාම කිව්වේ මොකක්ද? පෞද්ගලික සමාගම් හරහා තරගකාරිත්වය හදලා ගෑස් මිල අඩු කරනවා කියලායි. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? රජයේ සමාගමේ සාමාන්‍ය ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක් රුපියල් 500කින් අඩුයි. එතකොට සමහර අය කල්පනා කරනවා කහ පාට එකෙන් නිල් පාට එකට මාරු වෙන්න. හැබැයි, මාරු වෙන්න කල්පනා කළාට ගෑස් සිලින්ඩර නැහැ. ඒ නිසා අපි සිලින්ඩර ලක්ෂයක් ඇණවුම් කර තිබෙනවා. මේ මාසයේ 12වන දා ඒ සිලින්ඩර් ලක්ෂය market එකට එනවා. මෙහෙමයි අපි කටයුතු කරන්නේ. නමුත් මම දැක්කා, "ගෑස් හිඟයි, ගෑස් හිඟයි" කියලා මෙතැන කෑගැහුවා. එහෙම නැහැ. අර්බුදය තේරුම් ගන්න. මෙට්‍රික් ටොන් 8,000ක නම් ගබඩා තිබෙන්නේ; ලිට්‍රෝ සමාගමට පුළුවන්කම තිබෙන්නේ මෙට්‍රික් ටොන් 1,000ත්, 1,200ත් අතර සපයන්න නම්; සැලසුම ඒක නම්; මෙට්‍රික් ටොන් 1,800ක ඉල්ලුමක් එකවර ආවා නම්; සැපයීමට පුළුවන්කම තිබෙන්නේ දින 5කටත් වඩා අඩුවෙන් නම් අර්බුදයක් මතු විය හැකියි. අපි ඒ අර්බුදයට විසඳුම් හොයන්න ඕනෑ. අපි මොකක්ද කරන්නේ? අපි ඒකට විසඳුම් සකස් කරමින් යනවා. මම හිතනවා, මේ තිබෙන තත්ත්වය අනුව තෙල් සහ ගෑස් ක්ෂේත්‍රයේ අර්බුදයක් මතු වීමේ ඉඩ කඩ බොහොම අවමයි කියා.

ඊළඟට, අපි විශේෂයෙන් මුහුණ දෙනවා, මැද පෙරදිග කලාපයේ සිටින විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් පිළිබඳ ප්‍රශ්නයට. විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් විශාල ප්‍රමාණයක් ඒ කලාපයේ වැඩ කරනවා. ආසන්න වශයෙන් ගත්තොත්, දැනට ලක්ෂ 10ක් පමණ අපේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වුණු අය ඉන්නවා. අපි දන්නවා, එසේ ලියාපදිංචි වුණු අයට අමතරවත් කණ්ඩායමක් සිටින බව. ලක්ෂ 10කට ආසන්න විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් ප්‍රමාණයක් ඒ ගැටුම් සහිත කලාපයේ ඉන්නවා. එතකොට අපි බලන්න ඕනෑකම තිබෙනවා, ක්ෂණිකව මුහුණ දිය හැකි අනතුරකදී ඒ ශ්‍රී ලාංකිකයන් බලාගන්නේ කොහොමද කියලා. දැනට අපි සෑම තානාපති කාර්යාලයකම පැය 24 පුරා දියත් වන hotline service එකක් ආරම්භ කර තිබෙනවා. ඕනෑම කෙනෙකුට, ඕනෑම මොහොතක තමන්ගේ ගැටලුව තානාපති කාර්යාලවලට දැනුම් දෙන්න පුළුවන්, පැය 24 පුරාම. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේත් අපි පැය 24 පුරාම ක්‍රියාත්මක වන එවැනි ක්ෂණික සේවා සපයන මධ්‍යස්ථානයක් හදලා තිබෙනවා. ඒ වාගේම, අපි විදේශ කටයුතු අමාත්‍යාංශයේත් එවැනි සේවාවක් හදලා තිබෙනවා. අපේ රටේ සිටින ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට තමන්ගේ දෙමාපියන්, තමන්ගේ ඥාතියෙක්, තමන්ගේ සහෝදරයෙක් එම රටවල සිටිනවා නම්, ඒ අය සම්බන්ධව මොකක් හෝ අනතුරක් පිළිබඳව සැකයක් තිබෙනවා නම්, ඒගොල්ලන්ට ඒ පිළිබඳව අමාත්‍යාංශයට දැනුම් දෙන්න පුළුවන්; Sri Lanka Bureau of Foreign Employment වෙත දැනුම් දෙන්න පුළුවන්. එවිට ක්ෂණිකව තානාපති කාර්යාලය සම්බන්ධ කරගෙන තානාපති කාර්යාලයත් එක්ක ඒ තත්ත්වයට මැදිහත් වෙන්න අපට පුළුවන්. ඒ වාගේම, ඒ රටේ පුරවැසියන්ට පැය 24 පුරාම තානාපති කාර්යාලවලට කෙළින්ම කථා කරන්න පුළුවන් අවස්ථාවක් හදලා දීලා තිබෙනවා. ඒ අනුව, විශේෂයෙන්ම විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව පිළිබඳ කල්පනා කරමින් අපි සැලැස්මකට අවතීර්ණ වෙලා තිබෙනවා. මේ තිබෙන තත්ත්වය වර්ධනය වුණොත්, දැනට අපේ හැකියාවෙන් අපි එයට ඔරොත්තු දෙන්නේ කොහොමද? මේක ඉතාම නරක තත්ත්වයකට ගියොත් අපේ හැකියාව ප්‍රමාණවත් නැහැ. එහෙම නම්, ඒ හැකියාව අත්පත් කර ගැනීම සඳහා අපට තිබෙන රාජ්‍ය තාන්ත්‍රික සබඳතා මොනවාද? ඊට සහායක් ලබා ගැනීම සඳහා අනෙක් රාජ්‍යයන් එක්ක අපි කටයුතු කරන්නේ කොහොමද? අපි ඒ ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කරමින් තිබෙනවා.

ඊළඟට, අපි ප්‍රධාන වශයෙන් මුහුණ දෙන ප්‍රශ්නයක් තමයි සංචාරක කර්මාන්තය. විශේෂයෙන්ම අපේ සංචාරක කර්මාන්තය පිළිබඳව ගත්තොත්, මාර්තු මාසයේ පමණක් ලක්ෂ 3කට ආසන්න සංචාරකයන්ගේ පැමිණීමක් අපි අපේක්ෂා කර තිබුණා. සමහර සංචාරකයින්ගේ පැමිණීම යම් ප්‍රමාණයකට අඩාළ වෙමින් තිබෙන බව වාර්තා වෙනවා, අපේ හෝටල් කර්මාන්තය ඇතුළේ. හැබැයි, ලංකාව ඇතුළේ යම් සංචාරකයින් ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන් ප්‍රශ්නයකට මුහුණ දෙනවා; ඔවුන්ගේ වීසා කාලය අහෝසි වෙලා තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවක් හැටියට තීරණය කළා ඒ සියලු දෙනාට සති 2ක නිදහස් වීසා බලපත්‍රයක් නොමිලේ ලබා දෙන්න. අපි ඔවුන්ගෙන් මුදල් අය කිරීමකින් තොරව සති 2ක වීසා කාලයක් ලබා දෙන්න කථා කළා. ජනාධිපති ලේකම්තුමාත්, අපේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්තුමියත්, අපේ සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමාත්, හෝටල් කර්මාන්තයට අදාළ නියෝජිත මහත්වරුන් එක්ක පසුගිය ඉරිදා සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ සාකච්ඡාවේදී හෝටල් කර්මාන්තය තුළ දැනටමත් සිටින අය පිළිබඳ ප්‍රශ්නය මොකක්ද, අපි ඒ අය රැකබලා ගත යුතුද, අපි ඒ ගොල්ලන් ගැන අවධානය යොමු කළ යුතුද කියා සාකච්ඡා කළා. ඒ පිළිබඳ අපි සැලැස්මක් හදලා තිබෙනවා. ලංකාව තුළ සිටින සංචාරකයින් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය වන සැලැස්ම අපි සකස් කර තිබෙනවා.

ඊළඟට, ප්‍රධාන වශයෙන් අපි දන්නවා වරාය පිළිබඳ තත්ත්වය. දැනට අපට ඉල්ලුම් ලැබෙමින් තිබෙනවා, මැද පෙරදිග කලාපයේ ගමනාන්තය දක්වා ආපු සමහර නැව්වලින්. ඔවුන්ගේ containers කොළඹ වරායේ තැන්පත් කිරීම සඳහා අපෙන් අවකාශ ඉල්ලා තිබෙනවා. අපි බලන්න ඕනෑ, අපේ වරායට ඒ ධාරිතාව දරා ගන්න පුළුවන්ද කියලා. ඒ වාගේම, ඒගොල්ලන් ඒවා dump කරන්නේ නැතිව නැවත ගෙන යනවා කියා සහතිකයක් අපට අවශ්‍යයි. දැනට මැද පෙරදිග කලාපයට නැව් යන්නේ නැති නිසා, ඒ containers අපේ කොළඹ වරායේ ස්ථානගත කරන්න පුළුවන්ද කියා සමහර නැව් සමාගම්වලින් අපට ඉල්ලීම් ඇවිල්ලා තිබෙනවා. අපි ඒ ගැන අධ්‍යයනය කරමින් යනවා. මොකද, ඒවා dump කරන්න පටන් ගත්තොත් අපට ලොකු ප්‍රශ්නයක් මතු වෙනවා. ඒගොල්ලන්ට ඒවා ගෙන යෑමේ කාල සටහනක් අපට ඉදිරිපත් කරන්න පුළුවන් නම්, ඒ වෙනුවෙන් අපට කොළඹ වරායේ පහසුකම් සපයන්න පුළුවන්. මොකද, අපි රටක් හැටියට ඒ ගැන කල්පනා කරන්න ඕනෑ. ඒ නැව් සමාගම් කාලයක් අපේ කොළඹ වරායත් එක්ක ගනුදෙනු කරපු සමාගම්. මොකක් හෝ අර්බුදයක් මතු වෙච්ච වෙලාවේ අපට ඒ සමාගම් අත් හරින්න බැහැ. ඒ සමාගම් මුහුණ දෙන ගැටලු පිළිබඳවත් අවධානය යොමු කරමින්, අපේ වරාය තුළ අර්බුදයක් ඇති නොවන ආකාරයෙන් කාර්යක්ෂමව අප කටයුතු කරන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. අපේ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉල්ලීමක් කළා, මැද පෙරදිග කලාපයට අපනයනය කරන්න බලාපොරොත්තු වන ඒවා දැනට කොළඹ වරායට ගෙනෙන්න එපා කියලා. අපි ඒවා එතැන ගොඩ ගසාගෙන ඉන්න එකේ තේරුමක් නැහැ. මොකද, දැනට මැද පෙරදිග කලාපයේ -ගැටුම් තිබෙන කලාපයේ- වරායවල් සක්‍රියව වැඩ කරන්නේ නැහැ.

ඒ නිසා අපි ඈත කුරුණෑගල තිබෙන බඩු තොගයක් ගෙනැල්ලා කොළඹ වරායේ තියාගන්න ඕනෑ නැහැ. ඒ නිසා හොඳම දේ තමයි, ඒ රටවල වරායන් සක්‍රිය වුණාට පස්සේ අපේ අපනයන භාණ්ඩ ටික කොළඹ වරායට ගෙන එන එක. ඒක තමයි වඩාත් හොඳ. කොළඹ වරාය තවත් ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් බවට පත් වෙන්න ඕනෑ නැහැ කියන අදහස අපේ තිබෙනවා. ඒ නිසා වරායේ කාර්යක්ෂමතාව ගැනත් අපි කල්පනා කරමින් තිබෙනවා.

ඒ වාගේම, ගුවන් යානා ගණනාවක් අපේ ගුවන් තොටුපොළවල නතර කර තියන්න ඉල්ලා සිටියා. අපි ඒ සඳහා අවස්ථා ලබා දීලා තිබෙනවා. සමහර ගුවන් මගීන් වෙනත් airlinesවලට සම්බන්ධ කරන්න පුළුවන් ද කියලා අපේ ගුවන් තොටුපොළ සහ අපේ SriLankan Airlines එක සාකච්ඡා කරමින් ඉන්නවා. එම නිසා ඒ ප්‍රශ්නය පිළිබඳවත් අපි අවධානය යොමු කරමින් ඉන්නවා. ඒ නිසා මේ අර්බුදයේදී සෑම දිසාවකින්ම ක්ෂණිකව මතුවිය හැකි දේවල් ගැන කල්පනා කරමින් අපි සැලසුම් හදමින් තිබෙනවා. හැබැයි, දිගුකාලීනව අපට මුහුණ දිය හැකි අර්බුද පිළිබඳවත් මා අවධානය යොමු කරවන්න කැමැතියි. අපේ ප්‍රධාන ආදායම් මාර්ග කිහිපයක් තිබෙනවා, විශේෂයෙන්ම ඩොලර් ලැබීමේදී. අපට ඩොලර් ලැබෙන ප්‍රධාන ආදායම් මාර්ගයක් තමයි විදේශගත ශ්‍රී ලාංකිකයන් එවන විදේශ සංක්‍රාම. පසුගිය අවුරුද්දේ අපට ඩොලර් බිලියන 8.2ක් වාගේ ප්‍රමාණයක් ඔවුන්ගෙන් ලැබුණා. ලංකා ඉතිහාසයේ ඒ මඟින් වැඩිම ආදායම් උපයන්න පුළුවන් වුණු අවුරුද්ද තමයි පසුගිය අවුරුද්ද. ඩොලර් බිලියන 8.2කට ආසන්න ප්‍රමාණයක් විදෙස් සංක්‍රාම අපට ලැබුණා. ඒක අපේ ආර්ථිකයට විශාල පිටිවහලක්. මේ යුද ගැටුම් වර්ධනය වුණොත්, ඒ විදෙස් සංක්‍රාම හරහා අපට ලැබෙන ඩොලර් ප්‍රමාණයට බලපෑමක් ඇති වෙන්න පුළුවන්; අනතුරක් ඇති වෙන්න පුළුවන්.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ඊළඟට, අපේ ප්‍රධානම ආදායම් මාර්ගයක් තමයි, වර්ධනය වෙමින් තිබුණු ආදායම් මාර්ගයක් තමයි සංචාරක කර්මාන්තය. මේ යුද ගැටුම් හේතුවෙන් අපේ රටේ සංචාරක කර්මාන්තයට යම් බලපෑමක් ඇති වෙනවා. විශේෂයෙන්ම අපේ සංචාරක කර්මාන්තයට දායක වන යුරෝපා රටවල් සහ ඒ ආශ්‍රිත රාජ්‍යයන්ගේ වැඩි ප්‍රමාණයක්ගෙන් එන සංචාරකයන්ට transits තිබුණේ Doha, Abu Dhabi සහ Dubaiවලින්. Emirates, Etihad Airways සහ Qatar Airwaysවල transit මධ්‍යස්ථාන බවට ප්‍රධාන වශයෙන්ම පත්වෙලා මේවා තිබුණේ. ඒවා යම් ප්‍රමාණයකට අඩාළ වීම හරහා සංචාරක කර්මාන්තයට බලපෑමක් ඇතිවීමේ අනතුරක් තිබෙනවා. ඒ වාගේම, යුද්ධය විශාල ලෙස වර්ධනය වුණොත් හැම කෙනාටම, හැම රටකටම, සෑම ජන කොටසකටම ආර්ථික පීඩනයක් ඇති වෙනවා. ඒ ආර්ථික පීඩනය විසින් සංචාරය සඳහා කරන වියදම අඩු කරනවා. ඒ කියන්නේ, පළමුව තමන්ගේ ආහාර සපයා ගැනීමට, තමන්ගේ අනෙකුත් අවශ්‍යතා සපයා ගැනීමට තමයි කටයුතු කරන්නේ. ඒවාට පස්සේ තමයි සංචාර කෙරෙහි යොමු වෙන්නේ. ඒ නිසා ලෝකයේ ආර්ථික අර්බුදයක් ඇති වුණොත් ඕනෑම පුරවැසියෙක් පළමුව තමන්ගේ වියදම්වලින් කපා හරින එක තමයි සංචාරය. ඒ නිසා මේ අර්බුදය වර්ධනය වුණොත් සංචාරක කර්මාන්තයට ඇති වන බලපෑමක් තිබෙනවා. ඒ පිළිබඳව අපි අධ්‍යයනය කරමින් ඉන්නවා.

තුන්වැනි කරුණ තමයි විශේෂයෙන්ම අපේ අපනයන වෙළෙඳ පොළ. ඒක ආකාර දෙකකින් සිදු වනවා. පළමුවැනි එක, ඍජුවම යුද්ධ පවතින ක්ෂේත්‍රවලට අපේ අපනයන වෙළෙඳ පොළේ ඇතිවන කඩා වැටීම. දෙක, යුද්ධය නොපැවැත්වුණත් ආර්ථික අර්බුදයක් විසින් අපේ අපනයනවලට ඇති කරන බලපෑම. එවැනි බලපෑම් දෙකක් තිබෙනවා. ඍජුවම යුද්ධය ඇතිවන කලාපවලින් අපේ ආර්ථිකයේ යම් බලපෑමක් ඇති කරනවා. අපේ අපනයන වෙළෙඳ පොළට ඒ බලපෑම ඇති වෙනවා. දෙක, යුද්ධය විසින් ඇති කරන ආර්ථික අර්බුදය විසින් අපනයන වෙළෙඳ පොළට බලපෑමක් ඇති කරනවා. ඒ පිළිබඳවත් අපි අධ්‍යයනය කරමින් ඉන්නවා, මොකක්ද අපට කරන්න පුළුවන් කියලා. ඒ නිසා විශේෂයෙන්ම අපට අපේ ඩොලර් සංචිත පිළිබඳවත්, අපේ විදේශ විනිමය අනුපාතික ආරක්ෂා කර ගන්නේ කොහොමද, ඒවා අඩු වෙන්න ඉඩ නොදෙන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අපි කල්පනා කරමින් යනවා. අපට දිගු කාලීනව මුහුණ දිය හැකි අර්බුදත්, කෙටි කාලීන අර්බුද සමනය කර ගැනීම සඳහා අවශ්‍ය වන වැඩ පිළිවෙළක් එක්ක තමයි අපි මේ වැඩසටහන දියත් කරමින් තිබෙන්නේ. මේවා තමයි අප ගත යුතු ක්‍රියාමාර්ග. ඒ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශ, අපේ නිලධාරින්, ඒ ආයතන බාර අය මා දන්නා තරමින් ඉතාම සක්‍රියව වැඩ කරනවා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ගෑස් සමාගම, විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව ඇතුළු බොහෝ ආයතන ඉතා සක්‍රියව වැඩ කරමින් ඉන්නවා. මම දන්නා හැටියට අදත් විශාල සාකච්ඡාවක් මහ බැංකුව තුළ තිබෙනවා. මේ තත්ත්වය වර්ධනය වන ආකාරය ගැන ඔවුන් සාකච්ඡා කරමින් ඉන්නවා. අපේ සියලු රාජ්‍ය ආයතන මේකට මුහුණදීම සඳහා අවශ්‍ය වන යාන්ත්‍රණය සක්‍රිය කර තිබෙනවා. දේශපාලන අධිකාරිය හැටියට ඒකට නායකත්වය දීම, ඒ සඳහා අවශ්‍ය වන සහාය ලබා දීම තමයි අපේ කාර්යභාරය. අපි ඒ සහාය ලබා දෙමින් තිබෙනවා. අපේ අපේක්ෂාව මේ තත්ත්වය ඉතා කෙටි කාලයකින් සමනය වෙන්න කියන එකයි. ඒක තමයි අපේ ප්‍රාර්ථනාව. අපි සුබදායී දේ අපේක්ෂා කරනවා, නරකම දේට සූදානම් වෙනවා. මේ අනුව තමයි අපි වැඩ කරමින් ඉන්නේ.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Sajith Premadasa, you have 12 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[අ.භා. 12.08]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මැදපෙරදිග ඇති වෙලා තිබෙන යුදමය තත්ත්වය පිළිබඳව ආරම්භයේදීම අපි ප්‍රකාශ කරන්නට ඕනෑ කාරණාවක් තිබෙනවා. ඒ තමයි, ඉරානයට එල්ල වුණු ප්‍රහාරය අපි තරයේ හෙළා දකින බව. ඒක ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි Article 2(4) යටතේ කියා තිබෙන්නේ මොකක්ද? ඒකෙන් කියනවා, ප්‍රහාර එල්ල කිරීම තහනම් කියන එක. එහි Article 2(7) තුළින් කියන්නේ රටක අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගසන්නට බැහැ කියන එක. ඒ වාගේම, ප්‍රහාර එල්ල කරන්න පුළුවන් එකම හේතුව සඳහන් කරලා තිබෙන්නේ Article 51හි. ඒ, තමන්ගේ රටේ ආරක්ෂාව - self-defence - උදෙසා. ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුවක් හැටියට අපි එක හඬින්ම මේ අවස්ථාවේ කියනවා, ඉරානයට එල්ල කරපු ඒ ප්‍රහාරය ස්වෛරී රටකට එල්ල කරපු ප්‍රහාරයක්, එහි ස්වෛරීත්වය, භෞමික අඛණ්ඩතාව උල්ලංඝනය කරපු අවස්ථාවක් කියලා. ඒ නිසා ඒ ප්‍රහාරය අපි තරයේ හෙළා දකින්නට ඕනෑ, පාර්ලිමේන්තුව හැටියට. මම විශ්වාස කරන හැටියට රජයත් ඒ වාගේ ප්‍රකාශයක් නිකුත් කළොත් හොඳයි, මේක හෙළා දැකලා. ඒකට අපි බයවෙන්න හොඳ නැහැ.

ඒ වාගේම, අපි බොහොම පැහැදිලිව කියන්නට ඕනෑ පෙරළා ප්‍රහාර එල්ල වෙලා තිබෙන බව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සෞදි අරාබිය, කුවේට්, කටාර්, බහරේන් යනාදී රටවල් සමූහයකට. ඒ එල්ල කරපු ප්‍රහාරත් අපි හෙළා දකින්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම මේ යුධමය තත්ත්වය තුළ නිර්මාණය වී තිබෙන ව්‍යාකූලත්වය තුළ අපි රටක් හැටියට පිරිසිදු, ශක්තිමත් ස්ථාවරයක සිටිය යුතුයි කියන එක අපි විශ්වාස කරනවා. ඒ නිසා පැහැදිලිවම පාර්ලිමේන්තුවක් හැටියට මම යෝජනා කරනවා, අපි බෙදෙන්න යන්නේ නැතුව මේ ස්ථාවරය අපේ රටේ ස්ථාවරය හැටියට ඉදිරිපත් කිරීම වැදගත් කියන කාරණාව.

ඒ කාරණාවත් සමඟ මම විශේෂයෙන්ම මේ කාරණාවත් කියන්න කැමැතියි. අපේ ජනාධිපතිතුමාත් කිව්වා, "අපි අපි අතර ප්‍රශ්නයක් තිබෙනවා නම් අපට විසඳාගන්න පුළුවන්, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඇහුවාම ඒකට උත්තරයක් ලැබෙනවා" කියලා. ඉතින් ජනාධිපතිතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ බාල ගල් අඟුරු ගැන ප්‍රශ්නයක් අහන්නවත් දෙන්නේ නැහැ නේ. *[බාධා කිරීමක්]* නැහැ. ඒක තමයි ඇත්ත කථාව. හොඳයි, ඔබතුමා මේ සභාවේ ඉන්න එක. මොකද, බාල ගල්

අහුරු ගැන ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඇහුවා. ඒකට උත්තර ලබා දුන්නේ නැහැ. ඒ කෙසේ වෙතත්, ඔබතුමා තෙල් ප්‍රශ්නය ගැන, ගෑස් ප්‍රශ්නය ගැන, ඒ තුළ නිර්මාණය වී තිබෙන අර්බුද ගැන විග්‍රහයක් කළා.

මම ඔබතුමාට පෙන්වා දෙන්න කැමැතියි, ඔබතුමන්ලා බලයට ආපු මොහොතේ ඉඳලා අපි කියපු දෙයක්. ඒ තමයි අපි නැවත වරක් සාකච්ඡා කරලා IMF ගිවිසුම වෙනස් කර ගත යුතුයි කියන කාරණාව. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාගේම ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා, Debt Sustainability Analysis එක වෙනස් කරනවා කියලා. ඒක බොහොම පැහැදිලිව ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා. මම ඔබතුමාට යෝජනා කරනවා, තෙල් පිළිබඳව, ගෑස් පිළිබඳව ඔබතුමන්ලා ඉදිරිපත් කරපු කරුණු කාරණා- *[බාධා කිරීමක්]* සමාවෙන්න, ගරු ජනාධිපතිතුමනි. මම ඔබතුමාට කිසිම බාධාවක් කළේ නැහැ. කරුණාකරලා මට මේ කාරණා ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න. අපි ඇත්තටම උදව්වක් කරන්නයි මේ හදන්නේ. අපිත් සූදානම්, අපේ සහයෝගය ලබාදෙන්න මේ IMF ගිවිසුම වෙනස් කරන්න. ගරු ජනාධිපතිතුමනි, ඒක ඔබතුමා ජනාධිපතිවරණ වේදිකාවේ දීපු පොරොන්දුවක්.

ගරු ජනාධිපතිතුමනි, දැන් මම ඔබතුමාට පෙන්වා දෙන්න කැමැතියි, වර්තමාන තත්ත්වය තුළ 2028 වෙනකොට අපට වසරකට ඇමෙරිකානු ඩොලර් බිලියන 3.5ක්, ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක් ගෙවීමේ ප්‍රශ්නයක් එන බව. ඇත්ත වශයෙන්ම ඒ ප්‍රශ්නය එන්නට පෙර අපි නැවත වරක් IMF ගිවිසුම ගැනත් සාකච්ඡා කරලා, "දිට්වා" සුළි කුණාටුවත් එක්ක වර්තමානයේ නිර්මාණය වී තිබෙන මේ තත්ත්වය ගැන ජාත්‍යන්තර ආධාරක සමුළුවක් කැඳවන්න කියලා අපි ඔබතුමාට යෝජනා කළා. ඒ, රටට උදව් කරන්නයි. අපි කිව්වා, IMF ගිවිසුම වෙනස් කරගන්න කටයුතු කරන්න කියලා. ඒ, රටට උදව් කරන්න, ජනතාවට උදව් කරන්න, ලක්ෂ 220කගේ වර්තමානය සහ අනාගතය සුරක්ෂිත කරන්න. ඔබතුමා කිව්වා නේ, "අනේ, please! එපා" කියලා. ඇත්ත කථාව, "අනේ please!" කියන එක නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ රටේ ජනතාව වෙනුවෙන් අපි අනිවාර්යයෙන් මේ පියවර තබන්නට ඕනෑ. අපි කිසිසේත්ම කියන්නේ නැහැ, IMF රාමුවෙන් පිට පනින්න කියලා. නමුත්, අනිවාර්යයෙන්ම නැවත වරක් මේ ගිවිසුම පිළිබඳව සාකච්ඡා කරලා ඒක ජනතාවාදීව, ජනහිතකාමීව, පොදුජනවාදීව වෙනස් කර ගත යුතුයි කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ගෑස් අර්බුදය, තෙල් අර්බුදය කියන මේවා බරපතළ අර්බුද බව අපි පිළිගන්නවා. මේවාට ලෙහෙසි විසඳුම් නැහැ. හැබැයි, එකක් මතක තියා ගන්න. ඔබතුමන්ලා බලයට පත් වීම තුළ ජනතා විශ්වාසයක් ගොඩ නැඟුවා. ගෑස් ප්‍රශ්නය වේවා, තෙල් ප්‍රශ්නය වේවා, මේ පෝලිම් නිර්මාණය වීම තුළ අද ඒ විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. ඔබතුමන්ලාගේ වගකීමක් තමයි මේ රටේ පෝලිම් නිර්මාණය නොවන්නට කටයුතු කිරීම. මේ ප්‍රශ්නය උද්ගත වූ විගසම රටට කරුණු පැහැදිලි කරන්න තිබුණා. ඒ කරුණු පැහැදිලි කිරීම තුළ ජනතාවගේ විශ්වාසය තහවුරු කර ගන්න තිබුණා. ජනතාවගේ විශ්වාසය තහවුරු වුණා නම්, මේ පෝලිම් නිර්මාණය වෙන්නේ නැහැ. සත්‍යය අවබෝධ කරගෙන, "ඔව්, මේක බරපතළ අර්බුදයක්. මේ බරපතළ අර්බුදයට මුහුණ දීමට මෙච්චර කාලයකට ඩීසල් තිබෙනවා, පෙට්‍රල් තිබෙනවා" කියලා ඒ විශ්වාසය තහවුරු කිරීම මත මේ පෝලිම් නිර්මාණය වෙන්නේ නැහැ. ඒ නිසා, මේ කාරණාව තුළ අපි ඇත්ත වශයෙන්ම දකින්නේ රජය කෙරෙහි තිබූ ජනතා විශ්වාසය බිඳ වැටීමක් සිදු වෙලා තිබෙන බවයි.

ඊළඟට, ආපු දවසේ ඉඳලාම අපි කිව්වා, අනිවාර්යයෙන්ම reciprocal tariff ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් වෙනවා කියන එක. දැන් ඔබතුමා කියනවා, ඒක ප්‍රශ්නයක් නොවෙයි කියලා. ඔව්, ඇමෙරිකා එක්සත් ජනපදයේ ශ්‍රේෂ්ඨාධිකරණය යම්කිසි තීන්දුවක් දුන්නා. ඒ දුන් ප්‍රතිචාරක තීරුබදු තහනම් කරලා, දැන් යම් ප්‍රමාණයකට; ප්‍රතිශතාත්මක ප්‍රමාණයකට ආපසු පනවා තිබෙනවා. ඒ නිසා මේ තීන්දු තීරණ ගැනීමේදී ජාත්‍යන්තරයේ සිදුවෙන දේවල් පිළිබඳව මීට වැඩිය අවබෝධයක් ඇති කර ගන්නට ඕනෑ.

මම මේ අවස්ථාවේ යෝජනා කරනවා, හදිසි අවස්ථාවන්වලට මුහුණදීම පිළිබඳව සැලසුම් සකස් කිරීම - contingency planning; scenario planning - වැදගත් බව. මොකද, අපි ඉන්නේ අවිනිශ්චිත ලෝකයක. මේ ලෝකය තුළ බරපතළ අර්බුද නිර්මාණය වෙනවා. එසේ අර්බුද නිර්මාණය වෙනකොට ඒ ඒ අර්බුදවලට අපි මුහුණ දෙන්නේ කොහොමද? අපි ප්‍රතිපත්තිමය වශයෙන් කටයුතු කරන්නේ කොහොමද? තෙල් අවශ්‍යතාව වේවා, ගෑස් අවශ්‍යතාවය වේවා, ඒ සම්බන්ධයෙන් අපට තිබෙන විකල්ප ක්‍රියාමාර්ග මොනවාද? Strait of Hormuzහි තත්ත්වය ඇත්ත වශයෙන්ම ලෝකයේ තෙල් සැපයීම්වලින් සියයට 20කට බලපානවා. බැරි වෙලාවත් Strait of Hormuzවල මේ තියෙන තත්ත්වය තවත් බරපතළ ලෙස නිර්මාණය වුණොත්, අපට තිබෙන විකල්ප ක්‍රියාමාර්ග මොනවාද? ඒ නිසා ලෝකයේ තිබෙන අවිනිශ්චිත තත්ත්වවලදී ඒවාට මුහුණ දෙන ආකාරය පිළිබඳව රජයක් හැටියට ඔබ මීට වැඩිය විධිමත්ව, ශක්තිමත්ව සැලසුම් සකස් කිරීම වැදගත් කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි. ඒ වාගේම මේ අවස්ථාවේ මම කියන්න කැමැතියි, අපේ රටේ දුප්පත්කම එන්න එන්නම වර්ධනය වෙන බව, නැතිබැරිකම එන්න එන්නම වර්ධනය වෙන බව. නැතිබැරිකම "දිට්වා" සුළි කුණාටුව නිසා තවත් වේගවත් වුණා. ඒ වාගේම වර්තමානයේ නිර්මාණය වී තිබෙන තත්ත්වයන් තුළ දුප්පත්කම ව්‍යාප්ත වෙනවා; ප්‍රසාරණය වෙනවා. මේ රටේ ජන ජීවිතය අඩාළ වෙනවා.

මම යම් කාරණයක් ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ඔබතුමා පොඩ්ඩක් මේ ගැන හොයලා බලන්න. පසුගිය දවසක ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියලා තිබෙනවා, එක පුද්ගලයෙකුට මාසයක් ජීවත් වෙන්න රුපියල් 16,000ක්, රුපියල් 18,000ක් ඇති ලු. පොඩ්ඩක් හිතලා බලන්න, ආහාර වියදම් සහ ආහාර නොවන වියදම් ගැන. මේ සංඛ්‍යාලේඛනය විශ්වාස කරන කවුරු හරි දැන් මේ සභාවේ ඉන්නවාද? එක පුද්ගලයෙකුට මාසයක් ජීවත් වෙන්නට රුපියල් 16,000ක්, රුපියල් 18,000ක් ඇති කියනවා. මම ඒ ගණන් දෙකක් කිව්වේ, ග්‍රාමීය සහ නාගරික වශයෙන්. එක පුද්ගලයෙකුට රුපියල් 16,000කින් ජීවත් වෙන්න පුළුවන්ද? රුපියල්18,000කින් ජීවත් වෙන්න පුළුවන්ද? මේ, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන දත්ත. කිසිසේත්ම බැහැ නේ. ඒක ජනාධිපතිතුමාත් පිළිගන්නවා නේ. අපි බොරු, වැරැදි දත්ත මතයි යන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, you have only two more minutes left of your time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I will take some more time. I have the discretion to do so.

මේ යන්නේ වැරැදි දත්ත මත. මේ, මගේ සංඛ්‍යාලේඛන නොවෙයි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සංඛ්‍යාලේඛන. එක පුද්ගලයෙකුට රුපියල් 16,000කින්, රුපියල් 18,000කින් මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියන එක පදනම් කරගෙන රාජ්‍ය ප්‍රතිපත්තිය නිර්මාණය වෙනවා නම් එතැන බරපතළ විෂමතාවක්, ඌනතාවක්, රාජ්‍ය ප්‍රතිපත්තිවල දුර්වලතාවක් තිබෙනවා කියන එක මේ අවස්ථාවේ අපට කියන්න සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම මේ අවස්ථාවේ අපට අමතක කරන්නට බැරි කොට්ඨාසයක් ඉන්නවා. ඒ තමයි, අපේ රටවිරුවන්. විදේශීය රටවල ඉන්න දස ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් වූ අපේ රටවිරුවන්; අපේ ශ්‍රමික ප්‍රජාව අපේ රටට ඉමහත් සේවාවක් කරනවා. ඇත්ත වශයෙන්ම අපේ රටට දුවන්න හුස්මක් දෙන්නේ ඒ අයයි. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය, සෘජු විදේශ ආයෝජන, අපනයන ක්ෂේත්‍රය ගත්තොත්, ඒ අයත් අපට දැවැන්ත ශක්තියක්. නමුත්, විදේශ ප්‍රේෂණ - foreign remittances - ලබා දෙන අපේ රටවිරුවන් දස ලක්ෂයක් මැද පෙරදිග බල ප්‍රදේශවල ඉන්නවා, United Arab Emiratesහි 350,000ක්, සෞදි අරාබියේ 246,000ක්, කුවේට්වල 175,000ක්, කටාර්වල 140,000ක්, ජෝර්දානයේ 14,500ක්, ඕමාන්වල 32,000ක්, බහරේන්වල 13,130ක්, ඊශ්‍රායල්වල 30,000ක්, ලෙබනන්වල 7,000ක් යනාදී වශයෙන්. සංඛ්‍යාලේඛන අනුව තවත් රටවල් කිහිපයක, ඒ කියන්නේ ඉරානයේ 35ක්, සිරියාවල 20ක්, යේමනයේ 27ක්, පලස්තීනයේ 4ක් කියලා තමයි අපට දැනගන්නට ලැබී තිබෙන්නේ. කොහොම හරි විදේශ රටවල, විශේෂයෙන්ම මැද පෙරදිග ප්‍රදේශවල සේවය කරන අපේ රටේ ශ්‍රමික ප්‍රජාව දස ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. මේ අයගේ ආරක්ෂාව වෙනුවෙන් විධිමත් වැඩසටහනක් අවශ්‍යයි; ශක්තිමත් වැඩසටහනක් අවශ්‍යයි; විකල්ප වැඩසටහන් අවශ්‍යයි. විශේෂයෙන්ම තානාපති කාර්යාල හරහා රජය මැදිහත් වෙලා -තිබෙන විශේෂිත වූ සබඳතාවන් සහ ව්‍යුහයන් හරහා- විදේශ ශ්‍රමිකයන්, මැද පෙරදිග ශ්‍රමිකයන් දස ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් රැක ගන්නට, ආරක්ෂා කරන්නට කටයුතු කරන්න ඕනෑ කියන එක මම මේ අවස්ථාවේ ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ජනාධිපතිතුමා සඳහන් කළා, සංචාරක ක්ෂේත්‍රයේ වැදගත්කම පිළිබඳව. මම පිළිගන්නවා, සංචාරක ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නට ඕනෑ, අපනයන ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නට ඕනෑ කියලා. ඒ වාගේම ඔබතුමාට අමතක වුණු දෙයක් තිබෙනවා. ඒ තමයි, සෘජු විදේශ ආයෝජන - foreign direct investments. අපි මේ අවස්ථාවේ ඔබතුමාට යෝජනාවක් කරනවා. මැද පෙරදිග යුද්මය තත්ත්වය ඛේදවාචකයක්. ඒ තත්ත්වය නිසා අහිංසක ජීවිත නැති වෙලා තිබෙනවා; ජන ජීවිත විනාශ වෙලා තිබෙනවා. එවන් තත්ත්වයක් තුළ මේක ධනාත්මක අවස්ථාවක් - positive opportunity එකක් - හැටියට උපයෝගී කරගෙන අපේ රට පිළිබඳව විශ්වාසනීයත්වය ගොඩ නඟලා, අපේ රටට සෘජු විදේශ ආයෝජන ගෙන්වන්න යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ඒ සඳහා අපේ සහයෝගයත් ලබා දෙන්න අපි සූදානම්.

ඔබතුමා මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා මම නැවත නැවතත් කියනවා, ජාත්‍යන්තර ආධාරක සමුළුවක වැදගත්කම සහ අවශ්‍යතාව ගැන. මේ රටේ ලක්ෂ 220ක් වූ ජනතාව ගැන හිතලා, "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු ඒ වින්දිතයින් ගැන හිතලා, රට ගැන හිතලා කරුණාකරලා ජාත්‍යන්තර ආධාරක සමුළුව කැඳවන්න. මම දන්නේ නැහැ, මේ යුද්මය තත්ත්වය තුළ දැන් එය කොයි තරම් දුරට සාර්ථක වෙයිද කියලා. ඇත්ත වශයෙන්ම මේ පියවර ගන්න රජය ප්‍රමාද වුණා. එම සමුළුව කැඳවා තිබුණා නම්, "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වුණු හානිය තුළ ජාත්‍යන්තරයේ අනුකම්පාව, ආදරය, දයාව, කරුණාව අපේ රටට ලබා ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. එය අහිමි වුණු අවස්ථාවක්, missed opportunity එකක්. ඒ අවස්ථාව අපේ රටේ ජනතාවට මේ රජය අහිමි කළා. ඒ නිසා මම ඉතාම වැදගත් දෙයක් ඔබතුමන්ලාට කියන්න කැමැතියි. මේ ඇත්වී තිබෙන යුද්මය ඛේදවාචකය තුළ අපේ රටත්, අපේ රටේ ජනතාවත් මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳව විශේෂ සාකච්ඡාවක් කිරීම වැදගත් කියලා මම හිතනවා. ජනාධිපතිතුමාගේ පක්ෂ, විපක්ෂ භේදයෙන් තොර කැඳවීම තුළ, අපි හැමෝම එකතු වෙලා මේ ඇති වී තිබෙන හදිසි තත්ත්වයට අපේ රට මුහුණ දෙන්නේ කොහොමද, මේ නිසා අපේ රට තුළ ඇති වන ප්‍රශ්නවලට අපි විසඳුම් ලබා දෙන්නේ කොහොමද යන්න පිළිබඳව සාකච්ඡා කරමු. මේක එක පාර්ශ්වයකට පමණක් සීමා කරන්නේ නැතිව පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව අපි සියලු දෙනා එකට එකතු වෙලා විසඳුම් හොයන්නට කටයුතු කරමු. මොකද, මතක තබා ගන්න, අපිත් මේ රටට ආදරෙයි කියන එක. අපිත් මේ රටේ ලක්ෂ 220ක් වන ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් පෙනී සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ තත්ත්වය තුළ සිදුවන සාකච්ඡා සම්බන්ධයෙන් අපේ ජනාධිපතිතුමා පොඩ්ඩක් මැදිහත් වුණොත් හොඳයි. මොකද, අද පක්ෂ නායක රැස්වීමක් තිබෙනවා. විශේෂයෙන්ම මේ උද්ගත වෙලා තිබෙන ජාත්‍යන්තර යුද්මය තත්ත්වය තුළ, මේ නිර්මාණය වෙලා තිබෙන හදිසි තත්ත්වය තුළ කරුණාකරලා අපිට දින දෙකක විවාදයක් ලබා දෙන්න. ඒක යෝග්‍යයි කියලා මම හිතනවා. ඒ වාගේම මම ඉල්ලීමක් කරනවා. සියලු නායකයින්, සියලු සාමාජිකයින් කැඳවලා මේ උද්ගත වෙලා තිබෙන ප්‍රශ්නයට මුහුණ දෙන ආකාරය පිළිබඳව අපි හැමෝම එකතුවෙලා සාකච්ඡා කරමු. අපි විසඳුම් හොයමු, ප්‍රතිඵල කේන්ද්‍රීය වැඩ පිළිවෙළකට අපි යොමු වෙමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉරානයට එල්ල කරපු මිලේච්ඡ ප්‍රහාරය වැරදියි කියලා කියන්න සමඟි ජන බලවේගයේ සමඟි ජන සන්ධානය කිසිසේත්ම පැකිළෙන්නේ නැහැ කියන එක මම නැවත වරක් කියනවා. ඒක වැරදියි. අපි ඒක තරයේ හෙළා දකිනවා. ඒක, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය උල්ලංඝනය කිරීමක්. එහි 2 (iv), 2(vii) වගන්තිවලට අනුව තවත් රටකට ප්‍රහාර එල්ල කරන්නට කිසිසේත්ම හැකියාවක් නැහැ.

ඒ වාගේම එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සෞදි අරාබිය, කුවේට්, කටාර්, බහරේන්, අබුඩාබි වැනි රටවලට එල්ල කරපු ප්‍රහාරත් අපි තරයේ හෙළා දකින බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Wijesiri Basnayake. You have ten minutes.

[අ.භා. 1.00]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි විවාදයට භාජන කරනු ලබන්නේ 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියමය පිළිබඳවයි. මේ 2017 අංක 12 දරන විදේශ විනිමය පනත නිර්මාණය වෙන්නේ 1953 අංක 27 දරන විනිමය පාලන පනත අහෝසි කරලා. මේ පනතේ මූලික වශයෙන්ම ප්‍රධාන අරමුණු කිහිපයක් තිබෙනවා. ඒ අරමුණු තමයි, විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම පිණිස අවශ්‍ය විධිවිධාන සැලැස්වීම වාගේම විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ වගකීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාල පරිච්ඡේදයේ විශේෂයෙන්ම මේ රට තුළ විදේශ විනිමය සංචිත හිඟයක් උද්ගත වෙලා තිබුණු බව අපි දකිනවා. විශේෂයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ සමඟ බලන විට විවිධ අවස්ථාවල දී රටේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු වෙලා තිබුණේ නැහැ. මෙන්න, මේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා රටින් පිටට යන විදේශ විනිමය සීමා කිරීමට විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබුවා.

විශේෂයෙන්ම 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22වන වගන්තිය යටතේ පනවන ලද නව නියමය අනුමත කිරීම පිළිබඳවයි අද දවසේ අපි සාකච්ඡා කරන්නේ. ඒ, ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේයි. මෙය, මේ රට තුළ ආර්ථික ස්ථාවරභාවයක් නිර්මාණය වෙලා, ක්‍රමයෙන් වර්ධනය වෙමින් ඉදිරියට යන මොහොතක්. විශේෂයෙන්ම විදේශ විනිමය වෙළෙඳ පොළ තුළ පවතින වැඩිදියුණු කිරීමේ තත්ත්වය අපේ රටේ ව්‍යාපාරවලට අවශ්‍යයි. විවිධ ආයෝජන කරන්න, රටින් බැහැරව විදේශ ආයෝජන කරන්න වාගේම ඒවා ව්‍යාප්ත කරන්න අවශ්‍යයි. මේ සඳහා ප්‍රමුඛතාව ලබා දීලා, අවශ්‍ය ලිහිල් කිරීම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව තමයි අපි මේ නියමය හරහා සාකච්ඡා කරන්නේ. ඒ අනුව විදේශ විනිමය උපයන පිරිස්, විශේෂයෙන්ම අපනයන සමාගම් - corporates - විදේශ රටවලට තමන්ගේ ව්‍යාපාර පුළුල් කර ගැනීමට - business expansion සඳහා - තිබෙන අවශ්‍යතාව සඳහා පහසුතාවක් අපි ඇති කර ගන්න ඕනෑ. එතැනදී ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා ප්‍රාග්ධන ගනුදෙනු සඳහා කරන ගෙවීම් සිදු කිරීමට පවතින සීමා අපි ලිහිල් කරනවා. විශේෂයෙන්ම ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 2 සිට ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 5 දක්වා තිබෙන සීමාව ඉහළ නංවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා රුපියල්වලින් අරමුදල් සපයන ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් - Outward Investment Accounts - හරහා නේවාසික - resident - තනි පුද්ගලයෙකු විසින් සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු දීර්ඝ කාලයක් තිස්සේ අත්හිටුවා තිබුණේ. ඒ සඳහාත් තිබෙන සීමා ලිහිල් කරන්න ඕනෑ. මෙවැනි කාර්යයන් සඳහා පුද්ගලයන්ට විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලදී, විශේෂයෙන්ම Personal Foreign Currency Accounts හරහා තමා සතුව පවතින විදේශ ව්‍යවහාර මුදල් භාවිත කිරීමේදී ඇමෙරිකානු ඩොලර් 22,000ක සීමාවක් පනවා තිබුණා. එය ඇමෙරිකානු ඩොලර් 25,000 දක්වා පුළුල් කිරීම අනුමත කිරීමටයි අපි මේ සාකච්ඡා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට ආර්ථික වශයෙන් ස්ථාවර වෙලා, ඒ ස්ථාවරත්වයේ සිට අපි දැන් වර්ධනයක් කරා ගමන් කරනවාය කියන එක බොහොම පැහැදිලියි. මෙතැනදී රටක ආර්ථිකය බොහොම වැදගත්. රටක ආර්ථිකය ගත්තොත් එහි විචල්‍යයන් කිහිපයක් තිබෙනවා. එය, රටේ දේශපාලන ස්ථාවරතාව, ආර්ථික ස්ථාවරතාව සහ සමාජයීය ස්ථාවරතාව යන විචල්‍යය කිහිපයක එකතුවක්. විශේෂයෙන්ම 2025 වර්ෂය තුළ අපේ ආණ්ඩුව මුදල් කළමනාකරණය මනා ලෙස සිදු කිරීම හරහාත්, ඒ වාගේම වංචාවට, දූෂණයට තිත තැබීම - zero tolerance for corruption - හරහාත්, කෙසෙල් කැන කපපු මනුස්සයාගේ ඉඳලා රටේ ජනාධිපති දක්වා සැමට එක ලෙස රටේ නීතිය ක්‍රියාත්මක කළා. ඒ හරහා මේ රටේ ස්ථාවරභාවය, ආර්ථික කළමනාකරණය ඉහළ ගිහිල්ලා තිබෙනවා. පසුගිය වසර තුළ විශේෂයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, ශ්‍රී ලංකා රේගුවට සහ සුරාබදු දෙපාර්තමේන්තුවට ලබා දුන් ඉලක්ක ඔවුන් සියයට සියයක්ම අත්පත් කර ගත්තා. ඒ හරහා මේ රට තුළ මුදල් කළමනාකරණය, ආර්ථික කළමනාකරණය ඉතා මනා ලෙස සිද්ධ වුණා. ඒ හරහා අපට පුළුවන් වුණා, ට්‍රිලියන ගණනක විශාල මුදලක් එකතු කර ගන්න.

ඒ මුදල අපි පාවිච්චි කරනවා, සොබාදහමෙන් ඇති වුණු "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් ආදරණීය ජනතාවට සහන සලසන්න. අපි එක ශතයක්වත් ණයට ගන්නේ නැතුව රුපියල් බිලියන 500ක් ඒ වෙනුවෙන් වෙන් කරනවා. ඒ මොහොතේදී මේ රටේ විපක්ෂය යෝජනා කළේ 2026 අය වැය වෙනස් කරන්න අලුත් යෝජනාවක් ගෙනෙන්න කියායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් අපි විචක්ෂණ ලෙස මේ රටේ ආර්ථික කළමනාකරණය සිදු කිරීම නිසා අපට පැහැදිලි ලෙසම හැකි වුණා, ආපදාවට පත් වුණු ජනතාවට අවශ්‍ය මුදල් ලබා දෙන්න. ඒ විතරක් නොවෙයි, මේ වෙනකොට මේ රටේ විශාල දියුණුවක්, ප්‍රගතියක් නිර්මාණය වෙලා තිබෙනවාය කියන එක අපි දන්නවා. අපි 2025දීත් මේ රටේ මහජනතාව වෙනුවෙන් විශාල ප්‍රාග්ධන වියදමක් කළා. මේ රටේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහාත්, සෞඛ්‍ය, මහාමාර්ග, වාරිමාර්ග, කර්මාන්ත, ව්‍යවසායකත්වය සහ වෙළෙඳාම වර්ධනය කිරීම සඳහාත් අපි ට්‍රිලියන 1.4ක මුදලක් වෙන් කළා. ඒ වාගේම මේ වසරේදීත් එවැනිම විශාල මුදලක් ප්‍රාග්ධන වියදම් විධියට අපි වෙන් කර තිබෙනවා. 2025දී අපට හැකි වුණා, ආදායම් කළමනාකරණය මනා ලෙස සිදු කරන්න. අපි හරියටම ඒ වියදම් කළමනාකරණය කළා. ඒ වාගේම යහපත් වූ ආණ්ඩුකරණයක් - good governance - අපි හරියටම කළා.

එහි ප්‍රතිඵලයක් විධියට 2025 පළමුවැනි කාර්තුවේදී මේ රටේ ආර්ථිකය සියයට 4.8කින් වර්ධනය වුණා. දෙවැනි කාර්තුවේදී සියයට 4.9කින් ආර්ථිකය වර්ධනය වුණා. අපි දන්නවා, තුන්වැනි කාර්තුවේදීත් සියයට 5කට ආසන්නව ආර්ථිකය වර්ධනය වුණාය කියන එක. අපි දක්ෂ ලෙස ආර්ථික වර්ධන වේගය පවත්වා ගෙන යනවා. පොඩියට තිබෙන අපේ රටේ ආර්ථිකය ඩොලර් බිලියන 100 සිට ඩොලර් බිලියන 200 දක්වා ගෙනෙන්න අපට අවශ්‍යයි. නමුත්, මේ මොහොතේ තිබෙන ගැටලුව වෙන්නේ ඩොලර් බිලියන 100 ඉඳලා ඩොලර් බිලියන 200ක ආර්ථිකයක් දක්වා ගෙනෙන්න කොච්චර කාලයක් ගත වෙයිද කියන එකයි. අන්න, ඒ ගනුදෙනුව තමයි අපට විපක්ෂයත් එක්ක කර ගන්න ඕනෑ. එහෙම නම්, මේ මොහොතේදී අපි මේ රටේ ආර්ථිකය මනා ලෙස කළමනාකරණය කළ යුතුයි. පසුගිය කාලයේ මේ රටේ පොලී අනුපාතය සියයට 30 සීමාවේ තිබෙනවා අපි දැක්කා. අපි ඒක තනි ඉලක්කමකට ගෙනාවා. විශේෂයෙන්ම මේ රටේ කර්මාන්තකරුවන්ට අපි අවශ්‍ය ණය සහන දුන්නා. මේ රටේ උද්ධමනය සියයට 2-5ත් අතර පරාසයකට ගෙනැල්ලා, අපි මනා ලෙස එය කළමනාකරණය කරනවා. මෙන්න මේ විධියට අපි මේ රටේ ආර්ථික ස්ථාවරත්වයක් ඇති කර කර්මාන්තකරුවන්ට, ව්‍යවසායකයන්ට තමන්ගේ ආයෝජන කිරීම සඳහා අවශ්‍ය මුදල් සම්පාදනය කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය මේ මොහොතේදීත් මොකක්ද කරන්නේ? තෙල් අර්බුදය හමුවේ

[ගරු විජේසිරි බස්නායක මහතා]

ඔවුන් මොකක්ද කරන්නේ? තල් අත්තට බෙලි ගෙඩියක් වැටුණා වාගේ වැඩක් තමයි ඔවුන් කරන්නේ. හැබැයි, එහෙම කරලා මේ රටේ ආදරණීය ජනතාව වෙනස් කරන්න බැහැ; ඔවුන්ව කලබල කරන්න බැහැ. අපි මේ රටේ මහජනතාවගෙන් ඉල්ලා සිටින්නේ මේ මොහොතේදී ජාතික ජන බලවේගය රජය ඉදිරිපත් කරන, ක්‍රියාත්මක කරන, අධීක්ෂණය කරන ආර්ථික වැඩ පිළිවෙළ සාර්ථකත්වයට පත් කරමු කියායි. මේ රටේ ජනතාවට අවශ්‍යා සුභසාධනය, පහසුව සහ ජීවන තත්ත්වය අපි පොරොන්දු වූ පරිදි වර්ධනය කරනවා කියන සහතිකය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Mujibur Rahuman. You have 11 minutes.

[අ.භා. 1.10]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

විශේෂයෙන්ම විදේශ විනිමය පනත යටතේ නියමය සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ලෝකයේ අපි සියලුදෙනාම අද වනකොට ඉතා අවදානම් තත්ත්වයකට පත්ව සිටිනවා. විශේෂයෙන්ම ලෝක බලවතුන් විසින් ඉරානය මුල් කරගෙන ප්‍රහාර එල්ල කරන්න, ඉරානය සම්පූර්ණයෙන්ම විනාශ කරන්න කටයුතු කරනවා. තමන්ගේ ආධිපත්‍යය තහවුරු කර ගන්න ට්‍රම්ප් පරිපාලනයත්, ඒ වාගේම ඊශ්‍රායලයේ නෙතනියාහු පරිපාලනයත් එකතු වෙලා මුළු මැද පෙරදිගම අද යුද කලාපයක් බවට පත් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ හේතුවෙන් අද වනකොට මුළු ලෝකයම භීතියට පත් වෙලා තිබෙනවා. රටක් හැටියට අපිට ඒක ආර්ථික වශයෙනුත්, අපේ රටේ ඉදිරි ගමනටත් බලපානවා. මොකද, ලක්ෂ 10කට ආසන්න ප්‍රමාණයක් මැද පෙරදිග රැකියා කරනවා. ඊළඟට, තෙල් සම්පත පිළිබඳ ගැටලු මතු වෙලා තිබෙනවා, ගෑස් පිළිබඳ ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. ඒ නිසා අපේ රටේ ආර්ථිකයටත් සෘජුව ඒක බලපානවා. ඒ බලපානවත් එක්කම රටක් හැටියට අපේ විදේශ ප්‍රතිපත්තිය ගැනත්, මේ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග ගැනත් ලෝකය බලාගෙන ඉන්නවා.

අද උදේ ජනාධිපතිතුමා ඇවිල්ලා මේ විවාදය පටන් ගත්තා. ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා විවාදය පටන් ගන්න කොට මම හිතුවා, "ඉරානයට පහර දීම වැරදියි, ඉරානයේ හිටපු ආධ්‍යාත්මික නායකයා ඝාතනය කිරීම වැරදියි" කියලා යෝජනාවක් ගෙනැල්ලා, ඒක අපි සියලුදෙනාම ඒකමතිකව සම්මත කරලා ලෝකයට යම් පණිවුඩයක් දෙන්න රටේ ජනාධිපතිවරයා හැටියට එතුමා කටයුතු කරයි කියා. නමුත්, කනගාටුයි ජනාධිපතිතුමා ඒ ගැන කථා කළේ නැහැ. ජනාධිපතිතුමා ඒක මඟ හැරලා ඇමතිවරු කියන්න ඕනෑ ටික කිව්වා. බලශක්ති ඇමතිතුමාගේ කථාව තමයි ජනාධිපතිතුමා කළේ. ඊළඟට, වෙළෙඳ ඇමතිතුමා කියනන ඕනෑ ටික ජනාධිපතිතුමා කිව්වා. විදේශ ඇමතිතුමා කියන්න ඕනෑ ටික ජනාධිපතිතුමා කිව්වා. මේ ඔක්කොම දිහා බලනකොට ජනාධිපතිතුමා මෙතැන කථා කළේ ඇමතිවරු මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා විග්‍රහ කරන්න ඕනෑ දේවල්. තෙල් තිබෙනවාද නැද්ද, කොච්චර තෙල් තිබෙනවාද, තෙල් ටැංකිවල තිබෙන ප්‍රමාණය කොච්චරද, නැව් කීයක් එනවාද කියන්න ජනාධිපතිතුමා ඕනෑ නැහැ. අර ටැංකියට බැස්ස ඇමතිතුමාට ඕක කියන්න පුළුවන්. එතුමා ඉන්නේ ඒක කරන්න නේ. ජනාධිපතිතුමාට කොච්චර වැඩ තිබෙනවාද? ලෝකයේ යුද්ධයක් ඇති වෙලා, ඒ යුද්ධය වෙනුවෙන් එතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ. ඒ වාගේ බරපතළ කාරණා තිබෙනවා, ජනාධිපතිතුමාට කරන්න. ඇමතිවරුන් කියන්න ඕනෑ ටික ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කියනවා නම් ඇමතිවරුන්ගෙන් වැඩකුත් නැහැ. ඒකෙන් පෙනෙන්නේ ඇමතිවරු කාර්යක්ෂම නැහැ, අසාර්ථකයි කියන එක. ඒ කියන්නේ ජනාධිපතිතුමාට ඇමතිවරු ගැන විශ්වාසයක් නැහැ. මොනවාද කරන්නේ එහෙනම්? ඒක නේ ජනාධිපතිතුමාට ඇවිල්ලා හෝදන්න වෙලා තිබෙන්නේ.

එක අතකින් බලනකොට ජනාධිපතිතුමා පව්! අධ්‍යාපනය වෙනුවෙනුත් එතුමා ඇවිල්ලා කථා කරන්න ඕනෑ, වෙන මොනා හරි ප්‍රශ්නයක් ඇති වුණොත් එතුමා ඇවිල්ලා කථා කරන්න ඕනෑ. ඇමතිවරු ටික ඔක්කොම ඉස්සරහ පේළියේ වාඩි වෙලා ලස්සනට ඉන්නවා. ජනාධිපතිතුමා මූහුණ කළු කරගෙන ඇවිල්ලා ඔක්කොම කියලා යනවා. නමුත්, එතුමා ඉතාම කපටි ලෙස, අවස්ථාවාදී ලෙස එතුමාගේ දේශපාලන ව්‍යාපාරය, ජනතා විමුක්ති පෙරමුණ පසුගිය කාලයම දරපු මතය -විපක්ෂයේ ඉන්නකොට ඇමෙරිකාව පිළිබඳව, ඊශ්‍රායලය පිළිබඳව දරපු මතය- අද හෙළිදරව් කළේ නැහැ. ඒ බලගතු රටවල් අනෙකුත් රටවල්වලට කරන හානිය සම්බන්ධව අපි දැක තිබෙනවා. හැම දාම ඇමෙරිකානු තානාපති කාර්යාලය ඉස්සරහට ගිහිල්ලා උද්ඝෝෂණය කළ ආකාරය අපි දැක තිබෙනවා. ඉරානයට නොවෙයි, වෙනිසියුලාවට ගහපු වෙලාවෙත් ගිහිල්ලා උද්ඝෝෂණය කළා. එහෙම ඉතිහාසයක් තිබ්බා. අද ඒ රැඩිකල්භාවය කෝ? ඒ රැඩිකල්භාවය ජූලි චන්ග් අරගෙන ගියාද දන්නේ නැහැ. එක්කෝ ඒක ජූලි චන්ග්ට විකුණුවා ද දන්නේ නැහැ. අද එතුමා ඒ ගැන කථා කළේ නැහැ.

අද ඇමෙරිකාවේ කොංග්‍රසය මේක හෙළා දැක තිබෙනවා. ඒ කොංග්‍රසය කියනවා, මේක නීති විරෝධියි කියලා. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව කියනවා, මේක නීති විරෝධියි කියලා. අද ලෝකය පුරාම ජනතාව පාරට ඇවිල්ලා තිබෙනවා, මේ තිබෙන ආක්‍රමණයට විරුද්ධව. සමහර රටවල් - ස්පාඤ්ඤය වාගේ රටවල් - අද වනකොට ඇමෙරිකානුවන්ට ඉඩ දෙන්නේ නැහැ, ප්‍රහාර එල්ල කරන්න. තමන්ගේ රටවල් පාවිච්චි කරන්න එපා කියලා තිබෙනවා. එහෙම තිබෙද්දී ජනතා විමුක්ති පෙරමුණ වාගේ අධිරාජ්‍යවාදයට විරුද්ධව මේ රටේ ගොඩ නඟපු දේශපාලන ව්‍යාපාරයක් බලයට ඇවිල්ලාත් ඒ ගැන කථා නොකර හෙමින් මාරු වෙලා ගියේ ඇයි කියලා අද අපට හිතා ගන්න බැහැ. ඇයි හෙළා දැක්කේ නැත්තේ? ඇයි, ඉරානයේ ආධ්‍යාත්මික නායකයාව මරා දැම්මාම ඒක හෙළා දකින්න බැරි? අපි දැක්කා, නලින්ද ජයතිස්ස මාධ්‍ය ප්‍රකාශකතුමා එදා මාධ්‍ය සාකච්ඡාවේදී කිව්වා, ශෝකය පළ කරනවා කියලා. ශෝකය පළ කරන්න ඒ ආධ්‍යාත්මික නායකතුමා පපුවේ අමාරුව හැදිලා නොවෙයි මැරුණේ. පපුවේ අමාරුව හැදිලා මැරුණා නම් ශෝකය පළ කරන්න පුළුවන්. ඇමෙරිකාව සහ ඊශ්‍රායලය එල්ල කරන ලද බෝම්බ ප්‍රහාරවලින් එතුමා මැරුණේ. ඒක හෙළා දකින්න තරම් ආත්ම ශක්තියක් අද තමුන්නාන්සේලාට නැහැ.

නමුත්, මතක තබා ගන්න, මේ වාගේ අවස්ථාවලදී තීන්දු ගත් නායකයෝ මේ රටේ හිටපු බව. පලස්තීනය සම්බන්ධව ප්‍රශ්නය ආවාම එදා හිටපු රණසිංහ ප්‍රේමදාස මැතිතුමා Israeli Interest Section එක වහලා දැම්මා. මේ රටෙන් යන්න කියලා කිව්වා. නොබැඳි විදේශ ප්‍රතිපත්තියක යන, කොන්ද පණ තිබෙන එවැනි

නායකයෝ සිටියා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් එවැනි නායිකාවක්. එවැනි නායකයෝ සිටියා. අපේ රට හැමදාම නොබැඳි විදේශ ප්‍රතිපත්තියක සිටියේ. අපි හිතුවා, ඔබතුමන්ලා වගේ අය බලය ගත්තාම ඒ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය කලින් හිටපු නායකයින්ට වඩා හොඳින් ක්‍රියාත්මක කරයි කියලා. තමුන්නාන්සේලා කියන ඔය ධනපති, යැංකි ඩිකී නායකයෝ මීට වඩා හොඳට ඒ රටවල්වල නිදහස වෙනුවෙන් පෙනී ඉඳලා තිබෙනවා. නමුත්, තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්නකොට කථා කරපු දේවල් එකක්වත් අද ක්‍රියාත්මක කරන්නේ නැහැ. සම්පූර්ණ පාවා දීමක් තමයි කරලා තිබෙන්නේ. ඒකයි අද ජනාධිපතිතුමා ඇවිල්ලා, මුළු ලෝකයේම අවධානය යොමු වෙලා තිබෙන ඉරානයට පහර දීම ගැන එක වචනයක් හෝ කථා කළේ නැත්තේ. එතුමා ඒක මඟ හැරලා ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ප්‍රාථමික පාසලකට බෝම්බ දාලා සිසුවියන් 160ක් මැරුණා. වික්ටර් රත්නායක මහතාගේ සිංදුවක් ආහපු ගමන් අගමැතිතුමිය සංවේදී වුණා, මම දැක්කා. නමුත්, ප්‍රාථමික පාසලකට බෝම්බ දාලා සිසුවියන් 160ක් මරලා දැම්මා, ඒක ගැන නම් සංවේදී වුණේ නැහැ. වික්ටර් රත්නායක මහතාගේ සිංදුවට නම් සංවේදී වුණා. පුදුම සංවේදී භාවයක් තිබෙන්නේ. නමුත්, මේ වාගේ කාරණා ගැන සංවේදී වෙන්නේ නැහැ. බලය ගන්න කලින් නම් පලස්තීනය ගැන සංවේදී වුණා, හැම එක්කෙනා ගැනම සංවේදී වුණා. බලය ගන්න කලින් හැමදාම පලස්තීන කාර්යාලයට ගියා. දැන් සංවේදී නැහැ. ඒ තරම්ම අද ඔබතුමන්ලා අධිරාජ්‍ය ගැති, pro-Israel පාලන තන්ත්‍රයක් බවට පත්වෙලා තිබෙන බව අපට පෙනෙනවා. අපට කියන්න පුළුවන්, ඔබතුමන්ලා අද විපක්ෂයේ සිටියා නම් ඔය ස්ථාවරයේ නොවෙයි ඉන්නේ. අද ඔබතුමන්ලා විපක්ෂයේ සිටියා නම්, ඔබතුමන්ලා තමයි ඉස්සෙල්ලාම ඇමෙරිකානු තානාපති කාර්යාලය ඉස්සරහට යන්නේ. නමුත්, තමුන්නාන්සේලා බලය ගත්තාට පස්සේ අද සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා තිබෙනවා. හිතාගන්න බැරි විධියට වෙනස් වෙලා තිබෙනවා.

සාමාන්‍යයෙන් නම්, බලය ගත්තාම වෙනස් වෙන්න කාලයක් යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක එහෙම නොවෙයි, පැය 24න් වෙනස් වෙලා තිබෙනවා. මම හිතන විධියට ඔබතුමාටත් ගැටලුවක් ඇතිවෙලා තිබෙනවා, කොහොමද ඔතැන ඉන්නේ කියලා. මම දන්නවා, ඔබතුමා දිගටම පලස්තීනය වෙනුවෙන් පෙනී සිටින කෙනෙක්, ඔබතුමා දිගටම ඉරානය වෙනුවෙන් පෙනී සිටින කෙනෙක්, ඔබතුමා අධිරාජ්‍යවාදී කඳවුරට විරුද්ධව සිටින කෙනෙක්. ඒ නිසා, ඔබතුමාත් දැන් ඉන්නේ බොහොම අපහසුවෙන් කියලා මම දන්නවා. මට ඒක පෙනෙන්න තිබෙනවා. ඔබතුමාගේ හෘදය සාක්ෂිය දන්නවා, ඔබතුමා නියෝජනය කරන ආණ්ඩුව අද ඉන්නේ කාත් එක්කද කියලා. ඒක ඔබතුමාගේ හෘදය සාක්ෂිය දන්නවා. නමුත්, අද ඒ හෘදය සාක්ෂියට අනුව කටයුතු කරන්නේ නැහැ. අද සම්පූර්ණයෙන්ම ඊට පිටින් ගිහිල්ලා තිබෙනවා.

මේ යුද්ධය පටන් ගන්න හේතුව බවට පත් වෙලා තිබෙන්නේ, න්‍යෂ්ටික අවි ආයුධ හදනවාය කියන කාරණය. ඒ සාකච්ඡා පැවැත්වෙන අතරතුර තමයි මේ පහර දීම සිද්ධ වුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඉරානය කියන්නේ අපට හුඟාක් උදව් කරපු රටක්. අපේ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් උදව් කළා, මේ රටේ ඉන්ධන නැති වෙලාවේ ඉන්ධන දුන්නා. මම හිතන විධියට 2015දී ලබා ගත් තෙල් සඳහා ඉරානයට තවමත් මුදල් ගෙවලා නැහැ. එහෙම බැලුවොත් අපි ඉරානයට ණය ගැතියි. ඉරානය කියන්නේ එවැනි රටක්. නමුත්, ඒ විධියට උදව් කරපු රටක් වෙනුවෙන් පෙනී සිටින්න මේ ආණ්ඩුවට බැරි වුණා. අද අපට පෙනෙන්නට තිබෙනවා මුළු ලෝකයේම තත්ත්වය.

අද අපේ රට තුළත් ඊශ්‍රායල් ක්‍රියාකාරිත්වය වැඩිවෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ඒක දන්නවා. Cinnamon Red හෝටලය ඉස්සරහා තිබෙන Chabad House එක ගැන මම එදා පාර්ලිමේන්තුවේදී ඇහුවා. Chabad House එක නීති විරෝධී කියලා අගමැතිතුමිය මේ සභාවේදී ප්‍රකාශ කළා. නමුත්, තවම පොලිස් ආරක්ෂාව දීලා තිබෙනවා. නීති විරෝධියි නම් ඒක වහන්නේ නැත්තේ ඇයි? තවමත් Chabad Houses හැම තැනම අරිනවා. තමුන්නාන්සේලා වීසා ගාස්තු - visa fees - නැතුව ඊශ්‍රායල් ජාතිකයන්ට මේ රටට එන්න අවසර දීලා තිබෙනවා. ඒ උඩ අද IDF සොල්දාදුවෝ විශාල ප්‍රමාණයක් ඇවිල්ලා, ඒ ගොල්ලෝ නැඟෙනහිර පළාතේ කඳවුරු හදාගෙන තිබෙනවා. අද වෙනකොට මුළු රට තුළම ඊශ්‍රායල් ක්‍රියාකාරිත්වය එන්න එන්න වැඩි වෙලා තිබෙනවා. අපි හිතුවා, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආවට පස්සේ මේ වාගේ දේවල් අවම වෙයි, අඩු වෙයි කියලා. මෙච්චර ආණ්ඩු තිබුණා, ඊශ්‍රායල් ජාතිකයන් ලංකාවට එනකොට visa fee එක free කළේ නැහැ. නමුත්, තමුන්නාන්සේලා ඇවිල්ලා ඊශ්‍රායල් ජාතිකයන්ට මේ රටට එන්න පුළුවන් වන විධියට visa fee එකත් free කරලා දුන්නා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඉක්මනින් අවසාන කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපට පෙනෙන්න තිබෙනවා, මේ යුද්ධය හරහා අද මුළු ලෝකයම තැති ගැන්විලා තිබෙන බව. අද මුළු ලෝකයේම අස්ථාවරත්වයක් ඇති වෙලා තිබෙනවා. අද මුළු ලෝකයේම ජනතාව මේ යුද්ධයට විරුද්ධව නැඟී සිටින්න පටන්ගෙන තිබෙනවා. ඒ නිසා අපි මේ ආණ්ඩුවට යෝජනා කරනවා, ආණ්ඩුව රටක් හැටියට හිතලා විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය කියලා. අපි දීර්ඝ කාලීනව නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළා. හැම ආණ්ඩුවක්ම ඒක ආරක්ෂා කළා. හැම ආණ්ඩුවක්ම ඒ නොබැඳි විදේශ ප්‍රතිපත්තියේ හිටියා. ඒ නිසා රටක් හැටියට කොන්ද පණ ඇතිව ඒ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය ආරක්ෂා කරන්න කියා ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Wasantha Samarasinghe. You have 13 minutes.

[අ.භා. 1.22]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22වන වගන්තිය යටතේ නිකුත් කළ

[ගරු වසන්ත සමරසිංහ මහතා]

නව නියමය පිළිබඳව තමයි පාර්ලිමේන්තුවේ මේ විවාදය සිදු වෙමින් තිබෙන්නේ. මේ විවාදය සිදු වෙමින් තිබෙන වෙලාවේ මේ විවාදයට අදාළව කරුණු බොහොමයක් විශේෂයෙන් ආණ්ඩුව පාර්ශ්වයෙන් ඉදිරිපත් කළා. අපේ ගරු බස්නායක මන්ත්‍රීතුමාත් සඳහන් කළා, මේ නියමයේ අරමුණ මොකක්ද කියලා.

මේ නියමයේ අරමුණ පිළිබඳ කථා කරමින් යද්දී අද උදේ ගරු විපක්ෂ නායකතුමාත් කථා කළා; ගරු ජනාධිපතිතුමාත් ඇවිල්ලා කථා කළා. මේ වෙලාවේ අනපේක්ෂිත තත්ත්වයක් -අපි කවුරුත් අපේක්ෂා නොකළ තත්ත්වයක්- රට තුළ වාගේම ලෝකය තුළත් මතු වෙමින් තිබෙනවා. ලෝකය තුළ මතු වන තත්ත්වය නිසා අපේ ආර්ථිකයට සිදු වන බලපෑම පිළිබඳව තමයි මේ සංවාදයේදී; සාකච්ඡාවේදී වැඩිපුරම මතු කරන්න උත්සාහ කරන්නේ. මේ මතු වෙලා තිබෙන තත්ත්වය කෙරෙහි විශේෂයෙන් ලෝක නායකයන්ගේ අවධානය යොමු කිරීම පිළිබඳව අපේ ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී කරුණු අවධාරණය කළා.

ලෝකයේ කිසිදු ස්වෛරී රාජ්‍යයක් තවත් රටක් විසින් යටපත් කරන්න ගනු ලබන උත්සාහයක් පිළිගන්නා ආණ්ඩුවක් නොවෙයි අපේ ආණ්ඩුව. ඒ වාගේම, ලෝකයේ මිනිසුන්ට තිබෙන මූලික අයිතිවාසිකම් ආරක්ෂා විය යුතුයි කියන ස්ථාවරයේ ඉඳන් තමයි අපි රටක් හැටියට, ආණ්ඩුවක් හැටියට කටයුතු කරමින් ඉන්නේ. අද මේ ඇති වෙලා තිබෙන යුද්මය තත්ත්වය මැද පෙරදිග කලාපයට විශේෂ බලපෑමක් ඇති කර තිබෙනවා. මැද පෙරදිග කලාපයට ඇති කරන ලද එකී විශේෂ බලපෑම හේතුවෙන් - විශේෂයෙන් ඉරානයට සිදු කරන ලද පහර දීම්, ඒ වාගේම මැද පෙරදිග කලාපයේ අනෙකුත් රටවලට සිදු කරන ලද පහර දීම් හේතුවෙන්- අද මැද පෙරදිග කලාපයේ රැකියාවල නියුතු අපේ ලක්ෂ 10කට වැඩි ප්‍රමාණයක් වන සේවක සේවිකාවන් මුහුණ දීලා තිබෙන තත්ත්වය වාගේම, ඒ හරහා රටක් හැටියට, ආර්ථිකයක් හැටියට අප මුහුණ දීලා තිබෙන තත්ත්වයත් අපට විශේෂයයි.

මේ යුද්ධය අප කවුරුත් අපේක්ෂා කරන එකක් නොවෙයි. තමන්ගේ අධිකාරය; තමන්ගේ බලය පෙන්වන්න, එහෙම නැත්නම් ලෝකයේ ප්‍රාග්ධනය වෙනුවෙන් වෙළෙඳ පොළවල් ඇති කරන්න වාගේ තමයි අද බලගතු රාජ්‍යයන් විසින් මේ යුද්ධය නිර්මාණය කරමින් තිබෙන්නේ. එක මොහොතක එක යුද්ධයක් එම රටේ ජනතාවට සහ තවත් තැන්වල ජනතාවට පීඩාවක් බවට පත් වෙනවා. මීට කලින් මේ සිද්ධිය මතු වුණේ පලස්තීනය සහ ඊශ්‍රායලය අතරයි. පලස්තීනය සහ ඊශ්‍රායලය තුළ ඇති වෙච්ච තත්ත්වය තවදුරටත් ඉදිරියට යමින් දැන් මැද පෙරදිග කලාපය පුරා විහිදෙමින් තිබෙන තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා රජයක් හැටියට අප ඉන්න ස්ථාවරය තමයි වහාම ලෝක නායකයන් මෙයට මැදිහත් වෙලා මේ යුද්ධය නැවැත්විය යුතුයි කියන එක; ඒ මිනිසුන්ගේ ජීවත් වීමේ අයිතිය ආරක්ෂා විය යුතුයි. කොතැන හෝ කෙනෙකු මිය ගියත්, ඒ මිනිස් ජීවිතවලට වටිනාකමක් තිබෙනවා. ඒ අයට වටිනාකමක් නැති ජීවිත ලෙස මිය යන්න ලෝක බලවතුන්, එහෙම නැත්නම් මෙවැනි යුධ තත්ත්වයන් විසින් ඇති කර තිබෙන අසාධාරණය, එහෙම නැත්නම් ඒ තත්ත්වය, ඒ පීඩාව වහාම අවසන් කිරීම සඳහා ලෝකයේ අවධානය යොමු විය යුතුයි කියන අදහසේ තමයි අප ඉන්නේ. ඒ නිසා මේ ආණ්ඩුව මොකක්ද කියන්න ඕනෑ කියන එක විපක්ෂය කියලා දෙන්න ඕනෑ නැහැ. ආණ්ඩුව කියන්න ඕනෑ කථාව ආණ්ඩුව කියනවා. ආණ්ඩුවෙන් කියන්න ඕනෑ කථාව විපක්ෂය කියලා දෙනකල් ඉන්නේ නැහැ, මේ ආණ්ඩුව.

මේ ආණ්ඩුව මොකක්ද කරන්න ඕනෑ කියන කථාව කියාගෙන යද්දී, විදේශ විනිමය පනත යටතේ වන නියමය ගැන කථා බහ එනකොට විපක්ෂ නායකතුමා විශේෂයෙන් ගෑස් ගැන, ගල් අඟුරු ගැන, තෙල් ගැන කිව්වා. එතුමා ඒ අතරම කියාගෙන ගියා, දුප්පත්කමත් වැඩි වෙලා තිබෙනවා කියලා. ඊට පස්සේ මම බැලුවා විපක්ෂ නායකතුමා දුප්පත්කම වැඩි වෙලා තිබෙනවා කියන කථාව කියන්න හේතු කර ගත්තු කරුණ මොකක්ද කියලා. එතුමා මේ කථාව කියලා තිබෙන්නේ මෙකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සාමාන්‍යයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව Official Poverty Line එක වාර්ෂිකව හදලා කියනවා. මතක ඇති නේ, කාලයක් බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිවරයා කිව්වා රුපියල් 2,500කින් මිනිහෙකුට මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියලා. අද විපක්ෂ නායකතුමාත් ඒකම තමයි කිව්වේ. හැබැයි එතුමාට මතක නැහැ එතුමාගේ කාලයේ දරිද්‍රතා රේඛාවේ අගය කීයද කියලා. එතුමා ඇමතිවරයෙකු වෙලා හිටපු 2015 ඉඳන් 2019 වනකල් දරිද්‍රතාවේ නිල රේඛාවේ -Official Poverty Line- අගය කීයද කියන එක සම්බන්ධයෙන් එතුමා කරුණු කිව්වේ නැහැ.

දරිද්‍රතා රේඛාවට බලපාන හේතු තිබෙනවා. උද්ධමනය, අවධමනය ඒකට බලපානවා. මේ රට නිල ලෙස පිළිගත් දුප්පත්කමේ හෙවත් දරිද්‍රතාවේ රේඛාව - Official Poverty Line - පිළිබඳව තමයි කිව්වේ 2026 ජනවාරි මාසය වනකොට රුපියල් 16,730යි කියලා. එක පුද්ගලයකුට මීට වඩා ආදායම අඩු නම්, එනම් ඔහුගේ ආදායම රුපියල් 16,730ට වඩා අඩු නම් ඔහු දුප්පතෙක් ලෙසයි සලකන්නේ. හැබැයි විපක්ෂ නායකතුමා කියන්න හදපු කථාවේ සත්‍යයක් නැති තත්ත්වයකුත් තිබෙනවා. මා ඒක කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Official Poverty Line එක 2012-2013දී තිබුණේ රුපියල් 5,223කට; 2016දී තිබුණේ 6,117කට; 2019දී තිබුණේ 6,966කට. ආර්ථික අර්බුදයත් එක්ක විශේෂයෙන් රුපියලේ අගය වේගයෙන් කඩා වැටීම නිසා 2022 දෙසැම්බර් වනකොට එය රුපියල් 13,777කට ආවා. 2024දී ඒක 17,014යි. ඒ කියන්නේ 2024 වනකොට එයාට රුපියල් 14,014ක් ලැබුණේ නැත්නම් -එතැනින් පල්ලෙහා නම් ඉන්නේ- දුප්පත්කමේ රේඛාවෙන් පහළ ඉන්නේ; දුප්පතෙකු ලෙසයි සලකන්නේ. හැබැයි 2026 ජනවාරි මොකද වෙන්නේ? 17,014 තිබුණු එක 16,730 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ ගාණ අඩු වුණා කියන එකෙන් කියන්නේ මොකක්ද? රටේ උද්ධමනය පාලනය වෙලා තිබෙනවා, බඩු මිල අඩු වෙලා තිබෙනවා, මිල ඉහළ යාම පාලනය වෙලා තිබෙනවා කියන එකයි.

රුපියල් 17,014 ඉඳන් 16,730 දක්වා අඩු වීම ගැන එතුමා කිව්වේ නැහැ. දරිද්‍රතාවේ නිල රේඛාව පිළිබඳව තමයි එතුමා කිව්වේ. ඒක කියන කොට 16,000යි, 18,000යි වාගේ ගණන් දෙකක් කිව්වා. ඒක දිස්ත්‍රික්ක මට්ටමින් හදනවා. වැඩිම තිබෙන්නේ කොළඹ; රුපියල් 18,044යි. ඊළඟට ගම්පහ; 17,951යි. ඒකේ පොදු අගය තමයි රුපියල් 16,730. ඒකෙන් දුප්පතුන් වැඩි වීම ගැන නොවෙයි කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විපක්ෂ නායකතුමා කියන්න උත්සාහ කළා ඒක දුප්පතුන් වැඩි වීමක් කියලා. නැහැ. විපක්ෂ නායකතුමා ආපහු ගණන් හදලා බැලුවොත් මේ රේඛාව අනුවත් දුප්පත්කමේ යම් අඩුවීමක් තිබෙන්නේ. දරිද්‍රතාවේ නිල රේඛාවෙනුත් කියන්නේ දුප්පත්කමේ අඩුවීමක් පිළිබඳවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තත්ත්වයත් එක්කම අපේ රටේ තෙල් සහ ගෑස් පිළිබඳ සාකච්ඡාව ආවා. විශේෂයෙන් කියන්න ඕනෑ ගෑස් අඛණ්ඩව සැපයුම පිළිබඳව රජය හැටියට අපි අවධානයෙන් සිටි බව. අඛණ්ඩ ගෑස් සැපයුමක් පිළිබඳව අපි කරුණු කිව්වා, අඛණ්ඩව ගෑස් ලබා දීමට අපට තිබෙන හැකියාව ගැන කිව්වා. මේ අවුරුද්දට විතරක් ගෑස් මෙට්‍රික්ටොන් 380,000ක් ලබා ගැනීම සඳහා අපි ගිවිසුම්ගත වෙලා තිබෙනවා. ඒ අනුව අපට ජනවාරි මාසයේදී ගෑස් මෙට්‍රික්ටොන් 24,000ක් ගෙනාවා,

පෙබරවාරි මාසයේ ගෑස් මෙට්‍රික්ටොන් 28,000ක් ගෙනාවා. දැන් මාර්තු මාසයේ ගෑස් මෙට්‍රික්ටොන් 38,000ක් ගේන්න ගිවිසුම්ගත වෙලා තිබෙනවා. ඒ ගෑස් මෙට්‍රික්ටොන් 38,000න් යම් ප්‍රමාණයක් අරගෙන මාර්තු මාසයේ 01වන දා නැවක් ආවා. ඊට පස්සේ 03වන දා - අද - නැවක් එනවා. මේ 31වන දා දක්වා නැව් 10ක් එනවා. ඒ නැව් 10න් අපට ගෑස් මෙට්‍රික්ටොන් 38,000ක් අරගෙන එනවා. අපේ අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 32,000යි, මේ මාර්තු මාසයට. ඒ ගෑස් මෙට්‍රික්ටොන් 32,000 අවශ්‍යතාව සපුරන්න අද දවසේත් ගෑස් බෙදා හැරීම කරනවා.

ගෑස් පෝලිම් ගැන කියන කොට, තෙල් පෝලිම් ගැන කියන කොට අපි ජනතාවට කියන්න ඕනෑ මේ ගැන අනවශ්‍ය කලබලයක් හදා ගන්න ඕනෑ නැහැ කියලා. මොකද, අවශ්‍ය තරම් ප්‍රමාණවත් ගෑස් සහ තෙල් සම්පාදනය කරන්න අපි එකඟතාවලට ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව ගත්තොත් අද දවසේ කිලෝග්‍රෑම් 12.5 ගෑස් සිලින්ඩර 82,901ක් බෙදා හැරීමට සැලසුම් කරලා තිබෙනවා, කිලෝග්‍රෑම් 5 ගෑස් සිලින්ඩර 20,500ක් බෙදා හැරීමට සැලසුම් කරලා තිබෙනවා, කිලෝග්‍රෑම් 2.5 ගෑස් සිලින්ඩර 21,199ක් බෙදා හැරීමට සැලසුම් කරලා තිබෙනවා. ඒ අනුව ඒ විධියට අඛණ්ඩ distribution එකක් යනවා. අපේ තිබුණු දෛනික ගෑස් බෙදා හැරීම මෙට්‍රික්ටොන් 1,200 ඉඳන් 1,800 දක්වා වැඩි කරලා තිබෙනවා. ලිට්රෝ ගෑස් සමාගම තමන්ගේ පාරිභෝගිකයාට ගෑස් සිලින්ඩර 400,000ක් විකුණලා තිබෙනවා. නමුත් ඒ ගෑස් සිලින්ඩර 400,000 වෙළෙඳ පොළේ පරිහරණය කරන්න අවශ්‍ය ගෑස් ලබා නොදී ඉන්නවා.

ඒ නිසා ඒ සමාගමට අපි පසුගිය දවස්වල ඉතා පැහැදිලිව කිව්වා, "ඔබ මේ ක්‍රියාවලිය ඇතුළේ අඛණ්ඩ ගෑස් සැපයුමක් ලබා දෙන්න නම් ගෑස් ගේන්න ඕනෑ, යන එන ගමන් හමු වෙන නැව්වලින් ගෑස් අරගෙන බැහැ" කියලා. දැන් ඒ ගොල්ලෝ එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම, මේ විධියට අපට දැනුම් දීලාත් තිබෙනවා. පසුගිය 28වැනි දා ඒ ගොල්ලෝ ගෑස් මෙට්‍රික්ටොන් 3,675ක් ගෙනැල්ලා තිබෙනවා. ඒකෙන් ගෑස් මෙට්‍රික්ටොන් 3,420 ඒ ගොල්ලෝ නිදහස් කරගෙන තිබෙනවා. තවත් ගෑස් මෙට්‍රික්ටොන් 255ක් නිදහස් කර ගන්න තිබෙනවා. ඒ ගොල්ලෝ කොළඹින් ගෑස් බාගන්නේ ටැංකිවලටම තමයි. මේ මෙට්‍රික්ටොන් 3,675 කොළඹට ගෙනාවාම ටැංකිවලටයි බාන්න තිබෙන්නේ. ඒවා තමයි බෙදා හරින්නේ. 2026.03.10වැනි දා තවත් මෙට්‍රික්ටොන් 3,675ක නැවක් එනවා. 2026.03.20වැනි දා තවත් මෙට්‍රික්ටොන් 3,675ක නැවක් එනවා. ඒ නිසා මේ මාසයට මෙට්‍රික්ටොන් 11,025 ගෑස් ගෙනෙනවාය කියන අදහස සහ සැලැස්ම අපට ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ නිසා මෙතැනින් ඉස්සරහට කහ පාට ගෑස් එකේවත්, නිල් පාට ගෑස් එකේවත් හිඟයක් ඇති වෙන්න හේතුවක් නැහැ කියලා අපි හිතනවා. ඔවුන්ගේ ගෑස් සැපයුම මාසයකට මෙට්‍රික්ටොන් 10,000යි. ඒ මාසයට අදාළ මෙට්‍රික්ටොන් 10,000 ලබා දීමට අවශ්‍ය සැලසුම් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ වෙනකොට ඒ සමාගම් ඉදිරි මාස කිහිපය සඳහා ජීව ගෑස් මිලදී ගැනීම සඳහා, ඒ කියන්නේ ලිට්රෝ ගෑස් සමාගමට ගෑස් supply කරන, ගෑස් ටෙන්ඩරය දිනා ගත්ත ජීයෝ ගෑස් සමාගමෙන් මෙට්‍රික්ටොන් 10,000ක් හම්බන්තොටට ලබා ගැනීම සඳහා අවසරයක් අරගෙන තිබෙනවා. එය ලබා දීම සඳහා එකඟතාව අරගෙන තිබෙනවා. ඒ නිසා ගෑස් පිළිබඳව කථා බහේදී අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, මේ ගෑස් කථාවත් අර වාගේ එකක් කියලා. මොකද, ඒ සමාගම ගෑස් සම්පාදනය කරපු නැති නිසා තමයි, මිනිස්සුන්ට ප්‍රමාණවත් ගෑස් වෙළෙඳ පොළේ නැති වුණේ. වෙළෙඳ පොළ තත්ත්වය පාලනය කර ගැනීම සහ ගනුදෙනුකරුවන්ට භාණ්ඩ සැපයීම, පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම ඒ සමාගමේ වගකීමක්. හැබැයි, ඒක නොවුණ නිසා, මේ වෙනකොට ලිට්රෝ ගෑස් සමාගම සියයට 82ක් ගෑස් වෙළෙඳ පොළට ගෑස් සම්පාදනය කරනවා. ඒ සියයට 82 වෙනුවෙන්, අපි දවසකට වෙළෙඳ පොළට නිදහස් කරන ගෑස් ප්‍රමාණයට වඩා දැන් ගෑස් නිදහස් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි. තවදුරටත් වෙළෙඳ පොළ තුළ හිඟයක් ඇති වෙනවා නම්, ඒ හරහා පාරිභෝගිකයා පීඩාවට පත් වෙනවා නම්, ඒ පීඩාවට පත් වන පාරිභෝගිකයාට සහනයක් වීම සඳහා නව ගෑස් සිලින්ඩරයක් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම අපි සම්පාදනය කරනවා. ඒ සඳහා ගෑස් සිලින්ඩර ලක්ෂයක් ලබා ගැනීමට කටයුතු කරලා තිබෙනවා. පෙබරවාරි මාසයේත් ගෑස් සිලින්ඩර ප්‍රමාණයක් අපට ගෙනැල්ලා තිබෙනවා. මේ වන විට ඒ තාක්ෂණික ඇගැයීම් කරමින් තිබෙනවා. ඒ සියල්ල පරීක්ෂාවට ලක් කරලා, 12වැනි දා සිට වෙළෙඳ පොළට ගෑස් සිලින්ඩර නිදහස් කිරීම අපි ආරම්භ කරනවා.

ඒ වාගේම, කහ පාට සිලින්ඩරය නිල් පාට සිලින්ඩරයකට මාරු කරන්න පුළුවන්ද කියලා සමහරු අහනවා. කහ පාට සිලින්ඩරය නිල් පාට සිලින්ඩරයකට මාරු කිරීමේ තීරණය අපට ගන්න වෙන්නේ, තවදුරටත් කහ පාට ගෑස් සිලින්ඩර ලබා ගත්ත පාරිභෝගිකයන්ට අදාළ සමාගම ගෑස් ලබා දීම කරන්නේ නැත්නම් සහ තවදුරටත් පාරිභෝගිකයා අඛණ්ඩව පීඩාවට පත් කරනවා නම්. අන්න ඒ වෙලාවට අපට තීරණයක් ගන්න වෙයි. මේ පිළිබඳව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙළෙඳ පොළ සමීක්ෂණ කරමින් තිබෙනවා. අපි ඒ සමාගමට දැනුම් දීලා තිබෙනවා, ඒ අය ගෙන්වා සාකච්ඡා කරලා තිබෙනවා. ගෑස් අඛණ්ඩව ලබා දීමට ඔවුන් පොරොන්දු වෙලා තිබෙනවා. මේ වෙනකොට ඒ සැපයුම ඔවුන් කරමින් තිබෙනවා. ඒ නිසා තෙල් පිළිබඳවත්, ගෑස් පිළිබඳවත් කියන්න තිබෙන්නේ, මේ ඇති වෙලා තිබෙන ලෝක තත්ත්වය හමුවේ අපට ඉදිරි කාලය තුළ ගැටලුවක් නැතුව යන්න පුළුවන් වටපිටාව තිබෙනවා කියන එකයි.

තෙල් සැපයුම පිළිබඳවත් අපි එකඟතාවකට ඇවිල්ලා ගිවිසුම් ගත වෙලා තිබෙනවා. අපට ඉන්දියාව සහ සිංගප්පූරුවෙන් තමයි තෙල් ලබා දීම සිදු කරන්නේ. ගිය ඔක්තෝබර් මාසයේ ඉඳලා ආපු නැව්වලින් නැව් 17ක්ම අපට ඉන්දියාවෙන් තමයි ආවේ. පහක් විතර තමයි අපට සිංගප්පූරුවෙන් ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා තෙල් සැපයුම පිළිබඳ ගැටලුවකුත් නැහැ. ගෑස් සැපයුම සම්බන්ධයෙනුත් අපට ගැටලුවක් නැහැ. මොකද, මේ සමාගම අපට නිශ්චිතව කියලා තිබෙනවා -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have exhausted your time.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඔවුන් දකුණු අප්‍රිකාව ප්‍රදේශයෙන් තමයි අපට වැඩිපුර ගෑස් අරගෙන එන්නේ. ඒ නිසා ගෑස් ලබා දීමේදී කිසිදු ගැටලුවක් නැතුව, මේ අවුරුද්ද පුරාම අපට ගෑස් ලබා දීම සඳහා ඔවුන් ලිඛිතව එකඟතාව පළ කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණ විශේෂයෙන්ම කිව්වේ, මේ යුද්ධමය තත්ත්වය හමුවේ අපේ රටේ වෙළෙඳ පොළ තුළ ගෑස්වල හෝ තෙල්වල හිඟයක් ඇති වේ යැයි යම් බියක් හදන්න හෝ ඒ සඳහා ජනතාව රැස් කරනවා නම් හෝ මේ තත්ත්වය පාලනය කරන්න බැරි වන නිසායි. විශේෂයෙන්ම අද ලෝක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ ඇති වෙලා තිබෙන ලෝක තත්ත්වයට අපි

[ගරු වසන්ත සමරසිංහ මහතා]

කාටත් මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ගරු ජනාධිපතිතුමා උදේ කිව්වා, කොච්චර තෙල් ප්‍රමාණයක් ගබඩා කරන්න අපට ගබඩා පහසුකම් තිබෙනවාද කියලා. අපට ගෑස් ගබඩා කරන්න පහසුකම් තිබෙන්නේ දවස් 5කට පමණයි. අපට තෙල් ගබඩා කරන්න පහසුකම තිබෙන්නේ මාසයකට ටිකක් අඩු ප්‍රමාණයකට පමණයි. ඒ නිසා මේ තත්ත්වයත් එක්ක මෙතැනින් එහාට යනවා මිස, අපට වෙන විකල්ප නැහැ. ඒ වෙනුවෙන් රජය ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගණනාවක් අරගෙන තිබෙනවා. ගෑස් ටැංකි සංකීර්ණයක් ඉදිකරන්නත්, තෙල් ටැංකි සංකීර්ණය නවීකරණය කරලා අපට ප්‍රමාණවත් පහසුකම් අත්පත් කර ගන්නත් අවශ්‍ය කටයුතු කරනවා.

ඉතින් අද මේ පාර්ලිමේන්තු සාකච්ඡාවේදී මොනවා කියන්න උත්සාහ කළත්, අපි රටේ ජනතාව කියන්නේ ඔබ බිය විය යුතු නැහැ, බිය වෙලා මිලදී ගැනීම්වලට යන්න වුවමනා නැහැ කියන එකයි. ප්‍රමාණවත් තෙලුත්, ප්‍රමාණවත් ගෑසුත් දැන් වෙළෙඳ පොළට සම්පාදනය වෙනවා. මේ තත්ත්වය නිසා යම් අපහසුතාවකට පත් වුණා නම් ඒකත් දැන් සමනය වෙලා තිබෙනවා.

ඊළඟට, විපක්ෂ නායකතුමා කියන්න උත්සාහ කළ දුප්පත්කම පිළිබඳ කාරණය ගැනත් කියලා මම කථාව අවසන් කරනවා. මේ උද්ධමනය විසින් තමයි සමහර කරුණු පිළිබඳ සංඛ්‍යා දත්ත එහාට මෙහාට යන්නේ. අපේ රටේ කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2016 ඉඳලා ඒකක 136ට තිබුණේ. ඒක 2019දී ඒකක 155යි. 2022දී ඒකක 264යි. 2023දී ඒකක 308යි. 2024දී ඒකක 306යි. උද්ධමනය තවත් ටිකක් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම දුප්පත්කමේ රේඛාවත් තවත් ටිකක් අඩු කරලා තිබෙනවා.

ඉතින් ඒ අනුව ගත්තාම ආර්ථිකය කළමනාකරණය කිරීම ගැන අර ඉතිහාසයේ තිබිච්ච ගොඩක් කථා කියන්න වෙලාව නැති වුණත් මම කියන්න ඕනෑ, අපේ රටට දේශපාලන ස්ථාවරත්වයත් සමඟ ආර්ථික ස්ථාවරත්වයත් ගෙනැල්ලා, අපේ රටේ ආයෝජකයන්ට වඩා හොඳ වටපිටාවක් හදන්න, මේ රටේ කෘෂිකර්මාන්තයට අවශ්‍ය වටපිටාව හදන්න, මේ රටේ ජනතාවට වඩා හොඳින් ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් හදන්න අපේ ආණ්ඩුව කටයුතු කරමින් තිබෙන බව. ඒ සඳහා ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගන්නවා. මෙවැනි තත්ත්ව තුළත් ජනතාව අපහසුතාවට පත් නොකර, ජනතාවගේ පහසුකම් ලබා දීමට අවශ්‍ය තීන්දු තීරණ අරගෙන කටයුතු කරනවාය කියන කාරණය කියමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have seven minutes.

[பி.ப. 1.38]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்டுள்ள வெளிநாட்டு நாணயமாற்றுச் சட்டத்தின் கீழான கட்டளைக்கு ஒப்புதல் அளிப்பது தொடர்பான எனது கருத்துகளை இந்த அவையில் எடுத்துரைக்க விழைகின்றேன்.

வெளிநாட்டு நாணயமாற்று நிருவாகமானது, இலங்கையின் பொருளாதார நிலையை அளவிடும் கருவியாக வரலாற்று அடிப்படையில் செயற்பட்டு வருகின்றது. இப்பொழுது நாடாளுமன்ற ஒப்புதலுக்காக முன்வைக்கப்பட்டுள்ள வெளிநாட்டு நாணயமாற்றுச் சட்டத்தின் கீழான கட்டளையானது நாடு பொருளாதார நெருக்கடிக்குப் பிந்திய மீட்சி, அண்மையில் ஏற்பட்ட இயற்கைப் பேரிடர் ஆகிய வெளிப்புற அதிர்ச்சிகளை எதிர்கொண்டுள்ள சூழ்நிலையில் ஒரு முதன்மையான விடயமாகக் காணப்படுகின்றது. 2026 பெப்ருவரி 17ஆம் திகதியன்று நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்ட வெளிநாட்டு நாணயமாற்றுச் சட்டத்தின் கீழான கட்டளையானது, 2017ஆம் ஆண்டின் 12ஆம் எண் கொண்ட வெளிநாட்டு நாணயமாற்றுச் சட்டத்தின் 22ஆம் பிரிவின்கீழே வெளியிடப்பட்டுள்ளது.

இது இலங்கை மத்திய வங்கியின் பரிந்துரையின் அடிப்படையில் நாட்டின் நிதி அமைப்பின் உறுதித் தன்மையைப் பேணும் பொருட்டாக முன்வைக்கப்பட்டுள்ளது. இந்தப் பிரிவு, ஓர் ஒழுங்குமுறைப் பாதுகாப்புக் கருவியாகச் செயற்படுகின்றது. இது நாட்டின் வெளிநாட்டு நாணய இருப்பு நிலையைப் பாதுகாப்பதற்கும் நிதி உறுதித் தன்மையைப் பேணுவதற்கும் வெளிநோக்கிய சில பணப் பரிமாற்றங்களைத் தற்காலிகமாக நிறுத்த அல்லது மட்டுப்படுத்த நிதி அமைச்சருக்கு அதிகாரமளிக்கிறது. இந்த மாற்றமானது இலங்கை நிறுவனங்களின் உலகளாவிய விரிவாக்கத்துக்கு ஆதரவளிக்கும் அதேவேளையில், 2025ஆம் ஆண்டின் இறுதியில் 6.8 பில்லியன் அமெரிக்க டொலரை எட்டியுள்ள அரச மொத்தக் கையிருப்பு பாதிக்கப்படாமல் இருப்பதையும் உறுதி செய்கின்றது. வெளிநாட்டு நாணயமாற்று இருப்பைப் பாதுகாக்கும் அதே வேளையில், வெளிநாட்டு முதலீடுகளுக்கான வரம்புகள் கணிசமாகத் தளர்த்தப்பட்டுள்ளன.

கொழும்புப் பங்குச் சந்தையில் பட்டியலிடப்பட்ட நிறுவனங்கள் வெளிநாடுகளில் 500,000 அமெரிக்க டொலர் வரை முதலீடு செய்ய ஒப்புதல் அளிக்கப்படுகின்றது. இது உற்பத்தித் துறைகளில் செங்குத்து ஒருங்கிணைப்பு மற்றும் விரிவாக்கத்தை எளிதாக்குவதை நோக்கமாகக் கொண்டது. பட்டியலிடப்படாத நிறுவனங்களுக்கு இந்த வரம்பு 150,000 அமெரிக்க டொலராக மட்டுப்படுத்தப்பட்டுள்ளது. இது முந்தைய இடைநிறுத்தங்களோடு ஒப்பிடும்பொழுது குறிப்பிடத்தக்க அதிகரிப்பாகும். சிறிய மற்றும் நடுத்தர நிறுவனங்கள் மண்டல அடிப்படையில் கால்பதிக்க இது உதவுகிறது. புதிய வெளிநாட்டு அலுவலகங்களை அமைக்க 100,000 அமெரிக்க டொலர் வரையிலும் அனுப்ப ஒப்புதல் வழங்கப்பட்டுள்ளது. இது தொடக்க அமைப்பு, சந்தைப்படுத்தல் மற்றும் திட்டப் பேராளர் அலுவலகங்களுக்காக வடிவமைக்கப்பட்டுள்ளது. ஏற்கனவே உள்ள அலுவலகங்களின் செயற்பாட்டுச் செலவுகளுக்காக 30,000 அமெரிக்க டொலர் வரையிலும் அனுப்ப ஒப்புதல் வழங்கப்பட்டுள்ளது. இது ஏற்கனவே நிறுவப்பட்ட கிளைகளின் நடைமுறை மூலதனத் தேவைகளுக்காக வழங்கப்படுகிறது. இந்தக் கட்டளையானது, பட்டியலிடப்பட்ட நிறுவனங்கள் இலங்கைக்கு வெளியே குறிப்பிட்ட வரம்பு வரை முதலீடு செய்ய உதவுகிறது. இது 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் நிலவிய வெளிநோக்கிய முதலீட்டுக் கணக்குகளின் முழுமையான இடைநிறுத்தத்திலிருந்து ஒரு குறிப்பிடத்தக்க மாற்றமாகும்.

குடியகல்வோர், நிதியைத் திரும்பக் கொண்டுசெல்வதில் இந்தக் கட்டளை தொடர்ந்து எச்சரிக்கையான நிலைப்பாட்டைப் பேணுகின்றது. குடியகல்வோரின் நிதி இடமாற்றங்கள் மீதான சில கட்டுப்பாடுகள் நீக்கப்பட்டாலும், மூலதன இடமாற்றங்கள் இன்னும் கடுமையாக நிருவகிக்கப்படுகின்றன. முதல் முறைக்கான குடியகல்வுக் கொடுப்பனவு 100,000 அமெரிக்க டொலராக மட்டுப்படுத்தப்பட்டுள்ளது. இது 2021ஆம் ஆண்டின் விதிமுறைகளின்கீழ் ஒப்புதல் அளிக்கப்பட்ட 200, 000 டொலரிலிருந்து குறைக்கப்பட்டுள்ளது.

புதிய வெளிநாட்டு நாணயமாற்றுக் கட்டளையைப் புரிந்துகொள்ள, 2017ஆம் ஆண்டின் 12ஆம் எண் கொண்ட வெளிநாட்டு நாணயமாற்றுச் சட்டத்தை, அதன் முன்னோடியான 1953ஆம் ஆண்டின் 24ஆம் எண் கொண்ட, நாணயமாற்றுக் கட்டுப்பாட்டுச் சட்டத்தோடு ஒப்பிடுவது இன்றியமையாததாகும். 1953ஆம் ஆண்டின் சட்டம் ஒரு மூடிய பொருளாதாரத்துக்காக வடிவமைக்கப்பட்டது. இது அனைத்து வெளிநாட்டு நாணயமாற்றையும் ஒரு தேசிய சொத்தாகக் கருதி, அரசு அதைக் கட்டுப்படுத்த வழிவகுத்தது. 2017ஆம் ஆண்டின் சட்டம் வெளிநாட்டு நாணயமாற்றை ஈட்டுபவர்களே - ஏற்றுமதியாளர்கள் மற்றும் சேவை வழங்குநர்கள் - அதன் உரிமையாளர் என்ற கொள்கையின் அடிப்படையில் உருவாக்கப்பட்டுள்ளது. இங்கு அரசினது பங்கு, ஒழுங்குபடுத்துநராகவும் ஊக்குவிப்பாளராகவும் மட்டுமே காணப்படுகின்றது.

இலங்கையின் வெளிநாட்டு நாணயமாற்று நிருவாகத்தில் 1953ஆம் ஆண்டின் 24ஆம் எண் கொண்ட சட்டத்துக்கும் 2017ஆம் ஆண்டின் 12ஆம் எண் கொண்ட சட்டத்துக்கும் இடையில் பின்வரும் சில கொள்கை மாற்றங்கள் உள்ளன:

குற்றவியல் மீறல்களின் தன்மை: 1953ஆம் ஆண்டின் சட்டத்தின்கீழ் வெளிநாட்டு நாணயமாற்று விதி மீறல்கள் சிறைத் தண்டனைக்குரிய குற்றங்களாக இருந்தன. 2017ஆம் ஆண்டின் சட்டத்தின்கீழ் இவை சிவில் வழக்குகளாக மாற்றப்பட்டு, சிறைத் தண்டனை நீக்கப்பட்டுள்ளது.

விசாரணைக் காலம்: 2017ஆம் ஆண்டின் சட்டத்தின்கீழ் அனைத்து விசாரணைகளும் ஆறு மாத காலத்துக்குள் முடிக்கப்பட வேண்டும் என்ற காலக்கெடு விதிக்கப்பட்டுள்ளது.

நிறுவன கவனம்: 1953ஆம் ஆண்டின் சட்டத்தின்கீழ் கண்காணிப்பு மற்றும் கட்டுப்பாட்டு நோக்கத்துக்காக வெளிநாட்டு நாணயமாற்றுக் கட்டுப்பாட்டுத் திணைக்களம் உருவாக்கப்பட்டது. 2017ஆம் ஆண்டின் சட்டத்தின்கீழ் செயற்படுத்தல் மற்றும் வசதியளித்தல் நோக்கத்துக்காக வெளிநாட்டு நாணயமாற்றுத் திணைக்களம் என்னும் நிறுவனம் உருவாக்கப்பட்டுள்ளது.

தாராளமயமாக்கலை நோக்கிய முன்னேற்றம் இருந்தபோதிலும், 2026ஆம் ஆண்டின் கட்டளை மற்றும் பரந்த வெளிநாட்டு நாணயமாற்று கட்டமைப்பு பல விமர்சனங்களை எதிர்கொள்கின்றது. அதில் ஒன்று, 'நள்ளிரவு அரசிதழ்கள்': 2017ஆம் ஆண்டின் 12ஆம் எண் கொண்ட வெளிநாட்டு நாணயமாற்றுச் சட்டத்தின் 22ஆம் பிரிவின்கீழ், அடிக்கடி தற்காலிகக் கட்டளைகளை வெளியிடுவது நீண்டகால முதலீட்டாளர்களுக்குக் கணிக்க முடியாத ஒரு சூழலை உருவாக்குகிறது.

அதுபோல், ஏற்றுமதி வருமானத்தை 180 நாட்களுக்குள் நாட்டுக்குக் கொண்டுவர வேண்டும் என்ற விதி மற்றும் எஞ்சிய நிலுவையைக் கட்டாயமாக ரூபாயாக மாற்ற வேண்டும் என்ற கட்டுப்பாடுகள் ஏற்றுமதியாளர்களுக்குத் தேவையற்ற செலவுகளை ஏற்படுத்துகிறது. 500,000 டொலர் மற்றும் 150,000 டொலர் வரம்புகள் இலங்கையின் ஓர் உற்பத்திப் பொருள் உலகளவில் விரிவடைவதற்கு போதுமானதாக இல்லை என்று விமர்சிக்கப்படுகிறது.

இலங்கையின் வெளிநாட்டு நாணயமாற்றுச் சட்டங்கள், இந்தியா மற்றும் சிங்கப்பூர் ஆகிய நாடுகளோடு ஒப்பிடுகையில் இன்னும் கட்டுப்பாடுகள் நிறைந்ததாகவே உள்ளன. இந்தியாவின் வெளிநாட்டு நாணயமாற்று மேலாண்மைச் சட்டம் மிகவும் முற்போக்கானது. இந்திய நிறுவனங்களுக்கு ஏற்றுமதி வருமானத்தை மீளக்கொண்டு வருவதற்கு 15 மாதங்கள் வரை காலக்கெடு வழங்கப்படுகின்றது. இது, இலங்கையின் 6 மாத கால அவகாசத்தைவிட நெகிழ்வானது. மேலும், தனியாள் ஆண்டுக்கு 250,000 டொலர் வரை அனுப்ப ஒப்புதல் உள்ளது. இது இலங்கையின் 100,000 அமெரிக்க டொலரை அனுப்பலாம் என்பதனைவிடக் கூடுதலானது. சிங்கப்பூர் 1978ஆம் ஆண்டிலேயே அனைத்து வெளிநாட்டு நாணயமாற்றுக் கட்டுப்பாடுகளையும் நீக்கிவிட்டது. அங்கு வசிப்பவர்கள், வசிக்காதவர்கள் எவரும் எவ்விதக் கட்டுப்பாடும் இன்றி நிதியை அனுப்பவும் பெறவும் முடியும்.

இப்பொழுது, நாடாளுமன்ற ஒப்புதலுக்காக முன்வைக்கப்பட்ட வெளிநாட்டு நாணயமாற்றுச் சட்டத்தின் கீழான கட்டளைகள் மீதான விமர்சனங்களைத் தீர்க்கவும், இலங்கையை ஒரு மண்டல நிதி நடுவமாக வலுப்படுத்தவும் பின்வரும் பரிந்துரைகளை நான் முன்வைக்கின்றேன்:

சுங்கக் கட்டளைச் சட்டத்தைப் புதிதாக்கல்: வர்த்தகத்துக்கான எண்மிய "தேசிய ஒற்றைச் சாளரத்தை" செயற்படுத்துவது வெளிநாட்டு நாணயமாற்று ஒப்புதல்களுக்கான தாமதங்களைக் குறைக்கும்.

இணையத் தீர்வைகளைப் படிப்படியாக நீக்குதல்: துறைமுக மற்றும் விமான நிலையத் தீர்வை மற்றும் சிறப்புத் தீர்வை போன்றவற்றை ஐந்து ஆண்டுகளில் நீக்குவது குறித்த உறுதிப்பாட்டை அரசு கடைபிடிக்க வேண்டும்.

எண்மிய அடையாள அட்டை: 2026ஆம் ஆண்டில் வழங்கத் திட்டமிடப்பட்டுள்ள எண்மிய அடையாள அட்டை வழங்கலானது, நிதி முறையை எண்மிய மயமாக்கி, வெளிநாட்டு நாணயமாற்று ஓட்டத்தை மிகவும் திறமையாகக் கண்காணிக்க உதவும்.

2026ஆம் ஆண்டில் நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்டுள்ள வெளிநாட்டு நாணயமாற்றுச் சட்டத்தின் கீழான கட்டளையானது, இலங்கையின் பொருளாதாரப் பயணத்தில் ஓர் இன்றியமையாத மற்றும் அறிவுசார் நடவடிக்கையாகும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up now.

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
Please give me one more minute, Sir.

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

வெளிநோக்கிய முதலீட்டு வரம்புகளை அதிகரிப்பதன்மூலம், நெருக்கடி மேலாண்மையிலிருந்து வளர்ச்சி சார்ந்த கொள்கைக்கு மாறுவதை அரசு குறியீடு செய்கிறது. இருப்பினும், இலங்கையை உண்மையான வணிக மற்றும் நிதி நடுவமாக மாற்றுவதற்குத் தேவையான விரிவான சீர்திருத்தங்களில் ஒரு பகுதியே இதுவாகும். இந்தியா மற்றும் சிங்கப்பூரின் முன்மாதிரிகளைப் பின்பற்றி, ஒன்றைக் கொடுக்கல் வாங்கல்களுக்குத் 'தானியங்கி வழி' என்பதே தர நிலையாக மாறும் நிலையை நோக்கி இலங்கை நகர வேண்டும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சிங்கப்பூர் போன்ற ஒரு திறந்த பொருளாதாரமாக மாற வேண்டுமானால், நாம் சட்டங்களில் மட்டுமன்றி, நிறுவன அடிப்படையிலான சீர்த்திருத்தங்களிலும் கூடுதல் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Chathuranga Abeysinghe. You have ten minutes.

[අ.භා. 1.46]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද්ට නියමිත විවාදය කරගෙන යද්දී, ගරු ජනාධිපතිතුමා මේ සභාවට පැමිණ විශේෂ ප්‍රකාශයක් කරමින්, අපේ රට මොන වාගේ තත්ත්වයක ඉඳලා මොන වාගේ තත්ත්වයකට යනවාද කියලා ඉතාම හොඳ විද්‍යාත්මක පැහැදිලි කිරීමක් කළා. හැබැයි, අවාසනාවන්ත ලෙස විපක්ෂ නායකතුමා ඒකට ප්‍රතිචාර දක්වමින්, ඉතා අවිද්‍යාත්මක ප්‍රකාශ කිහිපයක් කරමින්, නැවතත් අර පරණ පුරුදු දේශපාලන කථාවම කළා.

ජාතික ජන බලවේගයේ අපි ආර්ථිකය නිර්මාණය කරද්දී තේමාව විධියටම ගත්තේ, "Resilient Economy". මොකද, මේ ලෝකයේ විචල්‍යතා - ලෝකයේ වෙනස් වීම් - දැන් නියතයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, uncertainty is the certainty. මේ සිදු වන වෙනස්වීම් පාලනය කරන්න අපට බැරි වුණත්, වෙනස්වීම් එක්ක රටක් කොහොමද ශක්තිමත්ව ඉස්සරහට යන්නේ කියලා බලමින්, ආර්ථික ගමන ශක්තිමත් කරන්න තමයි ජාතික ජන බලවේගය මැදිහත් වුණේ. මොකද, මේ විපක්ෂයේ ඉදිරි පෙළ මන්ත්‍රීවරු - ඇත්තටම කිහිපදෙනායි දැන් සභාව නියෝජනය කරන්නේ - දශක ගණනක් රට පාලනය කළා. නමුත්, මේ රට ගොඩනඟන්න ඒ අය මොනවාද කළේ? ආර්ථිකයක ප්‍රධාන පදනම් තුනක් තිබෙනවා. එකක් තමයි, ආහාර සුරක්ෂිතාව. මෙතුමන්ලා ආහාර සුරක්ෂිතතාව ඇති කරලා තිබෙනවාද? නැහැ. ඊළඟට, බලශක්ති සුරක්ෂිතාව ඇති කරලා තිබෙනවාද? නැහැ. ඊළඟට, මූල්‍ය ස්ථාවරත්වය ඇති කරලා තිබෙනවාද? නැහැ. මෙතුමන්ලා දශක ගණනක් ආර්ථිකය කළමනාකරණය කරලා, ආර්ථිකයක තිබෙන්න ඕනෑ ඔන්න ඔය මූලික ගුණාංග තුනම නැති කරලා, අවසාන වශයෙන් රට බංකොලොත් කරලා අතහැර දමලා ගියා. එහෙමයි දුවලා, පැනලා ගියේ.

විපක්ෂ නායකතුමා මෙතැනදී ඉතා සාවද්‍ය ප්‍රකාශ කිහිපයක් කළා. මම එය highlight කරන්න කැමැතියි. අවම වශයෙන් ආර්ථික විද්‍යාව ඉගෙන ගන්න, ආර්ථිකය ගැන සහජ දැනුමක් තිබෙන සමාජයේ ජනතාවට තේරුම් ගන්න පුළුවන් ප්‍රකාශ කරන්න. එතුමා කිව්වා, "2028 වනකොට බිලියන 3.5ක් ගෙවන්න තිබෙනවා. අපට ඒක ගෙවන්න බැහැ" කියලා. එය අමූලික අසත්‍ය ප්‍රකාශයක්; සාහසික ප්‍රකාශයක්. මොකද, මේ රටට ව්‍යවසායකයන්ට එන්න කියනකොට, ව්‍යාපාර වර්ධනය කරන්න කියනකොට, ඒ අය තුළ රට ගැන අවිනිශ්චිතතාවක් ඇති කරන්නේ මේ විපක්ෂ නායකතුමා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගිය අවුරුද්දේ ණය විධියට ඩොලර් බිලියන 3.9ක් ගෙව්වා. එතකොට මේ ජනවාරිවල අපනයනය වැඩි වෙලා නම්, මේ ජනවාරිවල සංචාරක ව්‍යාපාරය දියුණු වෙලා නම්, මේ ජනවාරිවල සෘජු ප්‍රේෂණ වැඩි වෙලා නම්, ගිය අවුරුද්දට වැඩිය මේ අවුරුද්දේ -2024ට වැඩිය 2025දී- ආයෝජන වැඩි වෙලා නම්, අපට 2028 වනකොට බිලියන 3.5ක් ගෙවන්න පුළුවන්. එහි කිසිදු තර්කයක් නැහැ. එතුමා අර වාගේ සාවද්‍ය ප්‍රකාශ කරමින්, මෙහෙම දෙයකුත් කිව්වා. අපි ආපු දවසේ ඉඳලා කිව්වා ලු. ඔව්, ඔබතුමන්ලා ආපු දවසේ ඉඳලා උදේ රෑ ප්‍රාර්ථනා කළා, "පෝලිම් හැදියන්, රට බංකොලොත් වෙයන්" කියලා. ඉතින්, අද සමහර අය බොහොම සතුටට පත් වෙලා තිබෙනවා, කොහොම හරි පෝලිමක් හැදුණු එක ගැන. මෙතැන ඉන්නවා කිහිපදෙනෙක්, පෝලිම් ගැන කථා කරලා මයික් පළනවා. පෝලිමක් හැදෙන කල් බලාගෙන හිටියා. නමුත්, අවුරුදු එකහමාරක් ගියා පෝලිමක් දකින්න. මොකද, ඔය පෝලිම් නැතුව, මේ ආර්ථිකයේ විචල්‍යතා නැතුව එතුමන්ලාට බලය ගන්න බැහැ කියලා දන්නවා. දේශපාලනය කරන්න විභවයකුත් නැහැ. මොකද, අපට වඩා හොඳ වෙන්නද? වංචා, දූෂණ නැහැ කියන්නද? ප්‍රසම්පාදනවලින් ඉස්සරහට ගනුදෙනු කරන්න කැමැතියි කියන්නද? දේශපාලන පත්වීම් නවත්වන්න පුළුවන් කියන්නද? කිසි දෙයක් කියන්න බැහැ. මේ රටේ ජනතාව ඉල්ලපු ආර්ථික, සමාජ හා දේශපාලන වෙනස ජාතික ජන බලවේගය ස්ථාපිත කළාට පසුව මෙතුමන්ලාට දේශපාලනයක් නැහැ. ඒ නිසා දැන් බලාගෙන ඉන්නවා, කාගේ හරි මාර්ගයෙන් පෝලිමක් ඇති කර ගන්න. ඒකට තෙල් දාලා අවුළුවන්න. ඒගොල්ලන්ගේ නාළිකා දෙක, තුන අරගෙන ගිහිල්ලා මිනිසුන්ගෙන් voice-cuts ගන්න. අනේ, පව්! ඒකටත් අවුරුදු එකහමාරක් බලාගෙන ඉන්න වුණා. ඒකට අවස්ථාව ලැබුණා. නමුත්, ලැබුණු අවස්ථාවෙනුත් වැඩක් නැහැ කියන එක ජනාධිපතිතුමා ඉතා හොඳින් පැහැදිලි කරලා දුන්නා.

ඊට පස්සේ කියනවා, scenario planning කරන්න ඕනෑ ලු, contingency planning කරන්න ඕනෑ ලු. මගේ අම්මෝ! එහෙම කළා නම් 1990 වර්ෂයේ ඉඳලා ලංකාව සිංගප්පූරුවක් වෙලා. 2015දී ISB ණය ගන්නකොට කළාද, contingency planning? 2015දී සියයට 7ට ISB ණය ගන්නකොට කළාද, scenario planning? ලංකාවට insurance ක්‍රමයක් නැහැ. "දිට්වා" සුළි කුණාටුව ආවාම ඒක expose වුණා. මේ වාගේ අර්බුදයක් ආවාම තෙල් ටැංකිවල ප්‍රශ්නයි, නළ පද්ධතිවල ප්‍රශ්නයි expose වෙනවා. මොකක් හරි හදිසියක් වුණාම මිනිසුන්ගේ දරිද්‍රතාව ප්‍රශ්නයක් විධියට expose වෙනවා. මොනවාද, මේගොල්ලන්ගේ තිබුණු contingency planning? මේගොල්ලන් ඒ කාලයේ තනිකරම කටයුතු කළේ කොහොමද? එක් එක් කාලයේ එක් එක් නායකයා අත්තනෝමතික තීරණ ගත්තා. මේ චන්දිහට්ටයින් ටික ඒකට අත ඉස්සුවා. ඒක තමයි අපේ රට ගිය මාර්ගය. එහෙම නැතුව යම් ප්‍රතිපත්තියක ගිය මාර්ගයක් නැහැ. මේ අයට නිසි ආර්ථික ප්‍රතිපත්තියක් තිබුණේත් නැහැ. මේ අයට එවැන්නක් ක්‍රියාත්මක කරගන්නත් බැරි වුණා. මෙන්න මේ තත්ත්වය යටතේ තමයි විශේෂයෙන්ම වර්තමානයේ අපි මේ ව්‍යුහාත්මක ප්‍රශ්නවලට විසඳුම් ගෙනෙන්නේ; යම් යම් අංශ ඩිජිටල්කරණයට ලක්

කරන්නේ; මාර්ග පද්ධතිය විද්‍යාත්මකව දියුණු කරන්නේ; බලශක්ති යටිතල පහසුකම් දියුණු කරන්නේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්නේ. මේ සියලුම ක්‍රියාමාර්ග සිදු වන්නේ මේ ආර්ථිකය දිනෙන් දින ඉහළට ගෙන යන්නයි.

ජනවාරි මාසයේදී මහ බැංකු වාර්තාව සභාගත කළා. ඒ අනුව පසුගිය ජනවාරි මාසයට ඉස්සෙල්ලා අපි සෑම ක්ෂේත්‍රයකින්ම ඉදිරියට ගිහිල්ලා තිබුණේ. වෙළෙඳ ශේෂයේ අගය වැඩි වෙලා තිබෙනවා; remittances වැඩි වෙලා තිබෙනවා, ඩොලර් මිලියන 751කින්; ඒ වාගේම, අපේ Gross Official Reserves 6.8න් ඉදිරියට යනවා. දැන් මෙතැන කෑ ගැහුවාට, අපේ import coverage එක තිබෙනවා, 3.8ක්. මේ, reserves build කරගෙන අපි ඉස්සරහට යන මොහොතක්. මේ වෙලාවේ විවිධ ප්‍රකාශ කරමින්, ලංකාවෙන් හරි, ආර්ථිකයෙන් පිට හරි මොකක් හරි විචල්‍යතාවක් අරගෙන උත්සාහ කරනවා, ජනතාව කුලප්පු කරන්න. අපේ රටේ ජනතාව ඉතාම බුද්ධිමත් දේශපාලන තීරණයක් ගත්තා. ඒ දේශපාලන තීරණය මත ඔවුන් සිටිනවා. එම නිසා ඔය මාධ්‍ය භාවිත කරලා, voice-cuts අරගෙන ජනතාවගේ මතය වෙනස් කරන්න බැහැ කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අනුමත කරන මේ නියමය මඟින් තවත් සුවිශේෂී කාරණයක් සිදු වනවා. 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ ඉදිරිපත් කරන නව විනිමය නීතියක් තමයි මෙම නියමය හරහා අද සම්මත කර ගන්නේ. අපි දන්නවා, නව විනිමය පාලන පනතක් තිබෙන බව. ඒක දැන් ඉතාම සක්‍රිය ආකාරයෙන් මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනවා. අපේ රටේ මුදල් නැති වෙච්ච කාලයේ - බංකොලොත් වෙච්ච කාලයේ, විදේශ විනිමය නැති වෙච්ච කාලයේ - තහංචි වගයක් පැනෙව්වා, විදේශීය ගිණුම් හිමි පුද්ගලයන්ට හා විදේශ ගිණුම් හිමි ව්‍යාපාරවලට ප්‍රාග්ධන වියදම් විධියට වෙන රටක ආයෝජනය කරන්න හෝ වෙන රටකට මේ රටෙන් මුදල් ගෙන යෑමේ සීමා සම්බන්ධයෙන්. පසුගිය වසර තුළදී මේ සීමාවන් එකින් එක අපි ලිහිල් කළා. එහි තේරුම තමයි, අපි විදේශ විනිමය වශයෙන් ශක්තිමත් රාජ්‍යයක් බවට පත් වෙලා තිබෙනවා කියන එක.

අනෙක් කාරණය මේකයි. මෙතැනදී අපි විදේශ ආයෝජකයන්ට සිග්නල් එකක් දෙනවා, මේ රට දැන් සාර්ථක ගමනක් යනවා, ඔයගොල්ලන්ගේ ආයෝජන ගෙනෙන්න කියලා. ඒ වාගේම විදේශ විනිමයෙන් ආනයනය කරන අපේ රටේ ආයතනවලට අපි පණිවුඩයක් දෙනවා, ඔබට මීට කලින් තිබුණේ ඩොලර් ලක්ෂ දෙකක් ගෙන යන්න අවස්ථාවක්, දැන් ඒක ලක්ෂ පහ දක්වා වැඩි කරලා තිබෙනවා කියලා. පෞද්ගලික ගිණුමක් නම් 20,000ක තිබුණු එක 25,000ට වැඩි කරලා තිබෙනවා. මේ කියැවෙන්නේ අපි ආර්ථිකය කොහොමද ප්‍රසාරණය කර ගන්නේ කියලායි. අපි ආර්ථිකය ප්‍රසාරණය කරනකොට අපේ රටට එන විදෙස් ආයෝජකයිනුත් දිරිමත් වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ වෙලාවේ ලංකාවේ කර්මාන්තකරුවාත් දිරිමත් කරනවා, විදෙස් රටවලට ගිහිල්ලා ඒ රටවල ආයෝජනය කරලා අපේ සන්නාමය එහේ පැළ කරන්න. එහි වර්ධනයකුත් අපට දිනෙන් දින, වසරින් වසර පෙනෙනවා. අපේ රටේ ආයතනවල හිමිකරුවන් වෙනත් රටවලට ගිහිල්ලා කර්මාන්ත මිලදී ගන්නවා වාගේම ඔවුන්ගේ සන්නාමයත් ඒ වෙළෙඳ පොළේ සාක්ෂාත් කර ගන්නවා.

අපේ ඇහලුම් සන්නාමයක් මේ වනකොට ඇමෙරිකාවේ ප්‍රසාරණයකොට තිබෙනවා. පසුගිය සතියේ අපේ බිස්කට් ආශ්‍රිත කර්මාන්තයක් වෙනත් රටක කර්මාන්තශාලාවක් මිලදී ගත්තා. මෙන්න මේ උනන්දුව, ධෛර්යය දෙන්න තමයි අපි මේ වෙනස්කම කරලා ඩොලර් ලක්ෂ පහ දක්වා වූ තමන්ගේ ආයෝජන වෙනත් රටවල කරන්න අවශ්‍ය නිදහස ලබා දෙන්නේ. රටක් දියුණු වනකොට ආයෝජන කැඳවන්න නම්, ඒ ආයෝජන ගෙනෙන අයට නැත්නම් විදේශ විනිමය උපයන අයට පුළුවන්කමක් තිබෙන්න ඕනෑ, තමන්ට අවශ්‍ය වෙලාවට වෙනත් රටවල ආයෝජනය කරන්න ඒ මුදල් නිදහසේ අරගෙන යන්න. ඒ වෙනස හරහා අපි ඉදිරියට බලාපොරොත්තු වනවා, තව තවත් ඉදිරියට මේ නිදහස් කිරීම කරන්න. ඒ හරහා තමයි ආයෝජනවලට සුදුසු වපසරියක් ලංකාවේ ඇති වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. මේ රට ස්ථායී තැනකට ඇවිල්ලා, ජනාධිපතිතුමා පැහැදිලි කළා වාගේ ලෝකයේ තිබෙන විචල්‍යතාවන්ට මුහුණ දෙන්න පුළුවන් ආර්ථිකයක්, resilient economy එකක් හදන එක, ඒ කියන්නේ වෙනත් මොන විචල්‍යතාවක් වුණත් ඉක්මනට අපට ප්‍රකෘති තත්ත්වයට පත් වන්න පුළුවන් කියන එක තමයි අපි බලාපොරොත්තු වන්නේ. ඒ සඳහා අවශ්‍ය කරන තොග ප්‍රමාණයක් තිබෙනවා; අවශ්‍ය කරන වෙනස්කම් ප්‍රමාණයක් අපට කරන්න තිබෙනවා. ඒ අවශ්‍ය කරන වෙනස්කම් ප්‍රමාණය කරනවාත් එක්කම අපි ආර්ථිකයේ දැවැන්ත ප්‍රසාරණාත්මක ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ නිසා මේ වසරේ ආර්ථික වර්ධනය, මේ වසරේ අපනයන ඉලක්ක, මේ වසරේ විදේශ සංචිත, විදේශ ප්‍රේෂණ, ඒ වාගේම සංචාරක අරමුණු සාක්ෂාත් කර ගන්න රට මැදිහත් වෙලා තිබෙනවා. ඒ මැදිහත් වීමේදී රජය පමණක් නොවෙයි, විපක්ෂයේ කාර්යභාරය වන්නේත් විද්‍යාත්මකව, pragmatically මේකට මැදිහත් වන එකයි. එහෙම නැතුව, එක එක statements දමා, විවිධ රාජ්‍යයන් එක්ක අපේ රජය සට්ටනය කරවන්න උත්සාහ කරලා බලන එක නොවෙයි. අපි සෑම රාජ්‍යයක් එක්කම ඉතාම හොඳ සහසම්බන්ධතාවක් පවත්වාගෙන යනවා. ලෝකයේ සිදු වන වෙනස්කම් අපට වෙනස් කරන්න අමාරුයි. නමුත් ඒ වෙනස්කම්වලට සාපේක්ෂව අපි ඉතාම විචක්ෂණශීලීව, ප්‍රතිපත්තිගරුකව මේ ආර්ථිකය මෙහෙයවනවා. ඉතින් මෙහෙම ආර්ථිකය මෙහෙයවනකොට මේ ඉලක්කම්, මේ ශක්තිය, මේ ආර්ථිකයේ විභවය ගැන හැමදෙනාම තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා කිසි කෙනෙකුට කලබල වෙන්න අවශ්‍යතාවක් නැහැ. මේ තත්ත්වය ඉතාම හොඳින් කළමනාකරණය කරන්න අවශ්‍ය කරන සියලුම කාරණා රජය විසින් මේ වනකොට සාක්ෂාත් කරලා තිබෙනවා. විපක්ෂයේත් සහාය අපි ඉල්ලා සිටිනවා, මේ රට දියුණු රටක් බවට පත් කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Chanaka Madugoda. You have seven minutes.

[අ.භා. 1.57]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද දවසේ විදේශ විනිමය පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නව නියමයක් පිළිබඳව කථා කරනවා. මීට පෙර කථා කළ අපේ නියෝජ්‍ය ඇමතිතුමාත්, අද උදේ සභාවට පැමිණි ගරු ජනාධිපතිතුමාත් අම්හිරි අත්දැකීම් පිළිබඳව කථා කළා. ගැස්

[ගරු චානක මාදුගොඩ මහතා]

පෝලිම්, තෙල් පෝලිම් ගැන කථා කළා. හැබැයි අපි අදටත් වග කියන විපක්ෂයක් විධියට, ගෑස් පෝලිම්වලට ගිහිල්ලා, තෙල් පෝලිම්වලට ගිහිල්ලා voice-cuts දීලා දේශපාලනය කරන දේශපාලන පක්ෂයක් නොවෙයි කියන කාරණයත් පළමුවෙන් සිහිපත් කරන්න ඕනෑ. මීට පෙර කථා කළ නියෝජ්‍ය ඇමතිවරයා එහෙම දෙයක් කිව්වා. ඒ වාගේම අපි මේ මොහොතේත් කියනවා, තෙල් ප්‍රශ්නයක් තවම ලංකාවේ නැහැ කියලා. තෙල් ප්‍රශ්නයක් ඇති වෙන්නත් එපා කියන ප්‍රාර්ථනය තමයි අපි විපක්ෂයක් විධියට මේ මොහොතේ කරන්නේ.

මීට පෙර අපේ වසන්ත සමරසිංහ ඇමතිවරයා කිව්වා, ගෑස් ගැන ප්‍රශ්නයක් නැහැ කියලා. හැබැයි, අදටත් අපේ ගම්වල මුදලාලි මහත්වරු තමන්ගේ දුරකථන විසන්ධි කරගෙන ඉන්නේ. තවමත් ග්‍රාමීයව ගෑස් නැහැ කියන කාරණය මේ ආණ්ඩුව දන්නේ නැත්නම් දැනගන්න කියන කාරණයත් මේ මොහොතේදී මම සිහිපත් කරනවා. ඒ ප්‍රශ්නයත් විසඳන්න. විපක්ෂයක් විධියට අපි සමාජය ගිනි තියන්න කටයුතු කරන්නේ නැහැ, සමාජය සුවපත් කරන්න තමයි කටයුතු කරන්නේ කියන කාරණයත් මම සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අද අපි හැමෝම කථා කරන මාතෘකාවක් තමයි, ඉරානයට එල්ල වෙච්ච ඒ ප්‍රහාරය. විශේෂයෙන් පක්ෂයක් විධියට ඒ පිළිබඳ අපේ දැඩි අප්‍රසාදය, දැඩි විරෝධය ප්‍රකාශ කරනවා. ඉරානයට එල්ල වුණු ඒ ප්‍රහාරය සම්බන්ධයෙන් අපේ කනගාටුව මේ මොහොතේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විධියට අපි ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි යුද්ධය සමඟ අවුරුදු 30ක් කටයුතු කළා. යුද්ධය ගැන කථා කරනකොට අපට ඒ යුද්ධයේ අමිහිරිකම, කුරිරුකම මේ මොහොතේදී සිහිපත් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉරානයත්, අපත් අතර තිබෙන මිතුදම පිළිබඳව අපට මතකයි. අපේ ලාංකීය ශිෂ්ටාචාරය වාගේම ඉරානයත් ඉතාම හොඳ, දීර්ඝ ශිෂ්ටාචාරයක් තිබෙන රටක්. යුද්ධය පැවැති කාලයේදී වාගේම යුද්ධය නොමැති කාලයේදීත් අපට ඉතාම හිතවත් මිතුරෙක් විධියට ඉරානය හැම දාම අපට සහයෝගය ලබා දුන්නා. අපට මතකයි, මානව හිමිකම් කවුන්සලය ශ්‍රී ලංකාවට විරුද්ධව මානව හිමිකම් සම්බන්ධයෙන් ඒ යෝජනා ගෙනෙන විට අපේ ඉතාම ළඟ මිත්‍රයෙක් විධියට අපව තනි නොකර ඉරානය අපත් සමඟ හැම දාම හිට ගත්තාය කියන කාරණය. කෘතවේදී ජනතාවක් විධියට අපි මේ මොහොතේදී එම කාරණය ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම, ඔබ එදා විරුද්ධ වුණු උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය මේ රටට දායාද කළේ ඉරානය කියන කාරණයත් මේ මොහොතේදී මම සිහිපත් කරනවා. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාත්, ඉරානයත් අතර තිබෙන මිතුදමත් සිහිපත් කරමින්, ඉරානයේ අධ්‍යාත්මික නායකයාට වාගේම අප සමඟ ඉතාම ළඟින් කටයුතු කරපු ඉරානයේ හිටපු ජනාධිපති අහමදිනෙජාද් ඇතුළු ඒ ජනතාවට අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ වාගේම, මේ යුද්ධය නිසා මැද පෙරදිග සිටින ලක්ෂ 10කට ආසන්න අපේ ශ්‍රී ලාංකිකයන් අද වනකොට ඉතාම අපහසුතාවට පත් වෙලා සිටිනවා. ඒ නිසා ඉරානය මේ මොහොතේදී මැද පෙරදිග රටවල් ඉලක්ක කර සිදු කරන ඒ ප්‍රහාරයන් පිළිබඳව අපි, අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ ආණ්ඩු බලය ලබා ගත් රටවල් තමන්ගේ බලය පතුරුවමින් කටයුතු කරන වෙලාවක, මේ ආණ්ඩුව තමන්ට ලැබුණු බලය ආරක්ෂා කර ගන්න බැරිව දිනෙන් දින ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙමින්, ජනතාවගේ අප්‍රසාදයට පත් වෙමින් තමයි අද වනකොට කටයුතු කරන්නේ කියන එක අපට පෙනෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි, ජනතාවගේ මතයට පිටුපෑම. ඕනෑම හරස්කඩකින්, ඕනෑම පැතිකඩකින් අද පෙනෙන්නේ මේ ආණ්ඩුවේ දූෂණය සහ වංචාව කියන කාරණය බව මේ මොහොතේදී මම සිහිපත් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දූෂණය, වංචාව, බලය අවභාවිත කිරීම, අකාර්යක්ෂමතාව, ජාතික ආරක්ෂාව සහ ආගමික සංහිඳියාව පිළිබඳව අවුරුදු දෙකක් යන්න පෙර මේ ආණ්ඩුවට විරුද්ධව චෝදනා එල්ල වෙලා තිබෙනවාය කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පිළිබඳව කථා කරනකොට මේ කාරණයත් මම මතක් කරන්න කැමැතියි. අපේ අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිවරයා මේ අවස්ථාවේදී මේ සභාවේ සිටියා නම් හොඳයි. එතුමා මගේ කථාවට පෙර නැඟිටලා ගියා. දින 3ක් මුළුල්ලේ අපි මේ සභාවේ හඬ නැඟුවා, වංචාවක්, දූෂණයක් පිළිබඳව. අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිවරයා මේ පාර්ලිමේන්තුවෙන් වැඩි දුරකට යන්න විධියක් නැහැ. මොකද, මීට විනාඩි 5කට විතර ඉස්සෙල්ලා තමයි එතුමා මේ සභා ගර්භයෙන් ඉවත් වුණේ. මම එතුමාට ආරාධනා කරනවා, පුළුවන් නම් ඇවිල්ලා මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කියලා.

පසුගිය ජනවාරි 22වැනි දා අපි මේ පාර්ලිමේන්තුවට කිව්වා, ත්‍රිවිධ හමුදාවේ වියළි ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ ටෙන්ඩරය පිළිබඳව අතිවිශාල වංචාවක් සිදුව තිබෙනවාය කියලා. හැබැයි, මේ ආණ්ඩුවේ කවුරුවත් ඊට උත්තර දුන්නේ නැහැ. කනගාටුවෙන් වුණත් මම කියනවා, විපක්ෂයවත් ඒ පිළිබඳව කථා කළේ නැහැ කියන එක. නමුත්, ඉතාම දැවැන්ත වංචාවක් සිදු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ටෙන්ඩරය අත්සන් කරන්න පැයකට ඉස්සෙල්ලා අපි පාර්ලිමේන්තුවේදී කිව්වා, මෙහෙම දූෂණයක්, වංචාවක් වෙනවා කියලා. හැබැයි, අද වෙනකම් ඒකට උත්තර දුන්නේ නැහැ. අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිවරයාගෙන් අපි ඉල්ලා සිටිනවා, පුළුවන් නම් මගේ ඉතුරු වේලාව අරගෙන මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කියලා. ආරක්ෂක ඇමතිවරයා විධියට ජනාධිපතිතුමාත්, ඒ වාගේම මේ කැබිනට් මණ්ඩලයත් හවුලේ මේ දූෂණයට සම්බන්ධ වුණා ද කියන ප්‍රශ්නය අපි හමුවේ තිබෙනවා කියන කාරණයත් මේ මොහොතේදී මම සිහිපත් කරනවා. එම නිසා මම ඉල්ලා සිටිනවා, ඒ වංචා පිළිබඳව අද මේ සභාව හමුවට ඇවිල්ලා පුළුවන් නම් උත්තර දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා කෙටි වෙලාවක් තිබෙන නිසා මම ඉක්මනින්ම මේ කාරණයත් කියන්නම්. මේ පාර්ලිමේන්තුවට අද මොවුන් ගෙනාපු ඒ සියලු කාරණා ගත්තාම, අපි අවශ්‍ය දේවල්වලදී ඒවාට පක්ෂ වෙනවා; විරුද්ධ වෙන්න ඕනෑ තැන්වලදී අපි විරුද්ධ වෙනවා.

පාර්ලිමේන්තු පොලිසියේ සේවය කරන නිලධාරි මහත්ම මහත්මීන් මේ පාර්ලිමේන්තුවට විශිෂ්ට මෙහෙවරක් ඉෂ්ට කරනවා. ඔවුන් සිදු කරපු ඒ සේවාව අවසන් කරලා අද වනකොට ඔවුන්ට නික්ම යන්න සිදුවෙලා තිබෙනවා කියලා යම් යම් ආරංචි මාර්ග හරහා අපට දැනගන්න ලැබී තිබෙනවා. හැබැයි, ඔවුන් පාර්ලිමේන්තුව තුළ විශිෂ්ට මෙහෙවරක් කළා. ඔවුන් ඒ වෙනුවෙන් ඉතා හොඳ පුහුණුවක් ලබමින් කටයුතු කළා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් ඒ කාරණය සම්බන්ධයෙන් මැදිහත් වෙන්න කියලා. ඔවුන් ලබා දෙන ඒ සුවිශේෂී සේවාව අගය කිරීමක් වෙනුවෙන් ඒ පිළිබඳවත් මැදිහත් වෙන්න කියන කාරණයත් මම මේ මොහොතේදී සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම, ගාල්ල දිස්ත්‍රික්කයේ මතු වුණු ගැටලුවක් පිළිබඳව මේ මොහොතේදී මම කියන්න කැමැතියි. ගාල්ල දිස්ත්‍රික් ආරෝග්‍යශාලා සමුපකාර ඡන්දය පැවැත්වුණා. ඒ ඡන්දයේදී ජනතා විමුක්ති පෙරමුණ එහෙම නැත්නම් මාලිමාව ඉදිරිපත් කරපු කණ්ඩායමේ සියලුදෙනාම පරාජයට පත් වුණා. අද වනකොට ගාල්ල දිස්ත්‍රික්කයේ සියලුම සමුපකාර ඡන්දවලින් මාලිමාව පරාදයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි කනගාටුවට කරුණක් තිබෙනවා. ඔබේ ආණ්ඩුවේ, ඔබේ ජනාධිපතිවරයා පත් කරපු දකුණු පළාතේ ආණ්ඩුකාරතුමා ඒ සියලුම සමුපකාර ඡන්දවලින් නීතියට අනුව ජයග්‍රහණය කරපු සාමාජිකයන් වෙනුවට අනීතිකව තමන්ගේ හිතවතුන් පත් කරන්න යම් සූදානමක් තිබෙනවාය කියන කාරණයත් මම මේ මොහොතේදී සිහිපත් කරනවා. මැතිවරණයෙන් බලයට පත් වෙච්ච ඔබ, මැතිවරණ පිළිබඳ විශ්වාස කරන දේශපාලන පක්ෂයක් විධියට ගාල්ල දිස්ත්‍රික් ආරෝග්‍යශාලා සමුපකාර ඡන්දයෙන් දිනපු ඒ ජයග්‍රහණය අවභාවිත කිරීමට උත්සාහ කරන්න එපා කියලා අපි කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chanaka Madugoda, your time is up.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
අපි විශේෂයෙන්ම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරන්න ඕනෑ. ඔබේ ආණ්ඩුව නිවැරදි දේ කරන්න ආපු ආණ්ඩුවක් හැටියට තමයි කථා කළේ. හැබැයි, අද ඔබේ ආණ්ඩුව නිවැරදි දේ කරන්නේ නැතුව තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරමින් අද ගාල්ලේ සමුපකාර ඡන්ද අවභාවිත කරමින් කටයුතු කරන්න සූදානමක් තිබෙනවා කියන කාරණයත් මේ මොහොතේදී මම කනගාටුවෙන් වුණත් සිහිපත් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මේ රටේ පවතින ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්න කියලා අපි විශේෂයෙන්ම මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. ඒ විසඳුම් පිළිබඳව කථා කරන්න. එහෙම නැතුව විපක්ෂයට චෝදනා කරමින් කටයුතු කිරීමෙන් ඵලක් නැහැ කියන කාරණයත් සිහිපත් කරමින්, අවස්ථාව ලබා දීම පිළිබඳවත් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Thilanka U. Gamage. You have nine minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.07]

**ගරු තිලංක යූ. ගමගේ මහතා**
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියමය සම්බන්ධයෙන් විවාද කරන මේ මොහොතේදී මුලින්ම මම මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. අද දවසේදී අපේ ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ මේ සභාවට පැමිණිලා මේ වනවිට රටේ මතුවෙලා තිබෙන තත්ත්වය පිළිබඳව විශේෂ පැහැදිලි කිරීමක් කළා. ඒ පැහැදිලි කිරීමට අදාළව විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ මතය බවට පත් වෙලා තිබෙන්නේ ඔවුන්ට ඕනෑ දේ කියැවුණේ නැහැ එහෙම නැත්නම් ඔවුන් බලාපොරොත්තු වුණු දේ කියැවුණේ නැහැ කියන එකයි. අපි විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමන්ලාට ඕනෑ දේ කියන්න කොහොමත් ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ආවේ නැහැ. අපේ රටේ ජනතාව වෙනුවෙන් විශේෂයෙන්ම ලෝකයේ පවතින තත්ත්වය ගැනත්, මේ රටේ පවතින තත්ත්වය ගැනත් පැහැදිලි කිරීමක් කරන්න තමයි එතුමා මේ පාර්ලිමේන්තුවට ආවේ. ඔබතුමන්ලාට ඕනෑ දේ වුණා නම් මේ වෙනකොට රට පාලනය කරන්නේ ඔබතුමන්ලා. එහෙම වුණා නම් මේ රටේ අද තිබෙන මේ තත්ත්වය කොහෙත්ම තිබෙන්නේත් නැහැ කියන කාරණයත් මම කියන්න ඕනෑ. කොහොම වුණත් 2020 අවුරුද්දෙන් පසුව අපේ රටේ ආර්ථිකය දිනෙන් දින ගමන් කළේ කඩා වැටෙමින් තිබෙන තත්ත්වයකටයි. අපේ රටේ සිටින කුඩා දරුවාගේ ඉඳලාම හඳුනාගෙන තිබුණේ අපි සංවර්ධනය වෙමින් පවතින රටක් හැටියටයි. හැබැයි, 2024 අවුරුද්ද වනවිට බංකොලොත් රටක් බවට සීල් එක ගහලා තමයි අන්තිමේදී අපේ රට බංකොලොත් රටක් බවට පත් වුණේ.

අපි මේ රට භාර ගන්නකොට සෑම ආර්ථික දර්ශකයකින්ම, ආර්ථික, දේශපාලනික වැනි හැම පැත්තකින්ම මේ රට සහමුලින්ම කඩා වැටිලා ඉවරයි. ඇත්තටම ගත්තොත්, එහෙම රටක් තමයි අපිට භාර දුන්නේ. එවැනි අවදානම් තත්ත්වයක තිබුණු මේ රට අපි භාරගෙන, ක්‍රම ක්‍රමයෙන් ඒ ආර්ථික දර්ශකවලින් ඉහළට ඔසවා තබමින් ඉන්නවා. මේ වන විට අපේ රටේ පමණක් නොවෙයි, මහ බැංකුවේ අධිපතිවරයා පමණක් නොවෙයි, සියලු ලෝක තත්ත්වයන් යටතේ සියලු ජනාධිපතිවරුන් වාගේම විවිධ ආර්ථික සංවිධාන හැම එකකින්ම කියනවා, අද අපේ රට ක්‍රම ක්‍රමයෙන් ආර්ථික අර්බුදයෙන් ගලවාගෙන සැබෑ ආර්ථික ස්ථායීතාවකට අරගෙන එනවා කියන එක.

ගොඩක් වෙලාවට විපක්ෂය උත්සාහ කරනවා, මේ රටේ අවිනිශ්චිතභාවයක් තිබේ යැයි සඳහන් කරන්න. අපි ඒකත් කියන්න ඕනෑ. ඉතාම අවිනිශ්චිතභාවයක් මතු කරමින්, ජනතාව තුළ සැකය උපදවමින්, මේ රට කඩා වැටෙනවා, එහෙම නැත්නම් මේ අර්බුදය තවදුරටත් මේ රටේ පවතිනවා කියන එක මතු කරමින්, ඒ තුළ දේශපාලනය කරමින්, පාලන බලය ඔවුන් අතට පත් කරගන්න උත්සාහ කරනවා. එහෙම හිතනවා නම්, සොරි! මොකද, විශේෂයෙන්ම 2025 වසරේ මේ රටේ තිබ්බ තත්ත්වයන් අපි සහමුලින්ම වෙනස් කරගෙන තිබෙනවා.

2025 වසරේ අපේක්ෂා කළ බදු ආදායම සියයට 15.3ක්. එය සියයට 10ට පහළ මට්ටමක් දක්වා ඇද වැටිලා තිබුණේ. අපි සියයට 15.3ක බදු ආදායමක් අපේක්ෂා කළා. ඒක සියයට 15.8 දක්වා වැඩි කරගන්න අපි සමත් වෙලා තිබෙනවා. අපි දැකපු ඉතිහාසයේ කවදාවත් ඒ අපේක්ෂිත බදු ආදායම ළඟා කරගෙන

[ගරු තිලංක යූ. ගමගේ මහතා]

තිබුණේ නැහැ. නමුත් අපි අපේක්ෂිත බදු ආදායම ළඟා කරගත්තා විතරක් නොවෙයි, ඒක වැඩි කරගන්නත් සමත් වෙලා තිබෙනවා. අන්න ඒ තත්ත්වයට අපි ආර්ථිකය අරගෙන ඇවිල්ලා තිබෙනවා, ඉලක්ක අභිභවමින්. ඒ වාගේම, සමස්ත ආදායම සියයට 17.2 දක්වා වැඩි කරගෙන තිබෙනවා.

ඒ වාගේම තමයි අය වැය හිඟයත්. ලෝකයම පිළිගන්නවා, අය වැය හිඟය සියයට 5ට වඩා අඩුවෙන් තියාගන්න ඕනෑ කියලා. හැබැයි අපේ රටේ එහෙම තත්ත්වයක් තිබුණේ නැහැ. හැබැයි අපිට පුළුවන් වුණා, 2025 වසරේ අය වැය හිඟය සියයට 2.4ට අඩු කරගන්න. අපි මේ රට ස්ථායීතාවයට පත් කරගත්තා කියන එකට හොඳ උදාහරණ ඒවා.

ප්‍රාථමික ගිණුමේ ශේෂය කියන්නේ සුවිශේෂීම එකක්. ප්‍රාථමික ගිණුමේ ශේෂයට ගන්නේ පොලී ගෙවීම් හැර -අපි ණය වාරික පොලී ගෙවීම් සිදු කරනවා- සමස්ත ආදායමින් අපේ වියදම් ටික අඩු කළායින් පස්සේ ලැබෙන ශේෂය. සාමාන්‍යයෙන් අපි උත්සාහ කරන්නේම ඒ ශේෂය ධන අගයක තියාගන්න. ධන අගයක තියාගන්නවා කියන්නේ රටේ සමස්ත ආදායම දෛනික වියදම් ටික පියවා ගන්න ප්‍රමාණවත් කියන එක. ඒ කියන්නේ අපිට පුළුවන් වෙනවා, මීට කලින් ලබාගත්ත ණය වෙනුවෙන් ගෙවන පොලිය නොගෙවා මේ රට පවත්වාගෙන යන්න. විශේෂයෙන් ගත්තාම, අපි මේකේ ධන ශේෂයක්; නිකම්ම නිකම් නොවෙයි, සියයට 5.6ක ධන ශේෂයක් වාර්තා කරගෙන තිබෙනවා. ඒක ලොකු ජයග්‍රහණයක්. හැබැයි අද විපක්ෂයේ කිසිවෙකුවත් මේ ජයග්‍රහණ ගැන කථා බහ කරන්නේ නැහැ. අපේ රට දැවැන්ත ලෙස ආර්ථික අර්බුදයේ පතුළටම කඩාගෙන වැටිලා තිබුණේ. හැබැයි මේවා කවදාවත් සිදු වෙච්ච දේවල් නොවෙයි. අපි ආණ්ඩුවක් විධියට විශේෂයෙන්ම මේවා එකිනෙක මේ ආර්ථික දර්ශකවලින් ඉහළට ඔසවා තබමින් ඉන්නවා.

ඒ වාගේම තමයි, පොලී අනුපාතය සියයට 30, 35 මට්ටමේ පැවතියේ. ආයෝජකයෝ හැරිලා ගියා. ආයෝජනය කළේ නැහැ. ව්‍යාපාර වැහුණා, ව්‍යාපාර කඩාගෙන වැටුණා. හැබැයි, අපි පොලී අනුපාතිකය සියයට 8ක වාගේ තනි ඉලක්කමකට ගෙනැල්ලා තිබෙනවා. උද්ධමනය පැත්තෙන් ගත්තාමත් එහෙමයි. අපි දන්නවා, දැවැන්ත ලෙස භාණ්ඩවල මිල ගණන් ඉහළ ගිය බව. හැබැයි අපි සමත් වෙලා තිබෙනවා, උද්ධමනයත් තනි ඉලක්කමකට ගේන්න. මේ රටේ ඉතිහාසයේ මෙවැනි තත්ත්වයන් තිබුණේ නැහැ. අපි ඒ ස්ථායීකරණය කරගන්න සමත් වෙලා තිබෙනවා.

මේ හැම දෙයක්ම ඇතුළේ අපි කථා කරන්න ඕනෑ, විශේෂයෙන්ම ගෙවුම් ශේෂය ගැන, ගෙවුම් තුලනය ගැන. අපි දන්නවා ගෙවුම් තුලනය මහා අර්බුදයකට ලක් වෙලා තිබුණේ කියලා. ගෙවුම් තුලනය ගත්තාම, විශේෂයෙන්ම අපේ රටේ ආර්ථික විද්‍යාව හදාරන උසස් පෙළ දරුවන් පවා දන්නවා, ප්‍රධාන වශයෙන් ජංගම ගිණුම - Current Account, ප්‍රාග්ධන ගිණුම, මූල්‍ය ගිණුම කියලා ගිණුම් 3ක් තිබෙන බව. අපි දන්නවා, මෙන්න මේ ජංගම ගිණුම තුළ ගොඩක් වෙලාවට ආනයන, අපනයන ආදායම්, වියදම් ඇතුළත් වෙලා තිබෙන බව. හැබැයි, අද වන විට අපේ අපනයන ආදායම වැඩි කරගන්න අපි සමත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අපි වාහන ගෙන්වන එක නතර කරලා තිබුණා. අපි වාහන ගෙනැල්ලාත්, විශේෂයෙන්ම අපි අපේක්ෂා කරපු වියදමටත් වඩා වැඩියෙන් වියදම් කළත් ගෙවුම් ශේෂ අර්බුදය මඟ හරවාගෙන තිබෙනවා. එහි ප්‍රතිඵලයක් ලෙස ඇත්තටම අපි සමත් වෙලා තිබෙනවා, මෙහි මුදල් ආයෝජනය කරන්න. ඒ තත්ත්වයට අපි සංචිත අත්පත් කර ගනිමින් ඉන්නවා. ඒ නිසා තමයි විශේෂයෙන් අද දවසේ මේ විනිමය පනත් සංශෝධනයට අදාළව මේ සාකච්ඡාව කරන්නේ.

මේ පනත් සංශෝධනයේදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, විදේශ විනිමය උපයන පිරිස් වෙත විදේශ රටවල ව්‍යාපාර පුළුල් කිරීමේ අවශ්‍යතාව සඳහා පහසුවක් ලෙස, ව්‍යාපාරික විදේශ ව්‍යහාර මුදල් ගිණුම් හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන දැනට පවතින සීමාව ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 2 සිට ලක්ෂ 5ට ලිහිල් කර තිබෙන බව. ඒ කියන්නේ, යම් ආකාරයෙන් මේ තිබෙන මුදල් ටික අපට පුළුවන් ඒ ව්‍යාපාරවල ආයෝජනය කරන්නට. එහෙම නැත්නම් අපට මේ තිබෙන මුදල් ටික ණයට දෙන්න පුළුවන්; එහෙමත් නැත්නම් ආයෝජනය කරන්න පුළුවන්. නැත්නම් අපට එවැනි ණය ගෙවා දමන්න පුළුවන්. ඒ තත්ත්වයට පත් කර ගන්න පුළුවන් හැකියාව තිබෙන නිසා තමයි මේ සීමාවන් ලිහිල් කරලා ආර්ථිකය එතැනට ගෙනියන්න සමත් වෙලා තිබෙන්නේ.

ඒ වාගේම තමයි පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ගෙවීම්වල දැනට පවතින සීමාව ඇමෙරිකානු ඩොලර් 20,000 සිට 25,000 දක්වා ඉහළ නැංවීමට සමත් වෙලා තිබෙනවා. මේකෙන් නේවාසිකයන් සඳහා වැඩි නම්‍යශීලිතාවයක් ඇති වෙලා තිබෙනවා. මෙය හොඳ තත්ත්වයක්. හැබැයි, මෙහි තිබෙන හොඳ තත්ත්වයන් ගැන තවමත් කිසිවෙක් කථා කරනවා මා දැක්කේ නැහැ. මේ හොඳ තත්ත්වය තමයි අපි මේ තිබුණු අර්බුදයෙන් මඟ හැරිලා කියන එකට තිබෙන නිදසුන. ඇත්තටම ගත්තොත්, දැන් තමයි ආර්ථිකයක් විධියට පණ ගහලා එන්නේ. හැබැයි, මේක ඇතුළේ බලනවා, ජනතාවට අවිශ්වාසය හදන්න.

අපි දන්නවා, මේ ලෝක තත්ත්වයන් නිසා යම් යම් ආකාරයේ බලපෑම් තිබෙන බව. අපි ඒවාට මුහුණ දෙන්නේ කොහොමද කියන එක, ඒවාට අවශ්‍ය කරන අපේ සූදානම ගැන අපේ ගරු ජනාධිපතිතුමා විශේෂයෙන්ම අද පාර්ලිමේන්තුවේ සඳහන් කළා. මෙවැනි දැක්මක් සහිත ආණ්ඩුවක් කවදාවත් අපට තිබිලා නැහැ. මෙවැනි දැක්මක් සහිත නායකයෙක් කවදාවත් අපට ඉඳලා නැහැ. ඒක තමයි අද දවසේ පැහැදිලි කළේ. අපට පුළුවන් මේ අර්බුද හැම එකකින්ම ජයග්‍රහණය කරලා රට ඉදිරියට අරගෙන යන්න.

දූෂිතභාවයෙන් මිදුණු රටක් හැටියට අද ලෝකයේ රටවල් ගණනාවක් පසු කරමින් අපේ රට ඉහළට ඇවිල්ලා තිබෙනවා. වංචාව, දූෂණයට තිත තියලා තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිව දන්නවා, මේ ආණ්ඩුවට, අපට පුළුවන් ආර්ථිකය ස්ථායීකරණය කරලා, ආර්ථිකයේ ආයෝජනයට අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්නට. අනිවාර්යයෙන් තව අවුරුදු කිහිපයක් යනකොට මේක දැවැන්ත ලෙස පිම් වශයෙන්ම ඉහළට එනවා. අන්න ඒක ඇතුළේ මිනිස්සුන්ට සතුටින් ජීවත් වෙන්න පුළුවන් අපි බලාපොරොත්තු වෙන පොහොසත් රට නිර්මාණය කර ගන්න පුළුවන් අවස්ථාව තිබෙනවා. අපි සියලු දෙනාම එකට පොර බදින්නේ ඒ වෙනුවෙන් කියන එක මතක් කරමින් මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.16]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දේශීය වශයෙනුත්, විදේශීය වශයෙනුත් විශාල බලපෑම් තිබෙන අවස්ථාවක වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ ප්‍රස්තාව ලැබීම සම්බන්ධයෙන් මගේ සතුට ප්‍රකාශ කරනවා.

මීට පෙර, Exchange Control Act, No. 12 of 2017 යම් විධියකින් සංශෝධනයට ලක් වෙලා ඉදිරියට යෑම ගැන අපි සතුට ප්‍රකාශ කරනවා. ඇයි මෙවැනි තත්ත්වයක් තිබෙන්නේ? එදා ලක්ෂ 2ට තිබුණු දේ, මීට අවුරුදු තුනකට ඉස්සර ඩොලර් ලක්ෂ 2ක් එවන්න පුළුවන් සීමාව අද ඩොලර් ලක්ෂ 5කට වැඩි කරලා තිබෙනවා. නමුත් එදා ඩොලර් ලක්ෂ දෙකකින් ගන්න පුළුවන් දේ අද ඩොලර් ලක්ෂ හත අටකින්වත් ගන්න බැරි තත්ත්වයක් තිබෙන එක තමයි තිබෙන ගැටලුව. ඉතින් ඒ නිසා ඒක සම කිරීමක් නොවෙයි. මොකද, අපට ආයෝජනය කරන්න පුළුවන් හැකියාව අඩු වෙලා තිබෙනවා. මේ අවස්ථාවේදී ඒකත් මතක් කරන්න අවශ්‍යයි. මොකද, ලිහිල් කිරීම නොවෙයි, අපට සැබෑ මට්ටමට ආයෝජන ගේන්න පුළුවන් ආකාරය ඇති කිරීම තමයි වැදගත්. මේක Inward Investment Account එක, Outward Investment Account එක කියන ඒ දෙක තුළින් කටයුතු කිරීමක්. Inward Investment Account එකේ ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒකෙන් රට ඇතුළට ගේන එක තිබෙන්නේ. Outward Investment Account එකෙන් කියන්නේ ලංකාවේ තිබෙන කොම්පැනියකට පිටරටකට ගිහිල්ලා ආයෝජනය කරන්න අවශ්‍ය නම්, ඒක කරන විධිය. මීට පෙර, මහ බැංකුව විසින් රට බංකොලොත් කියා ප්‍රකාශ කළාට පසුව -මේ පාර්ලිමේන්තුව නොවෙයි, බංකොලොත් කියා ප්‍රකාශ කළේ- ඒ අවස්ථාවේදී ඇති වුණු ප්‍රතිවිපාකය නිසා මේ රටේ තහංචියක් තිබුණා, පිටරටට යවන්නට. ඒක ලිහිල් කළා, ලක්ෂ 2කට. ඒ සීමාව අද ලක්ෂ 5 දක්වා වැඩි කරලා තිබෙනවා. හැබැයි, මේක මා හිතන විධියට පුළුවන් තරම් ඉක්මනට නිවැරදි කරන්න අවශ්‍යයි. මොකද, පුළුවන් තරම් ලිහිල් කිරීම තුළ තමයි ආයෝජකයන්ට මේ රටින් පිට රට ගිහිල්ලා, ඒ රට තරණය කරලා මේ රටට ආයෝජන ගේන්න පුළුවන් වන්නේ.

මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමා ගෙවුම් ශේෂය ගැන වැදගත් අදහස් ටිකක් දුන්නා. ඒ වාගේම මම ඒ මන්ත්‍රීතුමාට සහ ආණ්ඩු පක්ෂයේ ඉන්න සියලු දෙනාටමත් කියන්නේ, කරුණාකරලා මීට පෙර තිබුණු ඒවා ගැන කථා කරලා වේලාව නාස්ති කරන්න එපා කියලායි. එදා එහෙම වුණු නිසා තමයි අද අපි විපක්ෂයට ඇවිල්ලා තිබෙන්නේ. ඉතින් දැන් රට ඉදිරියට ගෙනියන්න.

අද මේ විපක්ෂය ගිහිල්ලා බෝඩ් ලෑල්ලක් අල්ලාගෙන strike කරනවා කවදාවත් දැකලා තිබෙනවාද? මේ විපක්ෂය අද කොහේ හරි පෙළපාළි යනවා දැකලා තිබෙනවාද? හිතන්න එපා, බැහැ කියලා. ශීලාචාර විපක්ෂයක් වශයෙන් අපි ඔබතුමන්ලාට අවස්ථාව දීලා තිබෙනවා. මොකද අපි දන්නවා, ආණ්ඩු පක්ෂයේ ඉන්න කොට රටක් කරගෙන යන එක කොතරම් අමාරුද කියලා. මේ වාගේ අවස්ථාවක, යුද ගැටුම් කියන ප්‍රශ්නයත් උග්‍ර වුණොත් ඒකෙනුත් බාධාවක් ඇති වෙනවා මිසක් උදවුවක් නොවෙයි වෙන්නේ. ඉතින් ඒකත් මතක් කරන්න අවශ්‍යයි. හැමදෙනාටම එකම බුරුසුවෙන් පාට ගෑම නොවෙයි කළ යුතු වන්නේ. මේක අපේත් රට. ගලේ කොටලා නැහැ, මෙය ඉදිරි කාලයේම මෙහෙම තිබෙනවා කියලා.

මේ රට නිදහස ලබා ගත්තාට පසුව මා නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂය මේ රටට ඉමහත් සේවයක් ඉෂ්ට කරලා තිබෙනවා. අද ඔය කථා කරන කෘෂි කර්මාන්තයේ ස්වයංපෝෂිත තත්ත්වයක් නැහැ කිව්වාට, ලාල් කාන්ත ඇමතිතුමා කියනවා ස්වයංපෝෂිත වෙලා තිබෙනවා කියලා. මොනවා වුණත්, කුමාර ජයකොඩි ඇමතිතුමා අද වෙනත් රටවලින් ගන්නේ නැතිව විදුලි බලය සියයට 100ක් මෙහේ නිෂ්පාදනය කරනවා. අවදානම තේරුම් ගත් නිසා තමයි අපි හැම අවස්ථාවකදීම ප්‍රශ්න කළේ, මේ වාගේ තෙල් ප්‍රශ්න ඇති විය හැකියි නේද කියලා. ඒ වාගේම තමයි අපි ඇහුවේ, පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති කරන්නේ ඇයි කියලා. මේ රටට, අපට ස්වභාව ධර්මයෙන් හිරු එළිය, සුළඟ, ජලය ලැබිලා තිබෙනවා. අපි ඇහුවා ඇයි අපි මේවායෙන් විදුලි බලය නිපදවීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති කර ගන්නේ කියලා. මේවා හැකි තරම් ප්‍රචලිත කරන්න, මේවායෙන් විදුලිය ජනනය කරන්න අපට පුළුවන් නම් විදේශ විනිමය වැය කරන්න අපට අවශ්‍ය නැහැ. අපට අපේ සම්පත්වලින්ම ආර්ථික වර්ධන වේගය වැඩි කර ගන්න පුළුවන්; ඒ වාගේම, අපේ විදේශ සම්පත් ටිකත් ආරක්ෂා කර ගන්නත් පුළුවන්. ඒ නිසා තමයි අපි Battery Energy Storage System - BESS - එක ගැන ඇහුවේ. තෙල්වලින් නිපදවන විදුලියට ගෙවන්නේ ඇයි කියලා තමයි අපි එදා ඇහුවේ. ඒ මාෆියාවට හසු වෙලා ඒකකයකට රුපියල් 80ක් ගෙවන්නේ නැතිව විදුලිය ඒකකයක් රුපියල් 40ට නිපදවා ගන්න අවශ්‍ය වන්නේ මේ වාගේ ප්‍රශ්න ඇති වෙන නිසායි. අපි දැනගත්තා, මැද පෙරදිග හරි, වෙනත් කොහේ හරි මේ වාගේ ප්‍රශ්න ඇති වන බව. එහෙම ප්‍රශ්න ඇති වෙනකොට අපට අපේම ශක්තියෙන් හිටගන්න පුළුවන් නම් ඒක තමයි වටින්නේ.

මම මේ අවස්ථාවේ අපේ මහ බැංකුව ගැනත් කියන්න ඕනෑ. අද ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී කථා කරන අවස්ථාවේදී, මේ රටේ තිබෙන සම්පත් ටික කළමනාකරණය කරන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් අදහස් දක්වමින් කිව්වා, මේ පවතින තත්ත්වයන් පිළිබඳ සමාලෝචනය වාර්තාවක් සකස් කිරීමට මහ බැංකුවට භාර දීලා තිබෙනවා කියලා. මම ඉතාම ඕනෑකමින් හැම අවස්ථාවකම කරුණු දක්වමින් තනියෙන් වුණත් කරන සටන ඉදිරියට ගෙන යන්න හේතුවක් තිබෙනවා. මට පෙනෙන විධියට, ඒ අයට ස්වාධීන හැකියාව දී තිබුණාට, ඒ අය ඒ ආකාරයෙන්ම හැසිරෙන්නේ නැති එක තමයි තිබෙන ප්‍රශ්නය.

මේ අවස්ථාවේ අපි අහනවා, කෝ විදේශ සංචිත ටික කියලා. අද අපට ඩොලර් බිලියන 6.5ක විදේශ සංචිත තිබුණාට ඒකේ කොටසක් hot money. ඒ කියන්නේ වාණිජ බැංකු තුළින් අරගෙන මාස තුනහතරක සංචිත තාවකාලිකව ඇති කරලා තමයි මේ කියන ඩොලර් බිලියන 6.5ක සංචිතයක් ඇති කරලා තිබෙන්නේ. මේක නොවෙයි අපට අවශ්‍ය වන්නේ. අපේම සංචිත ඇති කරන්න පුළුවන් මහ බැංකුවක් මිසක්, මාස තුනහතරට තාවකාලිකව අරගෙන සංචිත පවත්වා ගන්නා එක නොවෙයි අවශ්‍ය වන්නේ. අද ඩොලරයේ රුපියල් අගය දෝලනය වෙලා තිබෙනවා රුපියල් තුනකින්. ඊයේ තිබුණේ රුපියල් 310ක් ලෙසයි; අද cross rate එක රුපියල් 313යි. මෙය ලංකාවට විතරක් බලපාන එකක් නොවෙයි. රුපියා එක, යුවාන් එක, යෙන් එක ආදි ඔක්කෝටම බලපෑමක් ඇති කරලා තිබෙනවා. ඉතින්, මේ අවස්ථාවේදී රුපියල කාන්දු වෙන්න පටන් ගත්තොත්, ඒක අපේ ජන ජීවිතයට බලපානවා වාගේම cost-push inflation එකකට, ඒ කියන්නේ උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාවකට ද අත් උදවු දීමක් වෙනවා.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය ගැන මා ඉතාම ඕනෑකමින් ආණ්ඩුවට කියන්නේ මේකයි. අදාළ කටයුතු කළමනාකරණය කරන්න ඕනෑ. කළ යුත්තේ මොනවාද කියලා ව්‍යවස්ථාවට ඇතුළත් කරන්න. වර්ධන වේගය - growth rate එක - සම්බන්ධයෙන් කරන්න ඕනෑ මොනවාද, රැකී රක්ෂා ඇති

[ගරු රවී කරුණානායක මහතා]

කරන්න කටයුතු කරන්නේ කොහොමද, විදේශ සම්පත් ඇති කරන මාර්ග මොනවාද යනාදි කාරණා කළමනාකරණය කළ යුතුයි. අද ඒගොල්ලන්ට කරන්න තිබෙන්නේ රුපියල පාලනය කිරීම සහ පොලී අනුපාතය ගැන කථා කිරීම විතරයි. අනෙක් මෙලෝ දෙයක් සම්බන්ධයෙන් ඒගොල්ලන්ගෙන් කිසිසේත්ම උදව්වක් නැහැ කියන එක තමයි පෙනෙන්න තිබෙන්නේ. එම නිසා මම ඉතාම ඕනෑකමින් ඉල්ලන්නේ මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලායි.

අද දේශීය ප්‍රශ්නවලට වඩා විදේශ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේක අපේ පාලනයේ නොවෙයි තිබෙන්නේ. ජනාධිපතිතුමා කිව්වා වාගේම මෙවැනි බලපෑමක් තිබෙන කොට ආණ්ඩුවත්, විපක්ෂයත් දෙකම එකට වැඩ කරන්න ඕනෑ. මෙය එහෙම වැඩ කරන්න ඕනෑ කාලයක්. හැබැයි අපි මේ ගැන ප්‍රකාශ කරලා තිබෙනවා මීට පෙරත්. නමුත් වෙන්නේ මොකක්ද? ඉල්ලීම් කරන නමුත් සමස්තයක් විධියට ගත්තොත්, ආණ්ඩුව වශයෙන් ඊට සම්පූර්ණයෙන් වෙනස් ආකාරයකට හැසිරෙමින් තමයි ගමන් කරන්නේ. අපි වෙනසක් ඇති කරමු. අපි නිදහස ලබාගෙන අවුරුදු 78ක් කටයුතු කරගෙන ආවා. දැන්වත් එකතු වෙලා ඉදිරියට ගමන් කරන්න ඕනෑ. අපට එයට අවස්ථාව ලැබී තිබෙනවා.

අපි මේ අවස්ථාවේදී කථා කරනවා Strait of Hormuz වහලා තිබෙන එක ගැන. Strait of Hormuz හරහා ලෝක තෙල් සැපයුමෙන් සියයට 22ක තෙල් ප්‍රමාණයක් ප්‍රවාහනය කරනවා. Crude oil බැරල් 14,200ක් ගෙන යනවා; ඒකෙන් refine කරලා තිබෙන ප්‍රමාණය 5,900ක්. මේ ක්‍රියාවලිය නැවතුණාම තෙල් මිල ඉබේම ඉහළ යනවා. දවස් තුනකට ඉස්සෙල්ලා US Dollars 62.50ක්ව තිබුණු බොර තෙල් බැරල් එක මේ කථා කරන මොහොතේ ඩොලර් 89ට වැඩි වෙලා තිබෙනවා. දැනට ඇස්තමේන්තු කරලා තිබෙන විධියට බොර තෙල් බැරල් එකක් ඩොලර් 100ට, 120ට ඉහළ යනවා. මේවා අපට නවත්වන්න බැරි කරුණු වුණාට, මිල නොවෙයි, අන්තිමට සැපයුමත් නැති වුණොත් ඒක ලොකුවට බලපානවා.

ඒ වාගේම තමයි, LP gas මිල. එය සියයට 55කින් වැඩි වෙලා තිබෙනවා. කටාර්වල බලශක්ති මධ්‍යස්ථානවලට එල්ල වූ ප්‍රහාරයත් සමග එහි LNG නිෂ්පාදනය සම්පූර්ණයෙන් නවත්වා තිබෙන නිසා ගෑස් මිල ඊයේ තිබුණු ප්‍රමාණයට වඩා සියයට 55කින් වැඩි වෙලා තිබෙනවා. නමුත්, ජන ජීවිතය පවත්වාගෙන යෑමට ගෑස් භාවිතය උදව් වෙනවා. අපට අවශ්‍ය වන්නේ මේ අභියෝග හමුවේ ඉදිරි ගමන යන්නේ කොහොමද කියන ප්‍රශ්නයට පිළිතුරු සෙවීමයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් ලංකාවට හොඳ අවස්ථාවක් තිබෙනවා ආයෝජන ගෙන්වා ගන්න. මෙතෙක් කාලයක් සෘජු ආයෝජන වැඩි කරන්න ඕනෑ කියලා කථා කරලා තිබුණා. සෘජු ආයෝජන වැඩි කරන්න කථා කරලා තිබුණාට සෘජු ආයෝජන වැඩි වීම තවම මේ රටේ පෙනෙන්නට තිබෙන දෙයක් නොවෙයි. සෘජු ආයෝජන වැඩි කිරීම තමයි අවශ්‍ය වන්නේ. මා හිතන විධියට, තවත් අවුරුදු දෙකතුනකටවත් මැද පෙරදිග රටවල ගිහිල්ලා ආයෝජනය කරන්න මිනිස්සු භය වේවි. ඒ නිසා අවස්ථාව ගන්න ඕනෑ ලංකාවට; විශේෂයෙන් අපේ BoI - Board of Investment of Sri Lanka - එකට, Colombo Port City එකට. මේ සම්බන්ධයෙන් කථා කළාට ඒගොල්ලන්ට කිසිසේත්ම හැකියාවක් නැහැ මේක market කරන්න. ඒකට හේතුව මොකක්ද? මම හැම අවස්ථාවකදීම කියන කාරණයක් තිබෙනවා. රට බංකොලොත් වුණාට පසුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟතාවක් ඇති කර ගන්න අවශ්‍යතාව තිබුණාට එහෙම වුණේ ඇයි කියන ප්‍රශ්නය ගැන අපි තවම සොයා නැහැ. නමුත්, අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට බලපෑම් කරන්න ඕනෑ, ආයෝජකයන් දිරි ගන්වන්න අවශ්‍ය වන පරිසරයක් ඇති කරන්න ඕනෑ කියලා. මොකද, ආයෝජකයන් දිරි ගන්වන්න නම් ඒ අයට tax holidays දෙන්න අවශ්‍යයි; සුදුසු පරිදි investment reliefs දෙන්න අවශ්‍යයි. ඒවා දුන්නේ නැත්නම් මොකද වෙන්නේ? වෙනත් රටවල තිබෙන කොම්පැනි මේ රටට -ලංකාවට- ආදරෙයි කියලා එන්නේ නැහැ නේ. මේ රටේ යම් විධියකට මුදල් ප්‍රමාණයක් උපයන්න පුළුවන් කියලා ඒගොල්ලන්ට පෙනුණොත්, අන්න ඒ වෙනුවෙන් එනවා මිස නිකම්ම එන්නේ නැහැ. ඉතින් අපි ඒ පරිසරය හදා ගන්න අවශ්‍යයි. ඒ ආකාරයට තමයි කටයුතු කරන්න අවශ්‍ය වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආයෝජන ගැනත් කියන්න ඕනෑ. ආයෝජන ගෙන්වා ගැනීම කළ යුතුයි. ආයෝජන ගැන කථා කරද්දී අද ජනාධිපතිතුමා කියපු දෙයක් මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමැතියි. එතුමා කිව්වා, අද RM Parks සමාගම, Shell, IOC සහ CPC ආදිය ඉන්ධන ආනයනය කරනවා කියලා. මහ බැංකුව මේ රට බංකොලොත් කරන අවස්ථාවේදී CPC එක - ඛනිජ තෙල් සංස්ථාව - විතරයි ඉන්ධන ආනයනය කළේ. මහ බැංකුව මේ රට බංකොලොත් කළා කියලා මම නැවත නැවත කියන්නේ, එසේ බංකොලොත් බව ප්‍රකාශ කිරීමට පාර්ලිමේන්තුව අවසර දීලා නැහැ කියලා ආණ්ඩුව උත්තර දීලා තිබෙන නිසා. අද RM Parks, Shell, IOC ඉන්ධන ආනයනය කරන නිසා රටට බරක් නැහැ. මොකද, ඒ කටයුත්තට දැන් කොම්පැනි තුනහතරක් තිබෙනවා නේ. අන්න ඒක තමයි අයෝජනය කියන්නේ. ඒ ආයෝජනය ආ නිසා අද බරක් එන්නේ නැහැ CPC එකට. අද තෙල් නැව් ගණනාවක් එන්නේ අන්න ඒ උපක්‍රමය අනුවයි. ඒ ක්‍රමය ගෙනාවේ කවුද? එක්සත් ජාතික පක්ෂය සහ මීට පෙර තිබුණු ආණ්ඩු. එහෙම නම්, "අවුරුදු 76ක ශාපය" කියලා හරියන්නේ නැහැ.

මෙතෙක් දුරට අපට energy සුරක්ෂිතතාව, බලශක්ති ස්වයංපෝෂිතභාවය ඇති වුණේ මීට පෙර ආණ්ඩු කරපු ඒවායෙන්. අවුරුදු 30කින් නිම කිරීමට තිබුණු "මහවැලි සංවර්ධන ව්‍යාපාරය" අවුරුදු 5කින් නිම කරපු නිසා තමයි ඒකෙන් ඉක්මන් ප්‍රතිලාභ ලැබිලා තිබෙන්නේ. කෘෂිකර්මයත් ඒ ආකාරයමයි. මම මේ අවස්ථාවේ මතක් කරනවා, අප කරලා තිබෙන සේවය අද නිහඬව ඔප්පු වෙලා ඉවර බව. දැන් ඉන්ධන ආනයනය කිරීම ගැන කිසිම බයක් ඇති වන්න අවශ්‍ය නැහැ. මොකද, කොම්පැනි පහහයක්ම ඒ කටයුත්ත කරනවා. RM Parks කියන්නේ පිටරට කොම්පැනියක්. ඒ ගොල්ලන්ට සල්ලි තිබෙනවා, ඉන්ධන ගෙන්වන්න. IOC එක කියන්නේත් භය නැතිව ඉන්ධන ගෙන්වන්න පුළුවන් හැකියාව තිබෙන ආයතනයක්. Sinopec එක එනවා කියලා කියා තිබෙනවා. එනවාද, නැද්ද කියලා තවම දන්නේ නැහැ. ඒ ආවාම තරගකාරී තත්ත්වය තවත් වැඩි වෙනවා. Shell Company එකත් එහෙමයි. මම ඉතාම ඕනෑකමින් ඉල්ලන්නේ අප රටේ ආයෝජනය වැඩි කරන්න කියන එකයි. 2028 අප්‍රේල් මාසය වන විට අපට විදෙස් ණය ගෙවන්න තිබෙනවා. ඒ ණය ප්‍රමාණය කියන්නේ, ඩොලර් බිලියන 3.6ක් නොවෙයි. ගෙවන්න තිබෙනවා, ඩොලර් බිලියන 5ත්, 6ත් අතර ප්‍රමාණයක්. Multilateral ගෙවීම් අනුව අපි අවුරුද්දකට ඩොලර් බිලියන 2ත්, 3ත් අතර ප්‍රමාණයක් ගෙවනවා. මේ bondholdersලාට ගෙවන්න පටන් ගත්තාට පසුව ඒක ඩොලර් බිලියන 5ත්, 6ත් අතර ප්‍රමාණයක් වනවා. ඒක ගෙවන්න බැරි එක නොවෙයි කියන්නේ. අපි ආයෝජනය ඇති කර ගන්න අවශ්‍යයි, ඒවායෙන් උපයන ආදායම් තුළින් ඒ ණය ගෙවීමේ හැකියාව හදාගන්න. ඒ මිස ඒ ගැන සාකච්ඡා කරලා නැවත කල් දමා ගැනීම නොවෙයි කරන්න ඕනෑ. ආයෝජකයන් දිරිමත් කරන්නේ කොහොමද, සවිමත් කරන්නේ කොහොමද කියලා අපි බලන්න

ඕනෑ. ලංකාවේ අපි අපේම දෙපයේ ශක්තියෙන් හිට ගන්න ඕනෑ කියන කාරණය මම මේ අවස්ථාවේදී නැවත මතක් කරන්න කැමැතියි. ඒ තුළින් තමයි ශ්‍රී ලංකාවේ සැබෑ වර්ධනයක් ඇති වන්නේ. අපි හැමදාම හෙට එන ආදායම බලාගෙන රට කරගෙන යනවාද, එහෙම නැත්නම් අද ගන්නා තීන්දු මඟින් අවුරුදු 20කට ආයෝජනය කරන ශක්තිය හදාගෙන සිංගප්පූරුව, මැලේසියාව, තායිලන්තය, ඉන්දුනීසියාව වාගේ මේ රටත් ඉදිරියට රැගෙන යනවාද? හොඳම උදාහරණය තමයි අද බොහෝ දෙනා කථා කරන 'ඉන්දියාව'. මීට අවුරුදු 20කට ඉස්සෙල්ලා, අවුරුදු 7ක, 8ක -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ, මම මිනිත්තු 12ක් කථා කරලා තිබෙනවාද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔව්, මිනිත්තු 12ක් කථා කරලා තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමියගෙනුත් මට තවත් මිනිත්තු දෙකක් ලැබෙනවා නම් හොඳයි. මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ අවස්ථාව වන විට ඉන්දියාව ඉදිරියට ගිහින් තිබෙන ආකාරය බලන්න. මීට අවුරුදු 20කට ඉස්සෙල්ලා ඒ ගොල්ලන්ගේ සම්පූර්ණ ආදායම ඩොලර් බිලියන 1යි. අද වන විට එය ඩොලර් ට්‍රිලියන 4.8ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඇමෙරිකාව, චීනය, ජපානයට පසුව තිබෙන්නේ ඉන්දියාව. තවත් අවුරුද්දකින් ඉන්දියාව තුන්වැනි ස්ථානයට එනවා. ඒ ඉන්දියාව ළඟ අපේ ශ්‍රී ලංකාව පිහිටා තිබෙන එක අපට වාසියක් වාගේම ඉන්දියාවටත් වාසියක්. එදා, හොංකොං චීනයට උදවු කළා වාගේ ලංකාව ඉන්දියාවත් එක්ක ඒකාබද්ධ වෙලා කටයුතු කළොත්, ඒගොල්ලන්ගේ වෙළෙඳ ක්ෂේත්‍රයෙන් සියයට 3ක් තිබුණා නම් අපේ වර්ධන වේගය සියයට 10කට, 12කට වාගේ ප්‍රමාණයකට ළං වෙනවා.

අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 3ක, 4ක තබාගෙන ඉදිරියට තල්ලු කරන්න බැහැ. මහ බැංකුව කියන විධියට උද්ධමනය පාලනයට පොලී අනුපාතය වැඩි කරලා, ඒ තුළින් රටේ ආර්ථිකය සංකෝචනය කරලා ඉදිරියට යන්න කටයුතු කරන්න බැහැ. අපිට අවශ්‍ය වන්නේ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ඉදිරියට ගෙන යන්න, අපේ තරුණ තරුණියන් ව්‍යවසායකයන් බවට පරිවර්තනය කරන්න, අපේ කාන්තාවන්ට අවස්ථාව ලබා දෙන්න. අපේ කාන්තාවන් මැද පෙරදිගට ගිහිල්ලා එන එක නොවෙයි සිද්ධ වෙන්න ඕනෑ. ඒ අයගේ ශ්‍රමය ලංකාව තුළ පාවිච්චි කරලා ඉදිරියට යන එකයි අවශ්‍ය වන්නේ. හෙට International Women’s Day එකේදී ඔබතුමිය ඒ අය ගැන කථා කරනවා වාගේම, ඒ අයට නම්බු නාමයක් ලැබෙන විධියට කටයුතු කිරීම අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි, මේ මහ බැංකුව කවදාවත් ඒක කරන්න ඉඩ දෙන්නේ නැහැයි කියන එක ඔප්පු කරලා අවසන්. ඒ නිසා මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා, මේ රටට පුළුවන් තරම් ආයෝජන ගෙන්වා ගනිමු කියන ඉල්ලීම කරන්න. මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමා ගෙවුම් ශේෂ සම්බන්ධයෙන් කියපු දේ හරි. අපි ඒ පැත්ත වැඩි දියුණු කර ගැනීම අවශ්‍යයි. ඒකට අවශ්‍ය වන්නේ ප්‍රාග්ධන ගිණුම මිසක්, ජංගම ගිණුම නොවෙයි. ප්‍රාග්ධන ගිණුම් හරහා මේ රටට සල්ලි ගෙන්වන්න පුළුවන් නම්, අපේ රුපියල ශක්තිමත් වෙනවා වාගේම අපේ ජීවන වියදමත් අඩු වෙනවා. මොකද, රුපියල ශක්තිමත් වුණොත්,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කොහොමත් සියයට 65ක් මේ රටට ආනයනය කරනවා. ඒ සියයට 65 ආනයනය කරනකොට රුපියල අවප්‍රමාණ වෙනවා කියන්නේ, මේ රටේ වියදම රුපියල් මිලියන 40කින් වැඩිවෙනවා කියන එකයි. පොලී අනුපාතය සියයට 1කින් වැඩි වෙනවා කියන්නේ, බිලියන 178ක් අපේ වියදමට එකතු වෙනවා කියන එකයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන දේම නොකර, අපි, අපේම ස්වයං විවේචනයක් එක්ක ඉදිරියට ගමන් කරන්න අවශ්‍යයි. මීට පෙර කටයුතු කරපු ආකාරයට අපි තරගකාරී තත්ත්වයක් ඇති කරලා, ආයෝජන වැඩි කරලා, කටයුතු කළ යුතුයි.

Madam, I will finish with these words. To start a war, it is very easy. History teaches us that escalation of war has no ceiling and retaliation has no memory. Real leadership is measured not by how hard we strike, but how wisely we stop fighting. I wish that sagacity would be exhibited not only by Sri Lanka but by other countries as well. Ensure that Sri Lankans would have better living standards today than what they had yesterday.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝජ් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.31]

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කළ නව නියමය තමයි අද විවාදයට ගන්නේ. මෙම නියමයේ වැදගත්කම ගැන අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කථා කළා. මෙරට විදේශ විනිමය වෙළෙඳ පොළ තුළ ඇති වූ හිතකර ප්‍රගමනයක් සහ ක්‍රියාත්මක වෙමින් පවතින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් යටතේ ඇති එකඟතාව මත මෙම ප්‍රාග්ධන ප්‍රවාහ පියවර ක්‍රමිකව ලිහිල් කරන එක තමයි දැන් කරමින් තිබෙන්නේ. මේ වනවිට අපේ විදේශ සංචිත ශක්තිමත් වෙමින් තිබෙනවා. ඒ සම්බන්ධ සංඛ්‍යාලේඛන කිහිපයකුත් මේ විවාදය තුළ මතු කළා.

[ගරු මනෝජ් රාජපක්ෂ මහතා]

2025 වසර තුළ දී සංචාරක ක්ෂේත්‍රය තුළින් ඩොලර් බිලියන 3කට වඩා විදෙස් සංචිත අපට එකතුවෙලා තිබෙනවා. 2025දී සංචාරකයන් ලක්ෂ 23කට වඩා ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම විදේශ ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් බිලියන 8.2ක් ලැබිලා තිබෙනවා. ඒක, පසුගිය වසරවලට සාපේක්ෂව වැඩිම ප්‍රමාණයක් බවට වාර්තා වෙලා තිබෙනවා. අපට අපනයන ආදායමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 17.1ක් ලැබිලා තිබෙනවා. ඒ වාගේම අපට FDIsවලින් මිලියන 1,057ක් ලැබිලා තිබෙනවා. මෙවැනි සංඛ්‍යා දත්ත කිහිපයක් සියුම්ව නිරීක්ෂණ කරපුවාම අපට දැනෙමින් තිබෙන්නේ, අපේ විදේශ විනිමය ශක්තිමත් වීමක් සිද්ධ වෙලා තිබෙනවා කියන එකයි. පසුගිය කාලයේ අපේ රට ආර්ථික වශයෙන් බංකොලොත් වෙලා තිබුණා. අපට මාසයකට අවශ්‍ය ආහාරපාන ටික, අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ටික පවා ගෙන්වා ගන්න බැරිව බංකොලොත් වෙලා තිබුණු රටක් නේ, මේ.

එවැනි සංචිත ප්‍රමාණයක් නැතුව තිබුණු රට දැන් ස්ථාවර වෙමින් තිබෙනවා. ඒ ස්ථාවරත්වය තමයි මේ සංඛ්‍යා දත්ත ඇසුරෙන් පෙන්නුම් කර තිබෙන්නේ. එවැනි තත්ත්වයක් තුළ අපට පුළුවන් වෙලා තිබෙනවා, මේ වාගේ නව නියම ටිකක් ගේන්න. සිය ව්‍යාපාරික කටයුතු විදේශ රටවල ව්‍යාප්ත කිරීමේ අරමුණින් මෙරට ව්‍යාපාරිකයන්, ව්‍යාපාර, ව්‍යාපාර සන්නාම, එහෙම නැත්නම් වෙනත් කර්මාන්ත විදෙස් රටවලදී මිලදී ගැනීම් කරනකොට ඒ සඳහා යම් පහසුකමක් සැලසීම තමයි මේ නියමය හරහා අපි සිද්ධ කරන්නේ. දැනටමත් එය විවිධ මට්ටමින් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. දේශීය ව්‍යාපාර ගෝලීය වශයෙන් පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණ ඇතිව තමයි මේ කටයුත්ත කරන්නේ. ප්‍රාග්ධන ගනුදෙනු සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා ගෙවීමේදී දැනට පවතින සීමාව වැඩි කිරීම තමයි මෙහි එක් කටයුත්තක් බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මෙය අපේ රටේ ආර්ථිකය අලුත් තැනකට තල්ලු කරන, විදේශ සංචිතවල ස්ථාවරභාවය පෙන්නුම් කරන සහ අපේ ආර්ථිකය මනා ලෙස කළමනාකරණය කර ආර්ථිකයේ ශක්තිමත්භාවය පෙන්නුම් කරන එක ලක්ෂණයක් විධියටයි අපි හඳුනාගන්න ඕනෑකම තිබෙන්නේ. ඒක කුහක නොවන, හරි දේ හරියාකාරව දකින්න පුළුවන් ඕනෑ කෙනෙක් විශ්වාස කරන කාරණයක්.

අද උදෑසන අතිගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය කළා. මැද පෙරදිග කලාපයේ මතු වෙලා තිබෙන යුදමය වටපිටාව ගත්තොත්, අද ලෝකයටම යම් ප්‍රමාණයක බලපෑමක් සිද්ධ වෙමින් තිබෙනවා. ඒ බලපෑම අපේ රටටත්, අපේ රටේ ජීවත් වෙන ජනතාවටත් බලපාන ආකාර ගණනාවක්ම තිබෙනවා. මේ මොහොත, අපේ රට, අපේ සමාජය, අපේ ජනතාව, අපේ ව්‍යාපාරිකයන් සියල්ලම ගල්ෆ් කලාපය තුළ මතුවෙලා තිබෙන යුදමය තත්ත්වය හේතුවෙන් යම් ප්‍රමාණයකට තමන්ගේ ඉදිරි පැවැත්ම, සමාජයේ පැවැත්ම, ආර්ථිකය ගැන හිතමින් ඉන්න මොහොතක්. එතකොට අතිගරු ජනාධිපතිතුමාට වගකීමක් තිබෙනවා. ඒ වගකීම ජනාධිපතිතුමා අතහරින්නේ නැහැ. එතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට පැමිණ මේ රටේ සමස්ත ජනතාවටම පණිවුඩයක් ලබා දුන්නා. එය සමච්චලයට ලක් කර, හැල්ලුවට ලක් කර, පහත්කොට සලකා යම් පහත්, අවර ගණයේ දේවලුත් මේ විවාදයට එකතු වුණා; පහත් විධියට විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කළා. ජනාධිපතිතුමා දැන් අදහස් ප්‍රකාශ කරන්න ඕනෑ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඕනෑ විධියටද? එහෙම ජනාධිපතිවරයෙක් දැන් මේ රටේ නැහැ. දැන් ඉන්නේ, මේ රටේ ජනතාව, මේ රටේ අනාගතය භාරගත්ත ජනාධිපතිවරයෙක්. මේ රටේ ජනතාවගේ යහපත, උන්නතිය වෙනුවෙන්, මේ රටේ ඉදිරි දැක්ම, වැඩ පිළිවෙළ මොකක්ද, මේ මතු වෙලා තිබෙන යුදමය තත්ත්වය අපේ රටට බලපාන්නේ කොහොමද, ඒ සඳහා අපි සකස් කර තිබෙන සැලසුම් මොනවාද කියන කාරණා මත තමයි අද අපේ ගරු ජනාධිපතිවරයා මේ සභාව තුළ සාකච්ඡාව අරගෙන ගියේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එක් මන්ත්‍රීවරයෙක් මතු කළා, අපේ ආණ්ඩුව වංචා, දූෂණ, හොරකම් සහ අවභාවිත කරනවා කියලා. මට මේ ආසනයේ වාඩිවෙලා ඉන්නකොට දැනුණු දේ තමයි, ඒගොල්ලන්ට ඒගොල්ලන් කරපු පරණ දේවල් මතක් වුණාය කියන එක. ඒ මන්ත්‍රීවරයා හරහා මම ඒක දැක්කා, හරියට කණ්ණාඩියකින් බලනවා වාගේ. අපේ ශබ්ද කෝෂයේ හොරකම්, වංචා, දූෂණ කියන ඒවා එක පෙළට කියැවෙන ගණනටම හොරකම, වංචාව, දූෂණය කලාවක් බවට පත් කර තිබුණේ කවුද? ඒ ඉතිහාසය අපි දන්නවා. අපි ඒ ඉතිහාසය හොඳටම දන්නවා. ඒගොල්ලන් දැන් අපේ ආණ්ඩුවට චෝදනා කරනවා, හොරකම්, වංචා, දූෂණ කරනවා කියලා. ඒ, කිසිම පදනමක් නැති නිකම් වචන විතරයි. හිස් වචනවලට බැහැ වෙනස්කම් කරන්න; පරිවර්තන කරන්න. ඒකට යම් පදනමක් තිබෙන්න ඕනෑ; තර්කයක් තිබෙන්න ඕනෑ. ඒ නිසා මම ඒ මන්ත්‍රීවරයාට කියනවා, ඔබ කියපු වචන පිළිබඳව ආපහු සැරයක් හිතලා බලන්න කියලා. ඒවා හිස් වචන; පුස් වචන. ඒවා මේ සමාජය පිළිගන්න දේවල් නොවෙයි. මොකද, මේ ආණ්ඩුව හොරකම්, වංචා නැතිකර වඩා යහපත් පාලන ක්‍රමයක් මේ රටට හඳුන්වා දීලා තිබෙනවා. ඒ මහ ඔස්සේ තමයි අපි ආණ්ඩුව ඉදිරියට අරගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම ඉරානය, ඒ වාගේම මැදපෙරදිග කලාපය ගත්තාම, මහා ශිෂ්ටාචාරයක් තිබෙන බව අපි දන්නවා. දවසින් දවස, තත්පරයෙන් තත්පරය, මොහොතින් මොහොත මේ බිඳ වැටෙන්නේ මොකක්ද? ගොඩ නැඟිලා තිබුණු ශිෂ්ටාචාරය තමයි මේ බිඳ වැටෙන්නේ. ඒ පිළිබඳව අපට කම්පාවක් නැද්ද? කම්පාවක් තිබෙනවා. මේ කම්පාව කියන්නේ වචනයකින් ප්‍රකාශ කිරීම නොවෙයි. අතිගරු ජනාධිපතිතුමාත්, ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් විධියට අප සියලුදෙනාත් ඉරානය තුළ සිදු වූ සියලු මිනිස් සංහාරයන් තරයේ හෙළා දකිනවා. ඉරානයට එල්ල වෙච්ච ප්‍රහාරයන් වාගේම මේ යුද්ධය ඇතුළේ මිනිසුන් ඝාතනය වීමත් අපි ප්‍රතික්ෂේප කරනවා. ඒ වාගේම මේ යුද්ධය ඉතා ඉක්මනින් අවසන් වෙලා ලෝකයට සාමය උදාවේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා.

මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.33]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මූලික අදහසක් මම ප්‍රකාශ කරන්න කැමැතියි. විශේෂයෙන්ම හදිසි නීතිය පනවා තිබුණා, අපි දැක්කා. ඒ සම්බන්ධ විවාදය ලබන සිකුරාදා තිබෙනවා. ජනාධිපතිතුමා හදිසි නීතිය නැවත දීර්ඝ කළේ ඇයි? අද මේ ගරු සභාවට ඇවිල්ලා කිව්වා, මේ ප්‍රශ්නත් එක්ක තමයි මේක දීර්ඝ කළේ කියලා. "දිට්වා" සුළි කුණාටුව අවසන් වෙලා මාස 3කට වැඩියි. පවුල් 1,075ක් තවමත් ආරක්ෂිත ස්ථාන

32ක ඉන්නවා. තවම ඒගොල්ලන්ට යන්න තැනක් නැහැ. දැන් මාස 3ක් වෙනවා. ඊළඟට, 150,000ක් ඥාතීන් සහ යහළු මිත්‍රයන් සමඟ තාවකාලික ස්ථානවල ඉන්නවා. පවුල් 40,000ක් ඉන්නවා, යන්න ගෙවල් නැතිව. මේ සියල්ල එක්ක මේ ආණ්ඩුව තවමත් "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වුණු තත්ත්වයට විසඳුම් හොයා ගන්න බැරිව ඉන්නවා. රුපියල් 25,000න් තමන්ගේ නෑදෑයින්ගේ ගෙවල්වල, යාළු මිත්‍රයන්ගේ ගෙවල්වල තාවකාලිකව නැවතිලා සිටින පවුල් 46,000ක් ඉන්නවා. මේ වනකොට මාස 3ක කාලයක් ගත වෙලා තිබුණත්, අඩුම තරමින් ආණ්ඩුවට මේ අය සම්බන්ධයෙන් යම් විසඳුමක් ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා නම්, තමුන්නාන්සේලා ගහපු කයිය මොකක්ද? මෙච්චර කාලයක් පුදුම කයියක් නේ ගැහුවේ. උදේ ඉඳලා රෑ වෙනකල් හිටපු ආණ්ඩුවලට බැන්නා. "දිට්වා" සුළි කුණාටුව ඇති වෙලා දැන් මාස 3ක් ගතවෙලා තිබෙනවා. හැබැයි, මාස 3ක් එක දිගට හදිසි නීතිය දමනවා. හදිසි නීතිය දමලා තමුන්නාන්සේලා කරපු වැඩේ මොකක්ද කියන්නකෝ. අවසානයේ, කයිය නායකලා විතරයි.

ජනාධිපතිතුමා අද මේ ගරු සභාවට ඇවිල්ලා කියනවා, රටවල් ද මේවා, මේවා හුණ්ඩු ලු. ඒ, හුණ්ඩුවේ ජනාධිපති තමයි ඇවිල්ලා මෙතැන එහෙම කියන්නේ. මේවා රටවල් ද කියලා අහනවා. මේ රට එතුමාට රටක් නොවුණාට; එතුමාට හුණ්ඩුවක් වුණාට අපට රටක්. ශ්‍රී ලංකාව කියන්නේ අපේ රට. අපේ රටට හුණ්ඩුවක් කියනවා නම්, හුණ්ඩුවේ ජනාධිපති තමයි ඇවිල්ලා මේ කථාව කියන්නේ. ලජ්ජා වෙන්න ඕනෑ, මේ රටට හුණ්ඩුවක් කියපු ජනාධිපති.

ඒ වාගේම මේ කාරණයත් මම කියන්න කැමැතියි. පෝලිම් සම්බන්ධයෙන් දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද? මේ පිළිබඳව අපි කථා කරමු. ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා තෙල් සංචිත ගැන කිව්වා. තෙල් සංස්ථාවේ වර්තමාන සභාපති, රාජකරුණා මහත්මයා මාර්තු 01වැනි දා කරපු ප්‍රකාශයට වෙනස් ප්‍රකාශයක් තමයි 02වැනි දා කළේ. එතුමා ඇවිල්ලා කිව්වා, මාර්තු 01වැනි දා, 02වැනි දා දවස් දෙකේම ඉන්ධන බෙදා හැර තිබෙන්නේ මෙට්‍රික් ටොන් 5,000කටත් අඩුවෙන් කියලා. දින 35කට, 34කට තෙල් තිබෙනවා කියලා කිව්වා. එහෙම කිව්වා නම් ආණ්ඩුව වගකීම භාරගන්න ඕනෑ, මේ තෙල් ටික බෙදන්න. මම දැක්කා නිර්මාල් රංජිත් දේවසිරි මහත්මයා කියනවා, පෝලිම්වල ඉන්න සියයට 82ක් ආණ්ඩුවට සහයෝගය දෙන කට්ටිය ලු. ඉතින්, ඒගොල්ලන්ට ගෙදර යන්න කිව්වා නම් වැඩේ ඉවරයි නේ. එතකොට තෙල් පෝලිම් තිබෙන්නේ නැහැ නේ. ඡන්දය දුන්න කට්ටිය නම්, ආණ්ඩුවට කැමැති කට්ටිය නම් පෝලිම්වල සියයට 82ක් ඉන්නේ, ඉස්සෙල්ලා ඒගොල්ලන්ට ගෙදර ඉන්න කියන්න. එතකොට ප්‍රශ්නය ඉවරයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් තෙල් ටැංකි ගැන කථා කරනවා. 2022න් පස්සේ හිටපු කංචන විජේසේකර ඇමතිතුමා, සංස්ථාවේ හිටපු සභාපතිවරු, සුමිත් විජේසිංහ, මොහොමඩ් උවයිස්, හිටපු නාවික හමුදාපති ජගත් විජේගුණවර්ධන, සාලිය වික්‍රමසූරිය, දර්ශන රත්නායකලා ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ ටැංකි දෙකක් අලුත්වැඩියා කරලා අවසන් අදියරේ තිබුණේ. තමුන්නාන්සේලා ආණ්ඩුව අරගෙන දැන් අවුරුද්දක් වෙනවා. අඩුම තරමේ තමුන්නාන්සේලාට ඒ ටැංකි දෙක පුරවන්න පුළුවන් වුණාද? මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා දැන් අවුරුදු එකහමාරකට වැඩි කාලයක් වෙනවා. ටැංකි දෙකක් හදලා තිබුණා. මම දැක්කා, අර ඇමතිතුමා - අපේ තෙල් ඇමතිතුමා - ටැංකියක් ඇතුළට බැස්සා. හැබැයි, බැස්සා, බැස්සාමයි ඒකට වෙච්ච දෙයක් නැහැ. එතුමා එහෙම බැස්සාට පස්සේ පහුවදා උදේ වෙනකොට තෙල් ටික පුරවයි කියලා අපි හිතුවා. හැබැයි, එහෙම වුණේ නැහැ. ඒ වාගේම යහ පාලන ආණ්ඩුව කාලයේ ඉන්දියාවත් එක්ක එකතු වෙලා ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංවර්ධනය සඳහා ඒකාබද්ධ ව්‍යාපෘතියක් ගෙනාවා. එතකොට ඒකට විරුද්ධව නඩු දැම්මේ කවුද? ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වර්තමාන සභාපති ඩී.ජේ. රාජකරුණා මහත්මයා. ඒගොල්ලෝ නඩු දාලා ඒක නැවැත්තුවා. දැන් මෙතැනට ඇවිල්ලා කියනවා, ඉතිහාසයේ මොකුත් කළේ නැති ලු. මම දැක්කා පුවත් පත් සාකච්ඡාවක් තියලා එතුමාම කියනවා, කලින් හිටපු කට්ටිය කළේ නැහැ කියලා. කලින් කට්ටිය කරන්න හදනකොට මේගොල්ලෝ තමයි ඒක නැවැත්තුවේ. දැන් මගේ ළඟ තිබෙනවා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඒ පිළිබඳව ගත් තීන්දුව. ඒ වෙලාවේ එහි සභාපති විධියට හිටියේ, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා. මේකේ බොහොම පැහැදිලිව කියනවා, "ත්‍රිකුණාමලය තෙල් ගබඩා සංකීර්ණයේ තෙල් ටැංකි 102න් එකක් විනාශ වී ඇති බවත්, ටැංකි 15ක් LIOC එක භාරයේ පවතින පවත්, ඉතිරි ටැංකිවලින් ටැංකි 16ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව භාරයට ගෙන තෙල් ගබඩා කිරීමට යොදා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටින බවටත් කරුණු ඉදිරිපත් විය" කියලා. මේක තමයි, සුනිල් හඳුන්නෙත්ති මහත්මයා සභාපති ධුරයේ හිටපු COPE එකෙන් ගත් තීන්දුව. මේවාට විරුද්ධව තමයි ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ වෘත්තීය සමිති ගිහිල්ලා නඩු දැම්මේ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඊට පස්සේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ කොලොන්නාවේ තෙල් ටැංකි 3ක් අලුතින් ඉදිකරන්න පටන් ගත්තා. පසුව කට්ටිය වර්තමාන ජනාධිපතිතුමාව ගෙන්වලා, එතුමාව අන්දලා තෙල් ටැංකි 6ක්ද, 7ක්ද අලුතින් හදනවා කියලා, ඒකට මුල් ගල තියන්න එක්කගෙන ගියා. එතුමා දැනගත්තා ඒක බොරුවක් කියලා. ඒ නිසා යාන්තම් ෂේප් වෙලා නිකම් හිටියා.

ඊළඟ කාරණය මේකයි. එදා බෝම්බ ගහපු ටැංකි ඇතුළුව තෙල් ටැංකි 4ක් සංවර්ධනය කළා. සංවර්ධනය කරලා දැන් ඒවාට තෙල් පුරවනවා. අඩුම තරමින් අවුරුදු 76ක ශාපය නිසාවත් ඒ තෙල් ටැංකි ටික හැදුණා. තමුන්නාන්සේලා සිටියා නම් එකක්වත් හදන්න දෙන්නේ නැහැ. ඒ තරම් විනාශයක් එතැනට කරලා තිබුණා. අද ලෝකයේ මෙච්චර යුද්ධයක් තිබෙන අවස්ථාවක, මේ ප්‍රශ්නය ගැන ලෝකයම කථා වෙනවා. කොලොන්නාවේ පෙට්‍රල් මෙට්‍රික් ටොන් 17,000ක් හදන තෙල් ටැංකි කපලා විකුණනවා, "අටුව කඩලා පුටුව හදනවා" වාගේ. දැන් ඒවා කෑලිවලට කපලා විකුණනවා. 31වැනි තෙල් ටැංකිය මිලියන 350කට හදන වැඩ පිළිවෙළකට අනුමැතිය දීලායි තිබුණේ. දැන් මේ අප්පුහාමිලා ඇවිල්ලා මොකක්ද කළේ? ඒ තෙල් ටැංකිය කපලා මෙට්‍රික් ටොන් එකක් රුපියල් 52,000 ගණනේ විකුණනවා. Bureau Veritas කියන ආයතනය තමයි මේ සඳහා ලැහැස්ති වෙලා තිබුණේ. මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා තෙල් ටැංකි හදන්න කලින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තමුන්නාන්සේලාගේ සභාපතිවරයා විසින් කරන මේ විනාශය ගැන සොයා බලන්න කියලා. ඒක තමයි, ඉස්සෙල්ලාම කරන්න ඕනෑ වැඩේ.

මම දැක්කා, අද හෝමුස් සමුද්‍ර සන්ධියේ තෙල් නැව් 350කට වැඩි ප්‍රමාණයක් නවත්වා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඉරානයේ මේජර් ජනරාල් කෙනෙක් කිව්වා, ඒ නැව් ඔක්කෝටම ගහනවා කියලා. මේක තමයි දැන් ඇතිවෙලා තිබෙන තත්ත්වය. ඒ කියන්නේ, ඉස්සර - 2022 අගෝස්තු මාසය වෙනකොට - ඩීසල් මෙට්‍රික් ටොන් 5,500ක් ගියා. පෙට්‍රල් මෙට්‍රික් ටොන් 4,000ක් ගියා. හැබැයි, දැන් ඒ ප්‍රමාණය අඩුවෙලා තිබෙනවා. ඒකයි අපි දිගටම කියන්නේ, මේක ප්‍රශ්නයක් වන තැනට තල්ලු කරන්න එපා, මේ වැඩ පිළිවෙළ පුළුවන් තරම් ඉස්සරහට අරගෙන යන්න කියලා.

ඊළඟට, පෙට්‍රල් සහ ඩීසල්වල flat rates ගනිමු. තමුන්නාන්සේලා ඒ කාලයේ පුදුම කෑ ගැහිල්ලක් නේ කෑ

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ගැහුවේ, කලින් ගෙනාපු තෙල්වල මිල වැඩි කළා කියලා. තමුන්නාන්සේලා ඊයේ පෙරේදා සුදු ඩීසල් රුපියල් 4කින් සහ ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක මිල රුපියලකින් වැඩි කළා නේ. ඒ, කලින් ගෙනාපු තෙල්; මේ අර්බුදය ඇති වුණාට පස්සේ ගෙනාපු තෙල් නොවෙයි. කලින් ගෙනාපු තෙල්වල මිලත් දැන් වැඩි කරනවා. තවමත් වැඩි මිලට තෙල් ගෙනැල්ලා නැහැ. මේ තිබෙන්නේ කලින් ගෙනාපු තෙල්. හැබැයි, අනාගතයේ වැඩි වෙන්න පුළුවන්. මේක තමයි දැන් ඇතිවෙලා තිබෙන තත්ත්වය.

ගෑස් අර්බුදය ගැනත් මම විශේෂයෙන්ම කියන්න ඕනැ. ජනාධිපතිතුමා අද ඒ සම්බන්ධයෙනුත් කථා කළා. මේක පුදුම ප්‍රශ්නයක් කියලා මම කියන්නේ ඒකයි. ආණ්ඩුවට තිබෙන්නේ ගෑස් මෙට්‍රික් ටොන් 8,000යි ලු. පෞද්ගලික අංශයට - ලාෆ් ගෑස් සමාගමට - මෙට්‍රික් ටොන් 30,000ක් තිබෙනවා. ඔව්, ඒ කාලයේ ඒක කරන්න යනකොට සුනිල් හඳුන්නෙත්ති මහත්මයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒකට විරුද්ධව කථා කළා. ඒ කාලයේ ඒක කරන්න හැදුවා. මොකද, ඒ කොම්පැනිය - ලාෆ් ගෑස් සමාගම - රුපියල් බිලියන 30ක් ණයයි. ඒ ණය අරන් තිබෙන්නේ කාගෙන්ද? ලංකා බැංකුවෙනුයි, මහජන බැංකුවෙනුයි. ඒ රුපියල් බිලියන 30 දෙන්න විධියක් නැතුව ඒ මනුස්සයා අනාථ වෙලා ඉන්න වෙලාවේ තමයි පී.බී. ජයසුන්දර මහත්මයා කථා කරලා කිව්වේ, මේ දෙක එකතු කරලා එක වැඩ පිළිවෙළකට යමු කියලා. ඊට පස්සේ මොකක්ද වුණේ? ලංකාවේ, ගමෙන් ආපු ව්‍යාපාරිකයකු විධියට ලාෆ් ගෑස් සමාගමේ වෑගපිටිය මැතිතුමා ඒක කරන්න හදනකොට තමුන්නාන්සේලා ඒකට විරුද්ධ වුණා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද එහි සියයට 50කට වඩා වැඩි කොටසක් අරගෙන තිබෙන්නේ ධම්මික පෙරේරා මහත්මයා. LAUGFS Terminals Limited එකෙන් සියයට 50කට වැඩිය අරන් තිබෙන්නේ ධම්මික පෙරේරා මහත්මයා. ධම්මික පෙරේරා මහත්මයා ගත්තාට පස්සේ දැන් ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කියනවා, අපි ඒකෙන් මෙට්‍රික් ටොන් 15,000ක් ගන්න දැන් කථා කරගෙන යනවා කියලා. ඉතින්, තමුන්නාන්සේලා නේ මේකට විරුද්ධ වුණේ. ධම්මික පෙරේරා මහත්මයා ගත්තාම දෙන්න පුළුවන්. හැබැයි, වෑගපිටිය මහත්මයා ගත්තාම දෙන්න විධියක් නැහැ. තමන්ගේ යාළුවා ගත්තාම, ගෑස් ප්‍රශ්නය විසඳන්න ගෑස් මෙට්‍රික් ටොන් 15,000ක් ගන්න ඒගොල්ලන් දැන් සූදානම්.

ඒ වාගේම මම තවත් කාරණයක් කියන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට එක විනාඩියක් දෙන්න. මේ කාරණය සිද්ධ වුණේ, අපේ නිකවැරටියේ. මෙහි සිද්ධ වුණු කාරණය මම විනාඩියකින් කියන්නම්. ඇලවක, මැලිබන් ටෙක්ස්ටයිල් එක ඩොලර් මිලියන 12ක ආයෝජනයකට ආවා. ඒකට මොකද වුණේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, වෙලාව නැති බවයි සඳහන් වෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පොඩි වෙලාවක් දෙන්න.

මේකට දුන්නේ නිකවැරටියේ පශු සම්පත් මණ්ඩලයට අයිති අක්කර 20ක ඉඩමක්. සේවකයින් 4,000ක් ගන්න ආපු ආයෝජනයක්. මේකට විරුද්ධව වසන්ත සමරසිංහ මහත්මයා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දැම්මා. දැන් මොකද වෙලා තිබෙන්නේ? මුළු වැඩේම නතර වුණා. දැන් ඒගොල්ලන් කියනවා, සාකච්ඡා කරලා විසඳා ගනිමු කියලා. මොකටද මේ, පෞද්ගලිකව? ඒ නිසා මම කියන්න කැමැතියි, කරුණාකරලා මේ රට ගැන හිතලා වැඩ කරන්න කියලා. තමුන්නාන්සේලාගේ සටන් පාඨවල දේශපාලනය තවදුරටත් මේ රටේ වලංගු නැහැ කියන එකත් මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.50]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே!

இன்று மத்திய கிழக்குப் பிராந்தியத்தில் ஏற்பட்டுள்ள நிலைமை காரணமாக, பொதுவாக மனச்சாட்சி உள்ள அனைவரும் கண்டிப்பாக வேதனைப்படுகின்ற ஒரு சூழ்நிலைதான் காணப்படுகின்றது. குறிப்பாக, ஒரு நாட்டின் இறையாண்மையைத் தாண்டி அந்த நாட்டுக்குள் புகுந்து தாக்குதல் நடத்துகின்ற செயற்பாட்டை எந்தவொரு சந்தர்ப்பத்திலும் அனுமதிக்க முடியாது என்பதை நாங்கள் அரசாங்கம் என்ற வகையிலும் இலங்கையர் என்ற வகையிலும் மிக ஆணித்தரமாகக் கூறிக்கொள்ள விரும்புகின்றோம். பேச்சுவார்த்தைகளின் ஊடாக, இராஜதந்திர முயற்சிகளின் ஊடாகத் தீர்க்கப்படவேண்டிய பிரச்சினைகளைப் போர்மூலமாக - யுத்தம்மூலமாக முடிவுக்குக் கொண்டுவரலாமெனச் சிலர் நினைப்பது தவறு.

அண்மைக்கால உலக வரலாற்றில் இவ்வாறான பல விடயங்களைக் கண்டிருக்கின்றோம். யுத்தங்களினால் பிரச்சினைகளுக்கான தீர்வு கிட்டவில்லை; மாறாக பிரச்சினைகள் தொடர்ந்து அதிகரித்தும், நாடுகள் அழிந்தும், மக்களுடைய வாழ்க்கை சீரழிந்தும்போன ஒரு நிலைமைதான் எப்போதுமே ஏற்பட்டதை நாங்கள் கண்டிருக்கின்றோம். அந்த வகையில், நான் ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். கடந்த பல வருடங்களாக, ஊகங்களை அடிப்படையாகக்கொண்டு சிலர் யுத்தங்களை மேற்கொண்டு, மத்திய கிழக்கையும் மத்திய கிழக்கிற்கு அண்மையில் இருக்கின்ற - அண்டியிருக்கின்ற - நாடுகளையும் பலமுறை அழித்த வரலாறுதான் இருக்கின்றது. போர்கள் எப்போதுமே பிரச்சினைகளை அதிகரித்திருக்கின்றது. சில நாடுகளில் போர் முடிவடைந்தும்கூட

பிரச்சினைகள் முடிவடையாத நிலை காணப்படுகின்றது. எனவே, அத்தகையதொரு நிலைமை தொடரக் கூடாது. இந்த யுத்தம் மிக விரைவாக முடிவுக்கு வரவேண்டும் என்பதுதான் இந்த அரசாங்கத்தினதும் இந்த நாட்டில் வாழ்கின்ற மக்களினதும் உலகில் சமாதானத்தை நாடிப் பிரார்த்திக்கின்ற ஒவ்வொருவரினதும் வேண்டுகோள். யுத்தம் மிக விரைவாக முடிவுக்கு கொண்டுவரப்பட்டு, மக்கள் சுமுகமான, சமாதானமான, இயல்பு வாழ்க்கைக்குத் திரும்ப வேண்டும் என்பதுதான் எல்லோருடைய எதிர்பார்ப்பாகவும் இருக்கிறது.

மத்திய கிழக்குப் பிராந்தியத்திலும் அதனை அண்டிய நாடுகளிலும் ஒரு மில்லியனுக்கும் அதிகமான எமது நாட்டின் பிரஜைகள் தொழில்புரிவதற்காகவும் பல்வேறுபட்ட தேவை களுக்காகவும் வாழ்ந்து வருகின்றார்கள். பொறுப்புவாய்ந்த அரசாங்கம் என்ற அடிப்படையில் அவர்களுடைய பாதுகாப்பை உறுதிப்படுத்துவதோடு, அவர்களுக்கான தேவை களைக் கண்டறிவதற்குமான வேலைத்திட்டங்களை நாம் மேற்கொண்டு வருகின்றோம். குறிப்பாக, மத்திய கிழக்கில் தொழில்புரியும் மற்றும் அங்கு வாழ்ந்துவரும் எமது நாட்டவர்களை, தமது நாட்டு மக்களைப் போன்றே பாதுகாப்ப தற்கான நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்ற அந்நாட்டு அரசாங்கங்களுக்கு இந்தச் சந்தர்ப்பத்தில் எமது நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

உண்மையிலேயே ஒரு சர்வதேசப் பிரச்சினையாக இருக்கலாம், ஒரு நாட்டின் பிரச்சினையாக இருக்கலாம், அந்த நாட்டின் இறையாண்மையை மீறி அந்த நாட்டுக்குள் புகுந்து தாக்குதல் நடத்தி அந்தப் பிரச்சினைகளுக்குத் தீர்வைக் கொண்டுவர முடியாது. தற்போது ஏற்பட்டுள்ள யுத்தத்தினால் பாடசாலை மாணவர்கள், பொதுமக்கள் என்ற வகையில் பலர் உயிரிழக்கின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. இந்த நிலைமை மாற்றமடைய வேண்டும். இது மத்திய கிழக்கிலே ஏற்பட்ட யுத்தமாக இருந்தாலும்கூட, இந்த யுத்தத்தின் கோர விளைவுகள் உலக நாடுகள் பூராவும் தாக்கத்தை ஏற்படுத்தக்கூடிய சந்தர்ப்பம் இருக்கிறது. குறிப்பாக, எமது நாட்டைப் போன்ற பல நாடுகளும்கூட இத்தகைய யுத்தம் காரணமாகப் பொருளாதார ரீதியாகவும், வேறு பல காரணிகளாலும் பாதிக்கப்படக்கூடிய வாய்ப்பு இருக்கிறது.

இன்றைய தினம் மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்தப் பாராளுமன்றத்திலே குறிப்பிட்டது போன்று, எமது நாடு கடந்த காலத்தில் பொருளாதார ரீதியாக வங்குரோத்து நிலையை அடைந்து, மீண்டும் பொருளாதாரத்தைக் கட்டியெழுப்பி வருகின்ற இந்தச் சந்தர்ப்பத்திலே, உலக நாடுகளிடையே ஏற்படுகின்ற இத்தகைய மாற்றங்களால் - யுத்த சூழ்நிலைகளால் - போர் நிலைமைகளால் மீண்டும் பாதிக்கப் படக்கூடிய ஒரு நிலைமை காணப்படுகின்றது. எனவே, கண்டிப்பாக ஒவ்வொரு நாடும் எப்போதும் சர்வதேச சட்டங்களை மதித்து, அந்தச் சட்டங்களுக்கு உட்பட்டுச் செயற்படவேண்டிய தேவை இருக்கின்றது. அவ்வாறு செயற்படாதபோதுதான் உலகில் தேவையற்ற பல பிரச்சினைகள் தோன்றக்கூடிய வாய்ப்பு காணப்படுகின்றது. இன்னொரு நாட்டின் இறையாண்மையை இல்லாமல் ஒழிப்பதற்கோ, அதனை அடக்கி ஆள்வதற்கோ எந்தவொரு நாட்டுக்கும் அதிகாரம் கிடையாது. சுதந்திரமாகச் செயற்படக் கூடிய உரிமை ஒவ்வொரு நாட்டுக்கும் கண்டிப்பாகக் காணப்படுகின்றது.

இந்த யுத்த சூழல் காரணமாகப் பல்வேறுபட்ட பிரச்சினைகள் மேலெழுந்த வண்ணம் காணப்படுகின்றன. தலைவர்களைக் கொலை செய்தோ அல்லது மக்களைக் கொலை செய்தோ பிரச்சினைகளுக்கான தீர்வுகளை எட்ட முடியும் என யாராவது நினைப்பார்களாக இருந்தால், அது வெறும் கற்பனையாகத்தான் இருக்க முடியும் என்பதை இந்தச் சந்தர்ப்பத்திலே நான் குறிப்பிடுகின்றேன். இன்று யாரோடு உரையாடினாலும், அவர்கள் யுத்தம் இடம்பெறாத, அமைதியான, பாதுகாப்பான பிரதேசத்தில் வாழ்ந்தாலும், எப்போதும் ஒவ்வொருவரினதும் எதிர்பார்ப்பும் பிரார்த்தனை களும் யுத்தம் நடைபெறுகின்ற பிரதேசங்களில் சமாதானம் ஏற்படவேண்டும், எல்லோரும் நிம்மதியாக வாழுகின்ற ஒரு சூழ்நிலை ஏற்பட வேண்டும் என்பதாகவே இருக்கின்றது. சர்வதேச ரீதியாக இன்று உலகிலுள்ள சுமார் 200 நாடுகளின் நிலைப்பாடுகளைப் பார்க்கின்றபோது, மூன்றில் இரண்டு பங்கு நாடுகள் இந்த யுத்தம் சம்பந்தமாக அமைதியான முறையில் கண்காணிக்கின்ற ஒரு நிலையிலேயே காணப்படுவதற்குக் காரணம் இந்த யுத்தத்தை எவராலும் அனுமதிக்க முடியாது, இத்தகைய நிலைமையை எவரும் ஏற்றுக்கொள்ள முடியாது என்பதுதான். இந்தத் தரவுகள்மூலம், உலக வரைபடத்திலுள்ள அந்த நாடுகளின் அத்தகைய ஒரு செய்தியைத்தான் நாம் காணக்கூடியதாக இருக்கின்றது.

நான் முன்னர் குறிப்பிட்டதுபோன்று, மத்திய கிழக்கு நாடுகளிலே எமது நாட்டைச் சேர்ந்த சுமார் பத்து இலட்சம் - ஒரு மில்லியன் - மக்கள் வாழ்ந்தாலும்கூட, அவர்களுடன் தொடர்புபட்ட பல இலட்சம் குடும்பங்கள் எமது நாட்டில் இருக்கின்றனர். இந்த யுத்த சூழ்நிலை காரணமாக அவர்கள் ஒவ்வொருவரும் எந்தளவில் பீதிக்குள்ளாகியும் மானசீக ரீதியாகத் துவண்டுபோயும் இருப்பார்கள் என்பதை எம்மால் நன்றாக உணர முடிகின்றது. குறிப்பாக, எனது குடும்பத்தைச் சேர்ந்த பலரும்கூட அந்தப் பிராந்தியத்திலே வாழ்கின்றார்கள், தொழில்புரிகின்றார்கள். எனது குடும்பத்தில் உள்ளவர்கள் எவ்வாறு அதனை உணர்கின்றார்களோ அதே உணர்வுதான் அத்தனை பேர்களின் குடும்பங்களிலும் காணப்படுகின்றது.

ඇත්තටම මැද පෙරදිග කලාපය තුළ ඇති වී තිබෙන යුදමය තත්ත්වය පිළිබඳව හෘදය සාක්ෂියක් තිබෙන, හදවතක් තිබෙන, හිතන්න පුළුවන් හැම කෙනාගේම ප්‍රාර්ථනය වන්නේ, මේ යුදමය තත්ත්වය ඉතා ඉක්මනින් පහව ගොස් හැමකෙනාටම සාමයෙන්, සතුටෙන්, සහෝදර බැඳීමෙන් ජීවත් වෙන්න ලැබෙන්න කියන එකයි. හැබැයි අවාසනාවකට, මේ තත්ත්වය තුළත් සමහරුන් ජනතාව තවදුරටත් පීඩාවට පත් කරමින්, බිය උපද්දවමින්, තෙල් පිළිබඳ අර්බුද මවාපාමින් ඒ තුළින් දේශපාලන වාසි ලබා ගන්න හිතනවා නම් ඔවුන්ගේ හෘදය සාක්ෂිය පිළිබඳව අපට විශාල ප්‍රශ්නාර්ථයක් තිබෙනවා. මිලියනයකට ආසන්න අපේම පවුල්වල පිරිසක් රටට බත සපයන්න, පවුලට බත සපයන්න, අපේ ආර්ථිකය ශක්තිමත් කරන්න ඒ කලාපය තුළ වැඩ කරමින් ඉන්නකොට ඒ යුදමය තත්ත්වය තුළ ඔවුන් කොතරම්දුරට භීතියකට පත් වෙලා ඇතිද? ඔවුන්ගෙන් යැපෙන අපේ රටේ ඉන්න පවුල් ඔවුන් පිළිබඳව කොතරම් වේදනාවෙන් පසු වනවා ඇතිද? එවැනි තත්ත්වයක් තුළත් මේ රටේ ජනතාව නැවත නැවතත් පීඩාවට පත් කරලා, ඒ පීඩාව ඔස්සේ තමන්ට දේශපාලන වාසි ළඟා කර ගැනීමට කවුරු හරි මාන බලනවා නම්, ඔවුන්ගේ හෘදය සාක්ෂිය පිළිබඳව අපට නැවත ප්‍රශ්න කරන්න සිද්ධ වනවා.

ඇත්තටම මැද පෙරදිග කලාපය තුළ ඇති වී තිබෙන තත්ත්වය ගැන බැලුවොත්, අපි දන්නවා යුද්ධයට කවදාවත් ප්‍රශ්න විසඳන්න බැහැ, තිබෙන ප්‍රශ්නයට වඩා විශාල ප්‍රශ්න ගොඩක් ඇති කරන්න පුළුවන් බව. අපි විශ්වාස කරන දේ, අපේ ස්ථාවරය වන්නේ, ස්වෛරී රාජ්‍යයකට කාටවත් බලහත්කාරයෙන් ප්‍රහාර එල්ල කළ නොහැකි බවයි. හැම කෙනාටම නිදහසේ කටයුතු කරන්න පුළුවන් අයිතියක් එහි තිබෙනවා. ඒ වාගේම නායකයන් ඝාතනය කරලා ප්‍රශ්න විසඳන්න බැහැ කියන ස්ථාවරය තුළත් අපි ඉන්නවා.

[ගරු මුනීර් මුලාෆර් මහතා]

අපි ප්‍රාර්ථනා කරනවා, ඉතා ඉක්මනින් ඒ කලාපය තුළත්, ලෝකය තුළත් සාමය ඇති වෙලා හැම කෙනාටම සතුටින් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් ඇති වේවා කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.00]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වනවා, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්.

අදට නියමිත විෂය ගැන නොවෙයි බොහෝදෙනා කථා කළේ. නියමිත විෂයට පරිබාහිරව රටේ ඇති වෙලා තිබෙන සහ ලෝකයේ ඇති වෙලා තිබෙන තත්ත්වයන් පිළිබඳව අද බොහෝදෙනෙක් කථා කළා. ගරු ජනාධිපතිතුමා උදේ වරුවේ ඒ කථාව පටන් ගත්තා. ආණ්ඩුවේම මන්ත්‍රීවරුන් කියනවා අපි දැක්කා, මේ කථාව යම් කිසි හාස්‍යයකට ලක් කරලා අනෙක් පැත්තෙන් කථා කළා කියලා. අපි කියන්නේ ජනාධිපතිතුමාට මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්න තිබුණු කාරණා ඕවා නොවෙයි කියන එකයි. ඔය කාරණා ඉදිරිපත් කළ යුතුව තිබුණේ අමාත්‍යවරයෙක්. මොකද, තෙල් ගබඩා කරන ටැංකි සම්බන්ධයෙන් වර්තමාන ජනාධිපතිතුමා එදා විපක්ෂයේ ඉන්නකොට මේ පාර්ලිමේන්තුවේදීත්, එළියේ වේදිකාවේදීත් මොනවාද කිව්වේ කියලා මගේ phone එකේ තිබෙනවා. ත්‍රිකුණාමලය තෙල් ටැංකි ගැන එදා එතුමා කිව්වේ වෙන කථාවක්. විශේෂයෙන් දුම්රිය ස්ථානවල තිබෙන ටැංකි ගැන එදා එතුමා කිව්වේ වෙන කථාවක්. කළ හැකි දේ ගැන එදා එතුමා කථා කළේ වෙන විධියකට. හැබැයි, බලය අතට අරගෙන ප්‍රායෝගිකව තමුන්ට ඒ වැඩේ කරන්න වුණාට පස්සේ කියන්නේ වෙන කථාවක්. එතකොට මොනවාද ජනතාව කියන්නේ? අපි නොවෙයි ජනතාව ඉදිරියේදී කියාවි, ඒ මොනවාද කියලා. ඒ නිසා තමයි ජනාධිපතිතුමාට සිද්ධ වුණේ මේ රටට "හුණ්ඩුවක්" කියලා කියන්න. ඒ කියන්නේ මේ රට හුණ්ඩුවක් කියලා ජනාධිපතිතුමා දැනගත්තේ පුටුවට ගිහිල්ලා වාඩි වුණාට පස්සේ. හැබැයි ඒ හුණ්ඩුවවත් හරියට කර ගන්න බැරි නම් එතුමා සේරුව කොහොමද කරන්නේ? ඒක තමයි මෙතැන තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. හුණ්ඩුව කර ගන්න බැරි කෙනාට සේරුව ගැන කථා කරලා වැඩක් නැහැ.

එතුමාට අද කියන්න තිබුණේ එවැනි තත්ත්වයක් නිසා, විශේෂයෙන්ම ඒ කලාපයේ ඇති වෙලා තිබෙන යුද්ධය නිසා ශ්‍රී ලංකාවට අද මොකක්ද සිද්ධ වෙන්නේ කියලායි. විදේශ රටවලට ගිහින් අපි වෙනුවෙන් දුක් විඳින අපේ ජනතාව වෙනුවෙන් ගන්නා පියවර සම්බන්ධයෙන් එතුමාට කියන්න තිබුණා. ඊළඟට, අපි තෙල් ටික ගෙන්වා ගන්නේ කොහොමද, අපි ගෑස් ටික ගෙන්වා ගන්නේ කොහොමද, අපි බෙහෙත් ටික ගෙන්වා ගන්නේ කොහොමද කියන්න තිබුණා. ඊළඟට අපේ අපනයන ක්ෂේත්‍රය, අපේ තේ වෙළෙඳාම ආදී මේ සියල්ලම සිද්ධ කරන්නේ කොහොමද කියලා එතුමාට කියන්න තිබුණා. ඒවා තමයි අපට තිබෙන ප්‍රශ්න.

ඊළඟ කාරණය තමයි, අපේ රටට ආයෝජකයෝ එන්නේ කොහොමද, අපේ රටින් ගිහිල්ලා ඒ රටවල ආයෝජනය කරන ආයෝජකයෝ වැඩ කටයුතු කරන්නේ කොහොමද කියන එක. මේ, ඒ සම්බන්ධව බරපතළ විධියේ වැඩ කොටසක් කරන්න තිබෙන වෙලාවක්. ඒ නිසා තමයි, දෙවන ලෝක යුද්ධයෙන් පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්මාණය කළේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්මාණය කරපු තැන තමයි ඒ ගැන කථා කරන්න තිබෙන්නේ. එහෙම නම් ජනාධිපතිතුමාට තිබෙන්නේ ලෝකයත් එක්ක කථා කරන්න; මේ සංවිධානත් එක්ක කථා කරන්න; ඒකට විපක්ෂයත් සහභාගී කර ගෙන ඒ සම්බන්ධතාව ගොඩනහා ගන්න. ඒ අනුව තමයි, අපිට කණ්ඩායමක් හැටියට, ශ්‍රී ලංකාව හැටියට ඒ ගැන ලෝකයට කථා කරන්න පුළුවන් වෙන්නේ. ඒක ගැනයි එතුමාට මේ සභාවේදී කථා කරන්න තිබුණේ. එහෙම කථා කරද්දී සාමාජික රටවල වගකීම සම්බන්ධව වෙනත් ආකාරයකින් කථා කරන්න තිබුණා. න්‍යෂ්ටික අවි ගැන කථා කරනකොට විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ පරමාණු බලශක්ති කේන්ද්‍රස්ථානය සම්බන්ධව, ඒ පරීක්ෂණ සම්බන්ධ අධිකාරියක් තිබෙනවා. ලෝකයේ සිද්ධ වෙන කාරණා අපට බලපාන විධිය සම්බන්ධව ඒ අධිකාරියත් එක්ක කථා කරන්න පුළුවන්. ඊළඟට, විශේෂයෙන්ම වෙළෙඳ පොළ ප්‍රශ්නය ගැන ලෝක වෙළෙඳ සංවිධානයත් - WTO එකත් - එක්ක කථා කරන්න පුළුවන්. මොකද, මේවා අපේ රටට බලපාන කාරණා. එතැන තමයි, අපේ රටේ අපනයන ක්ෂේත්‍රය, අපේ ආනයන සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න ගැන අපට කථා කරන්න තිබෙන හොඳම ස්ථානය.

ඊළඟට, විදේශගත ශ්‍රී ලාංකිකයින් ගැන අපට ILO එකත් එක්ක කථා කරන්න පුළුවන්. මේ වෙලාවේදී විදේශගත ශ්‍රී ලාංකිකයන්ට සිද්ධ වෙලා තිබෙන බරපතළ ප්‍රශ්න ගැන ගත්තොත්, එක පැත්තකින් ඔවුන්ට යුද්ධයෙන් හානියක් සිද්ධ වෙන්න පුළුවන්. මේ වෙනකොට සමහර කණ්ඩායම්වලට තුවාල සිදු වෙලා තිබෙනවා. ඊට අමතරව ඒගොල්ලන්ගේ රැකියා සම්බන්ධව ප්‍රශ්න තිබෙන්න පුළුවන්. ඊළඟට, අපේ රටින් ගිහිල්ලා ඒ රටවල ව්‍යාපාර කරන අයට බරපතළ හානි සිද්ධ වෙලා තිබෙන්න පුළුවන්. ඒ වාගේම, මේ රටින් පිටත් වෙලා ගිහිල්ලා, ඒ රටවල වැඩ කරන්න සූදානමින් ඉන්න කණ්ඩායමට ඒ සම්බන්ධව විශාල ප්‍රශ්න මතු වෙලා තිබෙන්න පුළුවන්. ඒ හා සමානව බැඳිලා තිබෙන අනෙකුත් ව්‍යාපාර ක්ෂේත්‍ර ආදී මේ සියල්ලටම ප්‍රශ්න ඇති වෙලා තිබෙන්න පුළුවන්. එතකොට මේ සම්බන්ධව කථා කරන්න ලෝකයේ ආයතන ටිකක් තිබෙනවා. මේ රටේ නායකයා හැටියට එතුමා අනෙක් සියලුදෙනා වාඩි කරවාගෙන, ඒ සම්බන්ධව සාකච්ඡා කරන්න ඕනෑ. ඒ නිසා තමයි, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා කිව්වේ ලෝකයේ අනෙක් රටවල අය කැඳවලා අපි එකට එකතු වෙලා, සාකච්ඡාවක් පවත්වමු, ඒකට විපක්ෂය සූදානම් කියලා. මේ වෙලාවේදී අපි ගියේ නැහැ, තෙල් පෝලිම්වල ඉන්න. අපි ගියේ නැහැ, ගෑස් පෝලිම් හදන්න. අපේ විපක්ෂයේ කවුරු හරි එහෙම දෙයක් කළා කියලා කොතැනක හරි තිබෙනවාද? එහෙම දෙයක් නැහැ. තමුන්නාන්සේලාට ඡන්දය දීපු, තමුන්නාන්සේලාට හැම දාම දරදිය ඇද්ද කණ්ඩායම තමයි ගිහිල්ලා පෝලිම්වල ඉඳගෙන කථා කළේ. අපි නොවෙයි එහෙම කථා කළේ. ඒගොල්ලන් ඇයි, පෝලිම්වලට ගියේ? ඒගොල්ලන්ට ඇයි, මේ භය ඇති වුණේ? මේ භය ඇති කළේ අරගළයත් එක්ක මීට ඉහතදී තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා එදා විපක්ෂයේ සිටියදී තමයි, ජනතාවගේ ඔළු ඔය වාගේ විෂබීජවලින් පිරවුයේ. අද පුංචි ශබ්දයක් එනකොට, ඒ අය දුවලා ගිහිල්ලා ඒ වැඩ කටයුත්තට සූදානම් වෙන්නේ ඒකයි. ඒ නිසා ඒකේ වගකීම තිබෙන්නේ තමුන්නාන්සේලාට. ඒ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්නේ කොහොමද කියන එක අද තමුන්නාන්සේලා දැන ගන්න ඕනෑ.

මතක තබා ගන්න, මෙවැනි ප්‍රශ්නයකදී ලෝකයත් එක්ක වැඩ කටයුතු කරන ක්‍රමවේදයක් තිබෙන බව. ඒ අනුව විශේෂයෙන්ම මේ වෙලාවේදී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයත් එක්ක සාකච්ඡා කරන්න අපට හැකි වෙන්න ඕනෑ. මොකද, ඉදිරි කාලය තුළදී අපිටත් ආරක්ෂාව ගැන ගැටලුවක් ඇති වෙනවා. අපි දන්නේ නැහැ, මේ යුද්ධය කොයි විධියට පැතිරිලා ඉස්සරහට යයිද කියලා. ඒ නිසා අපි සූදානම් විය යුත්තේ ඒ වැඩ කටයුත්තට තමයි. ලෝකයේ ඇති වන මේ යුද්ධය මීට වඩා පුළුල් වෙලා අනෙක් රටවලට බලපාන තත්ත්වයට යනවා නම්, අපි ඒකට මුහුණ දෙන්නේ කොහොමද කියන එක පිළිබඳව සාකච්ඡා කිරීම වර්තමානයේ රටක් හැටියට අපි කළ යුතු වෙනවා. ඒ නිසා අපේ රට ආසන්නයේ තිබෙන රටවල නායකයෝ එක්ක එකට වාඩි වෙලා එහෙම නැත්නම් යම් කිසි සම්බන්ධතාවක් ගොඩ නහාගෙන ඒ ගැන කථා කරන්න ඕනෑ. ඒ අවස්ථාව තමයි, ජනාධිපතිතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ මන්ත්‍රීවරුන් 225දෙනා එක්ක සාකච්ඡා කිරීම් කරන්න ඕනෑ කියන කාරණාව. ඒ රාජකාරිය ගැන එතුමා කථා නොකරපු එකයි තිබෙන ප්‍රශ්නය. මේ සභාවට ඇවිල්ලා අර සංඛ්‍යාලේඛන කියපු එකෙන් රටට ඇති වන ප්‍රතිඵලය මොකක්ද? අමාත්‍යවරයෙකුට නැඟිටලා කියන්න තිබුණා, මේ රටේ දැන් තිබෙන තත්ත්වය මෙන්න මේකයි, මේ වාගේ ප්‍රමාණයක් තෙල් තිබෙනවා, මෙන්න මේ වාගේ ප්‍රමාණයක් තෙල් එන්න තිබෙනවා, නැව් මහට එනවා, ගෑස් මහට එනවා කියලා. මේවා ජනාධිපතිතුමා ඇවිල්ලා කියන්න ඕනෑ නැහැ. මේක තමයි ප්‍රශ්නය. මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්නේ නැතුව අනෙක් අයට බැණලා වැඩක් නැහැ. මොකද, අපට තිබෙන්නේ මේවා ගැන කථා කරන්නයි.

ඒ වාගේම මේ අවස්ථාවේදී මට තවත් පොඩි කාරණාවක් ගැන කථා කරන්න තිබෙනවා. ඒක තමයි, පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධව වර්තමානයේ ඇති වෙලා තිබෙන තත්ත්වය. අපි විශේෂයෙන්ම මේ කාරණය ආණ්ඩුවට මතක් කරනවා. මමත් කතෝලිකයෙක් හැටියට කතෝලික සභාවේ ඉන්න කෙනෙක්. ඒ නිසා මම කතෝලික සභාවේ ඉන්න කෙනෙක් හැටියට කියනවා, පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන කරගෙන යන මේ විමර්ශන සම්බන්ධව තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳව කිසිසේත්ම සෑහීමකට පත් වෙන්නේ නැති බව. සලේව අත්අඩංගුවට ගැනීම සම්බන්ධව ගත්තොත්, ඒ සලේද, වෙනත් කෙනෙක්ද කියන එක අපට අදාළ නැහැ. අපි එදා ඉඳලාම ඉල්ලුවේ මේ සියලුදෙනා අත්අඩංගුවට අරගෙන, මේ රටේ ඒ වින්දිත ජනතාව වෙනුවෙන් සාධාරණය ඉෂ්ට කරන්න කියලායි.

මගේ ළඟ මේ තිබෙන්නේ "අනිද්දා" පත්තරේ. මොකක්ද ඒකේ තිබෙන්නේ? "සුරේෂ් සලේ අත්අඩංගුවට ගත්තේ ආරක්ෂක ලොක්කන්ට නොකියා" කියලා එහි කියනවා. මෙහෙම චිත්‍රපට හදන්න එපා; මෙහෙම චිත්‍රපට හදන්න එපා. රටේ ජනාධිපතිවරයෙක් ඉන්නවා; රටේ ආරක්ෂක ඇමතිවරයෙක් ඉන්නවා; රටේ අධිකරණ ඇමතිවරයෙක් ඉන්නවා; විශේෂයෙන්ම පොලීසිය භාර ඇමතිවරයෙක් ඉන්නවා; පොලිස්පති ඉන්නවා. ඒ සියලුදෙනා ඉන්නකොට කාව හරි අත්අඩංගුවට ගන්න එක දන්නේ නැහැ කියලා කවුරු හරි කියනවා වාගේ චිත්‍රපට මවලා මේ පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳ ප්‍රශ්නය ආපසු මුල්ලකට වීසි කරන්න, එහෙම නැත්නම් යම් කිසි කාලයක් ඇදගෙන ගිහිල්ලා ජනතාව රවටන්න සූදානම් වෙන්න එපා.

අපි විශේෂයෙන්ම මේ කාරණයත් අහනවා. තමුන්නාන්සේලාගේ ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තුවේ හිටපු ඊබ්‍රාහිම් නානා කියන කෙනා තමයි මේ පාස්කු ඉරුදින ප්‍රහාරයේ බරපතළ වැඩ කොටස කළේ. ඔහුගේ ගෙදරදී, ඔහුගේ පුත්තු තමයි සිය දිවි හානි කර ගත්තේ; blast කර ගත්තේ. ඒ එක්කම ඒ පවුලේ සියලුදෙනා ඒ මුදල් ටික වියදම් කළාය කියලා ඒ වෙලාවේදී ඔප්පු වුණා. අද වනකොට තමුන්නාන්සේලා අධිකරණයට කරුණු ඉදිරිපත් කර තිබෙනවා, ඒ අයගේ ගෙදර තිබුණු සියලු දේවල් ටික ආපහු දෙන්න කියලා. මේ සභාවේ කවුරු හරි නැඟිටලා කියන්න, ඊබ්‍රාහිම් නානාව කවුද බේරුවේ කියන එක. කවුද ඔහු බේරලා පැත්තකට කරලා තියලා තිබෙන්නේ? කවුද ඔහු වරදකාරයෙක් නොවෙයි කියන්නේ? කවුද එහෙම කරන්නේ? අපි දකින්නේ මේ ගැන සත්‍ය වසන් කරගෙන, තමන්ගේ පක්ෂයේ මිනිසුන්ව,- දැන් අපට අහන්න ලැබුණා, ඒ දවස්වල විශේෂයෙන්ම සහරාන් වෙනුවෙන් පෙනී හිටපු නීතිඥ මහත්වරු මේකේ ඉන්නවාය කියලා. එතකොට සහරාන්ගේ සම්බන්ධතාව ඒ කාලයේ ඉඳලාම ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම අර අමාත්‍යතුමාගේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. එතුමාව ප්‍රශ්න කරන්න තිබෙනවා, මේ පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධව. ඒ නිසා නිවැරදි ක්‍රියාමාර්ග අරගෙන අපට මහ මොළකරු හොයා දෙන්න ඕනෑ. තවත් සෙල්ලම් කරන්න එපා. ලබන අප්‍රේල් 21වැනි දාට උත්තරයක් දෙන්න තිබෙනවා, තමුන්නාන්සේලා පොරොන්දු වෙච්ච විධියට. පසුගිය අප්‍රේල් 21වැනි දා පහු වුණා. ආපහු මේ අවුරුද්දේ අප්‍රේල් 21වැනි දාත් එනවා. එදාටවත් තමුන්නාන්සේලා ඒ පොරොන්දුව ඉෂ්ට කර දෙන්න. එහෙම තිබියදී ගල් අඟුරු ප්‍රශ්නය එනකොට එක වතාවට සලේව අත්අඩංගුවට අරගෙන මේවා මකන්න, හංගන්න සූදානම් වෙන්න එපා. සලේ සම්බන්ධයෙනුත් ඒ පරීක්ෂණය හරියට කරලා, ඊබ්‍රාහිම් නානා සම්බන්ධ පරීක්ෂණයත් හරියට කරලා, රටක් හැටියට මොනවාට හරි සම්බන්ධ වෙලා ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒවාත් පරීක්ෂා කරලා, මේකට අවශ්‍ය කරන නිසි විසඳුම මේ රටට අරගෙන දෙන්න කියලා තමුන්නාන්සේලාට අපි බල කරනවා, විශේෂයෙන්ම කතෝලික සභාව හැටියට. මමත් කතෝලික සභාවේ කෙනෙක් හැටියට කියනවා, කවුරු මොනවා කිව්වත් ඒක අදාළ නැහැ කියලා. පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා කරන ක්‍රියාවලිය ගැන අපි සෑහීමකට පත් වෙන්නේ නැහැ. කරුණාකරලා මේ වෙනුවෙන් නිවැරදි විසඳුම ලබා දෙන්න කියලා අවසාන වශයෙන් මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 3.11]

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22වැනි වගන්තිය යටතේ නිකුත් කළ නව නියමය ගැන අද දින කථා කරන්න තිබුණත් අද උදේ ඉඳලාම ලෝකයේත්, ඒ වාගේම අපේ රට තුළත් ඇති වෙලා තිබෙන තත්ත්වයන් පිළිබඳව විවිධ අය විවිධ අදහස් පළ කළ බව අප දන්නවා. අපිට මතකයි, රටක් විධියට තිස් අවුරුදු යුද්ධයකට අප මුහුණ දුන් බව. ඒ වාගේම ඒ තිස් අවුරුදු යුද්ධයත්, ලෝකයේ ඇති වන යුද්ධත් දිහා බැලුවාම පෙනෙනවා, ඒවා විශේෂයෙන්ම පාලකයන්ගේ වුවමනාව මත සිදු වුණු යුද්ධ බව. ඒ නිසා අපි කුහක වෙන්නේ නැහැ, ලෝබ වෙන්නේ නැහැ, යුද්ධයකදී අත් විඳින්න සිද්ධ වන වේදනාව වෙනුවෙන් ඔවුන්ට අපේ කනගාටුව ප්‍රකාශ කරන්න. මොන රටක, මොන ජාතියක, මොන ආගමක අය වුණත් ඒ මිය යන්නේ මිනිස්සු විධියටයි අපි දකින්න ලැහැස්ති. එම නිසා ඒ මිය ගිය අය වෙනුවෙන් අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ඒ වාගේම මේකේ තිබෙන හාස්‍යය තමයි, යුද්ධයෙන් මිය ගිය අය වෙනුවෙන් අද කනගාටුව ප්‍රකාශ කරන්නේ, මේ රටේ යුද්ධ වෙනුවෙන් පාර හදපු අය වීම. පසුගිය කාලයේ පාස්කු ඉරුදින ප්‍රහාරය වාගේ ප්‍රහාර සංවිධානය කරලා, ඒවායේ විමර්ශන දැන් නිසියාකාරව ක්‍රියාත්මක වෙද්දී ඒවාට රිදිලා, ඒවාට එරෙහිව හඬ නඟන අය තමයි අද මේ යුද්ධයේ වේදනාව ගැන කථා කරන්නේ. තමන්ට බලය ලබා ගැනීම වෙනුවෙන් පාස්කු ප්‍රහාරය වාගේ ප්‍රහාර දියත් කරලා, මිනිසුන් ඝාතනය කළ අය තමයි අද මේ කිඹුල් කඳුළු හෙළන්නේ. නමුත් අපට ඊට වඩා එහා ගිය සංවේදීතාවක් තිබෙනවා. එහෙම දේශපාලන පක්ෂයක් තමයි, ජාතික ජන බලවේගය කියන්නේ.

ඒ විතරක් නොවෙයි. පාස්කු ප්‍රහාරයෙන් ගන්න බැරි වුණු රට, අල්ලාගෙන ඉන්න බැරි වුණු බලය, නැවත ලබා ගැනීම සඳහා තෙල් පෝලිම් හෝ පාවිච්චි කරන්න ඔවුන් පසුබට වෙලා නැහැ කියලා අදටත් අපට පෙනෙනවා. අපේ ඇතැම් ගරු මන්ත්‍රීවරු කිව්වා වාගේ, ඔවුන්ගේ ඇතැම් මාධ්‍ය නාළිකා පාවිච්චි කරලා කෘත්‍රිම තෙල් පෝලිම් හදන්න උත්සාහ කළා. හැබැයි, අද අපේ ගරු ජනාධිපතිතුමාගේ කථාව ඇතුළේ කියැවුණා, තෙල් පෝලිම් පෙන්වා අනාගතයේ මේ රටේ බලය ගන්න හිතාගෙන ඉන්නවා නම් ඒකත් අපි අහෝසි කරනවා කියලා. ඒකේ සැලසුම කොහොමද, කොච්චර කල් යනවාද, කොහොමද කරන්නේ කියලා එතුමා ප්‍රකාශ කළා. ඒක අහගෙන ඉඳලා ටික වෙලාවකට පසුව, පළපුරුද්ද සහ අත්දැකීම් තිබෙනවාය කියන විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කියනවා, "තෙල් ඇමතිතුමා ටැංකියට බැහැලා ආවා. අපි හිතුවා, පසුවදාම ටැංකියේ තෙල් පුරවයි කියලා" යනුවෙන්. ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ගැන අවබෝධයක් තිබෙන මන්ත්‍රීවරයෙක් තමයි එහෙම කිව්වේ. ඒ තරමට ඔවුන් අද කුහක වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව වට්ටන්න තිබෙන්නේ මොනවාද, ඒ හැම දේම පාවිච්චි කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ විනිමය පනත ගැන කථා කළොත්, මෙම පනත 2017 ඉඳලා මාස හයකට සැරයක් විටින් විට සංශෝධනය කරලා තිබෙනවා. මේ පනතේ විශේෂ අවස්ථාවක් තිබෙනවා. 2023දී මෙම පනත සංශෝධනය වන අවස්ථාවේදී කොන්දේසි ලිහිල් කරලා තමයි නියමයන් පනවන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ 2023දී. 2023දී ඒ කොන්දේසි ලිහිල් කරන්නේ, IMF එකේ ගිවිසුමට අනුව. ඒ කියන්නේ, ණය ප්‍රතිව්‍යුහගතකරණයට අනුවයි කොන්දේසි ලිහිල් වෙන්නේ. නැතුව, ආර්ථිකයේ මහා ප්‍රසාරණයක් වෙලා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි අපි දන්නවා, ඒ වෙලාවේ දළ නිල සංචිත තිබුණේ බිලියන 4.39යි කියලා. අපි 2025දී මෙම නියමයන් වෙනස් කරනවා. හැබැයි, ඒ වෙලාවේ දළ නිල සංචිත තිබුණා, ඩොලර් බිලියන 6.3ක්; මේ වසරේ ජනවාරි අග වනකොට ඩොලර් බිලියන 6.3ක සංචිත තිබුණා. එය වර්ධනය වුණේ, නවත්වා තිබුණු වාහන ආනයනය අපි නැවත ආරම්භ කරලායි. ඒ වාහන වෙනුවෙන් LCs ඩොලර් බිලියන 2.4ක open කරලා තිබෙනවා. ඩොලර් බිලියන 1.9ක් ගෙවීම් කරලා තිබෙනවා. ඩොලර් බිලියන 6.3ක සංචිත තිබෙද්දී තමයි අපි ආයෝජකයන් වෙනුවෙන් මේ නීති රීති, අණපනත් අපි ලිහිල් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ කඩා වැටුණු රටවල් තිබුණා. විශේෂයෙන් ඉන්දියාව, ග්‍රීසිය වාගේ දියුණු රටවල ආර්ථිකය එක පාරටම බංකොලොත් වෙලා නැවත ආර්ථිකය පිබිදෙන වෙලාවේ ඔවුන් මේ වාගේ උපක්‍රමයක් පාවිච්චි කළා. ඒ නිසා මෙය ලෝකයට අලුත් අත්දැකීමක් නොවෙයි. අපි දන්නවා අපි නිවැරදි ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා කියලා. අද ඉදිරිපත් කර තිබෙන මේ නියමය අනුව, ශ්‍රී ලංකාවේ නේවාසිකව ව්‍යාපාර කරන ව්‍යාපාරික ආයතනයක, ඔවුන්ගේ තිබුණු මුදල් සීමාවන් රුපියල් 200,000 සිට රුපියල් 5,00,000 දක්වා ඉහළ දමනවා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනුවලදී ඩොලර් 20,000ක් ලෙස තිබුණු සීමාව ඩොලර් 25,000 දක්වා ඉහළ දමා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම තීරණායක හදන්නේ අපි නොවෙයි, මහ බැංකුව. මහ බැංකුව ස්වාධීන ආයතනයක් විධියට බලලා මෙම තීරණායක රජය වෙනුවෙන් නිකුත් කරනවා. අපි විතරක් නොවෙයි, මහ බැංකුව ඇතුළු හැමෝම පිළිගන්නවා ඒක ස්වාධීනයි කියලා.

මට පෙර කථා කළ මන්ත්‍රීවරයෙක් මහ බැංකුවේ ස්වාධීනත්වය ගැන කථා කළා. ඇත්තටම මට හිනා ගියා. එතුමා මහ බැංකුවේ ස්වාධීනත්වය ගැන කථා කරනවා! 2015දී ඔවුන් බලයට ඇවිල්ලා මහ බැංකුවට මොනවාද කළේ කියලා මතක් වනකොට අපට හිනා යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ මුදල් සීමා වැඩි කරලා බලාපොරොත්තු වෙන්නේ, රටට ආයෝජකයෝ ළඟා කර ගන්නයි. ඒ වාගේම විදේශ රටවල ආයෝජන අවස්ථා ලබා දෙන්නයි. මෙතැන කාරණා දෙකක් තිබෙනවා. අපි දන්නවා, මහ බැංකුව වාගේ ආයතන මූල්‍ය ස්ථාවරත්වය ගැන සහතික දෙනකොට රටේ ආර්ථික ස්ථාවරත්වය නිසා foreign direct investments - FDIs - ලංකාවට වැඩිපුර ගලා එන්න පටන් ගන්න බව. ඔවුන් ආයෝජනය කරන මුදල් නැවත ප්‍රතිආයෝජනය කරන්න අවස්ථාවක් ලැබෙනවා. ආයෝජන ළඟා කරගන්න එක අපේ රජයේ ප්‍රධාන ප්‍රතිපත්තියක්. ඒ ප්‍රතිපත්තියට අනුව අපි මේ ලිහිල් කිරීම කරනවා. ඒ වාගේම තමයි, අපේ රටේ ඉන්නවා දක්ෂ ව්‍යාපාරිකයෝ. ඔවුන්ට ජාත්‍යන්තරය කරා යන්න අවශ්‍යයි. ඔවුන්ට මේ මූල්‍ය සීමාවන් බාධාවක් වෙලා තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉන්දියාව අපේ අසල්වැසි රටක්. ඉන්දියාව

වේගයෙන් දියුණු වෙමින් තිබෙනවා. ඒ නිසා අපට ව්‍යාපාරික අවස්ථා ලැබෙනවා. ඒ විතරක් නොවෙයි, අප්‍රිකානු කලාපයේ රටවල් දිහා බැලුවාමත් ඒ කලාපයේ රටවල් වේගයෙන් දියුණු වෙනවා. අපේ ඇතැම් ව්‍යාපාරිකයෝ ඒ රටවලට ගිහිල්ලා මුදල් ආයෝජනය කරලා තිබෙනවා. ඔවුන්ගේ ආයෝජනත් තව තවත් වැඩි දියුණු කරන්න තමයි, මේ පනත තුළින් ශක්තිමත් කරලා තිබෙන්නේ. අපේ රටේ විදේශ මුදල් සංචිතය එහෙම නැත්නම් විදේශ මුදල් ගලා ඒම වැඩි කර ගැනීමේ අරමුණින් මේ තීන්දුව ගත්තා කියලා මම කියන්න කැමැතියි.

අපි දැක්කා, විපක්ෂ නායකතුමාත් ඒ වාගේම විවිධ මන්ත්‍රීවරුනුත් මේ පනතේ අඩුපාඩු කියනවාට වඩා කථා කළේ අපේ රටේ තිබෙන ආර්ථික අස්ථාවරත්වය ගැන බව. අපි මේ වාගේ විශේෂ සංශෝධනයක් ගෙනැල්ලා ජාත්‍යන්තරයේත්, රට තුළත් ආයෝජකයන්ගේ විශ්වාසය තහවුරු කරන කොට විපක්ෂයේ අය එන්න තිබෙන ආයෝජන නවත්වන්න තමයි මේ අස්ථාවරභාවය ගැන කථා කළේ. එම අස්ථාවරභාවය ගැන කථා කරන කොට අපි දන්නවා, රටට එන ආයෝජකයන් දුර්වල වෙනවා කියලා. ඔවුන් හිතනවා නම්, ඔවුන් මේ කරන්නේ හුදු බලය ගැනීම සඳහා ක්‍රියාවලියක් කියලා, නැහැ, මේකෙන් බලය ගන්න එක නොවෙයි වෙන්නේ. මේකෙන් වෙන්නේ අපේ රටේ අනාගතය නැවතත් 2022දී ඇති වූ තත්ත්වය වාගේ තත්ත්වයන්ට ඇද දමන එකක්. ඔවුන් හනුමා වාගේ නැට්ට ගිනි තියාගෙන වටේම ගිනි තියන්න යනවා. අපි දන්නවා, පොඩි හනුමලා, ලොකු හනුමලා දැන් නැවත තෙල් පෝලිම් අස්සෙන් එළියට බැහැලා තිබෙනවා. ඒ කරන්න හදන්නේ රට බංකොලොත් කරන එකයි. එහෙම නැතිව ඒ තමන්ගේ දේශපාලනය වෙනුවෙන් කරන දෙයක් විතරයි කියලා හිතට ගන්න එපා කියලා අපි කියනවා. මොකද මේකෙන් අපේ රටේ ජනතාව නැවතත් අගාධයට යනවා. රටක් විධියට අගාධයට යනවා.

2020දී විතර නතර කරපු ලංකාවේ වාහන ආනයනය, අවුරුදු පහකට විතර පස්සේ නැවත ආරම්භ කරන කොට අලුත් මාදිලියේ, අලුත් තාක්ෂණයේ වාහන ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි අපි අවුරුදු පහක් පාලනය කරලා ඩිජිටල්කරණය ගෙනැල්ලා, තාක්ෂණය නව කර්මාන්තශාලාවලට හඳුන්වලා දීලා මේ රට ඉදිරියට ගෙන එනවා. ඔබතුමන්ලා ගෙදර අවුරුදු පහක් ඉඳලා එනකොට අපි නව තාක්ෂණයත් එක්ක ගොඩාක් දුර ගිහිල්ලා. එදාට විපක්ෂය යල් පැනපු විපක්ෂයක් බවට පත් වෙන එක, තාක්ෂණයත් එක්ක යන්න බැරි විපක්ෂයක් බවට පත් වෙන එක අනිවාර්යයි කියලා ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.21]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்திலே அந்நியச் செலாவணி சம்பந்தமான பல விடயங்கள் இங்கே பேசப்பட்டது. இந்த நாடு அந்நியச் செலாவணியை உழைக்க வேண்டுமென்றால், ஏற்றுமதிப் பொருளாதாரத்தை ஊக்கப்படுத்தும் அதேநேரம், நிலையான முதலீட்டு ஊக்குவிப்புக்களையும் மேற்கொள்ள வேண்டும். ஆனாலும், இன்று இந்த நாடு பலதரப்பட்ட பிரச்சினைகளை எதிர்கொள்வதால், நிலையான முறையின்மூலம் அந்நியச் செலாவணியைப் பெற்றுக் கொள்வதற்கான நடவடிக்கைகளை எடுப்பதில் அரசாங்கம் காட்டும் அக்கறை மிகவும் குறைவாகவே இருக்கின்றதென நான் நினைக்கின்றேன். இன்று இந்த நாட்டின் பொருளாதார வளர்ச்சி வீதம் 3 இலிருந்து 4 ஆக அதிகரித்திருக்கின்றது. இருந்தாலும், மத்திய வங்கியானது வருமானத்தைப் பெற்றுக்கொள்வதற்காக வட்டி வீதத்தை உயர்த்துவதற்கான சில செயற்பாடுகளை முன்னெடுத்து வருகின்றது. இது நாட்டின் பொருளாதாரத்தை அபிவிருத்தி செய்யும் என்று நாங்கள் எதிர்பார்க்க முடியாது.

இப்போது சர்வதேச ரீதியில் ஓர் அசாதாரண சூழ்நிலை ஏற்பட்டு இருக்கின்றது. குறிப்பாக, மத்திய கிழக்கின் வளைகுடா நாடுகளில் போர் நடந்துகொண்டு இருக்கின்றது. இந்தப் போர் நிலைமையின் காரணமாக, வெளிநாட்டில் வேலை செய்கின்ற பத்து இலட்சத்துக்கும் மேற்பட்ட எமது நாட்டவர்கள் மிகவும் பாதிப்பான ஒரு சூழ்நிலைக்குள்ளே தள்ளப்பட்டு இருக்கின்றார்கள். இந்த நாட்டுக்குப் பாரியளவில் அந்நியச் செலாவணியைப் பெற்றுத்தருபவர்கள் இவ்வாறு வெளிநாடுகளிலே தொழில்புரிகின்றவர்கள்தான். ஆனால், இன்று அவர்கள் அங்கே உழைக்கின்ற பணத்தை இந்த நாட்டுக்கு, தங்களது குடும்பங்களுக்கு அனுப்புவதற்கான வழிவகை மிகவும் குறைந்தளவிலே காணப்படுகின்றது. இப்படி அந்தப் பணப் பரிமாற்றம் சரியான முறையிலே நடைபெறவில்லையென்றால், இங்கே அவர்களை நம்பி வாழுகின்ற குடும்பங்கள் பொருளாதார ரீதியாக மிகவும் பின்னடையக்கூடிய, பாதிப்புக்குள்ளாகக்கூடிய ஒரு சூழ்நிலை காணப்படும். இந்த நேரத்தில் அரசு இங்கே வாழுகின்ற அவர்களது குடும்பங்களுக்கு என்ன செய்யப் போகின்றது? அவர்களது வாழ்க்கைக்கு என்ன உதவியைச் செய்யப் போகின்றது? அவர்கள் எதிர்நோக்குகின்ற பிரச்சினையை, நிதி ரீதியான நெருக்கடியை எப்படிச் சமாளிக்கப் போகின்றது? என்பவற்றைக் கருத்திற்கொள்ள வேண்டும்.

மாண்புமிகு சனாதிபதி அவர்கள் இன்று உரையாற்றும் பொழுது, "இந்த நாட்டில் எரிபொருள் தாராளமாக இருக்கின்றது, இரண்டு அல்லது மூன்று மாதங்களுக்குத் தேவையான எரிபொருளை நாங்கள் வைத்திருக்கின்றோம்" என்று சொன்னார். ஆனால், இந்த யுத்தம் நீடிக்குமாக இருந்தால், அதற்கான மாற்றுவழிகள் என்ன என்பதனை நாங்கள் சிந்திக்க வேண்டும். பெற்றோலியம் இந்த நாட்டுக்கு வரவில்லையென்றால், விவசாயம் தொடக்கம் இந்த நாட்டின் ஒட்டுமொத்தமான பொருளாதாரமும் பாதிக்கப்பட்டு, இந்த நாடு மீண்டும் ஆபத்தான ஒரு யுகத்துக்குப் போகின்ற துர்ப்பாக்கிய நிலை ஏற்படும். 2022, 2023ஆம் ஆண்டுகளில் இந்த நாடு பொருளாதார ரீதியாக முடக்கப்பட்டிருந்தது; அவ்வாறான நிலையொன்று மீண்டும் உருவாகக் கூடும். இந்த நாட்டின் விவசாயிகள் பாதுகாக்கப்பட வேண்டும், மீனவர்கள் பாதுகாக்கப்பட வேண்டும், இந்த நாட்டின் பொருளாதாரத் தைக் கட்டியெழுப்ப வேண்டுமென்றால், பெற்றோலியம் என்பது மிகவும் முக்கியமானதொன்றாக இருக்கின்றது.

இந்த நாட்டில் அந்நியச் செலவாணியைப் பெற்றுக் கொள்ளக்கூடிய மிக இலகுவான வழியாக இருப்பது உல்லாசப் பிரயாணத்துறை. நாங்கள் உல்லாசப் பிரயாணத் துறையை ஊக்குவிப்பதற்கான நடவடிக்கையை எடுக்க வேண்டும். அதன் ஊடாகத்தான் கூடுதலான அந்நியச் செலவாணியைப் பெற்றுக்கொள்ள முடியும். இலட்சக்கணக்கான வெளிநாட்ட வர்கள் இந்த நாட்டிற்கு வருகை தருவதாக இங்கே குறிப்பிடுகின்றீர்கள். ஆனால்,

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

இந்த நாட்டுக்கு அந்நியச் செலவாணியைப் பெற்றுக் கொள்ளக் கூடிய வகையில், இந்த நாட்டில் வெளிநாட்டு நாணயங்களைச் செலவிடுபவர்கள் - பணத்தைச் செலவிடுபவர்கள் எத்தனைபேர் இருக்கின்றார்கள் என்று பார்த்தால், அது மிகவும் குறைந்தளவாகவே இருக்கின்றது. இதனடிப்படையில், இந்த நாட்டைப் பொருளாதார ரீதியாக நாங்கள் கட்டி எழுப்ப வேண்டும், சென்மதி நிலுவையை அதிகரிக்க வேண்டும் என்றால், அதற்கு அவசியமான ஏனைய விடயங்களை முன்னெடுக்க வேண்டும். அப்போதுதான் இந்த நாட்டின் பொருளாதாரத்தை ஓர் ஸ்திரத்தன்மைக்குக் கொண்டு செல்ல முடியும்.

எங்களது அயல் நாடாக, எங்களோடு உறவாக இருக்கின்ற இந்தியாவைப் பாருங்கள்! அந்த நாடு எவ்வளவு முன்னேற்றம் அடைந்திருக்கின்றது! ஆனால், சுதந்திரம் அடைந்த காலம் தொடக்கம் இற்றைவரை இலங்கை அதே நிலையில்தான் இருக்கின்றது. ஏனைய சர்வதேச நாடுகளுடனான உறவு களைச் சரியாகப் பேணுகின்றபொழுதுதான், இராஜதந்திர ரீதியாகச் செயற்படுகின்றபொழுதுதான் இந்த நாட்டின் பொருளாதாரத்தை நாங்கள் கட்டியெழுப்ப முடியும். எனவே, நாட்டுக்கு நிலையான முதலீட்டு ஊக்குவிப்புத் திட்டங்களைக் கொண்டுவந்து, சரியான திட்டமிடலை மேற்கொண்டு, நாட்டுக்குத் தேவையான அந்நியச் செலவாணியை ஈட்டிக்கொடுக்க வேண்டுமென இந்த அரசிடம் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.27]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි .

මගේ කථාව ආරම්භ කරන්න කලින් මම කැමැතියි කාරණා කිහිපයකට ප්‍රතිචාර දක්වන්න. බොහෝ දෙනාට රිදිලා තිබෙනවා ජනාධිපතිතුමා එතුමාගේ කථාවේදී "හුණ්ඩුවක්" කිව්වා කියලා. විපක්ෂයේ අයට ඒ උපමාව තේරුම් ගන්න බැරිකම පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරනවා. මේක රටක් ලෙස පාලනය කරලා නැහැ; හුණ්ඩුවක් බවට පත් කරලා. "හුණ්ඩුවක්" කිව්වේ ඒකයි. හුණ්ඩුවක් ලෙස තමයි අපට රට භාර ගන්න වෙලා තිබුණේ. නමුත්, ජනාධිපතිතුමා එතුමාගේ කථාවේදී පැහැදිලිව කිව්වා, මේ හුණ්ඩුව රටක් කරන්න කොච්චර ප්‍රමාණයක් මහන්සි වෙලා තිබෙනවාද කියලා. විශේෂයෙන් ඉන්ධන පිළිබඳ ප්‍රශ්නය ගත්තොත්, මේ අවස්ථාව වන විට රුපියල් බිලියන 47.6ක ලොකු ආයෝජනයක් කරලා තිබෙනවා. මම ඒ ගැනත් විස්තර කියන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම තවත් කාරණාවකට ප්‍රතිචාර දක්වලාම මගේ කථාව පටන් ගන්නම්. මට කලින් කථා කරපු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, මාස 3ක් ගත වෙලාත් ආණ්ඩුවට "දිට්වා" සුළි කුණාටුවෙන් හානි වෙච්ච ඔක්කොම ගෙවල් ටික හදා දෙන්න බැරි වෙලා තිබෙනවා කියලා. මා හිතන්නේ, සියයට 98කට රුපියල් 25,000 දීලා ඉවරයි. සියයට 83කට රුපියල් 50,000 දීලා ඉවරයි. දිස්ත්‍රික්ක කිහිපයකම විනාශ වෙච්ච නිවාස නැවත හදන ව්‍යාපෘතිවලට ගරු ජනාධිපතිතුමා පෞද්ගලිකවම සම්බන්ධ වෙලා ඒවා ආරම්භ කරලා තිබෙනවා. ඒ මන්ත්‍රීතුමාට මතකද දන්නේ නැහැ, එතුමා එදා ආණ්ඩුවේ හිටපු කාලයේ - 2016දී - ලොකු ගංවතුරක් ආවා. මා නියෝජනය කරන කඩුවෙල ආසනයේ, 2024 මැතිවරණය සඳහා අපි මැතිවරණ ව්‍යාපාරය කරගෙන යනකොට අපට හමු වෙන්න ආපු ජනතාව කිව්වා 2016 ලබා දෙන්න තිබුණු රුපියල් 10,000ක ගංවතුර ආධාර මුදල 2024 වනකල්ම ලැබුණේ නැහැ කියලා. එය ලැබුණේ නැති පවුල් ගණනාවක් අපට හමු වුණා. ඒ නිසා අද මේවාට හිනා වෙනවා ඇරෙන්න අපට කරන්න වෙන දෙයක් නැහැ.

කොහොම වුණත්, අද දවසේ යෙදිලා තිබෙන්නේ 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ ඉදිරිපත් කරන ලද නියමය අනුමත කිරීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ප්‍රාග්ධන ප්‍රවාහයේ පියවරක් ලෙස 2020 වර්ෂයේ ඉඳලා අපේ රටින් පිටරටවලට ගලා යන ප්‍රාග්ධනය -capital- සීමා කරන්නට යෙදුණා, ඒ වනකොට අපේ රටේ ආර්ථිකය අගාධයට යමින් තිබූ නිසා. කොහොම වුණත් ගෙවුම් ශේෂ අර්බුදයක් ඇති වුණා. අපි දන්නවා, ආර්ථිකය වැටුණු බව; රට ලොකු අර්බුදයකට ලක් වුණු බව. රට බංකොලොත් වුණා නොවෙයි, බංකොලොත් කළා. කොහොම වුණත්, අපේ රට 2023 ඉඳලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක කිසියම් වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. 2023දී එය ආරම්භ වුණේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ඇති වෙච්ච කිසියම් එකඟතාවක් මත. නමුත්, අපි ආණ්ඩුව භාර ගත්තාට පසු ක්‍රමයෙන් මේ රටින් එළියට ගලා යන ප්‍රාග්ධන මුදල් ප්‍රමාණය ලිහිල් කරමින් යනවා. ඒ කියන්නේ, විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල පවතින අරමුදල් උපයෝගි කර ගනිමින් දේශීය ව්‍යාපාර විසින් වෙනත් රටවල සිදු කරන ආයෝජන කියන ඒවා. ක්‍රමයෙන් ආර්ථිකය ශක්තිමත් වන විට, ඒ වාගේම අපේ රටේ විදේශ සංචිත ක්‍රමයෙන් ගොඩනඟා ගනිමින් යන විට, ව්‍යාපාර පුළුල් කරන්න පහසුකමක් ලෙසත්, විදේශ ආයෝජන දිරිගැන්වීම සඳහාත්, අපේ වෙළෙඳ පොළ පුළුල් වීමේ ප්‍රතිඵලයක් ලෙසත්, විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා ගෙවීම් සිදු කිරීමට දැනට පවතින සීමාව ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 2 සිට ලක්ෂ 5 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා ප්‍රාග්ධන ගනුදෙනු සඳහා කරන ගෙවීම් ඇමෙරිකානු ඩොලර් 20,000 සිට ඇමෙරිකානු ඩොලර් 25,000 දක්වාත් වැඩි කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහොම වුණත් මේ සියල්ල සිදු වන්නේ ක්‍රමයෙන් අපේ ආර්ථිකය ප්‍රසාරණය වීම සහ අපේ ආර්ථිකය ශක්තිමත් වීම කියන සන්දර්භය ඇතුළේ. අන්න ඒකයි අප මේ මොහොතේ වටහා ගන්නට අවශ්‍ය. ඇත්තටම 2025 වර්ෂය අවසන් වනකොට අපේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.8ක් බවට පත් කර ගන්න අපට පුළුවන් වුණා. එය ඒ තත්ත්වයට පත් කර ගත්තේ market එක වහගෙන ඉඳලා නොවෙයි; ආර්ථිකය ප්‍රසාරණය කරමින්. විශේෂයෙන් වාහන ගෙන්වන එක සම්බන්ධයෙන් මුලින් ලොකු විරෝධයක් ආවා, අපට මේ බර දරා ගන්න පුළුවන් වෙයිද කියලා.

කොහොම වුණත් ගිය අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.8ක ණයවර ලිපි - Letters of Credit - open කරලා තිබෙනවා. ඒ වාගේම, ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2ක පමණ ප්‍රමාණයක වාහන නිදහස් කරගෙන තිබෙනවා. විශේෂ වාහන බදු ආදායමක් ලෙස 2025දී විතරක් රුපියල් බිලියන 904ක් රජයට

ලැබිලා තිබෙනවා. 2025 අග වනවිට වාහන සඳහා විතරක් total outflow එක ඇමෙරිකානු ඩොලර් බිලියන 2.4ක්. ඒ වෙනුවෙන් අපට ලැබිච්ච රේගු ආදායම රුපියල් ට්‍රිලියන 2.25ක්. විදේශවලින් අපි ගෙන්වන රථවාහන වෙනුවෙන් අපි එවැනි ආදායමක් ලබා තිබෙනවා. මම මේ ඔක්කෝම පසුබිම සකස් කරලා කිව්වේ, අපේ වෙළෙඳ පොළ විවෘත කිරීමත්, අපි ලෝකයට විවෘත වීමත්, අපේ ආර්ථිකය ප්‍රසාරණයවීමත් කියන සන්දර්භය ඉදිරිපත් කිරීම සඳහායි. මොකද, අපේ ආර්ථිකය ශක්තිමත් වෙනකොට තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ කටයුතු නිසි ලෙස කළමනාකරණය කරමින් අපේ රටේ ඉන්න ජනතාවට ඒ සහන ලබා දෙන්න පුළුවන් වන්නේ. "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ අපට මේ තරම් විශාල මුදලක් ජනතාවගේ සුබසාධනය සඳහා වෙන් කරන්න පුළුවන් වුණේ මේ ලැබිච්ච බදු ආදායමින්. අපේ භාණ්ඩාගාරයට එකතු වෙච්ච අතිමහත් ආදායමින් තමයි අපි ඒ කටයුතු කළේ.

ඒ වාගේම, අපේ අය වැය වෙන් කිරීම්වලදී අපේ ප්‍රමුඛතා මොනවාද කියලාත් මම කියන්නම්. විශේෂයෙන්ම ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම, නිදහස් සෞඛ්‍ය, නිදහස් අධ්‍යාපනය සහ පොදු ප්‍රවාහනය කියන කරුණු 4 තමයි අපේ මූලික ප්‍රමුඛතා. ඒ වාගේම, මේ එකතු කරන මුදලින් තමයි අපි රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන්නේ, පෞද්ගලික සේවකයන්ගේ වැටුප් වැඩි කරන්නේ, වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කරන්නේ, අපි ජනතාවට ලබාදීපු සුබසාධක සහ සහන දීමනා වැඩි කරන්නේ සහ "දිට්වා" වැනි හදිසි ආපදා තත්ත්ව අවස්ථාවලදී ජනතාවට සහන සලසන්නේ. මේ ඔක්කෝම කරන්නේ අර එකතු කරපු බදු ආදායමින්. ඒ නිසා අපේ ස්ථාවරත්වය ගැන, මූල්‍ය ශක්තිය ගැන අපට සැකයක් නැහැ.

2026 ජනවාරි මාසයේ මෑත කාලීන දත්ත අනුව අපේ foreign market එක ගත්තොත්, අපේ මුළු භාණ්ඩ හා සේවා අපනයන ඇමෙරිකානු ඩොලර් මිලියන 1,883ක්. ඒක ගිය අවුරුද්දට සාපේක්ෂව සියයට 7.1ක වර්ධනයක්. ඒ වාගේම, විදේශ ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් මිලියන 751ක්. සංචාරක ඉපැයීම් ඇමෙරිකානු ඩොලර් මිලියන 378ක් සහ ජංගම ගිණුමේ ශේෂය ඇමෙරිකානු ඩොලර් මිලියන 370ක ධන අගයක් ගන්නවා. මේ ඔක්කෝම එක්ක අපට අමතක කරන්න බැරි කාරණයක් තිබෙනවා. ඒ තමයි, අද විශේෂයෙන්ම කථා කරපු කාරණය වන මැදපෙරදිග ඇතිවෙලා තිබෙන යුදමය වාතාවරණයත් එක්ක අපේ ආර්ථිකය මොන වාගේ අභියෝගවලට ද මුහුණ දෙන්නේ කියන එක.

විශේෂයෙන්ම පසුගිය කාලයේමත්, අපි බලය ගන්නකොටත් අපට මුහුණ දෙන්නට තිබුණු ප්‍රධානම අභියෝගය තමයි, පුංචි සෙලවීමකින් වුණත් - internal shock එකක් - ඇති වුණොත් අපි කොහොමද ආර්ථිකය ස්ථාවරව පවත්වාගන්නේ කියන එක. මේ වෙද්දී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිවම, ස්ථාවරව ප්‍රකාශ කර තිබෙනවා, අපේ ආණ්ඩුව ඒ ස්ථාවරත්වය ඇති කරගෙන තිබෙනවා, ඒ නිසා වැටෙන්නේ නැහැ, internal shock එකකින් වැටෙන්නේ නැහැ කියලා. හැබැයි මැද පෙරදිග කලාපයේ අර්බුදය වාගේ external shock එකකින් අපට අභියෝග රාශියක් ඇති වෙනවා. විශේෂයෙන් ජනාධිපතිතුමා ඒ ගැන තිබෙන කෙටිකාලීන සහ දිගුකාලීන විසඳුම් ටික ගැන අද උදේ කථා කළා. අපට එහෙම වෙන්න පුළුවන්. අභියෝග තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යන්න පුළුවන්. සංක්‍රමණික සේවකයන්ගෙන් අපට ලැබෙන මුදල් අඩු වෙන්න පුළුවන්. ඇත්තටම ගත්තොත්, අපේ තේ අපනයනයෙන් සියයට 45ක්, 50ක් විතර යනවා, මැද පෙරදිග කලාපයට. එතකොට අපි කොහොමද තේ අපනයනය සඳහා විකල්ප වෙළෙඳ පොළවල් සොයාගන්නේ කියන අභියෝගය අපට තිබෙනවා. ඒ වාගේම සංචාරක කලාපය ගත්තොත්, සියයට 60ක් විතර අපේ රටට එන්නේ මැද පෙරදිග කලාපය හරහා. විශේෂයෙන් යුරෝපීය foreignersලා. ඒ අභියෝග ටික අපට තිබෙනවා; නැතුවා නොවෙයි. නමුත් අපේ රජය මේ වනවිටත් නිසි ලෙස මේවා කළමනාකරණය කරගන්න සිතමින් යනවා, දිගුකාලීනව පියවර අරගෙන තිබෙනවා.

බොහෝ අයට අද තිබුණු ප්‍රශ්නය තමයි තෙල් අර්බුදය කියන එක. මීට කලින් මේ තෙල් ටැංකි ටික හදලා තිබුණා නම් ඇත්තටම අද වෙනකොට අපේ ගබඩා කිරීමේ පහසුකම වැඩි වෙලා තිබෙන්න තිබුණා. ජනාධිපතිතුමා අද කියපු විධියටම සියයට 100කින් තෙල් ටැංකි ධාරිතාව වැඩි කරනවා. ටැංකි ප්‍රතිසංස්කරණය සහ සකස් කිරීම, අලුත් ඒවා සෑදීම සඳහා පමණක් රුපියල් බිලියන 31.9කුත් වශයෙන් සම්පූර්ණ රුපියල් බිලියන 47.6ක් අපි වෙන් කර තිබෙනවා. ඒ, මේ නළ පද්ධතිය එළීමටත්, අලුත් තෙල් ටැංකි ගබඩා සකස් කිරීමටත්. ඒ සමහර ව්‍යාපෘති පටන් අරගෙන දැනටමත් ඉවර වේ ගෙන යනවා. සමහර ව්‍යාපෘතිවල ටෙන්ඩර් කැඳවන්න තිබෙනවා. සමහර ව්‍යාපෘති මේ අවුරුද්දේ ක්‍රියාත්මක වෙනවා. මෙහෙම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හුණ්ඩුව රටක් බවට පත් කරන්නේ. ඒකත් කියමින් මම කථාව අවසන් කරන්නම්. කොහොම වුණත් අපි බලාපොරොත්තු වෙනවා, ජාත්‍යන්තර නීතිය අනුව ලෝකයේ මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන අර්බුදය ඉක්මනින් පහව යයි කියලා. මම හිතන්නේ අපි රටක් ලෙස ප්‍රාර්ථනා කළ යුත්තේත් එයයි. ඒ අනුව ලෝක සාමය වෙනුවෙන් අපේ ප්‍රාර්ථනයත් මේ අවස්ථාවේ එකතු කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි මේ කාලය ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.38]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට අද පක්ෂ, විපක්ෂ ඔක්කෝම කථා කරන්නේ මැද පෙරදිග යුද්ධය ගැන. ලෝකයට හිතුවක්කාර නායකයෝ පත් වුණාම මේ වාගේ දේවල් වෙනවා. හිතුවක්කාර නායකයෙක් කියන්නේ මේ නිසායි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසුගිය කාලයේ tax ගහගෙන, ගහගෙන, ගහගෙන, ගහගෙන ගියා රටවලට. ඇමෙරිකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන්ම කිව්වා, ඒ tax ගහපු විධිය වැරදියි, ජනාධිපති ගනිපු තීන්දුව වැරදියි කියලා. ඊට පස්සේ මොකක්ද කළේ? ඊට පස්සේ බලෙන් වෙනිසියුලාවට පැනලා ඒ රටේ ජනාධිපති උස්සන් ගියා. ඊට පස්සේ මොකක්ද කළේ? මීට මාස ගණනකට කලින් ඊශ්‍රායලය හරහා නැවත ඉරානයට පහර දුන්නා. මේ දෙවැනි වතාව, ඉරානයට පහර දෙන. මේ වාගේ හිතුවක්කාර නායකයෝ හින්දා මේ ලෝකයේ අපි වාගේ දියුණු නොවන දුප්පත් රටවල අනාගතයට වග කියන්න ඕනෑ ඇමෙරිකාව සහ ඊශ්‍රායලය. මොකද, කොහේවත් ඉන්න මිනිස්සුන්ගේ ඒවා හොයන්න ගිහිල්ලා, කොහේවත් ඉන්න මිනිස්සුන්ට ගහන්න ගිහිල්ලා තමයි මේ ගහගන්නේ. අද ඒකට චීනය එකතු වෙලා තිබෙනවා. තව ටිකකින් සෝවියට් රුසියාව එකතු වෙන්න ඉඩ තිබෙනවා. මේ යුද්ධය දිගටම ගියොත් අපි වාගේ දුප්පත් අහිංසක රටවලට තමයි ප්‍රශ්න ඇති වෙන්නේ. හිතුවක්කාර නායකයෝ පත් වුණාම තමයි මේ ලෝකයේ මේ වාගේ දේවල් වෙන්නේ. ඒ ගැන මම වැඩිය කථා කරන්නේ නැහැ.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ඒ එක්කම අපි මේ කාරණයත් කියන්න ඕනෑ. මෙතැන මේ හැමෝම කථා කළා, සලේ අත්අඩංගුවට ගැනීම ගැන. දැන් පිල්ලෙයාන් අත්අඩංගුවට අරගෙන අවුරුද්දයි. පිල්ලෙයාන් DO ගහලා අවුරුද්දක් තියාගෙන ඉන්නවා. ඔහු අත්අඩංගුවට අරගෙන අවුරුද්දක් වෙනකම් පිල්ලෙයාන්ගෙන් ගත්ත තොරතුරු මොනවාද කියලා පොලීසිය භාර ඇමති හෝ CID එක හෝ තවම මේ රටට කියලා නැහැ. පිල්ලෙයාන් අත්අඩංගුවට ගත්තා නම්, ඔහු පාස්කු ප්‍රහාරයට සම්බන්ධයි නම් පිල්ලෙයාන්ගෙන් මෙන්න මේ මේ තොරතුරු ගත්තා කියලා කියන්න ඕනෑ.

දැන්, සලේව අත් අඩංගුවට ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා, සලේව අත් අඩංගුවට ගන්න ඔය රවී සෙනෙවිරත්න, ශානි අබේසේකර, මේ ඉන්න අරුණ ජයසේකර, - බෝම්බ පිපිරෙන අවස්ථාවේ අරුණ ජයසේකර, නැගෙනහිර ආඥාපති. එතකොට රවී සෙනෙවිරත්න CID එකේ. ඒ වාගේම ශානි අබේසේකරත් හිටියා. ඔක්කෝම ඔතැන හිටියේ. ආණ්ඩුව මාරු වෙනකොට; ජාතික ජන බලවේගය දිනනවා කියලා හිතනකොට, අනුර කුමාර දිසානායක මැතිතුමා ජනප්‍රිය වෙනකොට ශානි අබේසේකරයි, රවී සෙනෙවිරත්නයි, අරුණ ජයසේකරයි ඒ වේදිකාවට නැග්ගා. නැතුව ඒ ගොල්ලෝ ජේවීපීකාරයෝ නොවෙයි. ඒ ගොල්ලෝ රනිල් වික්‍රමසිංහගේ, එක එක ආණ්ඩුවලට කඩේ ගිය අය. ඒ ගොල්ලෝ ගිහිල්ලා ඒ වේදිකාවට නැග්ගාම එක්කෙනෙක් ඇමති වුණා. අනික් දෙන්නාගෙන් එක්කෙනෙක් CID එකටයි, ලේකම් ධුරයටයි පත් වුණා. සලේත් ඒ වෙලාවේ මේ වේදිකාවට නැග්ගා නම්, අද සලේත් ඇමති කෙනෙක් නැත්නම් ඉහළ තනතුරක. නමුත් අද සලේ හිරේ. රවී සෙනෙවිරත්න ලේකම්. අරයා CID එකේ අධ්‍යක්ෂ. අරුණ ජයසේකර ආරක්ෂක නියෝජ්‍ය ඇමති.

මෙතැන ඉන්න පරණ ජේවීපීකාරයා - පැරණිම එක්කෙනා - මාතර දිස්ත්‍රික්කයේ අපේ හඳුන්නෙත්ති මැතිතුමා. හඳුන්නෙත්ති ඇමතිතුමා දන්නවා, අපි ඒ දවස්වල බලන්නේ ලංකා පත්තරේ. ලංකා පත්තරේ ගැහුවේ ජේවීපී එකෙන්. විජිත හේරත් තමයි ඒ වෙලාවේ ලංකා පත්තරේ වැඩ බැලුවේ. තොප්පිගලට ගහලා පළමුවෙන්ම යුද්ධය පටන් ගත්තා. මාවිල්ආරු අමුණ වහලා යුද්ධය පටන් ගත්තේ, තොප්පිගලට ගහන්නයි. තොප්පිගලට ගහන වෙලාවේදී, - ඒ මාධ්‍යවේදියා තවමත් මේ රටේ ඉන්නවා. ඒ මාධ්‍යවේදියා අරලගංවිල ඉඳලා තොප්පිගලට අරන් ගියා. තොප්පිගලට ඒ මාධ්‍යවේදියා අරගෙන ගියේ තොප්පිගල යුද්ධය පැවති වෙලාවේ. යුද්ධ කරනකොට ඒ පිරිස දෙකට බෙදුවේ කවුද? සලේ බෙදුවේ. සලේ තමයි තොප්පිගල කඳුවුරට ගිහිල්ලා, නැගෙනහිර කරුණාලා ඉන්නකොට, පොට්ටුඅම්මාන් උතුරෙන් ගෙනියලා, ඒ කටයුතු කළේ. බුද්ධි අංශ ගිහින් තමයි දෙකට බෙදුවේ. ඒ සලේලා වාගේ අය. යුද්ධය ඉවර කළේ සලේ. නමුත් එක එක අය යුද ජයග්‍රහණයට ලකුණු දා ගත්තා. එක එක නායකයෝ එයට උප්පැන්න සහතික දුන්නා. හැබැයි, යුද්දේදී සලෙත් ලොකු වැඩක් කළා. මොකද, සිංහල අයට බුද්ධි අංශවල වැඩ කරන්න බැහැ. දෙමළ භාෂාව දැන ගන්න ඕනෑ. බුද්ධි අංශවල ගොඩක් වැඩ කළේ මුස්ලිම් අය. යුද්ධය වෙලාවේ මුස්ලිම් අය තමයි හමුදාවලට බැඳිලා යුද්ධ කළේ. ඒ අය වැඩ කළේ බුද්ධි අංශවල. හැබැයි, අද සලේට කරන්නේ මොකක්ද? සලේ අත් අඩංගුවට ගත්තා නම්, -

විජයදාස රාජපක්ෂ 2017දී මේ ගැන කිව්වා. එම හැන්සාඩ් එක බලන්න. විජයදාස රාජපක්ෂ ආණ්ඩුවට කථා කරලා කිව්වා, මෙන්න මෙහෙම දෙයක් වෙනවා කියලා. හැබැයි, එවකට හිටපු ආණ්ඩුවේ අය කිව්වා, විජයදාස රාජපක්ෂ කොරහේ කිඹුල්ලු දකිනවා කියලා. එවකට හිටපු ආණ්ඩුව; එවකට හිටපු ජනාධිපති, රවී සෙනෙවිරත්න ඒ ඔක්කෝම අය කිව්වා, කොරහේ කිඹුල්ලු දකිනවා කියලා. හැබැයි, ඒ වෙලාවේ සලේ කියලා තිබුණා, මෙන්න මෙහෙම දෙයක් වෙන්න යනවා කියලා.

අද බලන්න, ඉරානය දෙස. පැය දෙකෙන් ගැහුවා. නායකයා මැරුවා. අයතුල්ලා අලි කමේනි - අධ්‍යාත්මික නායකයා - පැය දෙකෙන් මැරුවා. මැරුවේ කොහොමද? ඉරානයේ බුද්ධි අංශය එච්චරට දුර්වල වුණා. නැත්නම් පැය දෙකක් ඇතුළතදී ඉරාණයේ බුද්ධි අංශය, - බුද්ධි අංශ නායකයෝ කියන්නේ රටට වටිනා සම්පත්. සලේ අත් අඩංගුවට ගත්ත වෙලාවේ ඉන්දියාවේ Intelligence Agency එක අහලා තිබෙනවා; Indian Intelligence Agency එක මේ ආණ්ඩුවෙන් අහලා තිබෙනවා - මොකක්ද අහලා තිබෙන්නේ - අහලා කියලා තිබෙනවා, ඔය ගොල්ලෝ පාස්කු ප්‍රහාරය ගැන හොයා ගත්තා නම්, අපට වැඩිය ඔය ගොල්ලෝ හොයා ගත්තාද කියලා. තවම කිසිම දෙයක් හොයලා නැහැ. ඒ අය මේ රටට වැඩ කරපු මිනිස්සු. ඒ මිනිස්සු මේ රටේ යුද්ධය තිබුණු වෙලාවේ මේ රටට වැඩක් කරපු අය.

ගාමිණී පියතුමා මොකක්ද කියන්නේ? එදා මම මාධ්‍ය සාකච්ඡාවක් තිබ්බා. එහිදී සිරිල් ගාමිණී පියතුමා කියනවා, "සලේගේ ප්‍රශ්නය කථා කරන්න යන්න එපා, පාස්කු ප්‍රහාරය පිළිබඳව කථා කරන්න එපා" කියලා. සිරිල් ගාමිණී පියතුමාට එහෙම කථා කරන්න අයිතියක් නැහැ. මේ රටේ යුද්ධය ඉවර කරපු නායකයෝ සිරිල් ගාමිණී පියතුමාට වැඩිය අපට වටිනවා. අපි බෞද්ධයෝ. අපේ සිංහල මිනිස්සුන්ගේ එක දෙයක් තිබෙනවා. හොඳ දේට අත්පුඩි ගහනවා. මුත්තයියා විකට් ගන්නකොට වැඩියෙන්ම සතුටු වුණේ, අපි. ඒ වාගේම තමයි සලේ මුස්ලිම් වුණත්. සලේ යුද්ධය වෙනුවෙන් වැඩ කරපු නිසා සලේ මුස්ලිම් වුණත් අපි සලේ ගැන කථා කරනවා. සිංහල මිනිස්සු ළඟ කවදාවත් එහෙම භේදයක් නැහැ. අන්න ඒක මේ වෙලාවේදී මම මතක් කරන්න ඕනෑ. මම මීට වැඩිය ඒ පැත්ත ගැන කථා කරන්න යන්නේ නැහැ.

අද රටේ ප්‍රශ්න තිබෙනවා. මම ගෑස් ප්‍රශ්නය ගැන කිව්වේ දෙසැම්බර් 18. ආණ්ඩුව පිළිගත්තාද? නැහැ. ආණ්ඩුව කිව්වේ මොකක්ද? දෙසැම්බර් 18වෙනිදාත් ඔබතුමා ඔය මූලාසනයේ සිටියා. මම දෙසැම්බර් 18 කිව්වා, ගෑස් ප්‍රශ්නය එනවා කියලා. හැබැයි, ඒක පිළිගත්තේ නැහැ. මට ඒක වැඩක් නැහැ. මම තෙල් ප්‍රශ්නය ගැන කියන්නේ නැහැ. තෙල් පෝලිම් හදන්න අපි කියන්නේ නැහැ. මේ රටේ මිනිස්සුන්ට තෙල් නැති වෙන්න හොඳ නැහැ. මේ රටේ මිනිසුන්ට එහෙම විපතක් වෙන්න එපා. කවුරු රට පාලනය කළත් මේ රට අහිංසක රටක්; අපේ රට කවුරු පාලනය කළත් බොහොම දුප්පත් රටක්. අපිත් ඒ ගැන බයෙන් ඉන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ යුද්ධය ඉක්මනට ඉවර වෙයි කියලා අපි හිතනවා.

පමුණුවේ රෙදි ගත්තොත්, පමුණුවේ රෙදිවලටත් මේ ආණ්ඩුව tax එකක් ගහලා තිබෙනවා; සෙස් බද්දක්. සල්ලිකාරයෝ යන්නේ කොළඹ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය තව විනාඩි දෙකයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
තව පොඩි වෙලාවක් දෙන්න.

ඊළඟ කාරණය විධියට බීඩි ගනිමු. බීඩි ඔතන්නේ, බීඩි විකුණන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ දුප්පත් මිනිස්සු. බීඩි ඔතන

මිනිස්සුන්ගෙන් බීඩියටත් රුපියල් තුනක් ගන්නවා; ලයිසන් එකටත් රුපියල් 90,000ක් ගන්නවා. ඒ මදිවට ඒ මිනිස්සුන්ව raid කරලා ඒ මිනිස්සුන්ට හුඟක් කරදර කරනවා. බීඩි ඔතන මිනිස්සු ලක්ෂ 10ක් ගම්පහ දිස්ත්‍රික්කයේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාතර දිස්ත්‍රික්කයේ ඉන්නවා. මේ ගැන ආණ්ඩුව හොයන්න. මේවා පොඩි පොඩි දේවල්.

ඊළඟට, පපඩම් ගනිමු. අද වනකොට පපඩම් නිෂ්පාදනයට උඳු නැහැ. උඳු ගෙන්වන්නේ කවුද? උඳු ගෙන්වන්නේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයෝ, පපඩම් හදන මිනිස්සු නොවෙයි. උඳු ගෙන්වන මිනිස්සුන්ට අද උඳු ගෙන්වන්න දෙන්නේ නැහැ. එහෙම ප්‍රශ්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ එක ඔබතුමාගේ කැකිරාව ආසනයේ ප්‍රශ්නයක්. මම මේ කාරණය කියන්න ඕනෑ. මරදන්කඩවල අයිස්ක්‍රීම් හදන කම්හලක් තිබෙනවා, Ulankulama Dairies (Pvt.) Limited කියලා. ඉස්කෝලේ ඇරිලා යන ගමන් පොඩි ළමයි අයිස්ක්‍රීම් කටේ ගහගන්නවා. මේක නුසුදුසුයි කියලා ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ MOH report එකක් ගැහුවා. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවකුත් දීලා තිබෙනවා. මා එය **සභාගත*** කරනවා.

තවම අයිස්ක්‍රීම් කම්හල වැහුවේ නැහැ. නමුත්, MOH මාරු කළා; PHI මාරු කළා; MOHට මරණීය තර්ජන ආවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කය නේ. මේ ගැන හොයන්න. මේ ආණ්ඩුවෙන් මේ වාගේ වැඩ අපි බලාපොරොත්තු වුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සභාපතිට පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරන්න බැහැ. ඒ සඳහා ප්‍රාදේශීය සභාවට MOH report එක ඕනෑ. MOH report එක නැතිව කවදාවත් ප්‍රාදේශීය සභාවට ඒක දෙන්න බැහැ. නමුත්, MOHලා එහෙම report දෙන්නේ නැහැ. මේක ඔප්පු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ, මරදන්කඩවල අයිස්ක්‍රීම් කම්හල ගැනයි මම කියන්නේ. නුසුදුසු දේවල් තිබෙනවා නම් ඒවා නවත්වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය විධියට මම කියන්නේ මෙයයි. පසුගිය සැරේ Budget එකේදී කිව්වා, ආණ්ඩුව ගලි බවුසර් ගන්නවා, බැකෝ යන්ත්‍ර ගන්නවා කියලා; බැකෝ යන්ත්‍ර 100ක්. සෙනොක් ආයතනය කියන්නේ මේ රටට බැකෝ ගෙන්වන ආයතනයක්. මේ රටට බැකෝ ගෙනෙන්න සෙනොක් ආයතනයට ටෙන්ඩර් එක දෙන්නේ නැතිව මේ ආණ්ඩුව බැකෝ යන්ත්‍ර 100ක් ගෙන්වන්න හදනවා. ඒක ඇද ඇද ඉන්නවා. ගෑස්වලටත් ඕක තමයි කළේ. ආණ්ඩුව වැඩ කරගෙන යනකොට ආණ්ඩුවට විරුද්ධව නොවෙයි, ආණ්ඩුවේ තිබෙන අඩුපාඩු තමයි අපි මේ පෙන්වාගෙන යන්නේ.

කර්මාන්ත ඇමතිතුමනි, මාතර දිස්ත්‍රික්කයේ බීඩි හදන, බීඩි ඔතන මිනිස්සු කොච්චර ඉන්නවාද? ඔබතුමාගේ දිස්ත්‍රික්කයේත් ඉන්නවා. ගෙදර ඉඳගෙන බීඩි ඔතනකොට දවසකට රුපියල් 2,000ක් විතර හම්බ වෙනවා. ආණ්ඩුවක් විධියට මෙන්න මේවා ගැනත් බලන්න ඕනෑ. අපි මේවා ගැන කථා කරන්නේ නැත්නම් කවුද කථා කරන්නේ? ජාතික දේශපාලන නායකයෝ බීඩි ගැන කථා කරන්නේ නැහැ. ජාතික දේශපාලනයේ ඉන්න මිනිස්සු කියයි, බීඩි ගැන කථා කරන එක ලජ්ජාවක් කියලා. ගරු ඇමතිතුමනි, හැබැයි මට එහෙම ලජ්ජාවක් නැහැ. මේ රටේ ප්‍රශ්නයක් තිබෙනවා නම් මම ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ඒ වාගේම ගාල්ල දිස්ත්‍රික්කයේ පොලීසියේ ඉන්න පොලිස් නිලධාරින් ගත්තොත්, ඔවුන්ගේ සම්පූර්ණ පඩිය නිල නිවාස වෙනුවෙන් කපා හැර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි. කාලය ඉතාම සීමිතයි. එම නිසා ඔබතුමාගේ කථාව නවත්වන්න අවශ්‍ය වෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පව්! ඒ පොලිස් නිලධාරින්. පොලිස් නිලධාරින් පව් කියලායි කියන්නේ. එම නිසා මේ දේවල් හරියට බලලා කරන්න ඕනෑ. මේ අඩුපාඩු වෙනුවෙන් තමයි අපි මේ පාර්ලිමේන්තුවේ හඬ නඟන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.48]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාතෘකාවට අදාළව කථා කරන්න කලින් මම කාරණයක් කියන්න ඕනෑ. 1986 වසරේ සිට අපේ මේ සභා ගර්භයේ - මේ Chamber එකේ - අවුරුදු 39ක් සේවය කරපු රංජන් ගුණවර්ධන මහත්මයා මාර්තු මාසයේ පළමුවැනි දා විශ්‍රාම ගත්තා. එතුමා අපි සියලුදෙනාටම - මේ Chamber එකේ හිටපු සියලු මන්ත්‍රීවරුන්ට - යහපත් විධියට, මිතුරෙක් හැටියට ගොඩක් උදවු කළා. මුලින්ම මම එතුමාට යහපත් විශ්‍රාම දිවියක් ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි සාකච්ඡා කරන ප්‍රාග්ධන ගිණුම්වල, විදේශ ව්‍යවහාර ගිණුම්වල ගනුදෙනු සීමාවල් ලිහිල් කිරීම පිළිබඳවත්, මෙහි තිබෙන වැදගත්කම පිළිබඳවත් අපි හොඳින් තේරුම් ගන්න ඕනෑකම තිබෙනවා. මේ තුළින් අපේ රට ලෝකයට දෙන පණිවුඩයක් තිබෙනවා. ඒක තමයි අපේ රටේ තිබෙන ආර්ථික ස්ථාවරභාවය, අපේ රටේ තිබෙන දේශපාලන ස්ථාවරභාවය. අපට මෙවැනි පණිවුඩයක් ලෝකයට දෙන්න අවස්ථාවක් ලැබීමම ඉතා වැදගත් දෙයක්. මොකද, අපි මීට අවුරුදු එකහමාරකට කලින් හිටියේ ආනයන සීමා කරලා; වාහන ගෙන්වන එක සීමා කරලා. අපි විදේශ විනිමය අර්බුදයක හිටියේ. අපි ණය ගැනීම් පිළිබඳ අර්බුදයක හිටියේ. අපේ සමාගම්, අපේ ව්‍යාපාර, අපේ ආර්ථිකය වැටිලා තවත් රටකින් ණය ඉල්ලන්න බැරි මට්ටමකට පත් වෙලා හිටියේ. එහෙම තිබුණු රටක අද අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, අපේ රටේ ව්‍යාපාරිකයින්ට - දේශීය ව්‍යාපාරිකයින්ට - තමන්ගේ අපනයන ආදායම්වලින් ලැබෙන විදේශ විනිමය පිටරටවල වියදම් කරන්න වෙන් කරන මුදල් සීමාව ඩොලර් ලක්ෂ දෙකේ ඉඳලා ඩොලර් ලක්ෂ පහක් දක්වා ලිහිල් කරන්න. අපි විදේශ විනිමය ඉපැයුවත් ඕනෑම කෙනෙකුට රිසි ආකාරයකට ඒවා වියදම් කරන්න හැකියාවක්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

නැහැ. අපට රටක් හැටියට එක වෙලාවක සිද්ධ වනවා, අපි උපයන විදේශ විනිමයට යම් සීමාවන් හඳාගන්න. හැබැයි අද අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, අපේ වියදම් සීමාව ලිහිල් කරන්න. ඒකෙන් දෙන පණිවුඩය මොකක්ද? සාමාන්‍ය කටයුතු සියල්ල පවත්වාගෙන යන අතර, රටක් හැටියට අපි ජාත්‍යන්තරයට පණිවුඩයක් දෙනවා, විදේශ විනිමය සම්බන්ධයෙන් ස්ථාවරභාවයක අපි ඉන්නවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ආර්ථික වශයෙන් ඒ ස්ථාවරභාවය ඇති වන්නේ රටේ දේශපාලන ස්ථාවරභාවයත් එක්කයි. මේ රටේ දේශපාලන ස්ථාවරභාවය නැත්නම් ආර්ථික ස්ථාවරභාවය ගැන හිතන්න විදියක් නැහැ. අද ආයෝජකයින්ට, අලුතෙන් ව්‍යාපාර ආරම්භ කරන අයට කිසිම ආකාරයකට තමන්ගේ ගනුදෙනු පිළිබඳව සැකයක් නැහැ. අද ඔවුන්ට රස්තියාදු වෙන්න දෙයක් නැහැ, නොයෙක් ලියකියවිලි අනුමත කර ගැනීම් සඳහා පගාව දෙන්න අවශ්‍ය නැහැ. මොකද, අද කිසිම තැනක දේශපාලන වශයෙන් බැඳියාවක් නැහැ. මම මේ පක්ෂයට වැඩ කළා, මේ පක්ෂයට වැඩ කළා, ඒ නිසා මට මේක කර ගන්න බැහැ කියලා හැඟීමක් අද කාටවත් නැහැ. ඒ හැම දෙනාටම අද ආර්ථිකය පිළිබඳව විශ්වාසයක් ගොඩනැඟිලා තිබෙනවා. අද පෞද්ගලික අංශය අපිත් එක්ක ගොඩක් වැඩ කරනවා. ඔවුන් කැමැත්තෙන් බදු ගෙවනවා. මොකද ඔවුන් දන්නවා, තමන් ගෙවන බදුවල ප්‍රතිලාභය සමාජගත වනවා කියලා. අධිවේගී මාර්ග ඉදිකරන්න, එහෙම නැත්නම් ජල සම්පාදනයට, අනෙකුත් යටිතල පහසුකම්වලට ඒවා නැවත යෙදවෙනවා කියලා ඔවුන් දන්නවා. ඒවා පවුලකට හරි මිත්‍රයන් කිහිප දෙනෙකු අතර හරි බෙදා හැරෙන්නේ නැහැ කියලා ඔවුන් දන්නවා. ඒ දේශපාලන ස්ථාවරභාවය අද තිබෙනවා.

ජපාන රජයත්, අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයත් සම්බන්ධීකරණය කරලා, ඊයේ පෙරේදා අපේ කර්මාන්ත අමාත්‍යාංශයට ආවා 40කින් සමන්විත ආයෝජකයින් කණ්ඩායමක්. ජපානයේ ඉන්න multinational companiesවල ප්‍රධාන විධායක නිලධාරින් - CEOsලා - ආවා. ඔවුන් ඉතාම කැමැත්තෙන් ආවේ. අවුරුදු 10කට පස්සේ තමයි ඒ තරම් විශාල කණ්ඩායමක් එකවර ආවේ. අද ඉන්දියාව, චීනය විතරක් නොවෙයි, බොහෝ රටවල් අපේ රටේ ආයෝජනය කරන්න ඇවිල්ලා තිබෙනවා. ඒ ස්ථාවරභාවය අපි හදලා තිබෙනවා. අපි Kahatagaha Graphite Lanka Limitedවලට EoIs call කරලා තිබෙනවා, රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාරවලට. දැන්වීම් පළ කරලා ඒවා ප්‍රසිද්ධියේ කරන්නේ. එප්පාවල පොස්පේට්වලින් SSP හදන්න යන එකත් අපි කරන්නේ දැන්වීම් පළ කරලා. එහෙම නැතිව, හොර රහසේ නොවෙයි. හැම ව්‍යාපාරයක්ම, හැම දෙයක්ම මේ ආණ්ඩුව විනිවිදභාවයකින් යුක්තව අද සිද්ධ කරනවා. ඒ නිසා අද ගැසට් පත්‍රයේ, රජයේ ප්‍රවෘත්ති පත්‍රවල ඒ හැම එකකම මේ දැන්වීම් පළ කරනවා. හැම අමාත්‍යාංශයකම websitesවල ඒ දැන්වීම් පළ කරලා ආයෝජන කැඳවනවා. ව්‍යාපාරවලට ආයෝජකයින්ට එන්න හිතකර දේශපාලන පරිසරයක් තිබෙනවා කියන එක තමයි මේ දෙන පණිවුඩය.

ආණ්ඩුවේ තිබෙන දේශපාලන ස්ථාවරභාවය විසින් රටකට ආර්ථික ස්ථාවරභාවය හදනවා. ඉතින් එසේ ස්ථාවරභාවය ඇති වීම හරහා සිදු වන දේ ගැන අපි සතුටින් කියන්න කැමැතියි. ඒ ආදායම අපට සංචාරක කර්මාන්තයෙන් එනවා, ශ්‍රමිකයින්ගේ විදේශ ප්‍රේෂණවලින් එනවා, පිට රටවල ජීවත්වන ශ්‍රී ලංකා ඩයස්පෝරාව හරහා එනවා, විශේෂයෙන්ම අපේ අපනයන ආදායම හරහා එනවා. 2025 අවුරුද්දේ අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 17.2ක්. මේ අවුරුද්දේ අපේ ඉලක්කය වන්නේ, මාසිකව සියයට 10ක අපනයන වර්ධන වේගයක් ළඟා කරගෙන ඉදිරියට යෑම. ඒ අනුව පළමුවෙනි මාසයේ -ජනවාරි මාසයේ- අපි 13.3ක ඉලක්කයකට ගිහිල්ලා තිබෙනවා. ඒ, ජාත්‍යන්තර දේශපාලනයේ කැලඹීලි තත්ත්වයක් තිබියදී පවා. "දිට්වා" සුළි කුණාටුව ඇති වූ කාලයේ දී අපි හිතුවා, අපේ තේ අපනයන ආදායම අඩු වෙයි කියලා. මොකද, නොවැම්බර් මාසයේ සහ දෙසැම්බර් මාසයේ තේවල අගය එකතු කිරීම සිද්ධ කරන්නේ කැලණි මිටියාවතේ. කැලණි මිටියාවතේ තමයි ඒ ව්‍යාපාර වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ. තේ දළු කඩන්නේ පහත රට, නැත්නම් උඩ රට වෙන්න පුළුවන්. හැබැයි, තේවල අගය එකතු කිරීම් සිදු කරන්නේ කැලණි මිටියාවතේ, කැලණි ගඟ මායිමේ. "දිට්වා" සුළි කුණාටුවෙන් අපේ අපනයන ආදායමට හානියක් වුණේ නැහැ, ordersවලට හානියක් වුණේ නැහැ, ඇඟලුම් ක්ෂේත්‍රයේ ordersවලට හානියක් වුණේ නැහැ. නොවැම්බර් මාසයේ ඇති වූ "දිට්වා" සුළි කුණාටුවෙන් අපේ අපනයන ආදායමට, විදේශ විනිමය ඉපැයීම්වලට බාධාවක් වුණා නම් අපට ඒක දැනෙනවා, ජනවාරි මාසයේ ඉලක්කවලින්. නමුත් එහෙම වුණේ නැහැ. ඒකට විශේෂත්වයක් තිබෙනවා. අපි ස්ථාවරභාවය රැක්කා. අපි අපනයනකරුවන් තුළ ඒ විශ්වාසය ගොඩනැඟුවා. අපි අද මේ මොකක්ද කරන්නේ?

විදේශ විනිමය උපයන ව්‍යාපාරවලට, ව්‍යාපාරිකයින්ට වියදම් කරන්න පුළුවන් ඩොලර් සීමාව අපි වැඩි කරනවා. රටකට එහෙම කරන්න පුළුවන්කම ලැබෙන්නේ, ඒ රටට නැවත විදේශ විනිමය ගලා ඒම පිළිබඳව විශ්වාසයක් තිබෙන නිසායි. අපිට ඒ විශ්වාසය තිබෙනවා. අපි වාහන ගෙන්වීම වෙනුවෙන් ඉලක්ක කරපු ප්‍රමාණයට වඩා වැඩියෙන් වියදම් කරන්න සීමාවක් හදා ගත්තා. අපි ඩොලර් බිලියන 2ක විතර සීමාවක් වියදම් කරලා තිබෙනවා, විදේශ රටවලින් වාහන ගෙන්වන්න. ඒක ඒ වෙලාවේ හැටියට අපි ගත් නිර්භීත තීරණයක්. විදේශ විනිමය රටින් එළියට යන එක වෙනත් රටවල් සීමා කරද්දිත් අපි රජයක් හැටියට අපේ මිනිස්සුන්ට ඒක සීමා කළේ නැහැ. අපි එවැනි විවෘතභාවයකින්, විනිවිදභාවයකින් අපේ ආයෝජන කටයුතු, ව්‍යාපාර කටයුතු කරන නිසා අද ජනතාවට මේ ආණ්ඩුව පිළිබඳව විශ්වාසයක් ඇතිවෙලා තිබෙනවා. ඒ විශ්වාසය තමයි ජනතාව මේ ආණ්ඩුවට ආදරය කිරීම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසුගිය කාලයේ තෙල් පෝලිම්වලට ආපු ජනතාව ආණ්ඩුවට බණිනවා අපි දැක්කා. හැබැයි, මේ වතාවේ අපි ඊට වඩා වෙනස් දෙයක් දකිනවා. මේ වතාවේ පෝලිමට ආපු ජනතාවම කල්පනා කරනවා, ඔවුන් පෝලිමට ආවේ ඇයි කියලා. සමහර මාධ්‍ය විසින් ඒක උලුප්පලා දක්වපු ආකාරය අපි දැක්කා. හැබැයි, ජනතාව විචක්ෂණශීලීව කල්පනා කළා. ජනතාව කල්පනා කළා, අපි එහෙම කලබල වෙන්න ඕනෑ නැහැ කියලා. ඔවුන්ට ආණ්ඩුව පිළිබඳව විශ්වාසයක් තිබුණු නිසා අද ඒ ප්‍රශ්නය ක්‍රමානුකූලව විසඳිලා තිබෙනවා.

අපි තුන්වැනි ලෝක යුද්ධයක් බලාපොරොත්තු වන මිනිස්සු නොවෙයි. අවුරුදු 30ක් තිස්සේ පැවතුණු යුද්ධයෙන් පීඩා විඳලා රටක් හැටියට ආර්ථිකමය වශයෙන් අසරණ වෙච්ච රටක්, අපි. ඒ නිසා නැවත කිසිම රටක - මැද පෙරදිග වෙන්න පුළුවන්, යුරෝපය වෙන්න පුළුවන්, ඇමෙරිකා එක්සත් ජනපදය වෙන්න පුළුවන් - ජීවත්වන ජනතාවට යුද්ධයක් එපා. අපි මොනම ආකාරයකින්වත්, යුද්ධයකට කැමැති මිනිස්සු නොවෙයි. මොකද, මේ රටේ ඉන්න සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ ජනතාව යුද්ධය මොන තරම් අමිහිරි ද කියලා තමන්ගේ ජීවිතවලින්ම විඳලා තිබෙන මිනිස්සු. යුද්ධයක් නැති යථාර්ථයක් ඇතුළේ ආර්ථිකය මොන තරම් විවෘතව, විනිවිදභාවයකින් ඉදිරියට ගෙන යන්න පුළුවන් ද කියලා පෙන්නුම් කරපු මිනිස්සු තමයි අපි. යුද්ධයක් නැති රටක ආර්ථික නිදහස කියන්නේ,

දේශපාලන නිදහස කියන්නේ, මිනිස්සුන්ගේ සතුට කියන්නේ මොන තරම් දෙයක්ද කියලා රටක් හැටියට අපි මුළු ලෝකයටම පෙන්වා දී තිබෙනවා. ඒ නිසායි අද අපේ රටට සංචාරකයින් එන්නේ. ඒ නිසා තමයි සංචාරක කර්මාන්තයෙන් අපේ රටට ලැබෙන ආදායම අද දියුණු වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි කිසිම රටක යුද්ධයක් අනුමත කරන්නේ නැහැ. අපි මොනම ආකාරයකින්වත් යුද්ධය අනුමත කරන්නේ නැහැ.

අද ශ්‍රී ලාංකීය ජනතාව විතරක් නොවෙයි, මැද පෙරදිග වෙසෙන සියලු ජනතාවත් මේ යුද්ධය නිසා විශාල පීඩාවකට පත්වෙලා තිබෙනවා. මේ යුද්ධය නිර්මාණය කරන්නේ ආයුධ සමාගම් කියන එක අපි දන්නවා. එකම සමාගමෙන් දෙපැත්තටම ආයුධ බෙදන බවත් අපි දන්නවා. ඒක, ආයුධ වෙළෙඳ පොළක්. ඒක, ජාත්‍යන්තර වෙළෙඳාමේ කොටසක්. අපි ඒක දන්නවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය නියෝජනය කරන රටක් හැටියට, එක්සත් ජාතීන්ගේ මැදිහත්වීම අපේක්ෂා කරන රටක් හැටියට ජාත්‍යන්තර වශයෙන් පවතින මේ යුද්ධය ඉතාම කෙටි කාලයක් තුළ අවසන් වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. එය අවසන් කිරීම සඳහා අපට මැදිහත්වීමට අවම හෝ හැකියාවක් තිබෙනවා නම්, -ඒක සාකච්ඡාවලින් වෙන්න පුළුවන්, විවිධ මැදිහත්වීම්වලින් වෙන්න පුළුවන්, ජන මතයේදී වෙන්න පුළුවන්- අපි ඒ වෙනුවෙන් මැදිහත් වනවා. අපි ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා.

තෙල් අර්බුදයක් ඇති වනවා කියලා මවාපාන අය අඩුම තරමින් අපේ රටට තෙල් ගෙනෙන්නේ කොහෙන්ද කියලාවත්, කොච්චර ඇණවුම් කරලා තිබෙනවාද කියලාවත් දන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි අපට විදේශ විනිමය අර්බුදයක් තිබුණා නම්, ලොකු අර්බුදයක හිරවෙලා හිටියා නම්, මෙතැන ඉන්නේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව වෙනුවට පසුගිය කාලයේ පැවති ආණ්ඩුවක් නම් විදේශ විනිමය නිදහස් කිරීමේ මේ තීරණය අද ගන්නේ නැහැ.

එහෙම නම් මේ නියමය අද පාර්ලිමේන්තුවට ගෙනෙන එක අනිවාර්යයෙන් නවත්වනවා. මොකද, ඔවුන්ගේ පුරෝකථනය සිද්ධ වෙන්නේ එහෙමයි. යුද්ධය නැති කාලයේදීත් යුද්ධය විකුණාගෙන කෑවා; අර්බුද නැති කාලයේදීත් අර්බුද පෙන්වා මිනිසුන් පීඩාවට පත් කළා. එහෙම නම්, අද කියන්නේ මොකක්ද? "ඩොලර් වියදම් කරන එක අපට නතර කරන්න සිද්ධ වෙනවා, ඉරානයට පහර දීම නිසා වාගේම මැද පෙරදිග යුද්ධයක් තිබෙන නිසා" කියලා අනිවාර්යයෙන්ම මේ නියමය අද ගෙනෙන්නේ නැහැ. නමුත්, අපට එහෙම ප්‍රශ්නයක් නැහැ. ජාත්‍යන්තරව ඇති වන වෙනස්කම් අපි හොඳට විශ්ලේෂණය කර ගන්නවා. ඒවාට කොච්චර දුරට ඉදිරියට යන්න පුළුවන්ද, නතර වෙන්න පුළුවන්ද කියන එක ගැන අපට දැක්මක් තිබෙනවා. ඒ වාගේම අපේ න්‍යාය පත්‍රයට අනුව අපි වැඩ කරමින් යනවා. එවැනි අවස්ථාවලදී අපට තාවකාලික නැවතුම් පොළවල්වල නතර වෙන්න, හදිසි තීරණ ගන්න සිද්ධ වෙනවා. "දිට්වා" සුළි කුණාටුවත් එහෙම එකක්. ඒක අපි අපේක්ෂා කරපු දෙයක් නොවෙයි. දැන් මේ ඇති වෙලා තිබෙන ජාත්‍යන්තර දේශපාලන තත්ත්වයේ කැලඹීම අපි අපේක්ෂා කරපු දෙයක් නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නමුත්, අපට අපේම වෙච්ච න්‍යාය පත්‍රයක් තිබෙනවා; වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒක අපේ රටේ කර්මාන්තකරුවන්, අපනයනකරුවන්, සංචාරක කර්මාන්තයේ ඉන්න අය, ජනතාව විශ්වාස කරනවා වාගේම පිළිගෙන තිබෙනවා. ඒ වාගේම ජනතාව දන්නවා, අපේ දේශපාලන ස්ථාවරභාවය මොකක්ද කියන එකත්, පාර්ලිමේන්තුව තුළ අපට තිබෙන තුනෙන් දෙකකට වැඩි බලය අපි ඔවුන් වෙනුවෙන් අනිසි ලෙස පාවිච්චි කරන්නේ නැහැ කියන එකත්. ඒ දේශපාලන ස්ථාවරභාවය නිසා අපට මේ තීරණ ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, වියදම් සීමාව වැඩි කිරීම, ප්‍රාග්ධන ගිණුම ලිහිල් කිරීම නැවත ආයෝජනයක් කියලා. මොකද අපි දන්නවා, මේ නිදහස් කිරීම හරහා අපේ විදේශ විනිමය උපයන අයට නැවත ආයෝජනය කරන්න පුළුවන්කම ලැබෙනවා කියලා. අපේ වෙළෙඳ පොළ ශක්තිමත් වෙනවා; අපේ දේශපාලන ස්ථාවරභාවය ශක්තිමත් වෙනවා; ආර්ථික ස්ථාවරභාවය ශක්තිමත් වෙනවා. ඒ නිසා කිසිම කෙනෙක් කලබල වෙන්න අවශ්‍ය නැහැ. ඒ වාගේම ජනතාව කලබල කරන්නත් අවශ්‍ය නැහැ. අපි රටේ ජනතාවත් එක්ක හොඳ සංවාදයක් ඇතිව මේ ගමන යනවා. ඒ සඳහා ගත්ත තවත් එක් වැදගත් පියවරක් හැටියට අපේ විදේශ විනිමය උපයන ව්‍යාපාරික ප්‍රජාවට මේ අවස්ථාව ලබා දීම මම දකිනවා. ඒ කාරණයත් සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.02]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහාත්, ඒ වාගේම විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ වගකීම රජයේ නියෝජිත වශයෙන් මහ බැංකුව වෙත පැවරීම සඳහාත් වන 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ ගෙනෙන නියමය පිළිබඳවයි අද අපි කථා කරන්නේ.

මෙම පනත යටතේ වන නියමය 2020 අවුරුද්දේ සිට මාස හයෙන් හයට ගැසට් කරමින් දීර්ඝ කරනු ලැබුවා. ඒ අනුව තමයි අද දවසේ අපේ ආණ්ඩුව විසින් නැවත මාස හයකින් මෙය දීර්ඝ කිරීම සඳහා මේ ගැසට් පත්‍රය යොමු කර තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කරුණු සඳහන් කළා. මෙම නියමය මඟින් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා ගෙවීම් සිදු කිරීමට මෙතෙක් පනවා තිබුණු ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 2ක සීමාව ඩොලර් ලක්ෂ 5 දක්වා ඉහළ දමන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා ප්‍රාග්ධන ගනුදෙනු සඳහා කරන ඇමෙරිකානු ඩොලර් 20,000ක ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 25,000 දක්වා ඉහළ දමන්න කටයුතු කර තිබෙනවා. ඒ හරහා අපි ලෝකයට, ජනතාවට සහ රටට විදෙස් විනිමය ගෙනෙන අපේ රටේ පුරවැසියන්ට පණිවුඩයක් දීලා තිබෙනවා, අප ක්‍රම-ක්‍රමයෙන් මේ රටේ ආර්ථිකය පුළුල් කරමින්, ජනතාව වෙත ආර්ථික අවස්ථා ලබා දෙමින් මේ රට ඉදිරියට

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ගෙනියන්න සූදානම් කියලා. පසුගිය වසර අවසන් වෙනකොට ඩොලර් බිලියන 6.8ක විදෙස් සංචිතයක් අපේ රට තුළ ගොඩනඟන්න අපි සමත් වුණා; විදෙස් ප්‍රේෂණ ඉහළ දමා ගන්න අපි සමත් වුණා; සංචාරක ආදායම ඉහළ දමා ගන්න සමත් වුණා. 2018න් පසුව 2025දී තමයි ලංකාවට සංචාරකයන් වැඩිපුරම ආවේ. මේ වසරේ මෙතෙක් ලක්ෂ 5 ඉක්මවූ සංචාරකයන් ප්‍රමාණයක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපි, අපේ රටේ විදෙස් සංචිත ඉහළ දමා ගනිමින්, රටට විදෙස් විනිමය ගෙන එමින් තිබෙනවා.

අපේ රටට විශාල වශයෙන් විදෙස් විනිමය ගෙනෙන විශේෂයෙන් මැද පෙරදිග කලාපයේ අපේ අහිංසක ජනතාව අද වනකොට යම් අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ආණ්ඩුවක් ලෙස අපි මෙහිදී ගත හැකි හැම ක්‍රියාමාර්ගයක්ම ගනිමින්, ඔවුන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය වෙනුවෙන් මැදිහත් වෙමින් සිටිනවා. එහෙම දුක් මහන්සි වෙලා මේ රටට ගෙනෙන විදෙස් විනිමය රකින්න ඕනෑ. පසුගිය වසර එකහමාරක කාලය තුළ ඒ විදෙස් විනිමය රැක ගත්තේ කොහොමද කියන එක ඉතා මැනවින් අපි පෙන්වා තිබෙනවා. අපේ ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ගෙවුණු කාල සීමාව තුළ රටවල් 8කට විදෙස් සංචාර 7ක් ගිහිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විදෙස් සංචාර 7ටම අපි වියදම් කර තිබෙන්නේ රුපියල් මිලියන 14.94යි. හැබැයි, මේ රටට ගෙනාපු විදෙස් විනිමය ඉතිහාසයේ කාබාසිනියා කළේ කොහොමද? අපට මතකයි, විපක්ෂයේ ඉඳගෙන කෑ මොර දෙන මහත්වරු ආණ්ඩු කරපු කාලයේ විදෙස් විනිමය වියදම් කළේ කොහොමද කියලා. ඒ අනුව, 2010-2015 කාලයේ මහින්ද රාජපක්ෂ රුපියල් මිලියන 3,572යි; 2015-2019 කාලයේ මෛත්‍රීපාල සිරිසේන රුපියල් මිලියන 384යි; ගෝඨාභය රාජපක්ෂ මහදී අත්හැරලා ගියා නේ. එතුමා 2020-2022 කාලයේදී රුපියල් මිලියන 126යි; සංචාර 6යි, රුපියල් මිලියන 126යි. අනුර කුමාර දිසානායක සහෝදරයා සංචාර 7යි, රුපියල් මිලියන 14.9යි. ඒ වාගේම රනිල් වික්‍රමසිංහ මහත්මයා හිටපු කෙටි කාලය තුළ සංචාර 16යි, රුපියල් මිලියන 533යි. එහෙමයි මේ රටට ගෙනාපු විදෙස් විනිමය මේ මහත්වරු කාබාසිනියා කළේ. ඒ නිසා අපි කියන්න ඕනෑ, අප ආණ්ඩුවක් විධියට ගෙනෙන විදෙස් විනිමය ඉතා හොඳින් ආයෝජනය කරන්න පුළුවන් වන ආකාරයට අවශ්‍ය කරන පහසුකම් පුළුල් කිරීමට කටයුතු කරමින් යන බව.

විපක්ෂයේ අය දැන් අපට විවිධ චෝදනා නැඟුවා. අපි දැක්කා, විපක්ෂ නායකතුමා අපට සැහෙන්න උපදෙස් දෙනවා. ජනාධිපතිතුමාත් කිව්වා, "අනේ, please! " කියලා. මමත් කියන්න ඕනෑ, අනේ, please! කියලා. ඔය උපදෙස් අනුව තමයි මේ රට මෙතැනට වැටුණේ. විපක්ෂ නායකතුමාත් 2015-2019 ආණ්ඩුවේ හිටපු ප්‍රබල ඇමතිවරයෙක්. මෛත්‍රී - රනිල් - සජිත් ආණ්ඩුව තමයි 2015-2019 කාලයේ තිබුණේ. ඔය උපදෙස් දීලා එදා රට හොඳට ගෙනියන්න තිබුණා නේ. හැබැයි, රට ගෙනිච්ච තැන අපි දන්නවා. ආර්ථික වර්ධන වේගය සියයට 5 සිට සියයට 2 දක්වා පහළ වැට්ටුවා. ඒ වාගේම ISB ණය ගත්තා, ඩොලර් බිලියන 12ක. එහෙම ණය අරගෙන ණය කඳු ගොඩ ගැහුවා, ඒ ආණ්ඩුව පැවති කාලයේ. ඒ කාලයේ සජිත් ඇයි උපදෙස් දුන්නේ නැත්තේ? ඒ නිසා අනේ, ප්ලීස් අපට ඔය උපදෙස් එපා.

ඒ වාගේම අපි කියන්න ඕනෑ, ජාතික ජන බලවේගය - NPP එක - ලෝකයේ පවතින වාස්තවික තත්ත්වයන් එක්ක ඒවාට අනුගත වෙමින් ලෝකයත් සමඟ ඉදිරියට යන පාලනයක් සහිත ආණ්ඩුවක් බව; අපි, වෙනස් වන, වෙනස්වීම්වලට වෙනස් වන ප්‍රතිචාර දක්වන ආණ්ඩුවක්. එහෙම නැතුව, එක තැන තැබුවා වාගේ වෙනස් නොවෙන එකක් නොවෙයි. හැබැයි, මේගොල්ලන් නම් එහෙමයි. මේගොල්ලන්ට චිරාත් කාලයක් විපක්ෂයේම ඉන්න ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා. එහෙම දේශපාලන කණ්ඩායමක් තමයි අද මේ විපක්ෂය නියෝජනය කරන්නේ. විපක්ෂය කියන්නේම අනුන්ගේ පහනින් එළිය බලන කණ්ඩායමක්. මේ අය අනුන්ගේ පහනින් එළිය බලනවා. මේ දවස්වල කාගේ පහනින්ද එළිය බලන්නේ? තෙල් පෝලිම්වල ඉන්න අයගෙන්. තෙල් පෝලිම්වල ඉන්න අයගෙන් එළිය බලනවා. අපි දැක්කා, මීට කලින් සංවර්ධන නිලධාරීන් ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහ උපවාස කරනකොට එතැනට ගිහිල්ලා ඒ අය වෙනුවෙන් පෙනී සිටිමින් ලෙයින් ලියලා දෙන්න සහතික දෙමින්, පොරොන්දු දෙමින් කටයුතු කළ ආකාරය. ඒ විධියට එතුමන්ලා අනුන්ගේ පහනින් එළිය බලනවා.

ඒ වාගේම ධීවරයන් උද්ඝෝෂණ කරනකොට එතැනට ගිහිල්ලා ඒ අය වෙනුවෙන් පෙනී සිටිමින් අනුන්ගේ පහනින් එළිය බලනවා. අද වනකොට තෙල් පෝලිම්වල ඉන්න අයගේ පහනින් එළිය බලන්න ට්‍රයි එකක් දෙමින් ඉන්නවා. ඒකට එතුමන්ලා පුළුවන් තරම් උත්සාහ කළා. නමුත්, අද වනකොට සැලකිය යුතු මට්ටමින් තෙල් පෝලිම් අවසන් වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේත් ඉන්න නයි නාළිකාව තෙල් පෝලිම් තිබෙනකොට voice-cuts දෙමින් මේ තත්ත්වය පුළුවන් තරම් ප්‍රචාරය කරන්න උත්සාහ කළා. නමුත්, අද මොකද කියන්නේ? ඒ නාළිකාවේම අද විකාශය වනවා මම දැක්කා, තෙල් පෝලිම්වල හිටපු අයට අපහාස කරන voice-cut එකක්. සියල්ලට ඉහළින් ඉන්න නාළිකාව හොරණ පැත්තේ voice-cuts ගන්න ගිහිල්ලා හොඳ හරුපවලින් අහ ගන්නවා මම දැක්කා.

මේ තෙල් පෝලිම් හැදුවේත් මේ විපක්ෂයේ මහත්වරුයි, ඔය කියන නාළිකා ටිකයි එකතු වෙලා. රටේ නැති ප්‍රශ්නයක් හදලා, අර්බුදයක් හදාලා, ජනතාව කුලප්පු කරලා, දැන් අපට කියනවා අපි කුලප්පු කළා ලු. අපි මේ රටේ ජනතාව කවදාවත්, කොතැනකදීවත් අනවශ්‍ය ලෙස කුලප්පු කරලා නැහැ. අපි එදා විපක්ෂයේ සිටියදීත් ඇත්ත ප්‍රශ්නවලට නායකත්වය දුන්නා. අද ආණ්ඩුවක් ලෙසත් අපි මේ ප්‍රශ්න විසඳා ගැනීම වෙනුවෙන් මැදිහත් වෙමින්, නායකත්වය දෙමින් ඉන්නවා. එම නිසා අපි කියන්න ඕනෑ, අනුන්ගේ පහනෙන් එළිය බලන්න එපා, පුළුවන් නම් ඔබතුමන්ලා මොකක් හෝ දෙයක් තනිවම කරලා පෙන්වන්න කියලා. හාමුදුරුවරු එකතු වුණු සහ සමුළුවටත් සජිත් ප්‍රේමදාස මහත්මයලා ගිහිල්ලා ඉස්සරහා පේළියේ ඉඳගෙන ඒකෙන් එළිය බලන්න ට්‍රයි එකක් දුන්නා. තනිවම කිසිම දෙයක් කර ගන්න බැහැ. දහ පහළොස්දෙනෙක් එකතු කරගෙන උද්ඝෝෂණයක් කර ගන්න බැහැ. පාර්ලිමේන්තුව ඉස්සරහා පොල්දූව මංසන්ධියේ උද්ඝෝෂණයක් කළා, අඩුම ගණනේ මේ සභාවේ එහා පැත්තේ සිටින සජබයේ පනස් ගණනවත් එකතු කර ගන්න බැරි වුණා නේ. 10යි, 12යි සිටියේ, ඒකට. තනිවම මොකවත් කර ගන්න බැහැ, අනුන්ගේ පහනෙන් එළිය බලමින් ඉන්නවා.

මේ මහත්වරු හැමදාම උදේට ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවටත්, රටටත් පොඩි සිහිති ආතල් ටිකක් දෙමින් ඉන්නවා. අදත් අපි දැක්කා, ඉස්සරහට පැනලා සිහිති ආතල් දෙන්න කටයුතු කළ ආකාරය. එහෙම කරලා ඒක වීඩියෝ කරලා තමන්ගේම ෆේස්බුක් එකේ දමාගෙන සිහිති ආතල් එකක් ගන්නවා. කමක් නැහැ, ගන්න; කමක් නැහැ, ඒ සිහිති ආතල් ගන්න. මොකද, අපි කලින් හිටපු ආණ්ඩු පක්ෂ වාගේ නොවෙයි. ඔබතුමන්ලා මැදට පැනලා සිහිති ආතල් ගන්නකොට අපිත් මැදට පැනලා පුටුවලින් ගහන්න, වතුර බෝතල්වලින් ගහන්න, මිරිස් කුඩුවලින් ගහන්න කටයුතු කරන්නේ නැහැ. අනේ, අපි එහෙම කරන්නේ නැහැ. අපි ඒ වාගේ ආණ්ඩු පක්ෂයක් නොවෙයි. එම නිසා අපෙන් ඒ වාගේ දේවල් බලාපොරොත්තු වෙන්න එපා.

ඒ වාගේම මම තව උත්තරයක් දෙන්න ඕනෑ. මෙතුමන්ලා ඊබ්‍රාහිම් ගැන නිතර නිතර කියනවා. ඊබ්‍රාහිම් නිදහස් කළේ කවුද? ඊබ්‍රාහිම් නිදහස් වුණේ කවදාද? 2022 මැයි මාසයේ 25වැනි දා. එතකොට කාගේ ආණ්ඩුවද තිබුණේ? ඔය අනික් පැත්තේ සිටින මහත්වරුන්ගේ ආණ්ඩුව; නාමල්ගේ බාප්පොච්චි, ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව. එතුමාගේ ආණ්ඩුව කාලයේ තමයි ඊබ්‍රාහිම් අධිකරණයෙන් නිදහස් වුණේ. එහෙම නැතුව අපි නොවෙයි ඊබ්‍රාහිම්ව නිදහස් කළේ. අපි කොතැනකවත් නීතිමය කටයුතුවලට අත පොවලා නැහැ.

මම දැක්කා, පසුගිය දවස්වල අත්අඩංගුවට ගත් බුද්ධි අංශ නිලධාරියා ගැන කියනවා. ඒවා නීතියට අදාළ කටයුතු. නීතිය පැත්තෙන්, අධිකරණය පැත්තෙන් කටයුතු සිදු වෙනවා. ඉතින්, වාමර arrest කරන එක හරි, හිරේට දමන එක හරි, තව කවුරු හරි හිරේට දමන එක හරි, ඒවා අපට අදාළ දේවල් නොවෙයි. ඒවාට අදාළ නීතිමය කටයුතු අදාළ විධියට සිදු වෙනවා. ආණ්ඩුවක් ලෙස අපි ඒවාට ඇඟිලි ගහන්නේ නැහැ.

ඒ වාගේම, මේ සභාවේ එහා පැත්තෙන් කිව්වා, "මේවා ජනාධිපතිතුමා ඇවිල්ලා කියන්න ඕනෑ ඒවා නොවෙයි, ඇමතිතුමා ඇවිල්ලා කියන්න ඕනෑ දේවල්" කියලා. ඉතින් දෙයියනේ! ඇමතිලා කීදෙනෙක් මේ ගැන කිව්වාද? කුමාර ජයකොඩි ඇමතිතුමා තෙල් ප්‍රශ්නය ගැන පැහැදිලි කළා. ඊළඟට, CPC එකේ සභාපති ජානක රාජකරුණා මහත්මයා මේ ගැන පැහැදිලි කළා. ඒ වාගේම, නලින්ද ජයතිස්ස ඇමතිතුමායි, රාජකරුණා සභාපතිවරයායි දෙදෙනාම ඊයේ මාධ්‍ය සාකච්ඡාවක් පවත්වලා මේ ගැන පැහැදිලි කළා. ඉතින්, දෙයියනේ! කිව්වාට අහන්නේ නැහැ නේ. ඇමතිලා සහ සභාපතිලා කියන දේවල් අහන්නේ නැහැ නේ. බැරිම තැන නේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කළේ. ජනාධිපතිතුමා කිව්වාට පස්සේවත් අහයි කියලා අපි හිතුවා. ඒ අහන්නේත් නැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එතුමා කිව්වාට පසුවත් සජිත් ඇතුළු මේ විපක්ෂයේ නඩයම නැවත, නැවත එකම බොරුව කියනවා නේ, නැවත, නැවත එකම දේ කියනවා නේ. අඬලා, පෙව්වත් පිළිගන්නේ නැහැ. එහෙව් විපක්ෂයකට තේරුම් කරන්නේ කොහොමද කියලා අපට තේරෙන්නේ නැහැ. ජානමය අවුලක්ද කොහේද තිබෙන්නේ. ඒ නිසා තමයි ජනාධිපතිතුමාම ඇවිල්ලා පැහැදිලි කරලා දුන්නේ. තව දුරටත් මේ රටේ ජනතාව නොමඟ යවන්න මේ විපක්ෂයට ඉඩක් නැහැ කියන කාරණය අපි කියන්න ඕනෑ. ඔබතුමන්ලා කියන බොරු අතේ පත්තු වෙනවා. තෙල් පෝලිම දවස් දෙකයි, තුනයි තිබෙන්නේ. ඒක එතැනින් අහෝසි වෙනවා. හැම එකක්ම දවසකට, දෙකකට, තුනකට සීමා වෙනවා. අපි විපක්ෂයට ආශිර්වාද කරනවා, තව දුරටත් ඔය විධියටම කටයුතු කරගෙන යන්න. අපි අපේ වැඩ පිළිවෙළ, අපේ ගමන, මේ රට හදන ගමන අපි ක්‍රමානුකූලව ඉදිරියට අරගෙන යනවාය කියන කාරණය අවධාරණය කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මොහොමඩ් නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 4.41]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, இன்று விவாதிக்கப் படுகின்ற விடயம் எதுவாக இருந்தாலும், மாண்புமிகு சனாதிபதி அவர்கள் இங்கு உரையாற்றிய பிறகு, அவ்விடயம் சம்பந்தமாகத்தான் நானும் பேச வேண்டிய நிர்ப்பந்தத்தில் இருக்கின்றேன். இன்று உலகில் நடக்கின்ற யுத்தமானது அசிங்கமான ஒரு யுத்தமாகும். இன்று உலகத்தில் சமாதானம் இல்லை என்றால், அதற்குக் காரணம் ஒரேயோர் ஆள்தான். அது வேறு யாருமல்ல, அமெரிக்காவின் சனாதிபதி டொனால்ட் டிரம்ப்! அவர் ஒரு பெரிய ஷைத்தான். அதேபோல், இஸ்ரேலில் ஒரு குட்டி ஷைத்தான் இருக்கிறார். இவர்கள்தான் உலக சமாதானத்துக்கு மிகப் பெரிய அச்சுறுத்தல்! ஈரான் அரசாங்கத்தால் சட்டப்படி உருவாக்கப்பட்ட அரசியல் தலைமைத்துவத்தை சர்வதேச சட்டங்களை மீறிப் படுகொலை செய்துவிட்டு, இந்தப் பெரிய ஷைத்தான் sportsக்குப் போடுகின்ற capஐப் போட்டுக்கொண்டுவந்து கதைக்கிறார். அதைப் பார்க்கும்பொழுது மிகவும் ஆத்திரமாக இருக்கிறது. உங்களுடைய சனாதிபதி அவர்கள் இதைக் கண்டித்து ஒரு வசனமாவது சொன்னாரா? ஏன் அவர் இதைக் கண்டிக்கவில்லை? அவர், இந்த யுத்த சூழ்நிலைக்கு எப்படி எமது நாடு முகங்கொடுக்க வேண்டும் என்பது பற்றி கதைத்தார். அது நல்ல விஷயம்! அது பற்றி கதைக்கத்தான் வேண்டும். ஆனால், யுத்தத்தை ஆரம்பித்து வைத்தவர்களுக்கு எதிராக ஒரு வார்த்தையேனும் சொல்ல முடியாத அளவுக்கு இந்த சனாதிபதியும், இந்த அரசாங்கமும் இப்பாரிய சக்திகளுக்குக் கீழ்ப்படிந்து இருக்கின்றார்களா? என்ற கேள்வி எழுகின்றது.

ඇත්ත වශයෙන්ම මෙක හරි අසාධාරණයක්. මෙච්චර ලොකුවට ජාත්‍යන්තර නීතිය කඩ කළ අවස්ථාවක එය හෙළා දකින බව ජනාධිපතිතුමාට ඔය පුටුවේ ඉඳගෙන කියන්න බැරි වුණු එක ගැන හැම මුස්ලිම් ඡන්ද දායකයෙක්ම, මේ රජයට ඡන්දය දීපු හැම මුස්ලිම් පුද්ගලයෙක්ම අද තරහෙන්, කනගාටුවෙන් ඉන්නවා. இந்த அரசாங்கத்துக்கு வாக்களித்த ஒவ்வொரு முஸ்லிம் பிரஜையும் - ஒவ்வொரு முஸ்லிம் வாக்காளரும் - இன்று தலைகுனிந்து நிற்கின்றார்கள். ஈரானுக்கு எதிராக செய்த அசிங்கமான வேலைக்கு இந்தப் பாராளுமன்றத்தில் சனாதிபதி அவர்கள் கண்டனம் தெரிவிக்கவில்லை என்பது எவ்வளவு அவமானம்?

Hon. Presiding Member, it is true that I have nothing against the United States of America and the people of the United States, the Americans. The problem is, they have got a mad hatter. That mad hatter puts on a sports cap with “USA” written on it and speaks about his absolute violation of international law, as if he has done a huge thing. Shameless! It is time that the USA use their discretion in terms of Article II Section 4 of their Constitution and impeach that man! That is the time when there will be peace in the world. Americans must know that Donald Trump has absolutely no right to wear that cap with "USA" written on it and a sports cap, on top of it. That is the worst part of it.

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

තව දෙයක් තිබෙනවා. ඒ තමයි, අපේ රටේත් සෑහෙන අර්බුද ප්‍රමාණයකට ඔය සාතන්ලා දෙන්නා වග කියන්න ඕනෑය කියන කාරණය.

මේ වන විට බුද්ධි අංශයේ එක්කෙනෙකු අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මට කනගාටුයි, මේ පැත්තේ ඉන්න මන්ත්‍රීවරුත් ඒ ගැන කථා කරනවා. 2014දී මුස්ලිම් අන්තවාදී කණ්ඩායම් එක්ක ගනු දෙනු කළා ලු, ඒ ගනු දෙනු කළේ ත්‍රස්තවාදය නැති කරන්න ලු. මට දැන ගන්න ඕනෑ, 2014දී මොන ත්‍රස්තවාදයක්ද ලංකාවේ තිබුණේ කියලා. මා හිතන විධියට, ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා මේ ගැන දන්නවා. 2012 ඉඳලා ඔය හමුදා බුද්ධි අංශය සහරාන් හෂීම්ගේ අන්තවාදී කල්ලියත් එක්ක ගනු දෙනු කළා. ගනු දෙනු කළා විතරක් නොවෙයි, ඔත්තුකරුවන් යවලා ඔවුන්ට සියලු පහසුකම් ලබා දුන්නා. ඒ මොකටද? එවකට සිටි රජයේ දේශපාලන නායකයන්ට දෙමළ ත්‍රස්තවාදයට පස්සේ දේශප්‍රේමීත්වය පෙන්වා ගන්න තවත් target group එකක් ඕනෑ වුණා. 2015දී, 1915 සිංහල-මුස්ලිම් ජාතිවාදයේ සියවස් සංවත්සරය නැවතත් අනුස්මරණය කරන්න ඒගොල්ලන් කල්පනා කළා, තවත් සිංහල-මුස්ලිම් ජාතිවාදී කෝලාහලයක් හරහා. නමුත්, වැරදුණා. අලුත්ගම සිද්ධියෙන් පටන් ගත්තා. ඒ කරුණු එකින් එකට එළිවෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. 2012 ඉඳලා පවත්වපු ඒ සබඳකම් එළියට එයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒක හරි වැදගත්. මේ රටේ ස්වෛරීභාවය, මේ රටේ අනාගතය, මේ රටේ ජනාධිපති කියපු ඒ පාරා රාජ්‍යය පරද්දන්න ඒක හරි වැදගත්. ඒ පාරා රාජ්‍යය පරද්දන්න තිබුණු කරදර හින්දා ද දන්නේ නැහැ අද ජනාධිපතිතුමා එක වචනයකින්වත් ඒ යුදමය තත්ත්වය හෙළා නොදැක ෂේප් එකේ කථා කරලා ගියේ. අපට ඒ ගැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

உண்மையிலேயே இன்று முழு உலகமுமே பயந்துபோய், அதிர்ந்துபோய் நிற்கின்றது. நான் ஒரு விஷயத்தைச் சொல்ல வேண்டும். அதாவது, 'டேவிட்' என அழைக்கப்படும் தாவூத் நபியாக இருந்தாலும் சரி, Jesus Christ என்று அழைக்கப்படும் ஈஸா நபியாக இருந்தாலும் சரி, Prophet Muhammad Sallallahu Alaihi Wasallamஆக இருந்தாலும் சரி, நாங்கள் எல்லோரும் ஒரே கடவுளை வணங்குகின்றவர்கள். We all believe in one God; be it David, whom we call Prophet Dawud, the Jesus Christ, whom we call Prophet Isa, or Prophet Muhammad, we believe in one single God, the one God proclaimed by Prophet Ibrahim. We are the children of Prophet Ibrahim; ඉබ්‍රාහිම්, නබිතුමන්ලාගෙන් පැවත එන කට්ටියක්, අපි. අපේ මුස්ලිම් ජනතාව තුළ මේ භේදය ඇති කරන්නේ කවුද? ඒ තමයි ලොකුම සාතන්. ලොකුම සාතන් කියන කොට මට Goliath මතක් වෙනවා. ඊයේ පෙරේදා ලස්සන film එකක් ආවා ඩේවිඩ් ගැන. කොහොමද shepherd David, පසුව නබිතුමා සහ රජකම ලබා ගත් තැනැත්තා, Goliath කියන මහා ප්‍රතිරූපය එක ගලකින් වැට්ටුවේ? ඒක පොඩ්ඩක් මතක් කරන්න කැමැතියි. එතැන ලස්සන කථාවක් තිබෙනවා. It is there in the Old Testament; it is there in the Hebrew Script. In that, 1 Samuel 17:45-46 states, "You come to me with a sword and with a spear and with a javelin, but I come to you in the name of the LORD of hosts,.."

Sir, I, too, have come here today, not with any power; I do not have any power. Giant Donald Trump, who thinks he is the greatest Goliath, stands before the world proud and powerful, stirring divisions among the children of Ibrahim. He uses money, fear, tariffs as his weapons and many shrink under his shadow, perhaps some people in Sri Lanka, too. Yet, I am only an ordinary Member of Parliament from the small island of Sri Lanka. I have no army, no police protection and no power to impose tariffs or crush others. I have nothing, except my faith in one God, the same God revealed to us by our Father Ibrahim. With faith, as my sling and truth, as my stone, I aim at the pride and arrogance that seek to divide the world. You may shout and rise, Mr. Donald Trump, but remember, the faithful standing firm will bring justice and unity! I tell the world, the day Donald Trump would not have any power in the political scenario is the day this world would have peace. That is the day we would get rid of another Hitler. If we allow him to function this way - he is now targeting Iran - next, he will ask for Greenland, then he will ask for Cuba and why not, he might even ask for Trincomalee! So, let us guard ourselves against this big Satan. I urge the people of America to stand up, impeach him and get rid of him in the name of peace and justice.

Sir, let me wind up my speech by reminding all these powers - Pharaohs thought they were invincible and so does Donald Trump - that time has dawned upon this world to speak up for peace and stand up in solidarity in the name of peace and justice.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.24]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දින විවාදයට ගැනෙන 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියමය, කැබිනට් මණ්ඩලය අනුමත කරලා, පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. මෙහි තිබෙන විශේෂත්වය සහ අද තිබෙන ආර්ථික තත්ත්වයට හා අපේ ආණ්ඩුකරණයට තිබෙන අදාළත්වය ගැන මම පළමුව සැකෙවින් පැහැදිලි කරන්නම්.

අපි දන්නවා, ඕනෑම රටක් තමන්ගේ ආර්ථික ක්‍රියාවලිය පවත්වා ගෙන යනකොට විදේශ වෙළෙඳාම, එහෙම නැත්නම් විදේශයන් එක්ක ගනුදෙනු කරන බව. ඒක තමයි, බාහිර අංශය - external sector - කියලා කියන්නේ. අපි ආණ්ඩුව භාර ගන්න කොටත් ප්‍රධාන වශයෙන් ඒ අර්බුදය මතු වෙලා එළියට ඇවිත් තිබුණු ක්ෂේත්‍ර 2ක් තිබුණා. එකක් තමයි, බාහිර අංශය. බාහිර අංශය බිඳ වැටීම කියන එක සරලව තේරුම් ගත්තොත්, රටට විදේශ රටවලින් භාණ්ඩ ආනයනය කර ගන්න, ණය වාරික ගෙවා ගන්න, ආයෝජන සිදු කරන්න අවශ්‍ය කරන ඩොලර් ප්‍රමාණය

නොමැති වීම කියන එකයි. එදා බාහිර අංශය බිඳ වැටිලා තිබුණා; එය නියෝජනය කරන විදේශ සංචිත අඩු වෙලා තිබුණා. අනෙක් අංශය තමයි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව පවත්වා ගෙන යැමට ප්‍රමාණවත් ආදායමක් ආණ්ඩුවට තිබෙන්න ඕනෑ. ඒ කාලයේ ඒ විධියේ ප්‍රමාණවත් ආදායමක් ආණ්ඩුවට එකතු කර ගන්න බැරි වෙලා තිබුණා; බාහිර අංශය බිඳ වැටිලා තිබුණා. ඒ හේතුවෙන් යම් යම් සීමා කිරීම් පවා බාහිර අංශයට යොදා තිබුණා. නමුත්, අද ඉදිරිපත් කරන නියමය තුළින් සිදු කරන්නේ, එයිනුත් පෙන්නුම් කරන්නේ, අප 2025 වර්ෂයේදී අත්පත් කර ගත්තු ස්ථාවරත්වයයි.

අපි 2025 වර්ෂයේ අත්පත් කර ගත්තු ස්ථාවරත්වය පිළිබිඹු වන දර්ශක ගණනාවක් තිබෙනවා. ඒ දර්ශක අපට පැහැදිලි කර ගන්න පුළුවන්. එවායින් එක් ප්‍රධාන දර්ශක පෙන්නුම් කරන ක්ෂේත්‍රයක් තමයි බාහිර අංශය. ඒ කියන්නේ විදේශ විනිමය. රටකට විදේශ විනිමය ප්‍රමාණයක් ආරක්ෂා කරගෙන, සංචිත රැකගෙන ඉදිරියට යන්න පුළුවන් ප්‍රධාන ආකාර දෙකක් තිබෙනවා. එකක් තමයි, උපයා ගන්නා මුදල්, ඒ විදේශ සංචිත වැය නොකර පවත්වා ගෙන යන එක. ඒ කියන්නේ, අපට අවශ්‍ය කරන ආනයන කරන්නේ නැතුව, බාහිර ගනුදෙනු පුළුවන් තරම් සීමා කරමින් පවත්වා ගෙන යන එක. මෙවැනි තත්ත්වයක් බොහෝදුරට සිදු කරන්නේ, හදිසියේ අප හිර වෙලා සිටින තත්ත්වයකදී, හදිසි අවශ්‍යතාවකදී තමයි. හැබැයි, එහෙම කටයුතු කළොත් වෙන දේ මොකක්ද? ආර්ථිකය වර්ධනය වෙන්නේ නැහැ, ඉස්සරහට යන්නේ නැහැ, ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩ නැඟෙන්නේ නැහැ. ඒ නිසා විදේශයන් එක්ක ගනුදෙනු කරද්දී වඩා හොඳ ක්‍රමය තමයි, පුළුවන් තරම් දුරට විදේශ අංශය විවෘත කරමින්, ආර්ථිකය ප්‍රසාරණය කරන්න බලන එක. ඒ අනුව විදේශ විනිමය සම්බන්ධයෙන් යම් සීමා කිරීම් පනවා තිබුණා. ඒ පනවා තිබුණු සීමා කිරීම් විටින් විට වෙනස් කරමින්, පනතේ විධිවිධාන යටතේ ගැසට්පත්‍ර මඟින් නියෝග නිකුත් කරලා තිබුණා. එවැනි නියෝගයක් නිකුත් කළාම, සාමාන්‍යයෙන් මාස 6ක කාලයකට ඒක වලංගු වෙනවා. අද මේ අනුමත කරන්න යෝජනා කරන නියමය 2467/67 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර තිබෙන්නේ, අප විදේශ විනිමය ගනුදෙනු ලිහිල් කරපු ඒවා තවදුරටත් ඉදිරි මාස 6කට පවත්වා ගෙන යැම සඳහායි. මේ නියමය මඟින් දැනට තිබෙන ලිහිල් කිරීම්වලට අමතරව ව්‍යාපාර පුළුල් කිරීම සඳහා, ආයෝජන පුළුල් කිරීම සඳහා ප්‍රධාන ලිහිල් කිරීම් දෙකක් කරනවා.

පළමුවැනි ලිහිල් කිරීම මෙකයි. විදේශ ව්‍යවහාර මුදල්වලින් පවත්වා ගෙන යන Business Foreign Currency Accounts, ඒ කියන්නේ ව්‍යාපාර වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වා ගෙන යන අය ඉන්නවා. ඒ කියන්නේ, ඩොලර් ආදී විවිධ විදේශ ව්‍යවහාර මුදල්වලින් ගිණුම් පවත්වා ගෙන යන අය. විශේෂයෙන් ආයෝජකයන්, ව්‍යාපාරිකයන් සහ අපනයනකරුවන් **2021** සීමා කිරීම්වලට කලින් තමන් ව්‍යාපාර කරලා උපයා ගත්තු ඩොලර් ඒ ගිණුම්වල තැන්පත් කරලා තිබුණා. දැන් අපි අවස්ථාව ලබා දෙනවා ඒ සීමා කිරීම ඩොලර් ලක්ෂ දෙකේ සිට ඩොලර් ලක්ෂ පහ දක්වා පාවිච්චි කරන්න. කුමක් සඳහාද? ඒ ඩොලර් ලක්ෂ 2 සිට ලක්ෂ 5 දක්වා පුළුල් කරන්නේ, නිදහස් කරන්නේ, ආයෝජන කිරීම සඳහා. ඒ ආයෝජන කළ යුත්තේ කෙසේද? කොටස්වල, සමාගම්වල, ඒ වාගේම සේවකයන් වෙනුවෙන් ලබා දෙන sharesවල. විශේෂයෙන්ම ප්‍රාග්ධන ස්වරූපයේ ආයෝජන සඳහා තමයි මේ නිදහස් කිරීම ලබා දෙන්නේ. ඒ වාගේම එය විමර්ශනය කිරීම, පසු විපරම් කිරීම, monitoring කිරීමේ කාර්යය මහ බැංකුව විසින් නිසි පරිදි සිදු කිරීමට අවශ්‍ය ක්‍රමයත් සඳහන් කරලා තිබෙනවා. ඒ තමයි ව්‍යාපාර සඳහා නිදහස් කිරීම.

ඊට අමතරව පෞද්ගලික, තනි තනි පුද්ගලයන් සම්බන්ධයෙනුත් තිබෙනවා. ඒ පුද්ගලයන්ගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර ගිණුම් සඳහාත් සීමාවක් පැනවෙලා තිබුණා , ඩොලර් 20,000 දක්වා. එය ඩොලර් 25,000 දක්වා වැඩි කරලා ලබා දෙනවා. ඊට අමතරව තවත් ලිහිල් කිරීම් ගණනාවක් තිබුණා. ඒ ලිහිල් කිරීම් එහෙමම පවත්වාගෙන යනවා. ඒවා වෙනස් කරන්නේ නැහැ. ඒ වාගේම සංක්‍රමණික දීමනාව යනාදී වශයෙන් විවිධ විදේශ ප්‍රේෂණ සිදු කිරීමට ප්‍රාග්ධන ගිණුම හරහා කරන්න තිබෙන සීමා කිරීම, ඒ කියන්නේ ඒ කලින් දීලා තිබ්බ ඒවාට අමතරව තමයි මේ නිදහස් කිරීම් දෙක අපි ලබා දෙන්නේ. ඒ වාගේම කාට හරි තර්කයක් මතු කරන්න පුළුවන් මේ නිදහස් කිරීම් නිසා විදේශ විනිමයට යම් බලපෑමක් මතු වෙයිද කියන එක ගැන. නමුත් ඒ කටයුතු කරන්නේ, විශේෂයෙන්ම මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සඳහා, තොරතුරු පාදකව, තොරතුරු ගණන් හදලා බලලා.

දැන් මම දත්ත කිහිපයක් ඉදිරිපත් කරන්නම්. විශේෂයෙන්ම 2024 ජූලි - දෙසැම්බර් කාලය ඇතුළතදී මේ නිදහස් කිරීම යම් ප්‍රමාණයක් තිබුණා, අද මේ නිදහස් කිරීමට කලින්. ඒ අනුව මේ ප්‍රාග්ධන නිදහස් කිරීම් ඇතුළේ එළියට ගලාගෙන ගිය ප්‍රමාණය වෙන්නේ ඩොලර් මිලියන 16.89ක්. ඒ වාගේම 2025 ජනවාරි - ජූනි කාල පරිච්ඡේදයේදී මේ නිදහස් කිරීම් ඇතුළේ එළියට ගලාගෙන ගිහිල්ලා තිබෙන්නේ ඩොලර් මිලියන 14.26යි. ඒක ඉතාම සුළු ප්‍රමාණයක්. 2025 ජූලි - දෙසැම්බර් කාල පරිච්ඡේදයේ එළියට ගලාගෙන ගිහිල්ලා තිබෙන්නේ ඩොලර් මිලියන 37.03ක්. නමුත් මේ අවස්ථාවේදී අපි බලාපොරොත්තු වෙනවා මීට වඩා වැඩි ප්‍රමාණයක් එළියට ගලාගෙන යයි කියලා. හේතුව මෙකයි. ව්‍යාපාර පුළුල් කිරීම, ප්‍රාග්ධන පුළුල් කිරීම සඳහා තමයි මේ ඩොලර් ලක්ෂ 2 සිට ලක්ෂ 5 දක්වා වැඩි කරන්නේ. එය ආර්ථිකමය පැත්තෙන් ගත්තාම, ආර්ථිකය ප්‍රසාරණය වෙන්න ඉඩ හැරලා, එය කළමනාකරණය කරමින් ආර්ථික වෘද්ධියට දායකත්වයක් ලබා දෙන ආකාරයේ වැඩ පිළිවෙළක්. ඒ වාගේම අපි අද මේ නිදහස් කරන ගිණුම් පවතින, ඒ කියන්නේ Business Foreign Currency Accounts සහ Personal Foreign Currency Accounts කියන ආකාර දෙකේ සමස්ත බැංකු පද්ධතිය ගත්තාම දැනටමත් ඒ ව්‍යාපාරවල එකතුව ඩොලර්වලින් -ඒගොල්ලන්ගේ බැංකු ගිණුම්වල තිබෙන ප්‍රමාණය- ඩොලර් බිලියන 3.2ක් වෙනවා. ඒ අනුව ප්‍රමාණාත්මක ඩොලර් ප්‍රමාණයක් තිබෙනවා. එයින් සැලකිය යුතු ප්‍රමාණයක් අපි එළියට ලබා දෙන්න උත්සාහ කරනවා, මේ ව්‍යාපාර දියුණු කිරීම සඳහා.

ඒ වාගේම මෙකට ගැට ගැහිලා තිබෙනවා, මම කලිනුත් සඳහන් කරපු විදේශීය අංශය. අපේ රට 2025 වර්ෂයේදී මේ ස්ථාවරත්වය අත්පත් කරගෙන මේ ස්ථාවරත්වයෙන් ඔබ්බට ආර්ථික ප්‍රගතිය කරා යන ගමනේදී වැදගත් වන බාහිර අංශයේ දත්ත කිහිපයක් මම ඉදිරිපත් කරන්න කැමැතියි. එහිදී වෙළෙඳ ගිණුම, ඒ කියන්නේ භාණ්ඩ ආනයන අපනයන ගිණුම ගැන කියන්න ඕනෑ. අපි වාගේ රටක අපනයනවලට වඩා ආනයන වැඩියි. අපට අවශ්‍ය අමුද්‍රව්‍ය, පාරිභෝගික භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ ගෙන්වා ගන්න සිද්ධ වෙනවා. ඒ නිසා අපේ ආනයන ප්‍රමාණය අපනයනවලට වඩා වැඩියි. ඒ නිසා නිරන්තරයෙන්ම අපේ තිබෙන්නේ වෙළෙඳ ගිණුමේ හිඟයක්. හැබැයි අපි මේ කාල පරිච්ඡේදය ඇතුළේ මේ හිඟය කළමනාකරණය කිරීම, ඒ කියන්නේ ආනයනය වර්ධනය වෙන්න වෙන්න අපනයනත් ඒ හා සමානව වර්ධනය කර ගැනීමෙන් අපට මේ වෙළෙඳ හිඟය කළමනාකරණය කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ වෙළෙඳ හිඟය ඇතුළට සම්බන්ධ වන අපනයන ක්ෂේත්‍ර පුළුල් කරන්න අපනයන සංවර්ධන මණ්ඩලයේ ඉදිරි වැඩසටහනක් මඟින් භාණ්ඩ විවිධාංගීකරණයත්, වෙළෙඳ පොළ විවිධාංගීකරණයත්, සැපයුම් දාමය සඳහා අලුතින් භාණ්ඩ එකතු කිරීමටත් යෝජනා ගණනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. දැනට තිබෙන දත්ත අනුව ඇඟලුම්වලින් තමයි වැඩිම අපනයන ආදායම

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

එන්නේ. ඒ වාගේම තේ, සහ පෙට්‍රෝලියම් ආශ්‍රිත නිෂ්පාදන. එවැනි නිෂ්පාදන විශාල ප්‍රමාණයක් තිබෙනවා. මම කිහිපයක් පමණයි සඳහන් කළේ. ආනයන ගත්තාම තෙල් ආනයනයට අපට විශාල මුදල් ප්‍රමාණයක් වැය වෙනවා. 2025 වර්ෂයේදී ඩොලර් බිලියන 4ක් පමණ වැය වෙලා තිබෙනවා. තෙල් සම්බන්ධයෙන් අදත් සමහර කථා මතු කර ගත්තා, අපේ මාතෘකාවට අදාළ නැති වුණත් විදේශයක ඇති වෙච්ච යුදමය තත්ත්වය පාදක කරගෙන. ලංකාවේ තෙල් පෝලිම් නැවත එනවා, තෙල් නැහැ, හිඟයක් එනවා කියලා අනවශ්‍ය බියකුත් සමාජයේ මතු කළා.

සංඛ්‍යා දත්ත හා ලේඛන ගත්තාම අපට ඒ සඳහා සැලකිය යුතු ඩොලර් ප්‍රමාණයක් යොදවන්න වනවා. හැබැයි, අපි කිසිදු ආකාරයකින් තෙල් හිඟයක් ඇති නොවන විධියට තෙල් ගෙනැල්ලා ගබඩා කරලා තියා ගන්න හැටි, ගබඩා සංකීර්ණ පුළුල් කරන්න අවශ්‍ය ආයෝජන කරලා තිබෙන හැටි, ඒ සඳහා අපට තිබෙන හැකියාව සහ ගබඩා ඉඩකඩ අනුව කොහොමද එය කළමනාකරණය කරලායි තිබෙන්නේ කියන එක ඉතා පැහැදිලිව අද උදේ ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට කරුණු කාරණා සහිතව ඉදිරිපත් කළා. එම නිසා මම ජනතාවට කියනවා, මේ මොහොතේදී කිසිදු ආකාරයක බියක් ඇති කර ගත යුතු නැහැ කියලා. මොකද, අපි ස්ථාවරත්වයෙන් ඔබ්බට යන මොහොතේදී කවුරුන් හෝ කුමන හේතුවක් නිසා අනවශ්‍ය බියක් නිර්මාණය කිරීම ආයෝජන කැඳවීමට බාධාවක්. මහජනතාව වෙනුවෙන් මේ රට ඉදිරියට ගෙන යන ගමනට, විශේෂයෙන් අපේ රටේ තිබෙන දුප්පත්භාවය තුරන් කිරීම කියන කාර්යභාරයට අකුල් හෙළීමක් තමයි සිද්ධ කරන්නේ මේ බිය නිර්මාණය කිරීමෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තවශයෙන්ම ගත්තොත්, දීර්ඝ කාලීන යුද්ධයක් වැනි අපට පාලනය කරන්න බැරි පිට රටක හේතුවක් නිසා අපට තෙල් හෝ පිට රටින් ගෙනෙන භාණ්ඩවල හිඟයක් ඇති වනවා නම් අපි රටක් විධියට කුමක්ද කළ යුතු වන්නේ? අපි කථා බහ කරලා, සහයෝගයෙන් පොදු වැඩ පිළිවෙළක් යටතේ ඒවා ඉතා අරපිරිමැස්මෙන් පාවිච්චි කළ යුතු වැඩ පිළිවෙළක් නේද අපට අවශ්‍ය කරන්නේ? එහෙම නැතුව මේ විධියට මහ ජනතාව තුළ සැකයක් මතු කරමින්, මහ ජනතාව කුලප්පු කරවමින් රට ඇතුළේ අවිනිශ්චිතභාවයක් නිර්මාණය කිරීම නොවෙයි කළ යුත්තේ.

අපේ ආර්ථික ස්ථාවරභාවය සඳහා තවත් වැදගත් ක්ෂේත්‍රයක් තිබෙනවා. ඒ තමයි, විදේශ විනිමය හා සම්බන්ධ විදේශ විනිමය ගලාගෙන එන සංචාරක කර්මාන්තය. 2026දී උපාය මාර්ගික ක්ෂේත්‍රයක් ලෙස සංචාරක කර්මාන්තය හඳුනාගෙන තිබෙනවා. එහි ප්‍රගතිය දැනටමත් අපට පෙන්නුම් කරමින් තිබෙනවා. 2025දී සංචාරක ක්ෂේත්‍රයෙන් ඩොලර් බිලියන 3.2ක් වැනි විශාල ආදායමක් අපි ලබාගෙන තිබෙනවා. අපේ විදේශ සංචිත ශක්තිමත් කරන්නේ විදේශීය ප්‍රේෂණවලින්; විදේශගත අපේ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන මුදල්වලින්. ඉතිහාසයේ වැඩිම අගය වන ඩොලර් බිලියන 8කට වඩා වැඩි ප්‍රමාණයක් එම ශ්‍රමිකයන් 2025 වර්ෂයේදී ලබා දීලා තිබෙනවා. ඒ අනුව 2025දී අපට පුළුවන්කම ලැබුණා විදේශ සංචිත ශක්තිමත් කරන ජංගම ගිණුමේ ධන ශේෂයක් පවත්වා ගන්න. ගෙවුම් ශේෂ - balance of payment - තුලන අර්බුදයක් නිර්මාණය නොවන බවට හොඳම සාක්ෂිය, සාධකය තමයි ගෙවුම් ශේෂ තුලනයේ තිබෙන වැදගත්ම ගිණුම වන වර්තන ගිණුමේ ධන ශේෂයක් පෙන්නුම් කිරීම. 2025 වර්ෂයේදී මෙන්න මේ වර්තන ගිණුමේ ඇති කරනවා ඩොලර් බිලියන 1.7ක ශේෂයක්. මේ තමයි ස්ථාවරභාවයේ ලක්ෂණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය මාස දෙක ගත්තත් එය පැහැදිලිව පෙනෙනවා. අපි ජනවාරි මාසයේ ප්‍රගතිය පමණක් සැලකිල්ලට භාජන කළත්, මුළු අපනයන, ඒ වාගේම භාණ්ඩ ආනයන, වෙළෙඳ හිඟය යනාදිය කළමනාකරණය කර තිබෙන ආකාරයත්, බාහිර අංශය කොහොමද ශක්තිමත් වෙන්නේ කියන කාරණයත් ඉතා පැහැදිලිව තිබෙනවා. අපි විදේශ විනිමය ප්‍රතිපත්ති ලිහිල් කරද්දී, ආර්ථිකය හකුළනවා වෙනුවට ආර්ථිකය ප්‍රසාරණය කිරීම සඳහා තමයි ඉඩකඩ දුන්නේ. විශේෂයෙන්ම වාහන ආනයනය සඳහා තීන්දුව ගත්තාට පස්සේ ඒ වාහන ආනයනය තුළින් විදේශ විනිමය අංශයට කළ බලපෑම අපට පෙනෙනවා. විශාල බලපෑමක් සහිතව තමයි මේ ආර්ථික ප්‍රගතිය අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණේ. 2024 වර්ෂය අගදී වාහන ආනයනය කිරීමට කරන ලද නිදහස් කිරීමේදී 52,986ක L/Cs ප්‍රමාණයක් විවෘත කර තිබෙනවා. LCs සඳහා වටිනාකම ඩොලර් මිලියන 2,547යි. මේ දක්වා සම්පූර්ණයෙන් ඩොලර් මිලියන 2,547ක් දක්වා වූ ණයවර -LCs- පහසුකම් ලබාගෙන තිබෙනවා. ඒ අනුව වාහන ආනයනය සඳහා ඇණවුම් ලබා දීලා තිබෙනවා 450,735ක්. එවන් තත්ත්වයක් යටතේ 2025 වර්ෂයේදී ඩොලර් බිලියන 1.9ක් රටින් එළියට ගිහින් තිබෙනවා.

ඊළඟට, ආනයන. සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවලදී ඩොලර් බිලියන 2 ඉක්මවා ආනයන සිදු වුණා. ඉතින් මේ හැම කාරණයකින්ම පෙන්නුම් කරන්නේ, ආර්ථිකය හකුළුවන්නේ නැතුව අපේ සෑම ආර්ථික දර්ශකයකින්ම ස්ථාවරව ඉදිරියට ගමන් කිරීමයි. අපට දර්ශක තිබුණේ, හැම තිස්සේම අර්ථිකය හැකිළීමෙන්. එම නිසා අපි බලාපොරොත්තු වනවා ඉදිරියේදී මේ කාරණා මත ආයෝජන රට ඇතුළට එයි කියන එක. විශේෂයෙන් අයෝජකයන්ගේ විශ්වාසය ඉතාම වැදගත් වනවා. ඒ විශ්වාසයට අවශ්‍ය අඩිතාලම තමයි මේ විදේශ අංශයෙන් පෙන්නුම් කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය කියලා මම කථාව අවසාන කරනවා.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාරණයේදීත් අපට පුළුවන්කම ලැබුණා ඒ ස්ථාවරත්වය තබාගෙන අපි නිකුත් කරන ලද අලුත් බැඳුම්කර අළෙවි කරන්න. ස්වෛරී බැඳුම්කර දැන් ද්විතීයික වෙළෙඳ පොළේ අළෙවි වනවා. කලින් ඩොලර් 30ට, ඩොලර් 40ට අළෙවි වුණු ඩොලර් 100 බැඳුම්කර දැන් ඩොලර් 100ට ආසන්න ප්‍රමාණයෙන් අළෙවි වනවා. ඒ අනුව, ඒ සඳහා ගෙවන පිරිවැය පහළට ගිහිල්ලා, ආයෝජකයන්ටත් මේ ස්ථාවරත්වය පෙන්නුම් කරනවා. ඒක නිසා ස්ථාවරත්වයෙන් ඔබ්බට ආයෝජන කැන්දවන දිශාවට යන්න අවශ්‍ය පදනම ලංකාවේ සකස් වෙලා තිබෙනවා කියන කාරණය සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නන්ද බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.40]

**ගරු නන්ද බණ්ඩාර මහතා**
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් සුවිශේෂී මාතෘකාවක් සාකච්ඡා කරන දවසක්. 2017 අංක 17 දරන විදේශ විනිමය පනතේ 22වන වගන්තිය යටතේ පනවනු ලැබූ නියමයක් ගැන තමයි අද විවාද කරන්නේ. මෙහි සාකච්ඡා කරන සුවිශේෂී කාරණාව තමයි, ව්‍යාපාරික අවශ්‍යතාවන්ට ඉතාම වැදගත් නියමයක් පැනවීම. මේ නියමයේ මූලික අරමුණ වෙලා තිබෙන්නේ දේශීය ව්‍යාපාර ගෝලීය වශයෙන් පුළුල් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම. දැනට ක්‍රියාත්මක වෙන විදේශ විනිමය පිළිබඳ උපාය මාර්ග යටතේ විදේශ විනිමය උපයන අයට මුදල් ආයෝජනය කිරීම සඳහා සීමාවක් තිබෙනවා. ඒ අනුව, එම සීමාව ඇමෙරිකන් ඩොලර් දෙලක්ෂයේ සිට පන්ලක්ෂය දක්වා පුළුල් කිරීම තමයි මේ නියමයේ අරමුණ. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ජාතික ජන බලවේග රජය ක්‍රියාත්මක වෙනවා. අපට තිබෙන වැදගත්ම කාර්යය තමයි විදේශ ප්‍රේෂණ ඉහළ නංවා ගැනීම; රටේ ආර්ථිකය ප්‍රසාරණය කර ගැනීම.

මේ කාර්යයේදී ජාතික ජන බලවේග රජය ගන්නා තීන්දු තීරණ හැම වෙලාවේම රටේ පොදු ජනතාවගේ අනාගතය පිළිබඳව හිතලා, අනාගතය ගැන කල්පනා කරලා, මේ රටේ ආර්ථිකය වර්ධනය කර ගැනීම, ශක්තිමත් කර ගැනීම පිළිබඳව හිතලා ගන්නා තීන්දු තීරණ. රජයක් විධියට අප බලාපොරොත්තු වෙන්නේ, අනාගතයේදී අපේක්ෂිත විදේශ ප්‍රේෂණ තවදුරටත් වර්ධනය කර ගැනීම. එතකොට මේ කාර්යයේදී අපි බලාපොරොත්තු වෙනවා, වෙනස් වෙන ලෝකයට ගැළපෙන විධියට නීති-රීති වෙනස් කරලා, නීති-රීති සංශෝධනය කරලා අපේ ආර්ථිකය විධිමත්ව හා ක්‍රමවත්ව කළමනාකරණය කරලා ඉදිරියට ගෙන යන්න.

අපේ රටේ මේ මොහොතේ පාර්ලිමේන්තුව නියෝජනය කරන විපක්ෂය කියලා කියන්නේ මීට පෙර මේ රටේ රාජ්‍ය බලය හොබවපු කණ්ඩායම. හැබැයි, අද ඔවුන් ඉතාම දුර්වල මට්ටමකට වැටිලා ඉන්නේ. අපේ රජය අරගෙන යන දූරදර්ශී ක්‍රියාමාර්ගය පිළිබඳව ඒ කරන හැම වැඩක් සම්බන්ධව ඔවුන්ට තිබෙන්නේ විවේචනයක්. ඔවුන් මෙහි සාධනීය ලක්ෂණ දකින්නේම නැහැ. මේ රටේ මිනිසුන්ට කියන්න විපක්ෂයට බැහැ, මාලිමා ආණ්ඩුව ආර්ථික වශයෙන් දුර්වලයි, එහෙම නැත්නම් අර්බුදයට පත් වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම තමයි දේශපාලන වශයෙන් අපි අරාජික වෙලා තිබෙනවා කියලා ඔවුන්ට සටන් පාඨයක් කියන්න බැහැ. ඒ වාගේම තමයි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හකුළලා ඒකාධිපති වියරුවකින් මේ රට අරගෙන යනවා කියලා ඔවුන්ට සටන් පාඨ කියන්න බැහැ. ඒ තත්ත්වයට අද ඔවුන් අසරණ වෙලා. එදා වේල හොයා ගන්නා යාචකයන් වාගේ, එදා වේල ෂේප් කර ගන්න වැඩක් කරනවා වාගේ කටයුතු කරනවා. විශේෂ මාතෘකාවක් ගත්තාම ඒ මාතෘකාවට අදාළ නොවන මොනම හෝ දෙයක් ප්‍රකාශ කිරීම අද ඔවුන්ගේ කලාව බවට පත් වෙලා තිබෙනවා.

මෙතුමන්ලා හැමදාම එකම කාරණය කියනවා. මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවුරුදු එකහමාරකට ආසන්න කාලයක් වෙනවා. මේ කාලය තුළ විපක්ෂ නායකවරයාගෙන් අපි දැක්කේ හැමදාම එකම කථාව. අදත් එකම කථාව. අලුත් කථා ඔවුන්ට නැහැ. එතුමන්ලා ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට මේ රටට වෙච්ච විනාශය කොච්චරද කියලා අපි දන්නවා.

මම තව එක කාරණයක් මතක් කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ පක්ෂයක් නැති මන්ත්‍රීවරයෙක් කියනවා, "දිට්වා" සුළි කුණාටුව ඇති වෙලා මාස තුනක් ගත වෙලා තිබෙනවා ලු. තවම මිනිසුන්ට ගෙවල් දීලා නැති ලු. තවම මිනිස්සු නැවත පදිංචි කරවා නැති ලු. මම නියෝජනය කරන්නේ කෑගල්ල දිස්ත්‍රික්කය. "දිට්වා" සුළි කුණාටුවෙන් වැඩිම හානියට පත් වුණේ මගේ ආසනය; අරණායක ආසනය. මාස තුනක් යන කොට අපේ ආසනයේ සුවිශාල වැඩ කොටසක් -සියයට 90ක විතර වැඩ කොටසක්- අපි කරලා අවසන් කරලා තිබෙනවා. ඒකට දේශපාලන අධිකාරිය මැදිහත් වෙනවා වාගේම රාජ්‍ය නිලධාරින් විධියට දිස්ත්‍රික් ලේකම්තුමන්, ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩල සියලුදෙනාත්, ස්වේච්ඡා සංවිධානත් කියන හැමෝම මැදිහත් වෙලා පුනරුත්ථාපන කටයුතු ඉතා වේගයෙන් කරගෙන යනවා.

අපි ගම්වල ජීවත්වන මිනිස්සු. ඒවාට සෘජුවම මුහුණ දෙන මිනිස්සු. "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වුණු විනාශය ජයග්‍රහණය කිරීම වෙනුවෙන් අපේ සක්‍රිය දායකත්වය ලබා දෙනවා. මේක මුළු රටටම බලපෑ මහා ව්‍යසනයක්. මේක එක ප්‍රදේශයකට බලපෑ කාරණාවක් නොවෙයි. උදාහරණයක් විධියට මතක් කරලා දෙන්නම්, මෙන්න මේ කාරණයත්. 2016 අවුරුද්දේ යහ පාලන ආණ්ඩුවට ඒ කාලයේ ජනතාව කිව්වේ "වහ පාලන" ආණ්ඩුව කියලා. ඒ ආණ්ඩු කාලයේ අරණායක ආසනයේ සාමසර කන්ද නාය ගිය වෙලාවේ, බදුල්ලේ මීරියබැද්ද නාය ගිය වෙලාවේ ඒ ජනතාව අවුරුදු එකහමාරක කාලයක් හිටියේ, කූඩාරම්වල; පිට්ටනිවල ඒ අය හිටියේ. මාස තුනක් නොවෙයි, අවුරුදු එකහමාරක් විතර ඒ අය එහෙම ඉන්නකොට අද ඔය කථා කරන මහත්වරු ඒ තැන්වලට ගිහිල්ලා ප්‍රශ්නවලට මැදිහත් වුණේ නැහැ, ඔවුන්ට සහන දෙන්න මැදිහත් වුණේ නැහැ. එහෙම දුක් විඳපු මිනිස්සු හිටියා. අද එහෙම ප්‍රශ්නයක් නැහැ. අපට බේරාගන්න තව ප්‍රශ්න ටිකක් තිබෙනවා. අපේ ආසනයෙත් තව ටිකක් තිබෙනවා. අද වන්දි ගෙවීම කරගෙන යනවා. ජීවිත හා දේපළ වෙනුවෙන් ඔවුන්ට හානිපූරණය කරමින් යනවා. ව්‍යාපාර සඳහා වන්දි ගෙවමින් යනවා. ඒ වැඩ ටික කරගෙන යනවා. අද මේගොල්ලන්ට ඒවා ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. නිෂ්පාදන ආර්ථිකය නඟා සිටුවීම වෙනුවෙන් අද අපේ ආණ්ඩුව ලංකාවේ දිස්ත්‍රික්ක 25ටම රුපියල් බිලියන 25ක් අතිරේකව වෙන් කර තිබෙන බව අපි දන්නවා. මේ ආණ්ඩුව කෑගල්ල දිස්ත්‍රික්කයටත් රුපියල් බිලියනයක් වෙන් කර තිබෙනවා. ඒ රුපියල් බිලියනය තුළින් අපි ප්‍රජා ශක්ති සංවර්ධන කමිටු හරහා ගම්වල ජනතාවට ස්වයං රැකියා සඳහා, මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර සඳහා ආධාර ලබා දෙනවා. රුපියල් ලක්ෂ 15, ලක්ෂ 20 දක්වා ආධාර ලබා දෙනවා. ඒවා ණය නොවෙයි. ඒ විතරක් නොවෙයි. ව්‍යාපාරිකයන් නඟා සිටුවීම වෙනුවෙන්; නිෂ්පාදන ආර්ථිකයට පණ දීම වෙනුවෙන් බැංකු මඟින්, මූල්‍ය පද්ධතිය මඟින් පොලී රහිතව රුපියල් මිලියන 250ක් වැනි ආධාර ලබා දෙනවා. ඒ විතරක් නොවෙයි. සියයට 4ක් වැනි ඉතා අඩු පොලියට රුපියල් මිලියන 5 දක්වා ණය මුදල් සම්පාදනය කර දෙනවා. ඒ සියලු කාර්යයන් කරමින් පසු විපරම් සහිතව අපි ඉස්සරහට යනවා. මතක තබාගන්න, අද විපක්ෂයට කට උත්තර නැත්තේ ඇයි? මේ ආණ්ඩුවට රුපියල් ට්‍රිලියනයකට වැඩි දේශීය සංචිත මුදලක් -රුපියල් සංචිත- ඉතිරි කරන්න පුළුවන්කම ලැබුණේ, ආණ්ඩුවේ තිබෙන දූරදර්ශී න්‍යාය නිසා, වංචා දූෂණ අවම කරපු නිසා, විදෙස් ප්‍රේෂණ වැඩි වෙච්ච නිසායි. අපි මේ රටේ ජනතාවගේ බදු මුදල් නැවත මේ රටේ ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් හරියට වෙන් කරනවා. ඉදිරි කාලයේදී මේ රටේ ජනතාවට සහනාධාර මානසිකත්වයෙන් මිදිලා තමන්ගේම වූ ආර්ථිකයක් නිර්මාණය කරගන්න ඉඩහසර ලබා දෙන්න මේ ආණ්ඩුව දැනට සියලු කටයුතු සංවිධානය කරමින්, සූදානම් කරමින් යනවා. එසේ යන අතර, සුපුරුදු පරිදි විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් -අමු මාළු කාලා පෙන්වපු මන්ත්‍රීවරයා- හඬ

[ගරු නන්ද බණ්ඩාර මහතා]

නහනවා අපි දැක්කා. උදෑසන පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කිරීම ඔවුන්ගේ කලාව බවට පත් වෙලා තිබෙනවා. නැවත මේ රටේ මාදැල් ප්‍රශ්නයක් ඇදගෙන මේ සභාවේ උදෑසන කාලය නාස්ති කරන්නයි ඔවුන් උත්සාහ කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නන්ද බණ්ඩාර මහතා**
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)
මට තව තත්පර කිහිපයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

"දිට්වා" සුළි කුණාටුව නිසා අපට වෙච්ච හානිය ඩොලර් බිලියන 4ක් කියලා කියනවා. හැබැයි, ඒක ප්‍රතිපූරණය කරන්න අපට පුළුවන්කම තිබෙනවා. ජාත්‍යන්තර දේශපාලනය තුළ මැද පෙරදිග කලාපයේ තිබෙන අස්ථාවරත්වය පිළිබඳව ජනාධිපතිතුමා ප්‍රකාශ කළා. ලෝකයේ කොහේ හෝ තැනක මනුෂ්‍ය ඝාතනයක්, ජීවිත හානියක්, දේපළ හානියක් වෙනවා නම් අපි ඒ කිසිවක් අනුමත කරන්නේ නැහැ කියලා එතුමා ප්‍රකාශ කළා. ඒක තමයි, එතුමා කරපු හෙළා දැකීම. ඒක දකින්න බැරි විපක්ෂය බොරු හඬ නහමින් අපට බලපෑම් කරනවා.

මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.49]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ මේ රටේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ ගෞරවනීය සභාව අමතා මේ රටට අපහාස කළා; මේ රට හුණ්ඩුවක් කියලා කිව්වා. මේ රටේ කිසි දෙයක් සිද්ධ වෙලා නැහැ, 76 අවුරුද්දක සාපය නිසා ඊට කලින් මොකුත්ම රටේ සිද්ධ වෙලා නැහැ, වර්තමාන රජය තමයි මේ රටේ සෑම දෙයක්ම කරන්නේ කියලා කිව්වා. කුහක, පසුගාමී, දුෂ්ට මානසිකත්වය නිසා තමයි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වෙලාත් එහෙම කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට අඩුපාඩුකම් නැති රටක් නොවෙයි. මේ රටේ අඩුපාඩු තිබෙනවා. හැබැයි, මේ ශ්‍රේෂ්ඨ මාතෘ භූමියේ නිදහස දිනාගෙන, මේ රට ආහාරවලින් ස්වයංපෝෂිත කරන්නට අවශ්‍ය කුඹුරු ප්‍රමාණය අස්වද්දලා, මේ රටේ බලශක්තිය වැඩි ප්‍රමාණයක් ජල විදුලියෙන් ලබා ගන්න පුළුවන් විධියට ජල විදුලි බලාගාර හදලා, මේ රටට ප්‍රමාණවත් තරම් ගල් අඟුරු බලාගාර හදලා, ලෝකයේ විශිෂ්ටතම වරාය මේ රටේ නිර්මාණය කරලා, මේ රටේ හොඳම මාර්ග පද්ධතියක් හදලා, අධිවේගී මාර්ග ගොඩනඟලා, මේ රටේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 14,022ට පාසල් 10,100ක් හදලා, ඉතිහාසයේ මේ රටේ කරන්න පුළුවන් වෙච්ච හැම දෙයක්ම අපේ රටේ සිටි අතීත නායකයන් විසින් කළ බව අපි මතක තබාගන්න ඕනෑ. එදා මේ රටේ නිදහස දිනා ගැනීමට මූලික වෙච්ච නායකයන් සිටියා. ඩී.එස්. සේනානායක මැතිතුමා, ඩඩ්ලි සේනානායක මැතිතුමා, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා, සර් ජෝන් කොතලාවල මැතිතුමා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා, ඩී.බී. විජේතුංග මැතිතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ඇතුළු නායකයින් මේ රටේ සිවිල් යුද තත්ත්වයන්ට මුහුණ දීලා මේ රට හදද්දී, මේ රටේ ඉදිරි ගමනට බාධා කරපු සංවිධාන දෙකක් තිබුණා. ඉන් එකක්, එල්ටීටීඊ ත්‍රස්තවාදී සංවිධානය; අනික, ජනතා විමුක්ති පෙරමුණ. 1971දී තරුණයින් 25,000කට ජීවිත අහිමි වුණා. මැතිවරණය තිබුණේ 1970දී. මැතිවරණය තියලා අවුරුද්දක කාලයක් ගත වෙලා තිබුණේ. හරියටම තමුන්නාන්සේලා බලයට පත්වෙලා මේ වන විට අවුරුද්දකුත් මාස කිහිපයක් ගතවෙලා තිබෙනවා වාගේ. කොයි තරම් වැරදි කළත්, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව එළවන්න අද කැරැල්ලක් ගහනවා නම් ඒක කොයි තරම් අසාධාරණ ද? එදා සිරිමාවෝ මැතිනියගේ ආණ්ඩුව එළවන්න වසරක් ඇතුළත මේ රටේ දරුවෝ නොමඟ යවලා, ගල්කටස් තුවක්කු අරගෙන ගම්බද පොලිස් ස්ථානවලට පහර දීලා ඒ කරපු නොමනා ක්‍රියා නිසා තරුණයින් 25,000කට පමණ ජීවිත නැති වුණා; රටේ සම්පත් නැති වුණා; රට ආපස්සට ගියා.

ඊට පස්සේ මේ රටේ බෙදුම්වාදී ව්‍යාපාරය දියුණු වෙමින් ඉදිරියට ආවා. අපේ සන්නද්ධ හමුදා බෙදුම්වාදයට එරෙහිව කටයුතු කරද්දී, අපේ රණ විරුවන් දසදහස් ගණනක් ජීවිත පරිත්‍යාග කරද්දී, ඔවුන් මේ මව්බිම මත තමන්ගේ රුධිරය පරිත්‍යාග කරද්දී ජනතා විමුක්ති පෙරමුණ දකුණේ යුද්ධයක් ආරම්භ කළා. අපි ඒ කාලයේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ. එදා මම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු ශිෂ්‍යයෙක්. එදා ජනතා විමුක්ති පෙරමුණ තමයි ඒක කළේ. වෙන කවුරුවත් නොවෙයි. එදා දයා පතිරණ ඝාතනය කරලා පළමුවෙන්ම මේ රටේ සිවිල් මිනිස්සු මරන්න පටන් ගත්තා, ජනතා විමුක්ති පෙරමුණ.

අද මේ රට බලශක්තියෙන් පරිපූර්ණ වෙලා නැහැ කියලා අපි පිළිගන්නවා. හැබැයි, සාම්පූර් බලාගාරය හදනකොට මහජනතාව උසිගන්වලා ඒ බලාගාරය හදන එක ආපසු හරවන්න කටයුතු කළේ කවුද? ජනතා විමුක්ති පෙරමුණ. මේ රටේ වැදගත් දෙයක් කළා නම්, ඒ හැමදේකම ඇදක් කුදක් කියලා මහජනයා උසිගන්වලා ඒවා කඩාකප්පල් කරන්න කටයුතු කරපු මිනිස්සු අද ඇවිල්ලා කියනවා, මේ රට හුණ්ඩුවක් කියලා. අනුර කුමාර දිසානායක මේ පාර්ලිමේන්තුවේම, විපක්ෂය පැත්තේ මේ ඉස්සරහා පේළියේ පුටුවක අපිත් එක්ක වාඩිවෙලා ඉඳලා එදා විපක්ෂයේ සිටියදී නැඟූ හඬම තමයි අද මේ රටේ ජනාධිපති වුණාට පස්සේත් නඟන්නේ. මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා, අලුත් කණ්ඩායමකට බලය දීලා නැවුම් මුහුණුවරකින් මේ අපේ ආදරණීය මාතෘ භූමිය ලෝකයේ ඉහළම තැනකට ඔසවලා ආඩම්බරකමින් ඉදිරියට අරගෙන යයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තෙල් පෝලිම් ඇති වුණේ ආණ්ඩුවේ වරදක් නිසා නොවෙයි. අපි ඒක දන්නවා. මැද පෙරදිග ඇති වුණු මේ තත්ත්වයත් එක්ක මිනිසුන්ගේ සංවේදීකම නිසා ඔවුන්

පෝලිම්වලට එකතු වුණා. ඒක වැරදියි. අපිත් කියන්නේ මේ රටේ මිනිස්සු එහෙම පෝලිම්වලට එකතු විය යුතු නැහැ කියලායි. මේ මොහොතේ ප්‍රමාණවත් තරම් අපේ රටේ ගබඩාවල ඉන්ධන තිබෙනවා. අපි ප්‍රාර්ථනා කරනවා, මේ අර්බුදය ඉක්මනින් විසඳෙයි කියලා. හැබැයි, ඒ ප්‍රශ්නය කථා කරන්න ආපු රටේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

රටට අපහාස කරනවා මේක "හුණ්ඩුවක්" කියලා. එතුමා හුණ්ඩුවේ ජනාධිපති. එතුමා දැන් මේ රටේ ජනාධිපති කියලා එතුමාට තවමත් තේරෙන්නේ නැහැ. මම කියන්නේ නැහැ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා. හැබැයි, එතුමා තවමත් ඉන්නේ එහෙමයි; හුණ්ඩුවේ ඉන්නේ. එතුමාගේ තිබෙන පළපුරුද්දට, එතුමාගේ තිබෙන දැනුවත්කමට එහෙම කියනවා ඇති. එතුමා ගමක මධ්‍ය මහා විද්‍යාලයක ඉගෙනගෙන අද මේ රටේ ජනාධිපති වෙලා තිබෙන්නේ මේ තිබෙන නිදහස් අධ්‍යාපනය නිසායි. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ඇතුළු එදා හිටපු අපේ නායකයෝ ආරම්භ කරපු ඒ නිදහස් අධ්‍යාපනය නිසා තමයි මං ඇතුළු අතිමහත් බහුතරයක් අද මේ පාර්ලිමේන්තුව තුළ ඉන්නේ. එතකොට පසුගිය 76 වසර පුරාවටම මොකුත් වෙලා නැද්ද? මේ හුණ්ඩුව ඇතුළේ තමයි අපි දියුණු වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ රට හුණ්ඩුවක්ය කියපු, ඒ විධියට අපහාසාත්මකව කථා කරපු ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සම්පූර්ණයෙන්ම අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඇත්තවශයෙන්ම, අවංකවම, හෘදයංගමව, සාමාන්‍යයෙන් මම එතුමාට මෙහෙම කථා කරන්නේ නැහැ. එතුමා මගේ මිත්‍රයා. හැබැයි, තමන්ගේ හිත ඇතුළේ තවමත් ඉන්නේ ඒ හුණ්ඩු ගතියෙන්. එතුමා හුණ්ඩුව දන්නේත් නැහැ; සේරුව දන්නේත් නැහැ; ජනාධිපති වුණා කියලා දන්නේත් නැහැ; එතුමාට ජනාධිපතිකම තේරෙන්නේත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, එතුමා දැනුවත්ව හෝ නොදැනුවත්ව මේ වනකොට නියමෙටම වැඩේ දෙනවා. නමුත්, දූෂණ විරෝධීව කටයුතු කරනවා කියලායි බලයට ආවේ.

අද වනකොට බාල ගල් අඟුරු නැව් 10ක් අපේ රටට ඇවිල්ලා තිබෙනවා. මේ බාල ගල් අඟුරුරු අපේ රටට එන්න හේතුව මොකක්ද? මේ බාල ගල් අඟුරු ගෙන ඒම සඳහා වූ ටෙන්ඩරය ඉදිරිපත් කරලා තිබෙන්නේ අඩුම මිල ගණනකට. අපි කියනවා, undercut කරනවා කියලා. බාල ගල් අඟුරුවලට මිල තිබ්බා, ටෙන්ඩරය දිනුවා. හැබැයි, අද වනකොට ඒ බාල ගල් අඟුරු අරන් එන්න කටයුතු කරපු පුද්ගලයින්ට රටට අවශ්‍ය කරන ප්‍රමිතිය, නොරොච්චෝලේ බලාගාරයට අවශ්‍ය කරන ප්‍රමිතිය ලබා දෙන්න පුළුවන්කමක් නැහැ. මේ වන විට වෙලා තිබෙන සෘජු අලාභය විතරක් රුපියල් බිලියන 8ක් පමණ වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කියනවා, දඩ ගහනවා ලු. දඩ ගහන්න මේකේ දේශීය නියෝජිතයා කවුද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අඩු මිලක් ඉදිරිපත් කරලා මේ රටට ගල් අඟුරු සැපයීමේ කොන්ත්‍රාත්තුව දිනාගත් Trident Chemphar Limited කියන ඉන්දියානු සමාගමේ දේශීය නියෝජිතයා, Panaurora (Pvt.) Limited. Panaurora (Pvt.) Limited එක තිබෙන්නේ මේ ළඟ, රාජගිරියේ. එහි අධ්‍යක්ෂවරුන් කවුද? හක්මන නන්දාලෝක හිමි, Sayaara Holdings, Invest LK. Sayaara Holdings එකේ අධ්‍යක්ෂවරුන් කවුද? හේරත් බණ්ඩාරලාගේ අනුරාධා ඕෂධී හේරත් සහ ශානිකා කුමාරි. මේ රටට ගල් අඟුරු සපයන දේශීය සමාගමේ ඉන්නේ අනුරාධා හේරතුයි, ශානිකා කුමාරියි, හක්මන නන්දාලෝක හිමියි. තව ඉන්නවා. Invest LK එකේ අධ්‍යක්ෂවරුන් කවුද? හක්මන නන්දාලෝක හිමි සහ සනත් ජයසුන්දර. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු, ක්‍රිකට් තරගවලදී ලකුණු දාන කෙනා - scorer - තමයි සනත් ජයසුන්දර කියන්නේ. මීට කලින් ඔහුට ක්‍රිකට් තහනම් කළා, ICC එකෙන්. ඒ වාගේම Trident Chemphar Limited සමාගමේ ප්‍රධාන විධායකවරයාව ඉන්දියාවේ දිල්ලිවල තිබුණු Delhi liquor licence case එකේදී අත්අඩංගුවට ගත්තා. මොකද, ඔහු දූෂිතයෙක්. ඒ විතරක් නොවෙයි. තව කෙනෙක් ඉන්නවා. ඔහු රචිත රාජපක්ෂ. ඒ නම හුරු ඇති. ලංකාවට ගල් අඟුරු අරගෙන ඒමේ වගකීම භාරගෙන තිබෙන්නේ කවුද? හක්මන නන්දාලෝක හිමියි, සනත් ජයසුන්දරයි, රචිත රාජපක්ෂයි, අනුරාධා ඕෂධී හේරතුයි, ශානිකා කුමාරියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කියනවා නේ, දඩ ගහනවා කියලා. දැන් අපේ වෛද්‍යාචාර්යතුමා කිව්වා, දඩ ගහනවා, දඩයෙන් පුළුවන් කියලා රට බේරාගන්න. පොලීසිය භාර ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. මේ ගැන පරීක්ෂා කරන්න ඕනෑ, පොලීසිය භාර ඇමතිතුමනි. මේ අය කවුද? මේ රටේ ජනාධිපතිවරයා, මේ රටේ බලශක්ති ඇමතිවරයා මෙවැනි කාරණා පිළිබඳව හොයලා බලන්න ඕනෑ. මේ වාගේ බරපතළ ටෙන්ඩරයක් දෙද්දී ඒ දේශීය නියෝජිතයා කවුද කියලා හොයලා බලන්න ඕනෑ. මොකද, ඒ වැඩේ වැරදුණොත් ඒ දේශීය නියෝජිතයා - local agent - හරහා තමයි නීතිමය කටයුතු කරන්න වෙන්නේ. Local agent වශයෙන් ඉන්න ඕනෑ ශක්තිමත් මිනිස්සු; local agent වශයෙන් ඉන්න ඕනෑ පිරිසිදු මිනිස්සු; local agent වශයෙන් ඉන්න ඕනෑ දූෂණ චෝදනාවලට වරදකරුවෝ නොවෙච්ච අය; local agent වශයෙන් ඉන්න ඕනෑ ව්‍යාපාර ශක්තිය තිබෙන අය, වරදක් කළොත් වන්දියක් අය කරගන්න පුළුවන් අය. පොලීසිය භාර ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් CID පරීක්ෂණයක් පවත්වන්න. මෙහෙම සමාගම් තිබෙනවාද? එහි නම, P-a-n-a-u-r-o-r-a (Pvt.) Limited, අකුරු වෙන් වෙන්ව මම කිව්වේ search කරන කෙනෙකුට වැරදෙන්නේ නැති වෙන්නයි.

මේ කරුණ නාමිනී විජේදාස මහත්මිය "The Sunday Times" පුවත් පතෙහි වාර්තා කරලා තිබුණා. මම ස්තුතිවන්ත වනවා, එතුමියට. එතුමිය මේ විස්තර හරියටම අරගෙන "The Sunday Times" පුවත් පතේ සඳහන් කරලා තිබුණා. ඒ වාගේම ලසන්ත

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

රුහුණගේ "අනිද්දා" පුවත් පතට මේ විස්තර අරගෙන තිබුණා. මම පෞද්ගලිකව හොයලා මේ ගැන කියනවා නොවෙයි. මේ රටේ ප්‍රධාන කීර්තිමත් ජනමාධ්‍යවේදීන් දෙදෙනෙක් මේ ගැන සඳහන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා අවංක අය, උගත් අය. ඔබතුමා වාගේ කෙනෙක් මූලසුනේ ඉන්න වෙලාවේ මෙවැනි දෙයක් කියන්න වීමත් කනගාටුයි. ඔබතුමා මේ රට හදන්න දේශපාලනයට එනකොට කවදා හරි හිතුවාද, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ විශාලතම ටෙන්ඩරය මේ තරම් දූෂිත ටෙන්ඩරයක් වෙයි කියලා? ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ වැදගත්ම අමාත්‍යාංශයක ඇමතිකමට දැනටමත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පරීක්ෂණයකට යටත් වෙලා ඉන්න කෙනෙක් පත් වෙයි කියලා හිතුවාද? ඒ වාගේම රුපියල් බිලියන ගණනක් මේ රටට පාඩු කරන මේ ටෙන්ඩරය පිළිබඳ දේශීය නියෝජිතයා මෙවැනි බරපතළ වගකීමක් දරන්න හැකියාවක් නැති පුද්ගලයකු බව හිතුවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තත්ත්වයකට තමයි රට පත් වෙලා තිබෙන්නේ. ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

රටේ ගල් අඟුරු මිලදී ගැනීම පිළිබඳව ප්‍රධාන දූෂණයකට වගඋත්තරකරු වෙලා. එතුමාව පත් කරන්න කලින් ඉඳලාම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ නඩුවක් තිබෙනවා. ඒ නඩුවත් දැන් ප්‍රමාද කරමින්, ප්‍රමාද කරමින් ඉන්නවා. අපි දන්නවා, දැන් පරිසර දූෂණයකුත් වෙමින් තිබෙන බව. ඒ වාගේම දිනපතා රුපියල් බිලියන ගණනින් රටට පාඩුවකුත් වෙමින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම පසුබිමක් තියෙද්දි රටේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ රටට අපහාස කරනවා, මේ රට හුණ්ඩුවක් කියලා.

මේ රට ගැන අපට ආඩම්බරයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආදරණීය මාතෘ භූමිය මේ රට. අපි මේ වෙනුවෙන් කැපවීම් කරලා තිබෙනවා. අපේ පූර්වගාමීන් මේ වෙනුවෙන් කැපවීම් කර තිබෙනවා. එදා පෙර රජ දවසේ ඉඳලා මේ ආදරණීය මාතෘ භූමිය වෙනුවෙන් කැපවීම් කරපු, ජීවිත පරිත්‍යාග කරපු, මහන්සි වෙච්ච, දැනුමෙන් පෝෂණය කරපු, මාතෘ භූමිය වෙනුවෙන් රුධිරය හලපු, සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් යන සියලු ජාතීන්වලට අයත් මේ රට වෙනුවෙන් පරිත්‍යාග කරපු මිනිසුන් ගැන අපට ආඩම්බරයක් තිබෙනවා. මේ රටට අපහාස කරන, කුහකකම් කරපු, මේ රටේ සංවර්ධනයට විරුද්ධව හැම දාම කටයුතු කරපු සන්නද්ධ කැරලි දෙකකට නායකත්වය දීපු, තවමත් ඒ කැරලිකාරී මනස අතහැර ගන්න බැරි ඒ නායකයන් කෙරෙහි අපේ තිබෙන බරපතළ අප්‍රසාදය මේ අවස්ථාවේ මා පළ කරනවා.

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.00]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්තටම මම හිතනවා, අද විවාදයට සම්බන්ධ වීම පොඩ්ඩක් විශේෂයි කියලා. ඒකට හේතුව මෙයයි. අවුරුදු එකහමාරකට ආසන්න කාලයක් අපි මේ රට පාලනය කිරීම තුළ යම්කිසි ආකාරයක ජයග්‍රහණයක් අත්පත් කර ගත්ත එකේ ප්‍රතිඵලයක් විධියට තමයි අද අප මේ නියමය දකින්නේ. විදේශ විනිමය පනත යටතේ නියමය ගත්තොත්, ඒක ඉතාම වැදගත්. ඒකට හේතුව මෙයයි. යම්කිසි ආකාරයකින් ආර්ථික ස්ථාවරභාවය, විදේශ විනිමයේ ස්ථාවරභාවය ඇති වෙනවාත් එක්ක තමයි මේ නියමය අපි ගෙනෙන්නේ. අපි දන්නවා, පසුගිය අවුරුදු දෙක තුනකට කලින් තිබුණු ඒ ආර්ථික තත්ත්වය කොහොමද කියලා. ඉතාම සුන්දර තත්ත්වයක් නොවෙයි ඒ කාල සීමාව තුළ පැවතියේ. සමස්තයක් ලෙස මේ රටේ විදේශ විනිමය විනාශ වීමත් එක්ක තමයි පසුගිය කාල වකවානු තුළ තෙල් පෝලිම්, ගෑස් පෝලිම් ඇතුළු විවිධ දේවල්වලට අපට මුහුණ දෙන්න සිද්ධ වුණේ. මේ සභාවේ විපක්ෂය පැත්තේ ඉස්සරහ ආසනවල වාඩි වෙලා ඉන්න මහත්වරු එක්කෝ තමන් පාලනය කරපු, එහෙම නැත්නම් තමන් හවුල් වුණු ඒ පාලන කාල සීමාව තුළ සිදු වුණු දූෂණ, වංචා, නාස්ති සහ අක්‍රමිකතා හේතුවෙන් මේ රට කබලෙන් ළිපට වැටිච්ච ඒ කාරණාව මතක් වුණු නිසාමද දන්නේ නැහැ, මොකක් හරි කෘත්‍රිම කාරණාවක් නිසා තැන් තැන්වල පොඩි පොඩි අර්බුද මතු වෙනකොට ඒක නිකම් තමන්ගේ කාල වකවානු තුළ සිද්ධ වෙච්ච අර්බුද වාගේ දකින ගතියක් තිබෙනවා. මම හිතන විධියට, ඒක එක අතකට සාධාරණයි.

මීට දින කිහිපයකට පෙර මන්ත්‍රීතුමෙක් සඳහන් කරලා තිබෙනවා මම දැක්කා, ජනතාවට මේ ආණ්ඩුව සම්බන්ධව විශ්වාසය නැහැය කියලා. ජනතාවට මේ ආණ්ඩුව සම්බන්ධයෙන් එඩිතර විශ්වාසයක් තිබෙන නිසාම තමයි කොච්චර පත්තු කරන්න, අර්බුදයක් ඇති කරන්න, කෘත්‍රිම පෝලිම් නිර්මාණය කරන්න උත්සාහ කළත් එය සාර්ථක නොවන්නේ. මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. ඔය විපක්ෂය එකතු වෙලා හදපු සමහර සමූපකාර තිබෙනවා නේ. ඒ සමූපකාර හරහා order එක දාපු නැති අවස්ථාත් තිබෙනවා. උදාහරණයක් වශයෙන් මම නියෝජනය කරන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ගත්තොත්, මම order list එක අරගෙන බලනවා. WhatsApp groups හදලා තිබෙනවා. දවසකට දෙවතාවක් අපි තෙල් ප්‍රශ්නයට අදාළව සාකච්ඡා කරනවා. අපි order list එක අරගෙන බැලුවාම අපට දැනුණා, ගෝමරන්කඩවල පෙට්‍රල් ෂෙඩ් එකේ order එක දාලා නැහැ කියලා. ඒකට හේතුව මොකක්ද කියලා හොයපු ගමන්ම එතැන තිබෙන්නේ විපක්ෂයේ සමූපකාර සමිතියක්. හිතාමතාම ආණ්ඩුවට අප්‍රසාදයක් හදන්න ඕනෑ කියන කාරණය හේතුවෙන් මෙවන් කෘත්‍රිම අර්බුද නිර්මාණය කරන එක සාධාරණයි. නමුත්, ජනතාව රවටන්න මෙතුමන්ලා කොච්චර උත්සාහ කළත් ජනතාව ඒක පරාජය කරලා හමාරයි. තැන් තැන්වල තිබුණු පෝලිම් තත්ත්වය දැන් සෑහෙන දුරට අඩු වෙලා එය යථා තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම ජනාධිපතිතුමා රටට හුණ්ඩුව කිව්වා කියලා යම්කිසි කාරණාවක් මේ සභාවේ මතු වෙලා තිබුණා. එල්ලෙන්න කාරණා නැත්නම් පොඩි පොඩි වචනවල එල්ලෙන එක නේ කරන්නේ. එතුමා රටට හුණ්ඩුව කියලා කිව්වේ නැහැ. හුණ්ඩුව වාගේ ආණ්ඩු. සුද්දෝ අපේ රට දාලා ගියාට පස්සේ අපේ රේල් පාර, එහෙම නැත්නම් ඒ පද්ධතිය ඊට වඩා විශාල ප්‍රමාණයකින් දීර්ඝ කරන්න, සුද්දෝ එවකට හදා තිබූ තෙල් ටැංකි පවා ප්‍රතිසංස්කරණය කරන්න වාගේම අපේ සංචිතය ගබඩා කිරීම සඳහා විශාල ප්‍රමාණයේ ගබඩා සංකීර්ණයක් ඇති කරන්න අපට බැරි වෙලා තිබුණා. හැබැයි, පසුගිය අවුරුදු 76 තුළ කරපු නැති දේවල් අපි අවුරුදු එකහමාරක් තුළ සිදු කරලා තිබෙනවා. එම නිසා ඒ වචනය සම්බන්ධව කිසිම දෙගිඩියාවක් තබා ගත යුතු නැහැ. මොකද, එහෙම කිව්වේ අපේ රටට නොවෙයි, පසුගිය ආණ්ඩුවලට. අපි මේ රට ඉතාම වේගයෙන් ගොඩනඟනවා කියන පණිවුඩයත් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි පොඩි කාලයේ TV බලනකොට ඔය සමහර දේශපාලනඥයෝ දකිද්දී ඔවුන් "පොරවල්" කියලා තමයි හිතුවේ. පොඩි කාලයේ ඉඳන් ඒ දේශපාලන කථා අහලා තමයි අපි හැදුණේත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි ඒ සම්බන්ධයෙන් කනගාටු වෙනවා. මොකද, එවැනි දේශපාලන නායකයෝ දිහා බලා අපි දේශපාලනය තෝරා ගත්ත එකත් වැරදියි. හැබැයි, එක අතකින් අද අපි සතුටු වෙනවා, ඒ දේශපාලනය වැරදියි කියලා තේරුම්ගෙන මේ දේශපාලනය තෝරා ගැනීම ගැන. ඒ වාගේම ජාතික ජන බලවේගය හරහා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ රටට යමක් කරන්න අවස්ථාව ලැබීම ගැන අපි ආඩම්බර වෙනවා.

කුමන තත්ත්ව යටතේ වුණත් ලෝකයේ ආපදා තත්ත්ව නිර්මාණය වෙන්න පුළුවන්; යුද තත්ත්වයන් ඇති වෙන්න පුළුවන්; ගෝලීය දේශපාලන තත්ත්වය වෙනස් වෙන්න පුළුවන්; ඒ වාගේම supply chainsවලට යම්කිසි ආකාරයේ තර්ජනයක් එල්ල වෙන්න පුළුවන්. ඒ කුමන තත්ත්වයක් ආවත් රටක් ලෙස නැඟී සිට ඉස්සරහට යන්න අපි සූදානම් කියන පණිවුඩය මේ උත්තරීතර සභාවට ලබා දෙන්න කැමැතියි.

උදේ විපක්ෂ නායකතුමා කථා කළා. ඇත්තටම මම දුක් වෙනවා, අවුරුදු 26කට වැඩි කාලයක් එතුමා මේ පාර්ලිමේන්තුවේ හිටියත් මේ රටේ විදේශ කටයුතු අමාත්‍යාංශය කියලා එකක් තිබෙනවාද කියලාවත් දන්නේ නැති එක ගැන. අපි ඒ දේශපාලකයන්ට ස්තුතියි කියන්න ඕනෑ නැහැ. අපියි දේශපාලනඥයෝ.

අපේ රටේ ජනතාවට සේවයක් කරන්න ඕනෑ කියන පදනම මත පසුගිය දින කිහිපයක් තිස්සේ නිදි මරමින් අපගේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය අඛණ්ඩව සේවය පවත්වාගෙන ගියා. විශේෂයෙන්ම අපි hotline අංකයකුත් හඳුන්වා දීලා තිබෙනවා. අපගේ සියලු තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල, කොන්සල් ජනරාල් කාර්යාලය ඇතුළු මේ සියලු යන්ත්‍රණය ඉතාම හොඳ විධියට සංවිධානය කරමින්, අපගේ අමාත්‍යාංශයේ කොන්සියුලර් සේවා අංශයත් ඉතාම ශක්තිමත් ආකාරයෙන් පවත්වාගෙන යමින් මේ ප්‍රශ්න අපිට අවම කරන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා. ලෝකයේ කොතැනක ප්‍රශ්න ආවත් අපේ ප්‍රමුඛතාව වෙන්න ඕනෑ අපේ ලාංකික පුරවැසියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම බව අපි විශ්වාස කරනවා. අපි සතුටු වෙනවා, මේ අර්බුදයෙන් එහෙම කිසිම ප්‍රශ්නයක් තවම ඇති වෙලා නැති එක ගැන. දෙදෙනෙකුට තුවාල සිදු වෙලා තිබුණා; එයින් එක්කෙනෙක් Israelවල, අනෙක් කෙනා UAEවල. තුවාලවලට අදාළ ප්‍රතිකාර ලබාගෙන ඒ රටවිරුවෝ දැන් තමන්ගේ නිවෙස්වලට ගිහිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට එන පැමිණිලි සම්බන්ධයෙන් අපගේ අමාත්‍යාංශය ඉතාම වේගයෙන් කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම අපි සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ මේකයි. මේ වාගේ බලවත් රටවල් යුද කරද්දී අපි වාගේ පොඩි රටවලට බාධා එල්ල වෙනවා. විශේෂයෙන්ම මේ යුද්ධයට, එහෙම නැත්නම් ගැටුම්කාරී තත්ත්වයට සම්බන්ධ වුණු සියලු රටවල් එක්ක අපට යම්කිසි බැඳීමක් තිබෙනවා. පටු දේශපාලන අරමුණුත් එක්ක අපිවත් යම්කිසි ආකාරයකට බිත්තියට හේත්තු කරන්න විපක්ෂය උත්සාහ කළා නම්, ඒ උත්සාහය කොන්දේසි විරහිතව පරාජය කරන්න අපි සූදානම් වෙලා ඉන්න ඕනෑ.

අමාත්‍යාංශයක් විධියට අපට විදේශ ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒ ප්‍රතිපත්තියට අනුකූලව අපි කටයුතු කරනවා. අපගේ ප්‍රධාන media release එක, ඒ කියන්නේ අපගේ නිවේදනය 2026 පෙබරවාරි මස 28වැනි දා අපි නිකුත් කරලා තිබෙනවා. "Sri Lanka Calls for Utmost Restraint and Immediate De-escalation in the Middle East" කියන මාතෘකාව යටතේ අපගේ පළමුවැනි නිවේදනය අපි නිකුත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊත් එක්කම "Situation in the Middle East" කියන මාතෘකාව යටතේ අපගේ Consular Affairs Division එකට වාගේම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අදාළ කරන පණිවුඩ ටික ඇතුළු කරමින් අපි 2026 පෙබරවාරි 28වැනි දා තවත් media release එකක් නිකුත් කළා. පළමුවැනි release එක 2026 පෙබරවාරි 28වැනි දා නිකුත් කළා; ඊළඟ නිවේදනයත් 2026 පෙබරවාරි 28වැනි දාම නිකුත් කළා. ඒ වාගේම අද දවස වනකොට අපගේ අමාත්‍යාංශය විසින් යම්කිසි මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවා තිබෙනවා. ඒ මෙහෙයුම් මධ්‍යස්ථානයට අදාළව යම්කිසි නිවේදනයක් අපි නිකුත් කර තිබෙනවා. මේ සියලු නිවේදන මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ වාගේ ගෝලීය තත්ත්ව නිර්මාණය වෙන්න පුළුවන්. ඒවාට මුහුණ දෙන්න අපි සූදානම් වෙලා ඉන්න ඕනෑ. ඒ වාගේම මේ තත්ත්වය මීට වඩා උග්‍ර වුණොත් ඒ තත්ත්වය පාලනය කරන්නේ කොහොමද කියන එකට අදාළවත් IOM ඇතුළු ආයතනත් එක්ක අපි දැන් සාකච්ඡා පටන්ගෙන තිබෙනවා. නමුත්, මේ තත්ත්වය යම්කිසි ආකාරයකට සමනයට පත් වෙයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. ජනාධිපතිතුමා උදේ කිව්වා වාගේ නරකම දෙයට සූදානම් වෙමින්, මේ තත්ත්වය යම්කිසි ආකාරයකට සමනයට පත් වෙයි කියන සුබවාදී අපේක්ෂාවෙන් අපි කටයුතු කරනවා. එම නිසා යළි වතාවක් මම කියන්නට කැමැතියි, මෙතැනදී තෙල් පෝලිම් ගැන, ගෑස් ප්‍රශ්න ගැන කථා කරන්න පුළුවන් කියන එක. මේ සියලු දේවල්වලට අදාළව ගත්තොත්, මේවා කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක තමයි මෙතැන තිබෙන ප්‍රධානම කාරණාව.

දූෂණ, වංචාව, නාස්තිය නැති ඉතාමත් හොඳ මූල්‍ය විනයක් තිබෙන පාලනයක් දැන් ලංකාව තුළ තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩියක් දෙන්න.

ඉතාමත් හොඳ පාලනයක් මේ රට තුළ තිබෙනවා. මේ පාලනයට පුළුවන් මේ රට තිබුණු තැනට වඩා ඉතාම වේගයෙන් ඉස්සරහට අරගෙන ගිහිල්ලා ඉතා හොඳ සංවර්ධිත, ජීවත් වෙන්න පුළුවන් රටක් බවට පත් කරන්න; පොහොසත් රටක්-ලස්සන ජීවිතයක් ඇති කරන්න. ඒ විශ්වාස අපට තිබෙනවා. ඒ සඳහා අපි සියලු දෙනා එකතු වෙමු. අපි කීයටවත් විපක්ෂයේ න්‍යාය පත්‍රවලට ගොදුරු වෙන්නේ නැහැ. අපිට අපේ ප්‍රතිපත්තිය තිබෙනවා. අපේ න්‍යාය පත්‍රය තිබෙනවා. ඒ හරහා අපි මේ රට ඉස්සරහට අරගෙන යන්න සූදානම් බව ප්‍රකාශ කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

## සිවිල් ආරක්ෂක නිලධාරීන් මුහුණ දෙන ගැටලු
## சிவில் பாதுகாப்புப் படை வீரர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள்
## ISSUES FACED BY CIVIL DEFENCE PERSONNEL

[අ.භා. 5.12]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පසුගිය යුද සමයේ මායිම් ගම්මාන ආරක්ෂා කිරීම සඳහා සිවිල් ආරක්ෂක භටයින් බඳවා ගන්නා ලදි. මෙම අය ජීවිත පරදුවට තබා ත්‍රස්තවාදීන්ගෙන් ගම් ආරක්ෂා කිරීමේ රාජකාරි කටයුතුවල නියැළෙන ලදි. මේ අය කළ සේවයට දුන් වටිනාකමක් ලෙස පසුගිය යහ පාලන රජය විසින් මෙම අයගේ සේවය ස්ථිර කරන ලදි.
>
> නමුත්, අද වන විට මෙම අය තමන්ගේ දිස්ත්‍රික්කවලින් පිටත වෙනත් දිස්ත්‍රික්කවල රාජකාරි කටයුතු සඳහා යොදවා ඇත. රජයේ සේවකයින්ගෙන් අඩුම වැටුපක් ලබන්නේ ද මෙම අය බව සඳහන් කරමි.
>
> වෙනත් ප්‍රදේශවල ඔවුන් සේවය කිරීමේදී අවශ්‍ය ආහාර සහ නවාතැන් ලබා ගැනීමේදී විශාල මුදලක් වැය කිරීමට සිදු වී තිබේ. මෙම අයට කිසිදු ආහාර දීමනාවක් ද ලබා දී නොමැත. මෙම අයට සහනයක් වන ලෙසට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා පසුගිය යුද සමයේ අපේ රණ විරුවෝ උතුරට, නැඟෙනහිරට ගිහිල්ලා යුද්ධ කරද්දී ඒ මායිම් ගම්මාන ආරක්ෂා කරන්න එදා මේ සිවිල් ආරක්ෂක භටයින් තමන්ගේ ජීවිත පරදුවට තබලා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට බැඳුණා. සමහර අය මේ රට වෙනුවෙන් තමන්ගේ ජීවිතය පරිත්‍යාග කළා.

මට මතකයි උතුරු-නැඟෙනහිර තිස්අවුරුදු යුද්ධය තිබියදී අද මේ ආණ්ඩු බලයේ ඉන්න ජේවීපී එකේ උදවිය ත්‍රස්තවාදී ව්‍යාපාරයක් විධියට අර සිවිල් යුද්ධයට -උතුරු නැඟෙනහිර යුද්ධයට- සහයෝගයක් දෙන විධියට, ආණ්ඩුවට තවත් කරදරයක් වෙන විධියට උතුර-නැඟෙනහිර ද්‍රවිඩ ත්‍රස්තවාදීන් -එල්ටීටීඊ ත්‍රස්තවාදීන්- ක්‍රියා කරද්දී, දකුණේ ජේවීපී ත්‍රස්තවාදීන් යුද්ධ කළා. ඒ වෙලාවේ- *[බාධා කිරීමක්]* ඔව්, බොහොම අමාරුයි. හිතට බොහොම අමාරුයි නේද, "ත්‍රස්තවාදීන්" කියනකොට. මිනී මරපු අය තමයි ඉන්නේ. ඒ වෙලාවේ හමුදාවට සිද්ධ වුණා, ගම් ආරක්ෂා කරන්න උතුරේත්, දකුණේත් යුද්ධ දෙකකට මුහුණ දෙන්න. එදා ගම් ආරක්ෂා කළේ මේ සිවිල් ආරක්ෂක භටයින්.

අපි ඒකට කරන ගෞරවයක් විධියට පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ ඒ අයගේ සුදුසුකම් පරීක්ෂා කර බලන්නේ නැතිව ඒ අය ස්ථිර සේවයට බඳවා ගත්තා. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව පිහිටෙව්වා. අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කළා. පසුගිය කාලයේ අපි ඒ අයව යොදා ගත්තා, රටේ ආර්ථිකයට ශක්තියක්, රටේ නිෂ්පාදන ආර්ථිකයට ශක්තියක් වෙන පරිදි. සමහර අය ගොවිතැන් කරලා වී කිලෝ ගණනක් දෙනවා ආණ්ඩුවට. බඩඉරිඟු වැව්වාම කිලෝ ගණනක් දෙනවා ආණ්ඩුවට. ඒ අයගෙන් ආර්ථිකයටත් අපි සහයෝගය ගත්තා.

නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ අය තමන්ගේ ගම්වල ඉඳලා; මොනරාගල, අම්පාර, පොළොන්නරුව, අනුරාධපුරය වාගේ ගම්වල ඉඳලා වෙන ප්‍රදේශවල පොලිස් ස්ථානවලට යවලා තිබෙනවා. දැන් මොනරාගල අය යවලා තිබෙනවා දකුණේ පොලිස් ස්ථානවලට. ඒ අය ගිහිල්ලා නවතින්නේ පන්සලක. වෙන නවතින්න තැන් නැහැ. ඒ අය කෑම කන්නේ කඩවලින්. ඒ අයට සිද්ධ වෙලා තිබෙනවා, තමන්ට ලැබෙන සොච්චම් වැටුපෙන් කෑම කන්නයි, නවාතැනටයි වියදම් කරන්න. හැබැයි, ඊට පස්සේ ඒ අයගේ අතේ කීයක්වත් ඉතුරු වෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් රජයේ සේවයේ අයකු වෙනත් තැනක සේවයට යැව්වාම දීමනාවක් ගෙවනවා. නමුත් මේ අයට එහෙම කිසිම දීමනාවක් ගෙවන්නේ නැහැ. සිවිල් ආරක්ෂක භටයින් 28,000ක් පමණ ඉන්නවා. සමහර අය රක්ෂාව අතහැර ගිහිල්ලා. මොකද, ඒ අය ගමේ ඉඳලා සිවිල් ආරක්ෂක රැකියාව කරන ගමන් තමන්ගේ ගොවිතැන් කටයුතුත් කළා. ඒ වාගේම තවත් වැඩ පිළිවෙළවල් කරගෙන ගියා. අද ඒවා කර ගන්න බැරිවෙන නිසා දහස් ගණනක් රැකියාව අතහැරලා ගිහිල්ලා තිබෙනවා. යුද්ධය දිනන්න සහයෝගය දුන්න සිවිල් ආරක්ෂක භටයින්ට මේ ආණ්ඩුව සලකන්නේ එහෙමයි.

මම ඉල්ලීමක් කරනවා. ඉස්සර තිබුණා, උප පොලිස් සේවය. RPCs, RSIsලාත් හිටියා. ඒ අයව ස්ථිර සේවයට බඳවා ගත්තා. අපි

කියනවා, මේ අයගෙත් සුදුසුකම් පරීක්ෂා කර බලා පොලිස් සේවයට කොටසක් බඳවා ගන්න කියලා. මම දැක්කා, ඊයේ පෙරේදා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට කොටසක් බඳවා ගන්න හදනවා. ඒක හොඳයි. මේ අය කරපු සේවයට වටිනාකමක් ලබා දෙන්න. ඒ අය, මේ රට බේරා ගන්න කටයුතු කරපු උදවිය, මේ රට වෙනුවෙන් කටයුතු කරපු උදවිය.

මම ඉස්සෙල්ලාත් කිව්වා, ඒ අයට අවම වැටුපක් ලැබෙන්නේ කියලා. ආණ්ඩුව කිසිම හිතක් පපුවක් නැති විධියට ඒ අයව විවිධ ස්ථානවලට යවලා තිබෙනවා. ඒ අයට ඉන්න තැනකුත් නැහැ, කන්නත් නැහැ, බොන්නත් නැහැ. ඒ අය තමන්ගේ ගෙදර හදා ගන්න බැංකුවෙන් ණයක් අරගෙන තිබෙන්න පුළුවන්. දැන් ඒ ණය ගෙවා ගන්න විධියක් නැහැ. රැකියාවක් කරන්න, ගොවිතැනක් කරන්න ණයක් අරගෙන තිබෙන්න පුළුවන්. අද ඒ ණය ගෙවා ගන්න විධියක් නැහැ. මම රජයෙන් සහ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ අයගෙන් පුළුවන් අයව පොලීසියට බඳවා ගන්න කියලා. පිටත රාජකාරි කරද්දී පොලීසියේ අයට දීමනාවක් ලබා දෙනවා. ඒ දීමනාව මේ අයටත් ලබා දෙන්න. මේ අයගේ ජීවිත අතරමං කරන්නේ නැතිව මේ අයට අවශ්‍ය ශක්තිය ලබා දෙන්න, මේ ඉල්ලීම් ඉටු කර දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.18]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් ගෙන ආ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ස්ථිර කරනවා.

අපට මතකයි, එදා යුද සමයේදී ග්‍රාම ආරක්ෂක නිලධාරින් විධියට මායිම් ගම්මාන ආරක්ෂා කරලා දුන්නේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරු. අද ඒ අයට ගැටලුවක් මතුවෙලා තිබෙනවා. වත්මන් ජනාධිපතිතුමා එතුමාගේ අය වැය කථාවේදී කිව්වා, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් 5,000ක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත්, පොලීසියටත් අනුයුක්ත කරනවා කියලා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වාගේ ආයතනයකට කිසිම නිලධාරියෙක් නිකම්ම අනුයුක්ත කරන්න බැහැ. මොකද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තිබෙන නීති රීති අනුව සමහර වනජීවී කලාපවලට පොලිස් නිලධාරියෙකුටවත් ඇතුළු වෙන්න බැහැ. ඒ නිසා යම්කිසි පුහුණුවක් ලබා දීලා තමයි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට නිලධාරියෙකු අනුයුක්ත කරන්න ඕනෑ.

ඒ වාගේම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරු බහුතරයක් ගොවියෝ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ගොල්ලෝ තමන්ගේ සේවා කාලයෙන් පසුව කුඹුරු ගොවිතැන් කරනවා. මොකද, ඒ අයට ලැබෙන වැටුපත් එක්ක ජීවත් වෙන්න අමාරුයි, පවුලක් නඩත්තු කරන්න අමාරුයි. ඒ නිසා තමන්ගේ කුඹුරු ගොවිතැන් කටයුතුත් කරමින් තමයි ඒ ගොල්ලන් තමන්ගේ ජීවන මාර්ගය හදා ගන්නේ. එහෙම ජීවත්වෙන අම්පාර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය වාගේ දිස්ත්‍රික්කවල සේවය කරන සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් විවිධ ප්‍රදේශවලට මාරු කරලා යැව්වොත් ඒ අයට ගොවිතැන් කටයුතු කරගන්න බැරි වෙනවා. මේ අය ඉල්ලා සිටින්නේ, ඒ ප්‍රදේශයේම තිබෙන - පොලීසිය වෙන්න පුළුවන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන් - ආයතනවලට අනුයුක්ත කරන්න කියලායි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, මේ දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරින්ට දීර්ඝ කාලයක් තිස්සේ අවශ්‍ය උපකරණ ලබා දීලා නැහැ. ඒ අයට uniforms ලබා දීලා නැහැ, සපත්තු ටික ලබා දීලා නැහැ, වැහි කබා ලබා දීලා නැහැ. ඒ ආකාරයට ඉතා දුෂ්කර සේවයක් තමයි මේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් සිදු කරන්නේ. මම දැක්කා, ඒ අයගේ බිරින්දෑවරු කන්තලේට ගිහිල්ලා උද්ඝෝෂණය කරනවා. ඒ උද්ඝෝෂණය කළේ මේ රජයට විරුද්ධව නොවෙයි. ඒ අයට සාධාරණයක් ඉෂ්ට සිද්ධ කර දෙන්න කියන ඉල්ලීම තමයි කළේ. මහජන ආරක්ෂාව භාර ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්න නිසා මම විශ්වාස කරනවා, එතුමන්ලා මේ කාරණය කෙරෙහි අවධානය යොමු කරාවි කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් අද දින ගෙනෙන ලද කල් තැබීමේ යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කරන අය මේ රට වෙනුවෙන් සටන් කරලා මායිම් ගම්මාන ආරක්ෂා කර දුන්නු රණවිරුවන් විධියට එදා අපි දැක්කා; අදත් එහෙම දකිනවා. ඒ අයට සාධාරණයක් ඉෂ්ට සිද්ධ කර දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මොහොමඩ් නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.21]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

ඉස්සෙල්ලාම යමක් කියලා මගේ කථාව පටන් ගන්න කැමතියි. මොකද, අද වැදගත් දිනයක්. මේක කිව්වත් ඔබතුමන්ලා විශ්වාස කරයිද දන්නේ නැහැ. අද තමයි මැදින් පුර පසළොස්වක පොහොය දිනය. බුදු රජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසුව තමන්ගේ ඥාතීන් බලන්න කපිලවස්තු පුරයට - කිඹුල්වත් පුරයට - වැඩම කළ දිනය, අද; ඊයේ නොවෙයි. ඒ ගැන මොනවා හරි සැකයක් තිබෙනවා නම් පොඩ්ඩක් සොයා බලන්න. චන්ද්‍ර ග්‍රහණයක් ඇති වෙන්නේ, පුර පසළොස්වක දිනයකයි. නමුත්, අවාසනාවට පුර පසළොස්වක දිනයක පාර්ලිමේන්තුව රැස් වෙලා තිබෙනවා. කමක් නැහැ. ඒක මට අදාළ නැහැ. නමුත්, මම ඒක කියන්න කැමතියි.

ග්‍රාමාරක්ෂක නිලධාරින් පිළිබඳව මම යමක් කියන්න ඕනෑ. මම අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ ප්‍රදේශ වාසියෙක්. ඒ දවස්වල මම අම්පාර උසාවියට, කල්මුණේ උසාවියට යනවා; ගමටත් යනවා. ඒ කාලයේ මහ ඔය ඉඳලා ඒ පාර දිගේ දිගටම තිබෙන පොඩි පොඩි ගම්මාන සියල්ලක්ම වාගේ ආරක්ෂා කළේ

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

ස්වේච්ඡාවෙන් බැඳුණු ග්‍රාමාරක්ෂක නිලධාරින්. පසුව ඒගොල්ලන්ට යම්කිසි ගෙවීමක් කළා. අපි එහෙම යන එනකොට ඒගොල්ලන් සමහර වෙලාවට අපව නවත්වලා කථා කරනවා. මට තවමත් මතකයි, දවසක් ඒගොල්ලන් මාව නවත්වලා කිව්වා, "මහත්මයා, ප්‍රවේශමෙන් යන්න. අර කිලෝමීටර 10 කණුවෙන් පස්සේ කවුරු ඉස්සරහට ආවත් නවත්වන්න එපා. යන වේගයෙන්ම 'ටක්' ගාලා ඒ කිලෝමීටර ගණන පන්නා ගන්න. ඔතැන තමයි එල්ටීටීඊ කට්ටිය cross කරන තැන" කියලා. ඒ අය අපට ඒ දේවල් කියලා දුන්නා. මමයි, බිරිඳයි විවාහ වෙච්ච මුල් කාලයේ දවසක් අපි ගමනක් ගියා. ඒ දවස්වල සනීපාරක්ෂක පහසුකම් - වැසිකිළි පහසුකම් - තිබුණේ නැහැ. එදා අපි ඒ වාගේ අවශ්‍යතාවයකට එක්තරා ගමක වාහනය නැවැත්තුවා. එතකොට එතැන හිටපු ග්‍රාමාරක්ෂක නිලධාරින් අප ළඟට ආවා. ඒ අය කිව්වා "ඇයි සර්, මෙතැන නවත්වාගෙන ඉන්නේ? මෙතැන ඉන්න හොඳ නැහැ" කියලා. මම කිව්වා, "මගේ වයිෆ්ට වැසිකිළි යන්න ඕනෑ වෙලා. ඒ නිසායි නැවැත්තුවේ" කියලා. ඒ වෙලාවේ ඒ එක්කෙනෙක් කිව්වා, "ආ, කමක් නැහැ සර්. මෙතැන ඉඳලා මීටර් 300ක් ගියාම මගේ නැන්දාගේ ගෙදර තියෙනවා. එතැනට ගිහිල්ලා ඒ වැසිකිළි අවශ්‍යතා ඉටු කර ගන්න පුළුවන්" කියලා. ඒ වාගේ හොඳ ගුණයක් තිබුණු, ස්වේච්ඡාවෙන් වැඩ කරපු, ගම් පිළිබඳව දැනුමක් තිබෙන පිරිසක් ඔවුන්. ඒ සමහර අයගේ නම් මට තවමත් මතකයි. ඒගොල්ලන්ට වාහන පිළිබඳ හොඳ දැනුමක් තිබෙනවා. කවුද ඒ තැන්වලින් යන්නේ එන්නේ කියලා ඒ අය දන්නවා. නුහුරු වාහනයක්, වෙනදාට නොයන වාහනයක් ගියාම නවත්වනවා. මාව දවසක් එහෙම නැවැත්තුවා. මොකද, මම වෙන වාහනයක - මස්සිනාගේ වාහනයේ - ගියේ. "ආ, සර් ද ගියේ? මම හිතුවා වෙනත් කෙනෙක් කියලා. මොකද, වාහනේ වෙනස් නේ" කියලා ඒ නිලධාරියෙක් කිව්වා. ඒගොල්ලන් එච්චරට සුපරීක්ෂාකාරීව වැඩ කළා. මම මේ කියන්න හදන්නේ ඒ අය වටිනා සේවයක් කළ බවයි.

ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒ අයගෙන් සියයට 90ක්ම කුඹුරු වැඩ කරන කට්ටිය. ඒගොල්ලන් ඔය රැකියාවට ආවේත් තමන්ගේ ගමේ ඉඳගෙන, ගමත් බේරාගෙන, යමක් හොයාගෙන තමන්ගේ ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරන්න පුළුවන් නිසායි. ඒගොල්ලන්ට දීලා තිබුණේ automatic weapons නොවෙයි, shotgun එකක්. පුදුමත් හිතෙනවා; පව් කියලාත් හිතෙනවා. ඉතින්, ඒගොල්ලන්ට එක පාරටම කොළඹට එන්න කියන එක හරි අසාධාරණයි. හැබැයි, ඒගොල්ලන්ගෙන් යම්කිසි ආර්ථික දායකත්වයක් ලබා ගන්න පුළුවන්. දැන් මෙතැන නැහැ, අම්පාර නියෝජනය කට්ටිය. ගම්වල ගොවි පොළවල්වලට, කුඹුරුවලට අදාළව රජය විසින් මොනවා හෝ ප්‍රජා පද්ධතියක් හදලා ඒ සිවිල් ආරක්ෂක සේවයේ අයට ඒකට දායක වෙන්න කිව්වොත් ඒගොල්ලන් ඒක සන්තෝෂයෙන් කරාවි. එහෙම නැතුව, 'පොලීසියේ පුරප්පාඩු තිබෙනවා, sentry pointsවලට දමන්න කට්ටිය නැහැ' කියලා ඒගොල්ලන් ඒවාට දමන්න එපා. මොකද, ඒක හරිම අසාධාරණයි. ඒගොල්ලන් ඒකට පුරුදු වුණු කට්ටිය නෙවෙයි. ඒගොල්ලන් නගරය පිළිබඳව විශේෂ කැමැත්තක් නැති, හරිම අසරණ, දුප්පත්, දුෂ්කර ගම්මානවල ජීවත් වෙන කට්ටිය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මම ඉක්මනින් අවසන් කරන්නම්.

ඒගොල්ලන් විශාල සේවයක් කළා. හැබැයි මට ලොකු විශ්වාසයක් තිබෙනවා යහක් කරාවි කියලා. මොකද, උදේ අහපු ප්‍රශ්නයකට ඔබතුමන්ලා පිළිතුරු දුන්නා. ඒ පිළිබඳව පොඩ්ඩක් සානුකම්පිතව බලන්න. මේ කල්තැබීමේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.25]

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිවිල් ආරක්ෂක නිලධාරින් පොලීසියට සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් ගෙනැවිත් තිබෙන කල් තැබීමේ විවාදයේදී අදහස් පළ කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, සිවිල් ආරක්ෂක නිලධාරින් බඳවා ගත්තේ යුද්ධය කාලයේ මායිම් ගම්මානවල ආරක්ෂාව සඳහායි කියන එක. විශේෂයෙන් මගේ දිස්ත්‍රික්කය වන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් ඒ විධියට බඳවා ගත් සිවිල් ආරක්ෂක නිලධාරින් නිලධාරිනියන් විශාල පිරිසක් ඉන්නවා. අම්පාර, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, අනුරාධපුරය වාගේ දිස්ත්‍රික්කවල තමයි ඒ නිලධාරින්ගේ පදිංචිය තිබෙන්නේ. යුද්ධය කාලයේ ගම්මාන ආරක්ෂා කර ගන්න විශාල දායකත්වයක් ලබා දුන්නා වාගේම යුද්ධයෙන් පසුවත් ඒ නිලධාරින්, තමන් ලබා ගන්නා වැටුපට පමණක් සීමා නොවී, රාජකාරියට පමණක් සීමා නොවී ගමේ වැඩ වලට, තම ප්‍රදේශයේ වැඩවලට විශාල දායකත්වයක් ලබා දුන්නා. එවැනි පිරිසක් තමයි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහ නිලධාරිනියන්. ගමේ පින්කමකදී, ගමේ පෙරහැරකදී, ගමේ පොදු වැඩකදී, ඒ හැම දෙයකදීම ඔවුන්ගේ දායකත්වය ලබා ගන්න කටයුතු කර තිබෙනවා සහ ඔවුන් නොමසුරුව, නොපැකිළව ඒ දායකත්වය හැම වෙලාවේම ලබා දී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි ඔවුන්ට ආචාර කරනවා. අදටත් ගමේ පොදු වැඩකදී බර අදින්නේ සිවිල් ආරක්ෂක නිලධාරින් තමයි.

නමුත්, යුද්ධයෙන් පස්සේ පසුගිය ආණ්ඩු සමයන්හිදී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහ නිලධාරිනියන්ගේ සේවය ලබා ගැනීමේදී කළේ මොකක්ද? තම වෘත්තීය අභිමානය සහ තමන් යුද සමයේදී කරපු කාර්යභාරය, ඒ කාර්යභාරයේ අභිමානය ආරක්ෂා වන ආකාරයෙන් ඔවුන් සේවයේ යොදවා ගත්තාද කියන එක සම්බන්ධයෙන් විශාල ගැටලුවක් තිබෙනවා. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු හෝ නිලධාරිනියක එක්ක වාඩි වෙලා කථා කළා නම්, පසුගිය කාලයේ තමන්ගේ ප්‍රදේශවලින් එළියට ගෙනැල්ලා ඔවුන්ගෙන් ලබා ගත් වැඩ මොනවාද කියන එක ඇහුවා නම් ඒ ගැන දැනගන්න පුළුවන්. ඔවුන්ට විවෘතව කියන්න බැරි තරමේ, ඔවුන්ගේ වෘත්තීය අභිමානයට නොගැළපෙන තරමේ වැඩ තමයි ඔවුන්ගෙන් අරගෙන තිබෙන්නේ. ඒ ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. මේ ගරු සභාවේ කථා කළ අනෙකුත් මන්ත්‍රීතුමන්ලාත් දන්නවා ඇති, විවිධ දේශපාලනඥයන්ගේ වුවමනාව අනුව ඔවුන් කොළඹට ගෙනැල්ලා, විවිධ පළාත්වලට යවලා, සනීපාරක්ෂක රාජකාරිවලට, විවිධ දේශපාලනඥයන්ගේ, හිතවතුන්ගේ වතුවල වැඩවලට දාලා තිබෙන බව. යුද සමයේදී ගම්මාන ආරක්ෂා කර

ගන්න යොදා ගත්තු, විශාල කැප කිරීමක් කරපු ඒ අයගේ අභිමානය, වෘත්තීය අභිමානය පවා අහිමි වන ආකාරයේ සේවයක් තමයි ඒ අයගෙන් අරගෙන තිබුණේ. ඒ නිසාම තමයි පසුගිය කාලයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ විශාල ඉල්ලීමක් තිබුණේ, "අපෙන් ගන්නේ මේ විධියේ වැඩ නම්, ඊට වඩා හොඳයි මේ දෙපාර්තමේන්තුවෙන් අපව විශ්‍රාම යවන්න, අයින් කරලා දමන්න; දෙන්න පුළුවන් වන්දියක් දීලා අයින් කරලා දමන්න" කියලා. ඒ ඉල්ලීම ආවේ අන්න ඒ හේතුව නිසා මිස රජයේ ආරක්ෂක දෙපාර්තමේන්තුවක සේවය කරන්න තිබෙන අකැමැත්ත නිසා නොවෙයි. ඒ ඉල්ලීම කළේ ඔවුන්ගෙන් ලබා ගත් රාජකාරිය ඔවුන්ගේ අභිමානයට නොගැළපෙන නිසායි. ඒ නිසා තමයි ඔවුන්ගේ ඉල්ලීම වුණේ, අපට ගැළපෙන රැකියාවක්, අපේ අභිමානයට ගැළපෙන රැකියාවක්, රාජකාරි සීමාවක් අපට ලබා දෙන්න කියන එක.

ඒ අනුව අපි මුලින්ම විශ්‍රාම යාමේ ඉල්ලීම සම්බන්ධයෙන් සලකා බැලුවා. නමුත් ඔබ දන්නවා, පසුගිය කාලයේ ලංකාවේ යම් යම් පාතාල කටයුතු සිද්ධ වුණු බව. ඒ ගොඩක් සිදුවීම්, මිනී මැරුම් වූ තැන්වලදී අත්අඩංගුවට ගත් ගොඩක් පුද්ගලයෝ කලින් ත්‍රිවිධ හමුදාවේ සේවය කරලා පැනලා ගිය අය, ඉවත් වෙලා ගිය අය. තම ආර්ථික ඉපැයීම් ක්‍රියාවලිය අහිමි වුණාට පස්සේ, ආයුධ පුහුණුවක් තිබෙන කෙනෙකු සාමාන්‍යයෙන් එවැනි දේවලට යොමු කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් විශ්‍රාම යැවීම, වන්දියක් ලබා දීලා හෝ ඉවත් කිරීම පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් යම් විවාදයක් පැවතුණේ අර වාගේ තත්ත්වයක් තිබුණු නිසායි. ඒ අනුව තමයි රජය කල්පනා කළේ, එහෙම නම් මේ නිලධාරින් තම වෘත්තීය අභිමානය ආරක්ෂා වන ආකාරයෙන්, ආර්ථික ක්‍රියාවලියට ඵලදායි වන ආකාරයෙන් යොදා ගන්නේ කොහොමද කියලා. එතැනදීත් අප සලකා බැලුවේ ඒ නිලධාරින්ගේ පැත්තෙන් ආපු යෝජනායි.

විශේෂයෙන්ම අපේ ප්‍රදේශවල, කන්තලේ, පදවි ශ්‍රීපුර, ගෝමරන්කඩවල, සේරුවිල වාගේ ප්‍රදේශවල ඉන්න ඒ නිලධාරින්ගෙන්ම ආපු ඉල්ලීම තමයි, "අපි කලිනුත් කළේ ගම් ආරක්ෂා කරන එක, මේ වෙනකොට අපේ ගම්මානවලට තිබෙන තර්ජනයක් තමයි වන අලි උවදුර, එම නිසා මේ වන අලි උවදුරින් ගම්මාන ආරක්ෂා කරගන්න අපේ දායකත්වය ලබා ගන්න" කියන එක. වන අලි උවදුරින් ගම් ආරක්ෂා කර ගන්න අප යොදා ගන්න, පුළුවන් නම් වනජීවී දෙපාර්තමේන්තුවට අප අනුයුක්ත කර ගන්න" කියන ඉල්ලීම තිබුණා. ඒ වෙනකොටත් පොලීසියේ රාජකාරි සඳහා CSD එකේ යම් පිරිසක් යෙදාගෙන තිබුණා. ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු වුණා. ඒ අනුව තමයි තීරණය කරන්නේ, ඒ නිලධාරින්ගෙන් යම් ප්‍රමාණයක් පොලීසියටත්, තවත් ප්‍රමාණයක් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත් අනුයුක්ත කරගෙන ඒ නිලධාරින්ට අභිමානවත් ලෙස රැකියාවේ යෙදෙන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑය කියන එක.

නමුත් ගරු ඇමතිතුමනි, ඔවුන් වන ජීවී දෙපාර්තමේන්තුවට සහ පොලීසියට අනුයුක්ත කිරීමේ ක්‍රියාවලිය යම් කාලයක් අරගෙන විධිමත් ආකාරයකින් සිද්ධ විය යුතුයි කියන එක තමයි අපේ අදහස. මොකද, ඒ නිලධාරින් කාලයක් තිස්සේ ගම්මානවල රැකියා කරලා පුරුදු වුණු අය. මේ වැටුප ප්‍රමාණවත් නොවන නිසාම ඔවුන් තවත් අමතර ආදායම් මාර්ගවලට යොමුවෙලා තිබෙනවා. ඒ ගොඩක් ප්‍රදේශ කෘෂිකාර්මික ප්‍රදේශ. ඒ නිසා ඔවුන් ගොවිතැනක් කරනවා, හවසට ත්‍රිරෝද රථයක් දුවනවා. එහෙම කරලා තමයි ඔවුන් ජීවත් වෙන්න අවශ්‍ය ආදායම උත්පාදනය කරගෙන තිබෙන්නේ. එම නිසා අපි මේ කරන්න යන්නේ මේ දෙපාර්තමේන්තුවේ යම් වෙනසක් නම්, ඒ වෙනස අපි හරියාකාරව කළමනාකරණය කර ගන්නට ඕනෑ; ඒ change එක අපි හරියට manage කර ගන්න ඕනෑ. එම නිසා අපි හිතනවා, ඔවුන් පොලීසියට අනුයුක්ත කිරීමේ ක්‍රියාවලියේදී සහ වන ජීවී දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීමේ ක්‍රියාවලියේදී, ස්වේච්ඡාවෙන් - කැමැත්තෙන් - සේවයට පැමිණීම සඳහා ඔවුන් දිරිමත් කරන, ඒ සඳහා පොළඹවා ගතහැකි මට්ටමේ ප්‍රමාණවත් දිරි දීමනාවක් ලබා දීම සුදුසුයි කියන යෝජනාව මම කරනවා. ඒ වාගේම එම දීමනාව විධිමත් ආකාරයෙන් ලබා දිය යුතුයි.

ඒ වාගේම, ඔවුන්ගේ නිවාඩු සම්බන්ධයෙන් ගත්තොත්, පොලීසියේ රාජකාරි සඳහා වෙනත් ප්‍රදේශයකට - වෙනත් පළාතකට - ගියාට පස්සේ ඔවුන්ට නවාතැන් ගන්න වෙන්නේ පොලිස් නේවාසිකාගාරවල - quartersවල. ඒ නිසා ඒ සම්බන්ධයෙන් විධිමත් ආකාරයේ දැනුවත් කිරීමක්, විධිමත් නියෝග දීමක් පොලීසියට කළ යුතුයි කියලා අපි හිතනවා. එහෙම නැති වුණොත් ඔවුන් ඒ තැන්වලදී අපහසුතාවට පත් වෙනවා. අපි දන්නවා, මේ වාගේ දෙපාර්තමේන්තුවල නිලධාරින්ගේ යම් ධුරාවලියක් තිබෙන බව. ඒ ධුරාවලිය ඇතුළේ ඔවුන් කොතැනද ස්ථානගත වෙන්නේ කියන එක ගැන ඔවුන්ට හරි පැහැදිලි කිරීමක් අවශ්‍යයි. මේ නිවාඩු ලබා ගැනීම සම්බන්ධයෙන් කිව්වොත්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මම කථාව අවසන් කරන්නම්. මට තව තත්ත්පර 30ක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නිවාඩු ලැබෙන්නේ කොපමණ කාලයකට පසුවද, නිවාඩු ලබා ගැනීමේ ක්‍රියාවලිය කුමක්ද කියන එක සම්බන්ධයෙන් නිසි පැහැදිලි කිරීමක් අවශ්‍යයි. මොකද, පසුගිය කාලයේදී ඒ විධියට පොලීසියට අනුයුක්ත කළාට පස්සේ නිවාඩු නොලබා දවස් 30, 40 සේවය කරන්න ඔවුන්ට සිද්ධ වුණා. එම නිසා ඔවුන් අපහසුතාවට පත් වෙලා තිබෙනවා.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මේ නිලධාරින් කැමැත්තෙන් ඉන්නවා, ඔවුන්ගේ සේවය ඉතා ඵලදායි ආකාරයෙන් මේ රටට ලබා දෙන්න. එම නිසා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ, ඔවුන් ආකර්ෂණය වන ආකාරයෙන්, දිරිමත් වන ආකාරයෙන් ඒ දිරි දීමනා, නිවාඩු සහ සේවා කොන්දේසි නිසි ආකාරයෙන් සකස් කරලා මේ ක්‍රියාවලිය ඉස්සරහට අරගෙන යන්න කියන ඉල්ලීමයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.33]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් කරන විවාදයේදී,

[ගරු ආනන්ද විජේපාල මහතා]

විශේෂයෙන්ම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් පිළිබඳව සහ ඔවුන් මුහුණ පාන ගැටලු කිහිපයක් පිළිබඳව තමයි කරුණු අවධාරණය කරලා තිබෙන්නේ.

මේ දෙපාර්තමේන්තුවේ 30,025ක් වන සම්පූර්ණ සේවක සංඛ්‍යාව ගත්තොත්, ඇත්තටම ඔවුන් අතීතයේදී වාගේම වර්තමානයේදීත් මේ රටට සුවිශේෂී සේවාවක් ඉෂ්ට කරන පිරිසක් හැටියට අවධාරණය කරන්න අවශ්‍යයි. ඔවුන් ආරක්ෂක කටයුතුවල යෙදුණා වාගේම, පොලීසියේ සහ හමුදාවේ සහායක සේවාවක් හැටියටත් කාලයක් කටයුතු කළා. නමුත්, පසුගිය කාලයේ ඔවුන් විවිධ ව්‍යාපෘතිවලට යොදවලා තිබුණා. විශේෂයෙන් ඔවුන් කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ විවිධ වගා කටයුතුවල යෙදුණා වාගේම, ගොවිපොළ රාශියක් පවත්වාගෙන ගියා. ඒ හරහා රුපියල් මිලියන 2,000ක පමණ මුදලක් 2025 වර්ෂයේත් උපයාගෙන තිබුණා. මේ ආයතනය දෙපාර්තමේන්තුවක් හැටියට ස්ථානගත කරලා තිබුණත්, 30,000කට අධික ශ්‍රම බලකායක් සිටියත්, මෙම දෙපාර්තමේන්තුවේ ඉන්න හට පිරිස් සහ නිලධාරින් ඵලදායී ලෙස ඒ කර්තව්‍යය සඳහා යොදාගෙන නොතිබුණු බව තමයි ඒ පිළිබඳව සොයා බැලීමේදී අපට අනාවරණය වුණේ. ඒ සඳහා තමයි අපේ අවධානය යොමු වුණේ. එම නිසා අපට අවශ්‍ය වුණා ඔවුන් ගෞරවාන්විත සේවයක යොදවා, යම් වැටුප් තලයක් ලබා දීලා, ඔවුනුත් අනෙක් රාජ්‍ය සේවා හා සමානව ගෞරවනීය සේවාවක් කරන රාජ්‍ය සේවකයන් බවට පරිවර්තනය කරන්න. ඒ වෙනුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මොන ආකාරයෙන් යොදා ගන්න අවශ්‍යද කියන කාරණාව තමයි අපි සලකා බලන්නේ.

අපට පළමුවෙන්ම අවශ්‍ය වුණේ මේකයි. වන ජීවී දෙපාර්තමේන්තුවට 5,000ක පිරිසකගේ අවශ්‍යතාවක් තිබුණා. ඒ අවශ්‍යතාව වෙනුවෙන් වනජීවී දෙපාර්තමේන්තුවට මේ අයගෙන් 5,000ක් පූර්ණ වශයෙන් නිදහස් කරනවා. එතකොට ඔවුන් වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරින් බවට පත් වෙනවා. මේ වෙනකොට 4,500ක් නිදහස් කරලා තිබෙනවා. හෙට දිනයේ තවත් 500ක් නිදහස් කරනවා. ඒ අනුව වනජීවී දෙපාර්තමේන්තුවට 5,000ක පිරිසක් අනුයුක්ත කරනවා. වනජීවී දෙපාර්තමේන්තුවේ වැටුප් තල අනුව ඔවුන්ට නිශ්චිත තනතුරක් මේ වෙනකොට වනජීවී දෙපාර්තමේන්තුව විසින් සකස් කරමින් සිටිනවා, මහා භාණ්ඩාගාරය එක්ක සාකච්ඡා කරමින්. ඒ වාගේම ඒ අයට සුදුසු පුහුණුවක් ලබා දෙනවා. ඔවුන් විශාල කාලයක් වනජීවී දෙපාර්තමේන්තුව කරන කාර්යයන්ට සහාය වෙමින් සහායක සේවයක් ඉෂ්ට කළ අය. ඔවුන් අලි-මිනිස් ගැටුම හේතුවෙන් ඇති වෙන වගා හානි, මිනිස් ජීවිත අහිමිවීම් සහ දේපොළ හානි අවම කිරීමට මැදිහත්කරුවන් හැටියට දීර්ඝ කාලයක් වනජීවී දෙපාර්තමේන්තුවට සහායක සේවා සපයපු අය. ඒ අයගෙන් තෝරා ගත් 4,500ක් දැනට වනජීවී දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරලා තිබෙනවා, හෙට දිනයේ තව 500ක් අනුයුක්ත කරලා ඒ 5,000 සම්පූර්ණ කරනවා.

දෙවැනි කාරණය මේකයි. පොලිස් දෙපාර්තමේන්තුව තුළ මානව සම්පතේ හිඟයක් තිබෙනවා. ඒ නිසා මේ 30,000ක් වන පිරිස අතරින් 10,000ක් පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන්න ඕනෑය කියලා යෝජනාවක් ආවා වාගේම, අමාත්‍ය මණ්ඩල තීන්දුවකුත් ගත්තා. ඒකෙන් අදහස් කළේ මේ ශ්‍රම සම්පත, නැත්නම් මේ ශ්‍රම බලකාය ඵලදායී ලෙස යොදා ගැනීමයි. ඒ වාගේම අනාගතයේ ඔවුන්ගේ රැකියා සුරක්ෂිතතාව තහවුරු කිරීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙලාවේ මේ සභාවට අවධාරණය කරනවා අනිවාර්යයෙන්ම ඔවුන්ගේ සේවා සුරක්ෂිතතාව තහවුරු කරන බවට. ඔවුන්ගේ වැටුප් තල, විශ්‍රාම වැටුප්, අනෙකුත් සේවා සහ දීමනා අපි තහවුරු කරනවා.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා දැනට අනුයුක්ත කරලා ඉන්න අයට කෑම නැහැ, ඉන්න තැනක් නැහැ වාගේ කාරණා. මම ඒ කාරණා ප්‍රතික්ෂේප කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි පොලිස් දෙපාර්තමේන්තුවට මේ වනකොට 4,000ක පමණ පිරිසක් අනුයුක්ත කරලා තිබෙනවා. ඒ අනුයුක්ත කිරීමේදී යම් ස්ථාන මාරු ප්‍රමාණයක් සිද්ධ වුණා. ඒකට හේතුවක් තිබෙනවා. මොකද, සිවිල් ආරක්ෂක බලකායේ පිරිස් සියලු දිස්ත්‍රික්කවලින් බඳවාගෙන නැහැ. ඒ අයගෙන් වැඩි ප්‍රමාණයක් මොනරාගල, අම්පාර, අනුරාධපුරය, කුරුණෑගල වාගේ දිස්ත්‍රික්කවල අය. ඒ අය බස්නාහිර පළාතේ, දකුණු පළාතේ පොලිස් ස්ථානවලට දානකොට ස්ථාන මාරු ප්‍රමාණයක් කරන්න සිද්ධ වෙනවා. ඔවුන් පොලිස් ස්ථානයකට අනුයුක්ත කරන සෑම අවස්ථාවකම නවාතැන් පහසුකම් පොලිස් බැරැක්ක තුළ සූදානම් කරලා තිබෙන්නේ. ඒ වාගේම ඔවුන් කරන සේවාව වෙනුවෙන්, පොලිස් නිලධාරින්ට ගෙවනවා වාගේම නවාතැන් සහ ආහාර දීමනාවක් ලබා දෙනවා. පසුගිය දිනක, දැන් සති 3කට පෙර අමාත්‍ය මණ්ඩල තීන්දුවක් ගත්තා රුපියල් 25,200ක් ගෙවන්න. *[බාධා කිරීමක්]* මම පැහැදිලි කරන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මම හිතන විදියට, එහෙම දීමනාවක් ගෙවන්නේ නැහැ. ඒගොල්ලන් අපට ඒ සම්බන්ධව කියලා තිබෙනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු මන්ත්‍රීතුමා, ඒ අයට දීමනාවක් ගෙවන්න අමාත්‍ය මණ්ඩල තීන්දුවක් අරගෙන කටයුතු කරලා තිබෙනවා. ඒ ගැන දැනුවත් කරලා තිබෙනවා. තවම මාසයකට අඩු කාලයක් ගිහින් තිබෙන්නේ මේ අනුයුක්ත කිරීමට. අපි වහාම ඒ ගෙවීම පිළිබඳව පොලිස්පතිවරයා -

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

කීයක්ද ගෙවන්නේ?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

රුපියල් 25,200ක් ගෙවනවා ආහාර හා නවාතැන් දීමනා වශයෙන්. ජ්‍යෙෂ්ඨ උප නියාමක කෙනෙකුට රුපියල් 28,200ක් ගෙවනවා. අමාත්‍ය මණ්ඩල තීන්දුවක් අරගෙන ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ ගෙවීම් සිද්ධ නොවෙනවා නම් වහාම ඒ පිළිබඳව සොයා බලා ඒ ගෙවීම් කරන්න කටයුතු කරනවා. මේ කටයුතුවලට තවම කෙටි කාලයක් තමයි ගෙවිලා තිබෙන්නේ. ඉස්සෙල්ලාම 1,000ක විතර පිරිසක් තමයි අනුයුක්ත කළේ. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කිසිම හටයෙක් හෝ නිලධාරියෙක් නවාතැන් පහසුකමක් නැතිව, කෑම බීම නැතිව, ඉන්න තැනක් නැති ආකාරයට ස්ථාන මාරු කරන්නේ නැහැ. ඔවුන්ගේ නවාතැන් සහ අනෙකුත් සියලු දීමනා සුරක්ෂිත කරනවා, විශ්‍රාම වැටුපට කිසිම බලපෑමක් නොවන ආකාරයට. අපි බලයට එනකොට ඔවුන්ගේ මූලික වැටුප තිබුණේ රුපියල් 27,680යි. අපි ඒ මූලික වැටුප රුපියල් 41,985 දක්වා 2025 වර්ෂයේ වැඩි කළා. මේ වසරේත් රුපියල් 3,500ක විතර වැටුප් වැඩිවීමක් වුණා. අනෙක් රාජ්‍ය සේවකයන්ට සලකන ආකාරයෙන්ම මේ දෙපාර්තමේන්තුවේ සේවකයන්ටත් අභිමානයක්, ගරුත්වයක් ඇති නිලධාරින් ලෙස සලකමින් ඔවුන්ගේ ශ්‍රමය භාවිත කරන්න තමයි අපි සැලසුම් කරලා තිබෙන්නේ. අමාත්‍ය මණ්ඩල තීන්දුව ගත්ත

ආකාරයෙන්ම පොලිස් දෙපාර්තමේන්තුවට බඳවා ගත්ත 4,000ටත්, ඉදිරියේදී බඳවා ගන්නා 6,000ටත් ආහාර සහ නවාතැන් දීමනාවක් ලෙස රුපියල් 25,200කුත්, ඒ ජ්‍යෙෂ්ඨ උප නියාමක කෙනෙකුට රුපියල් 28,200කුත් ලබා දීමට කටයුතු කරනවා. ඔවුන් පොලිස් ස්ථානයකට මාරු කළොත්, පොලිස් බැරැක්ක තුළ ඔවුන්ට නියමිත නවාතැන් පහසුකම් ලබා දීමට අවශ්‍ය කටයුතු කරනවා. ඒ වාගේම අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබා දෙන්නත්, සුබසාධන පහසුකම් සැලසීමටත් අපි අනිවාර්යයෙන්ම කටයුතු කරනවා. ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නවා. ඒ නිසා ඔවුන්ට කිසිදු ආකාරයේ අසාධාරණයක් සිදු වන්න ඉඩකඩ තබන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඔවුන්ගේ ගැටලු පිළිබඳව ඕනෑම අවස්ථාවක සාකච්ඡා කරලා, ඒ ගැටලුවලට විසඳුම් දෙන්නත් අපි සූදානම්. ඒ වෙනුවෙන් අපි මැදිහත්වීමක් කරන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.41ට, 2026 මාර්තු 04වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.41க்கு, பாராளுமன்றம் 2026 மார்ச் 04, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.41 p.m. until 9.30 a.m. on Wednesday, 04th March, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

## මරණ දඬුවම නියම වී ජනාධිපති සමාව නොලැබූ සිරකරුවන්: විස්තර
## மரண தண்டனை விதிக்கப்பட்ட மற்றும் சனாதிபதி பொது மன்னிப்பு வழங்கப்படாத சிறைக் கைதிகள்: விபரம்
## PRISONERS SENTENCED TO DEATH AND NOT GRANTED PRESIDENTIAL PARDON: DETAILS

1630/2025

**1. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) මරණ දඬුවම නියමවී, ඒ පිළිබඳ සියලු අභියාචනා අවසන්ව ඇති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපති සමාව නොලැබූ, සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සිරකරුවාගේ නම සහ වයස වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) 1976න් පසුව, ජනාධිපතිවරයා විසින් මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම සඳහා වන විධානය නිකුත් කර නොමැති බවත්;

(ii) ඇතැම් අවස්ථාවල, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් මරණ දඬුවම, ජීවිතාන්තය දක්වාවූ සිර දඬුවමක් බවට පත් කරන බවත්;

(iii) එම ක්‍රියාවලිය 'විෂය මූලිකව' සිදු කිරීමෙන් තොරව, අවිධිමත්ව 'පුද්ගල බද්ධව' සිදුවන බවත්;

එතුමා පිළිගන්නේද?

(ඇ) (i) එම ක්‍රියාවලිය 'විෂය මූලිකව' සිදු කිරීම සඳහා ගන්නා පියවර කවරේද;

(ii) මරණ දඬුවම ජීවිතාන්තය දක්වාවූ සිර දඬුවමක් බවට පත් කළ පසු, එම සිර දඬුවම ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය සහ ඉන්පසු එම සිර දඬුවම ගෙවීයාම පිළිබඳ විධිවිධාන විධිමත් කිරීම සඳහා, බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව, `රෙගුලාසි' සෑදීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மரண தண்டனை விதிக்கப்பட்டு, அது தொடர்பான அனைத்து மேன்முறையீடுகளும் நிறைவு செய்யப்பட்டுள்ள, அரசியலமைப்பின் 34ஆம் உறுப்புரையின் பிரகாரம் சனாதிபதி பொது மன்னிப்பு வழங்கப்படாத சிறைக் கைதிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு சிறைக் கைதியினதும் பெயர் மற்றும் வயது வெவ்வேறாக யாது என்பதையும்;

அவர் அறிவிப்பாரா?

(ஆ) (i) 1976ஆம் ஆண்டிற்குப் பிறகு, சனாதிபதியினால் மரண தண்டனையை அமுல்படுத்துவதற்கான கட்டளை பிறப்பிக்கப்படவில்லை என்பதையும்;

(ii) சில சந்தர்ப்பங்களில், அரசியலமைப்பின் 34(1) ஆம் உறுப்புரையின் பிரகாரம் சனாதிபதியால் மரண தண்டனையானது ஆயுள் தண்டனையாக மாற்றப்படுகிறது என்பதையும்;

(iii) அச்செயன்முறையானது 'தற்சார்பற்ற அடிப் படையில்' அன்றி, முறையற்ற விதமாக 'தனிநபர் அடிப்படையில்' மேற்கொள்ளப்படுகிறது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) மேற்படி செயன்முறையினை 'தற்சார்பற்ற அடிப் படையில்' மேற்கொள்வதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) மரண தண்டனையானது ஆயுள் தண்டனையாக மாற்றப்பட்டதன் பின்னர், அச்சிறைத் தண்டனையை அமுல்படுத்தும் விடயம் ஆரம்பிக் கப்படும் திகதி மற்றும் அதன் பின்னர் அச்சிறைத் தண்டனை நிறைவடைதல் தொடர்பான ஏற்பாடுகள் ஆகியவற்றை முறைமைப் படுத்துவதற்காக, சிறைச்சாலைகள் கட்டளைச் சட்டத்தின் ஏற்பாடுகளின் பிரகாரம் 'ஒழுங்கு விதிகளை' ஆக்குவதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

asked the Minister of Justice and National Integration:

(a) Will he state the -

(i) number of prisoners sentenced to death, whose appeals against the sentence had been exhausted and who have not been granted Presidential Pardon in terms of Article 34 of the Constitution; and

(ii) name and age of each of those prisoners, separately?

(b) Will he admit that -

(i) the President has not ordered any execution since 1976;

(ii) in certain cases, the President commutes the death penalty to life imprisonment in terms of Article 34(1) of the Constitution; and

(ii) the said process is carried out in an informal and 'objective' manner without being 'subjective'?

(c) Will he also state -

(i) the steps that will be taken to carry out the said process in a 'subjective' manner; and

(ii) whether steps be taken to formulate 'regulations' in accordance with the provisions of the Prisons Ordinance to formalize the provisions regarding the date of commencement of imprisonment and the subsequent serving of the sentence of imprisonment after the death penalty is converted into a life sentence?

(d) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

(අ) (i) බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක කේ.07/ම:ද:නි කමිටුව/පාවා.ප්‍රශ්න/11/2026 හා 2026.02.05 දිනැති ලිපිය අනුව මරණ දඬුවම නියම වී, ඒ පිළිබඳ සියලු අභියාචනා අවසන්ව ඇති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපති සමාව නොලැබූ සිරකරුවන් 793ක ප්‍රමාණයක් බන්ධනාගාරය තුළ රඳවා සිටින බව දන්වා ඇත.

(ii) සිරකරුවන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරනු පිණිස එවැනි නාම ලේඛනයක් ලබා දීම ප්‍රතික්ෂේප කරමි.

(ආ) (i) එකඟ වෙමි.

(ii) පූර්වගාමී ජනාධිපතිවරුන් විසින් එසේ සිදු කර ඇති බව දැන ගැනීමට ඇත.

(iii) ඉහත (ii) සඳහන් අවස්ථාවලදී, ඇතැම් අවස්ථාවලදී කමිටු නිර්දේශ අනුවද, ඇතැම් අවස්ථාවල පුද්ගල බද්ධවද සිදු කර ඇති බව පෙනී යයි.

(ඇ) (i) මෙම ක්‍රියාවලිය විෂය මූලිකව සිදු කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකුගේ සහභාගිත්වයෙන් යුත් කමිටුවක් කැබිනට් මණ්ඩල අනුමැතිය මත මා විසින් පත් කර ඇත. ඊට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය ආදී විෂයානුබද්ධ අංශ නියෝජනය කරන්නා වූ සාමාජිකයන්ගෙන් සමන්විතය. එකී කමිටු වාර්තාව ලැබුණු පසු එකී කමිටු වාර්තාව කැබිනට් මණ්ඩල අනුමැතිය වෙත ඉදිරිපත් කර එකී අනුමැතිය මත එහි නිර්දේශ අනුව ක්‍රියා පටිපාටිය සකස් වනු ඇත.

(ii) එකී වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරි පියවර ගනු ඇත.

(ඈ) පැන නොනඟී.

(அ) (i) சிறைச்சாலைகள் ஆணையாளரின் கே.07/ம:த:நி கமிட்டுவ/பாவ.ப்ரஷ்ன/11/2026ஆம் இலக்க மற்றும் 2026.02.05ஆம் திகதிய கடிதத்தின்படி, மரண தண்டனை விதிக்கப்பட்டு, அது தொடர்பான அனைத்து மேன்முறையீடுகளும் நிறைவு செய்யப்பட்டுள்ள, அரசியலமைப்பின் 34ஆம் உறுப்புரையின் பிரகாரம் சனாதிபதி பொது மன்னிப்பு வழங்கப்படாத 793 சிறைக் கைதிகள் சிறைச்சாலையில் தடுத்து வைக்கப்பட்டுள்ள தாகத் தெரிவிக்கப்பட்டுள்ளது.

(ii) சிறைக் கைதிகளின் தனியுரிமையைப் பாதுகாப் பதற்காக வேண்டி அவ்வாறான பெயர்ப் பட்டியலை வழங்க நான் மறுக்கிறேன்.

(ஆ) (i) இணங்குகிறேன்.

(ii) முன்னாள் சனாதிபதிகளால் அவ்வாறு மேற்கொள்ளப்பட்டதாகத் தெரிந்துகொள்ள முடிகிறது.

(iii) மேற்படி (ii) இல் குறிப்பிடப்பட்ட சந்தர்ப்பங்கள் சிலவற்றில் குழுக்களின் பரிந்துரையின்படியும், சில சந்தர்ப்பங்களில் தனிநபர் அடிப்படையிலும் அவ்வாறு மேற்கொள்ளப்பட்டுள்ளது புலப் படுகிறது.

(இ) (i) இந்தச் செயன்முறையைத் தற்சார்பற்ற அடிப் படையில் மேற்கொள்வதற்கு உயர் நீதிமன்ற நீதிபதி ஒருவரின் தலைமையிலான குழு வொன்று அமைச்சரவையின் அங்கீகாரத்தின் மீது என்னால் நியமிக்கப்பட்டது. அது, நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சு, சட்ட மாஅதிபர் திணைக்களம், இலங்கை பொலிஸ் ஆகிய விடய அடிப்படையிலான பிரிவுகளைப் பிரதிநிதித்துவப்படுத்தும் உறுப்பினர்களை உள்ளடக்கியுள்ளது. குறித்த குழுவின் அறிக்கை கிடைத்ததன் பின் அதனை அமைச்சரவையின் அங்கீகாரத்திற்காகச் சமர்ப்பித்து, குறித்த அங்கீகாரத்தின்மீது அதன் பரிந்துரையின்படி நடைமுறை தயாரிக்கப்படும்.

(ii) குறித்த அறிக்கையின் பரிந்துரையின்படி அடுத்தகட்ட நடவடிக்கைகள் எடுக்கப்படும்.

(ஈ) எழாது.

(a) (i) By letter No.කේ.07/ම:ද:නි කමිටුව/පාවා.ප්‍රශ්න/11/2026 dated 05.02.2026, it has been informed that 793 prisoners who had been sentenced to death, in respect of whom all appeals had been exhausted and who have not received Presidential Pardon as provided for in Article 34 of the Constitution are being held in prison.

(ii) I refuse to provide such a list so as to protect the privacy of the prisoners.

(b) (i) I agree.

(ii) It is known that former Presidents had done so.

(iii) In the cases mentioned in (ii) above, it appears that in certain instances, the appointments had been made based on committee recommendations and in some other cases, on an objective manner.

(c) (i) I have appointed a committee with the participation of a Supreme Court Judge, on approval of the Cabinet, to carry out this process on a subjective manner. It consists of members representing subject-related arms such as the Ministry of Justice and National Integration, the Attorney-General's Department, the Sri Lanka Police et cetera. Upon receipt of the report of the said committee, it will be submitted to the Cabinet for approval and the procedure will be prepared according to its recommendation based on that approval.

(ii) Further steps will be taken according to the recommendations of that report.

(d) Does not arise.

## පානදුර ප්‍රසන්න ඔටෝ සර්විස් සමාගමට එරෙහිව ගොනු කළ පැමිණිල්ල: ගත් පියවර
## பாணந்துறை, 'பிரசன்ன ஒட்டோ சர்விஸ்' நிறுவனத்துக்கு எதிராக தாக்கல் செய்யப்பட்ட முறைப்பாடு: நடவடிக்கை
## COMPLAINT FILED AGAINST PRASANNA AUTO SERVICE, PANADURA: ACTION TAKEN

1864/2026

**2. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පානදුර, බටහිර මාලමුල්ල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන `ප්‍රසන්න ඔටෝ සර්විස්' නම් ව්‍යාපාරය පිළිබඳව යොමු කරන ලද WP/KT/PPA/ WP-K/0119/2025 දරන පැමිණිල්ල සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පැමිණිල්ලට අදාළව ඉදිරි නීතිමය පියවර ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) පැමිණිල්ල විභාග කිරීමට ප්‍රමාද වීමට හේතුව කවරේද;

(v) එම පැමිණිල්ලට අදාළව ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பாணந்துறை, மேற்கு மாலமுல்ல பிரதேசத்தில் இயங்கும் 'பிரசன்ன ஒட்டோ சர்விஸ்' எனப்படுகின்ற தொழில்முயற்சி தொடர்பாக செய்யப்பட்டுள்ள WP/KT/PPA/WPK/0119/2025ஆம் இலக்க முறைப்பாடு தொடர்பாக, மத்திய சுற்றாடல் அதிகாரசபையால் எடுக்கப் பட்டுள்ள நடவடிக்கை யாது என்பதையும்;

(ii) அந்த முறைப்பாட்டுக்கான அடுத்தகட்ட சட்ட நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) முறைப்பாட்டின் விசாரணை தாமதமாவதற்கான காரணம் யாது என்பதையும்;

(v) குறித்த முறைப்பாட்டுடன் சம்பந்தப்பட்டதாக எதிர்காலத்தில் எடுக்கப்படவுள்ள நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the action taken by the Central Environmental Authority in relation to the complaint WP/KT/PPA/WP-K/0119/2025 filed against the business named "Prasanna Auto Service" operating in the West Malamulla area of Panadura;

(ii) whether any further legal action has been taken regarding that complaint;

(ii) if not, the reasons for that;

(iv) the reason for the delay in investigating the complaint; and

(v) the action that will be taken in respect of the said complaint?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

(අ) (i) එම පැමිණිල්ලට අනුව 2026.01.16 දිනැතිව දෙපාර්ශ්වයම සම්බන්ධ කර ගනිමින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලදී. එම ක්ෂේත්‍ර පරීක්ෂණයේ නිරීක්ෂණ පහත පරිදි වේ.

- ක්ෂේත්‍ර පරීක්ෂණය සිදු කරන අවස්ථාවේ ත්‍රී රෝද රථ සේවා ස්ථානයේ කටයුතු සිදු කෙරෙමින් පැවති බව.

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

- මෙම කර්මාන්ත භූමියට ආසන්නව පැමිණිලිකරුගේ නිවස පිහිටා ඇති බව.
- මෙම සේවා ස්ථානයට අදාළව මෙම අධිකාරිය විසින් අංක WE - C01249(R4) හා 2025.05.23 දිනැතිව 2025.05.07 සිට 2027.01.16 දක්වා වලංගු වන පරිදි පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අලුත් කර ඇති බව.
- ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අනාවරණය වූයේ කර්මාන්තකරු මේ වන විට මිය ගොස් ඇති බව.
- පැමිණිලි පාර්ශ්වය හා මිය ගිය කර්මාන්ත හිමිකරුගේ බිරිඳ වන චමිලා අධිකාරම් මහත්මිය විසින් ප්‍රකාශිත ආකාරයට මෙම කර්මාන්තය පිහිටි ඉඩමට අදාළව පැමිණිලි පාර්ශ්වය සමඟ පානදුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 2918 යටතේ ඉඩම් නඩුවක් විභාග වන බව.
- චමිලා අධිකාරම් මහත්මිය විසින් ප්‍රකාශිත ආකාරයට ස්වාමිපුරුෂයා මිය ගිය පසු සේවක මහතෙකු යොදා ගනිමින් ත්‍රී රෝද රථ සේවා ස්ථානය පවත්වා ගෙන යනු ලබන බව.

(ii) 2026.01.16 දිනැතිව සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේ නිරීක්ෂණවලට අනුව මිය ගිය ජී. ප්‍රසන්න ජයසිරි මහතාගේ බිරිඳ වන චමිලා අධිකාරි මහත්මිය වෙත 2026.02.02 දිනැතිව පහත නිර්දේශ දින 21 තුළ ක්‍රියාත්මක කරන ලෙස ලිපියක් යොමු කර ඇත. එම ලිපිය **ඇමුණුම*** ලෙස දක්වා ඇත.

<u>නිර්දේශ</u>

- කර්මාන්තකරු වන ජී. ප්‍රසන්න ජයසිරි මහතා මිය ගොස් ඇති බැවින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඔහු වෙත අංක WE - C01249(R4) හා 2025.05.23 දිනැතිව නිකුත් කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ මුල් පිටපත හා මරණ සහතිකයේ පිටපතක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.
- වර්තමානයේ සේවා ස්ථානයේ හිමිකාරිත්වයට අදාළ ලිපිලේඛන මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

(iii) අදාළ නොවේ.

(iv)
- නීතිඥ අජිත් පී. පෙරේරා මහතා විසින් යොමු කළ පැමිණිල්ල 2025.09.11 දිනැතිව ප්‍රධාන කාර්යාලයේ පැමිණිලි සම්බන්ධීකරණ ඒකකය හරහා කළුතර දිස්ත්‍රික් කාර්යාලය වෙත ලැබී ඇත.
- ඒ අනුව 2025.10.28 දිනැතිව පැමිණිල්ල කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරින් විසින් පරීක්ෂා කළ අතර එම අවස්ථාවේ ත්‍රී රෝද රථ සේවා ස්ථානය වසා තිබුණි.
- 2025.11.26 දිනැතිව යළිත් එම කර්මාන්තය පරීක්ෂා කළ අතර එම අවස්ථාවේදී කර්මාන්තය ක්‍රියාකාරී වූ අතර පැමිණිලි පාර්ශ්වය නිවසේ නොසිටියේය. ඉන් අනතුරුව පැමිණිලිකරු කාර්යාලයට දුරකථන ඇමතුමක් දී පවසා සිටියේ තමන් හමු නොවූ බැවින් යළිත් ක්ෂේත්‍ර පරීක්ෂණයට පැමිණෙන ලෙසයි.
- එම ඉල්ලීමට අනුව 2026.01.16 දිනැතිව යළිත් දෙපාර්ශ්වයම සම්බන්ධ කර ගනිමින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලද අතර, උක්ත ප්‍රශ්න අංක iiට අදාළ නිර්දේශ දින 21ක් ඇතුළත සිදු කරන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රසන්න ජයසිරි මහතාගේ බිරිඳ වන චමිලා අධිකාරි මහත්මිය වෙත 2026.02.02 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

(v) මෙම කර්මාන්තය පිළිබඳව ලැබී ඇති පැමිණිල්ල සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සිදු කරනුයේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් කර්මාන්තකරුගේ බිරිඳ වෙත යොමු කරන ලද 2026.02.02 දිනැති ලිපිය සඳහා ඇය විසින් ලබා දීමට අපේක්ෂිත වාර්තා සහ ලිපිලේඛන සලකා බැලීමෙන් පසුවය.

(ආ) අදාළ නොවේ.

(அ) (i) அந்த முறைப்பாட்டுக்கமைய 2026.01.16ஆம் திகதி இரு தரப்புகளையும் தொடர்புபடுத்திய வாறு களச் சோதனையொன்று மேற்கொள்ளப் பட்டது. அந்தக் களச் சோதனையின் அவதானிப்புகள் கீழே குறிப்பிடப்பட்டுள்ளன:

- களச் சோதனையை மேற்கொள்ளும் சந்தர்ப்பத்தில் முச்சக்கரவண்டிச் சேவை நிலையத்தின் செயற்பாடுகள் மேற்கொள்ளப் பட்டுக்கொண்டிருந்தமை.
- இந்தக் கைத்தொழில் நிலத்துக்கருகில் முறைப்பாட்டாளரின் வீடு அமைந்திருந்தமை.
- இந்தச் சேவை நிலையத்துடன் தொடர்பு டையதாக 2025.05.07ஆம் திகதி முதல் 2027.01.16ஆம் திகதி வரை செல்லுபடியாகும் வகையில் இந்த அதிகாரசபையினால் WE-C01249(R4) இலக்க 2025.05.23ஆம் திகதிய சுற்றாடல் பாதுகாப்பு அனுமதிப்பத்திரம் புதுப்பிக்கப்பட்டிருந்தமை.
- களச் சோதனையின்போது கைத்தொழில் உரிமையாளர் தற்போது மரணமடைந் துள்ளார் என்ற விடயம் தெரியவந்தமை.
- முறைப்பாட்டுத் தரப்பினரான இறந்த கைத்தொழில் உரிமையாளரின் மனைவி திருமதி சமிலா அதிகாரம் அவர்களால் தெரிவிக்கப்பட்ட பிரகாரம் இந்தக் கைத் தொழில் அமைந்துள்ள காணி தொடர்பாக முறைப்பாட்டுத் தரப்புடன் பாணந்துறை நீதவான் நீதிமன்றத்தில் 2918ஆம் இலக்க வழக்கு விசாரிக்கப்பட்டு வருகின்றமை.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

- திருமதி சமிலா அதிகாரம் அவர்கள் தெரிவித்துள்ளபடி அவருடைய கணவர் இறப்பெய்தியதன் பின்னர் ஊழியர் ஒருவரை ஈடுபடுத்தி முச்சக்கரவண்டிச் சேவை நிலையத்தை நடாத்துகின்றமை.

(ii) 2026.01.16ஆம் திகதி மேற்கொள்ளப்பட்ட களச் சோதனையின் அவதானிப்புகளுக்கமைய, இறப்பெய்தியுள்ள திரு. ஜீ. பிரசன்ன ஜயசிரி என்பவரின் மனைவியான திருமதி சமிலா அதிகாரம் என்பவருக்கு 2026.02.02ஆம் திகதி கீழ்க்குறிப்பிடப்படும் பரிந்துரைகளை 21 தினங்களுக்குள் நடைமுறைப்படுத்துமாறு அறிவித்து கடிதமொன்று அனுப்பப்பட்டுள்ளது. அக்கடிதம் *இணைப்பாகத் தரப்பட்டுள்ளது.

பரிந்துரைகள்

- கைத்தொழிலின் உரிமையாளரான திரு.ஜீ. பிரசன்ன ஜயசிரி மரணமடைந்துள்ளமையினால் மத்திய சுற்றாடல் அதிகாரசபையினால் அவருக்கு வழங்கப்பட்டுள்ள WE-C01249(R4) இலக்க 2025.05.23ஆம் திகதிய சுற்றாடல் பாதுகாப்பு அனுமதிப்பத்திரத்தின் மூலப் பிரதி மற்றும மரண அத்தாட்சிப் பத்திரத்தின் பிரதியை மத்திய சுற்றாடல் அதிகாரசபைக்குச் சமர்ப்பித்தல் வேண்டும்.
- தற்போதைய சேவை நிலையத்தின் உரிமை தொடர்பான ஆவணங்களை மத்திய சுற்றாடல் அதிகார சபைக்குச் சமர்ப்பித்தல் வேண்டும்.

(iii) ஏற்புடையதாகாது.

(iv)
- சட்டத்தரணி அஜித் பீ. பெரேரா அவர்களால் முன்வைக்கப்பட்ட முறைப்பாடு 2025.09.11 ஆம் திகதி தலைமை அலுவலகத்தின் முறைபாடுகள் ஒருங்கிணைப்புப் பிரிவினூடாக களுத்துறை மாவட்ட அலுவலகத்திற்குக் கிடைக்கப்பெற்றுள்ளது.
- அதற்கமைய, 2025.10.28ஆம் திகதி முறைப்பாடு தொடர்பான சோதனையை களுத்துறை மாவட்ட அலுவலகத்தின் அலுவலர்கள் மேற்கொண்டதுடன், அந்தச் சந்தர்ப்பத்தில் குறித்த முச்சக்கரவண்டிச் சேவை நிலையம் மூடப்பட்டிருந்தது.
- 2025.11.26ஆம் திகதி மீண்டும் குறித்த கைத்தொழில் நிலையம் சோதனையிடப் பட்டதுடன், அந்தச் சந்தர்ப்பத்தில் கைத்தொழில் நிலையம் இயங்கியதுடன் முறைப்பாட்டாளர் தரப்பினர் வீட்டில் இருக்கவில்லை. அதன் பின்னர் முறைப் பாட்டாளர், அலுவலகத்துடன் தொலைபேசி ஊடாகத் தொடர்புகொண்டு, தன்னைச் சந்திக்கவில்லையென்பதனால் மீண்டும் களச் சோதனையை மேற்கொள்ளுமாறு தெரிவித்தார்.
- அந்தக் கோரிக்கைக்கமைய, 2026.01.16ஆம் திகதி மீண்டும் இரு தரப்பினரையும் தொடர்புபடுத்தி களச் சோதனையை மேற்கொண்டதுடன், மேலே வினா இலக்கம் ii உடன் தொடர்புடைய பரிந்துரையை 21 தினங்களுக்குள் நடைமுறைப்படுத்துமாறு மத்திய சுற்றாடல் அதிகாரசபையினால் திரு. பிரசன்ன ஜயசிரி என்பவரின் மனைவியான திருமதி சமிலா அதிகாரம் என்பவருக்கு 2026.02.02ஆம் திகதிய கடிதத்தினூடாக அறிவிக்கப்பட்டுள்ளது.

(v) இந்தக் கைத்தொழில் தொடர்பாக கிடைக்கப் பெற்றுள்ள முறைப்பாட்டுக்கான அடுத்தகட்ட நடவடிக்கைகள், மத்திய சுற்றாடல் அதிகாரசபையினால் கைத்தொழில் உரிமை யாளரின் மனைவிக்கு அனுப்பப்பட்டுள்ள 2026.02.02ஆம் திகதிய கடிதத்திற்காக அவர் வழங்கும் அறிக்கை மற்றும் ஆவணங்களைக் கவனத்திற்கொண்டதன் பின்னரே மேற் கொள்ளப்படும்.

(ஆ) ஏற்புடையதாகாது.

(a) (i) According to the said complaint, on 2026.01.16, a field inspection was carried out with the participation of both parties. The observations of the said field inspection are as follows.

- That at the time the field inspection was carried out, activities were being carried out at the three-wheeler service station.
- The complainant's house is situated in close proximity to this industrial premises.
- In relation to this service station, this Authority has renewed the Environmental Protection License bearing No. WE - C01249(R4) dated 2025.05.23, valid from 07.05.2025 to 16.01.2027.
- It was revealed during the field inspection that the industrialist has now passed away.
- As stated by the complainant party and by Mrs. Chamila Adhikari, the wife of the deceased industrial owner, in respect of the land on which this industry is situated, a land case with the complainant party is being heard before the Panadura Magistrate's Court under Case No. 2918.
- That according to the statement made by Mrs. Chamila Adhikari, after the death of her husband, the three-wheeler service station is being operated by employing a worker.

(ii) According to the observations of the field inspection carried out on 16.01.2026, a letter dated 02.02.2026 had been sent to Mrs. Chamila Adhikari, the wife of the late G. Prasanna Jayasiri, informing her to implement the following recommendations within 21 days. The letter is given as Annex *.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

*Recommendations*

- Since the industrialist, Mr. G. Prasanna Jayasiri, had passed way, the original copy of the Environmental Protection Licence bearing No. WE - C01249(R4) and dated 2025.05.23 issued to him by the Central Environmental Authority, together with a copy of the death certificate, should be submitted to the Central Environmental Authority.
- The documents relating to the present ownership of the service station should be submitted to the Central Environmental Authority.

(iii) Irrelevant.

(iv)
- The complaint submitted by Mr. Ajith P. Perera, Attorney-at-Law, was received by the Kalutara District Office on 11.09.2025 through the Complaints Coordination Unit of the Head Office.
- Accordingly, the complaint was inspected on 28.10.2025 by the officers of the Kalutara District Office, and at that time the three-wheeler service station was closed.
- The said industry was again inspected on 26.11.2025, and on that occasion, the industry was in operation. However, the complainant party was not at home. Thereafter, the complainant telephoned the office and asked the officers, as he was not met, to visit again for a field inspection.
- In accordance with that request, a field inspection was carried out again on 16.01.2026 with the participation of both parties, and by letter dated 02.02.2026, the Central Environmental Authority had informed Mrs. Chamila Adhikari, the wife of Mr. Prasanna Jayasiri, to implement the recommendations relevant to Question No. (ii) above, within 21 days.

(v) Further action in respect of the complaint received regarding this industry will be taken after considering the reports and documents expected to be submitted by the wife of the industrialist in response to the letter dated 02.02.2026 issued to her by the Central Environmental Authority.

(b) Irrelevant.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 3වන ප්‍රශ්නයට - 1865/2026 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 3ஆம் இலக்க வினாவுக்கு - 1865/2026 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation requested for two weeks' time to reply to Question No. 03 - 1865/2026 - raised by the Hon. Ajith P. Perera appearing in today's Order Paper.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 4වන ප්‍රශ්නයට - 1866/2026 - පිළිතුර දීමට අග්‍රාමාත්‍ය  සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය, ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 4ஆம் இலக்க வினாவுக்கு - 1866/2026 - விடையளிப்பதற்கு, பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education requested for two weeks' time to reply to Question No. 04 - 1866/2026 - raised by the Hon. Ajith P. Perera appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.